මම gentleman politics කරන මිනිහෙක්, රස්තියාදුකාරයෙක් නොවෙයි. ඔබතුමා ඔය විධියට කථා කරන්න එපා. මේ ඉදිරි පෙළේ සිටින මමත් පක්ෂ නායකයෙක්. ඒක මතක තියාගන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමාගේ පක්ෂය මොකක්ද කියලා කියන්න?

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
මම පක්ෂ නායක රැස්වීමටත් සහභාගි වන කෙනෙක්. *[බාධා කිරීම්]*

රු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමාගේ පක්ෂය මොකක්ද කියලා කියන්නකෝ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ශ්‍රී ලංකා නිදහස් පක්ෂය. *[බාධා කිරීම්]* මොකක්ද? *[බාධා කිරීම්]* ඔබතුමාට ඒක වැඩක් නැහැ. ඒක තීරණය කරන්නේ අපි. ඒක මතක තියාගන්න. ඒක තීරණය කරන්නේ අපි. මම සන්ධානයේ පක්ෂයක නායකයෙක්. මතක තියාගන්න. *[බාධා කිරීමක්]* කණ්ඩායම් නායකයෙක්.

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
පනත ගැන කථා කරන්න ඉස්සෙල්ලා ඔබතුමාගේ පක්ෂය මොකක්ද කියලා කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
අපි ඒක තීරණය කර ගන්නම්. ඔබතුමා කලබල වෙන්නේ නැතුව ඉන්න. අපි රස්තියාදුකාරයෝ විධියට හැසිරෙන්නේ නැහැ. ඔබතුමන්ලාට මේක දරා ගන්න බැරිවයි ඉන්නේ. ප්‍රශ්නය ඒකයි. ගරු කථානායකතුමනි,-

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමා තරහා ගන්න එපා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තරහා ගන්නේ නැහැ, තරහා ගන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මම නිකම් තොරතුරු ටිකක් අරගෙන ආවේ නැහැ.

පනතේ මේ වගන්තියේ ඊළඟට කියන්නේ මොකක්ද බලන්න. මොකද, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 23(1) විතරක් කියවලා හරියන්නේ නැහැ. 23(2)ත් කියවන්න.

එහි මෙසේ සඳහන් වෙනවා:

"අතුරු සම්මත ගිණුම යටතේ වියදම් වෙන් කරනු ලබන කාල සීමාව මාස හතරකට වඩා වැඩි නොවිය යුතු අතර, අතුරු සම්මත ගිණුම යටතේ වියදම් කරන ලද මුදල් ද ඇතුළත්ව විසර්ජන පනත සම්මත කරගත යුතු ය."

ඒකෙන් අදහස් කරන්නේ මොකක්ද? ඊළඟට ගෙනෙන විසර්ජන පනත් කෙටුම්පත සම්මත කිරීම සම්බන්ධව මේ කියන්නේ. දින 26ක් ඇතුළත මේක ගෙනෙන්න පුළුවන්. ඒක ගෙනාවේ නැති එක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මම කියන්නේ ඔබතුමන්ලා ඒ තර්කය පිළිගන්නේ නැති එක ගැනයි. මට මේක ඇතුළේ දේශපාලන වශයෙන් කථා කරන්න දෙයක් නැහැ. මේ රටේ මිනිහෙකුට උසාවියට ගිහිල්ලා ප්‍රශ්නයක් මතු කරන්න අවස්ථාවක් ඇති කරන්න එපා කියලායි මම මේ කියන්නේ. දැන් අපි මේ යන්නේ අපි සම්මත කරපු පනතක් අනුව නේ. මේ රටේ මිනිස්සුන්ට අයිතියක් තිබෙනවා, විසර්ජන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ නැතිව මෙහෙම අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළාම ඒ සම්බන්ධයෙන් උසාවියට යන්න. මොකද හේතුව, අපි පනතක් ගෙනැල්ලා තිබෙනවා. මම කියන්නේ මේකයි, ගරු කථානායකතුමනි. මට කිසි ගැටලුවක් නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට මයික් එක දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමාට මයික් එක දෙන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, කියන්න ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමාටයි මම කථා කරන්නේ. මට මේ ආණ්ඩුවත් එක්ක තිබෙන රණ්ඩුවක් හෝ එක එක්කෙනා එක්ක තිබෙන පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි, මේක. අපි මේවා ගැන පාර්ලිමේන්තුවේ කථා කරන්න ඕනෑ නැත්නම්, අපි එහෙනම් සද්ද නැතුව ඉන්නම්. තමුන්නාන්සේලා, තමුන්නාන්සේලාගේ වැඩේ කරගෙන යන්න. නමුත්, මම කියන්නේ එහෙම ඉඩක් දෙන්න කියලායි. ඒකට ලැහැස්ති වෙන්න. මොකද, ඒක පාවිච්චි කරන්න හදන්න එපා, නලින්ද ජයතිස්ස මැතිතුමනි. අපි මේ අපේ රාජ්‍ය සේවකයන්ට දෙන පඩිය කපන්න හදනවා කියනවා. එහෙම දෙයක් නොවෙයි, මේ කියන්නේ. විසර්ජන පනත් කෙටුම්පත ගෙනෙන්න, ගෙනැල්ලා ඒ වැඩේ කරන්න ඔබතුමන්ලාට කාලය තිබුණා. ඒක සිදු නොවුණු නිසා තමයි මේ ක්‍රියාදාමය කරන්නේ. ඒ නිසා මම මතු කරපු කාරණය පිළිබඳව මීට වැඩිය සාධාරණව කල්පනා කරන්න කියන එකයි මට කියන්න තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු හර්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා පොඩ්ඩක් ඉන්න. මට දීලා තිබුණු අවස්ථාව තමයි මම දයාසිරි මන්ත්‍රීතුමාට ලබා දුන්නේ.

ගරු කථානායකතුමා ගැන චමින්ද විජේසිරි මැතිතුමා කරපු ඇගයීම ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි මේ පාර්ලිමේන්තුව දැකලා තිබෙනවා නේ.

ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුව තුළ ජෝර්ජ් බුෂ්ගේ නම කියන්න බැරි කාලයක් තිබුණා. ඒ, වෙන රටක හිටපු ජනාධිපති කෙනෙක්. මේවා එහෙම suppress කරපු තැන්. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා දිනයක් සඳහන් නොකර ලිපියක් ඉදිරිපත් කර තිබියදීත් ගරු කථානායකතුමා ඊට අවසර ලබා දුන්නා. ඒ ලබා දීපු අවස්ථාව වැදගත් විධියට පාවිච්චි කරන්නත් අපි දැන ගන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී අවසර ඉල්ලා සිටිනවා, නීතිපතිතුමා අපට ලබා දී තිබෙන ලිපිය කියවන්න. මම දැන් එය කියවන්නම්. අපට එකම දේ තහවුරු කරන්න කරුණු ගොඩක් තිබියදීත් අපි මුලින් උත්සාහ කළා, සරල කරුණුවලින් යන්න. නමුත් දැන් ඒකත් මදි නිසා අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, නීතිපතිතුමා විසින් එවන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් පසුව සාධාරණව කල්පනා කර බලා අපට මේ ප්‍රධාන විවාදය ආරම්භ කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා. මොකද, අපේ පැත්තෙන් ප්‍රධාන කරීකයින් ගණනාවක් ඉන්නවා. එතුමන්ලාට වෙන් වූ කාලය කපන්න අපට බැහැ. මම ඒකයි කියන්නේ. අපි time management ගැන තමයි worry වෙන්නේ. ඊයේ විපක්ෂයේ සමහර මන්ත්‍රීතුමන්ලා කථා කළේ විනාඩි 3යි, විනාඩි 5යි. අපට ඒ ගැන දුකයි. එහෙම වුණාට පස්සේ මොකද

[ගරු බිමල් රත්නායක මහතා]

වෙන්නේ? තනි තනි පක්ෂවල මන්ත්‍රීවරයෙකුට කථා කරන්න වෙලාව ඉතුරු වෙන්නේ නැහැ. අපේ පැත්තෙනුත් මහාචාර්ය අනිල් ජයන්ත මැතිතුමා ඇතුළු මැති ඇමතිවරු විශාල සංඛ්‍යාවක් සූදානම් වෙලා ඉන්නවා, ජනතාවට කරුණු ඉදිරිපත් කරන්න. ජනතාව උනන්දු වෙනවා, පාර්ලිමේන්තුව මොනවාද කරන්නේ කියලා දැනගන්න. ඒ නිසා අපි මේ කරන හැම දෙයකින්ම ප්‍රධාන පෙළේ කථිකයින්ගේ වෙලාව තමයි අඩු වෙන්නේ. ඊයේ රාත්‍රි 12.00ට විතර තමයි මේ කාර්ය මණ්ඩලය ගෙදර ගියේ. අදත් අපට එහෙම කරන්න බැහැ. මම දැන්, ගරු නීතිපතිතුමා ඉදිරිපත් එවපු ලිපිය කියවන්නම්. මේ ලිපිය 2024 දෙසැම්බර් 2වැනි දා තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ.

It states, I quote:

"Secretary,
Ministry of Finance,
General Treasury,
Colombo 01.

Resolution under paragraph (2) of Article 150 of the Constitution
Vote on Account for the period of 01.01.2025 to 30.04.2025

I refer to your letter dated 29th November, 2024 addressed to you by the Legal Draftsman by letter dated 29th November, 2024 enclosing the final draft of the above Resolution.

I have perused the said final draft Resolution, Cabinet Memorandum dated 22nd November, 2024, Cabinet Decision dated 25th November, 2024, the provisions of the Constitution and Public Financial Management Act, No. 44 of 2024.

It is observed that, in terms of Article 148 of the Constitution, Parliament is vested with full control over public finance. It is further observed that Article 150(1) read with Article 150(2) of the Constitution provides for a sum to be withdrawn from the Consolidated Fund, under the authority of a warrant issued by the Minister in charge of the subject of finance, where such sum has, "by resolution of Parliament or by any law been granted for specified public services for the financial year during which the withdrawal is to take place or is otherwise lawfully charged on the Consolidated Fund". Further, the provisions of Section 23 of the Public Financial Management Act, No. 44 of 2024 are also noted.

Therefore, I am of the view that there is no legal impediment in respect of the aforesaid Resolution being submitted to Parliament for approval for a Vote on Account incorporating the expenditure required for specified public services of the Government for the period stipulated therein, being submitted to Parliament for approval by way of a Resolution."

නීතිපතිතුමාගේ ලිපියේ මේ ගැන තිබෙනවා. එම නිසා ගරු කථානායකතුමනි, අපි ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා, අද දිනට නියමිත විවාදය ආරම්භ කරන්න කියලා. මොකද, මීටත් වඩා මේ ගරු සභාවට පැහැදිලි කිරීම අවශ්‍යයි කියා මම හිතන්නේ නැහැ. අපි සාධාරණය ඉටු කරලා තිබෙනවා. ඒ නිසා අපට විවාදය ආරම්භ කරන්න අවසරය ලබා දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමනි, මේකට context එකක් දෙන්න පුළුවන්. මොකද, මම තමයි පසුගිය පාර්ලිමේන්තුවේ රජයේ මුදල් පිළිබඳ කමිටුවේ සභාපති හැටියට කටයුතු කළේ. අපි එතැනදී මේ සම්බන්ධව ගොඩක් වාද විවාද කරලා, නිලධාරීන් ගෙන්වලා, නීතිපතිතුමා ගෙන්වලා තමයි මේක සම්මත කළේ. ඉතින් පොඩි context එකක් දුන්නොත්, මේකට හේතුව තමයි කලින් Vote on Account එකක් ඉදිරිපත් කරනකොට නීතියේ රාමුවක් තිබුණේ නැතිකම. ඒ නීතිය ගෙනාපු එකයි කළේ. මෙතැන තිබෙන්නේ නීතිමය ප්‍රශ්නයක් නොවෙයි, සදාචාරාත්මක ප්‍රශ්නයක් පමණයි. මේකට solution එක තමයි, ගරු අනිල් ජයන්ත ඇමතිතුමා නම් මෙය ඉදිරිපත් කරන්නේ, එතුමාගේ කථාවේදී පළමුවෙන්ම "අපට වේලාව නැහැ, මේ අවස්ථාවේ අය වැයක් ගෙනෙන්න; ඒ නිසා අපට මේ අවස්ථාව ලබා දෙන්න" කියලා කිව්වා නම් මම හිතන විධියට එතැනින්ම ඒකට context එකක් ලැබෙනවා. ඒක තමයි මම කියන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමාගේ කථාව ආරම්භ කරනකොට නේ, මේ ඔක්කෝම බාධා කරන්න පටන් ගත්තේ. මම ඒකයි කිව්වේ,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් විවාදයට යමු.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපි විවාදය පටන් ගනිමු. මට කියන්න තිබෙන්නේ මෙච්චරයි. එතුමාගේ කථාව පටන් ගනිද්දි තමයි බාධා කිරීම ඇති වුණේ. ඒ නිසා තමයි මේක වෙලා තිබෙන්නේ. මේක අපේ ප්‍රශ්නයක් නොවෙයි. රටේ නීත්‍යානුකූලව මැතිවරණ පවත්වපු නිසා, ඒ මැතිවරණය නිසා ඇති වෙච්ච තත්ත්වයක් මිසක්, මේක අපේ ප්‍රමාදයක් නොවෙයි, ගරු කථානායකතුමනි. මම ඉල්ලා සිටිනවා, ගරු මහාචාර්යතුමාට කථාව ආරම්භ කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විවාදය ආරම්භ කරන ලෙස සභාවට යෝජනා කරනවා.

ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මට සභානායකතුමාගෙන් සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් පොඩි පැහැදිලි කිරීමක් කර ගන්න ඕනෑ. ඊයේ අර බාර් ලයිසන් list එක ඉදිරිපත් කරපු එකට බොහොම ස්තුතියි. ඔබතුමන්ලා කියපු විධියටම වැඩේ කරනවා. බොහොම ස්තුතියි.

ගරු සභානායකතුමනි, මේ විවාදය පටන් ගැනීමට කලින් මට විනාඩියක කාලයක් දෙන්න, පොඩි පැහැදිලි කර ගැනීමක් සඳහා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා,-

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)

ගරු සභානායකතුමා, මට විනාඩියක් දෙන්න. අපි මේ කාරණය සම්බන්ධව පැහැදිලි කර ගන්න එළියට යන්න ඕනෑ නැහැ නේ. බාර් ලයිසන් list එක ඔබතුමන්ලා ඊයේ ඉදිරිපත් කරලා තිබුණා. මට දැනගන්න ඕනෑ, ඒ බාර් ලයිසන් list එක එක්ක දුන්නු applications ටික, මන්ත්‍රීවරුන් දුන්නු recommendation letters ටික දැන් කොහේද තිබෙන්නේ කියලා. ඒ ගැන පරීක්ෂණයක් පවත්වනවාය කිව්වා. ඒ පරීක්ෂණය පවත්වන්නේ කවුද, CID එකද, පොලිසියද, ජනාධිපති ලේකම් කාර්යාලයෙන්ද, Attorney-General's Department එකද? ඒ වාගේම මේ බාර් ලයිසන් ටික cancel කරනවාද?

කිලිනොච්චි දිස්ත්‍රික්කයේ 100,000ක් ඉන්න තැනක බාර් ලයිසන් 18ක් දීලා තිබෙනවා. මිනිස්සු 100,000යි. එතකොට, මිනිස්සු 5,000කට එක බාර් ලයිසන් එකක්. ඒ නිසා මේ බාර් ලයිසන් ටික වහාම නවත්වන්න. මේ බාර් ලයිසන් ටික නවත්වනවාද? ඒවා cancel කරනවාද? අපට 300 ගණනකට වඩා බාර් ලයිසන් තිබෙනවා. මේ බාර් ලයිසන් සම්බන්ධයෙන් කරන පරීක්ෂණ ඉවර වෙනකොට ඒ තොරතුරු එළියට දෙනවාද? අන්න ඒක ගැන පොඩ්ඩක් කරුණු ඉදිරිපත් කරන්න. මොකද, ඊයේ මම අහපු ප්‍රශ්නයට බාර් ලයිසන් list එක ඉදිරිපත් කළා. මිනිස්සු මට කියනවා, මේ කාරණා ටිකත් අහන්න කියලා. ඉතින් මේ සභාව ඇතුළේදී ඔබතුමා ඒ ගැන පැහැදිලි කිරීමක් කළා නම් අපට ලෙහෙසියි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා, අපි ඒ ගැන ඉදිරියේදී කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත අමාත්‍යතුමනි, විවාදය ආරම්භ කරන්න.

[පූ.භා. 10.08]

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சரும்)
(The Hon. (Prof.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Economic Development)

ගරු කථානායකතුමනි, අද ඉදිරිපත් කර තිබෙන්නේ 2025 වසරේ මුල් මාස කීපය සඳහා වන අතුරු සම්මත ගිණුමයි. මේ ගරු සභාවේ ඉන්න සෑම මන්ත්‍රී කෙනෙක්ම දන්නවා, අතුරු සම්මත ගිණුමක් කියන්නේ මොකක්ද, අතුරු සම්මත ගිණුමක අවශ්‍යතාව මොකක්ද කියන කාරණය. කෙසේ වෙතත්, අදහස් ඉදිරිපත් කිරීමේදීම පැන නැඟුණු ඒ බාධා කිරීම් හමුවේ එය ඉදිරිපත් කරන්න ප්‍රමාද වුණා. ඇත්තටම විසර්ජන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරලා සම්මත වෙන්නේ නැති තත්ත්වයකදී අනිවාර්යයෙන්ම ඊළඟ මුදල් වර්ෂයේ පළමුවෙනි මාස 4 සඳහා රාජ්‍ය සේවා හා පවත්වාගෙන ආපු ඒ සංවර්ධන කටයුතු සඳහා ඒ මුදල් වෙන් කිරීම මේ අතුරු සම්මත ගිණුම හරහා සිද්ධ කරනවා. ඒ වාගේම ඒකට ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා. කලිනුත් සඳහන් කළා වාගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(2) අනුව්‍යවස්ථාව යටතේ සහ 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 23(1) වගන්තියට අනුකූලව තමයි මේ යෝජනා ඉදිරිපත් වෙන්නේ.

විශේෂයෙන්ම ඊළඟ අවුරුද්දේ පළමුවැනි මාස හතරේ රාජ්‍ය සේවාවන් සහ මේ කටයුතු කරන්න අපට වෙනත් ආකාරයකට මුදල් ලබා ගන්න බැරි නිසා අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරලා එය පාර්ලිමේන්තුවේ විවාද කරලා, සම්මත කර ගන්න සිද්ධ වෙනවා.

ජාතික ජන බලවේගයට ලැබුණු ජන වරම අනුව අපි මේ රට ඇද වැටිලා තිබුණු තත්ත්වයෙන් ගොඩ ගන්න පුළුවන් ක්‍රියා මාර්ග මොනවාද කියන එක ක්ෂේත්‍ර ගණනාවක් ඔස්සේ ඉදිරිපත් කළා. රට ගොඩ නැඟීමේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලියේදී මොන ආකාරයටද ඒ සංවර්ධන ව්‍යාපෘති ඇතුළත් කරන්නේ කියන කාරණය අපි අනිවාර්යයෙන්ම 2025 විසර්ජන පනත් කෙටුම්පතට ඇතුළත් කරනවා. ඒ වාගේම මේ අතුරු සම්මත ගිණුමෙන් අපි ඉදිරිපත් කරන වියදම් පිළිබඳ කාරණත්, 2025 විසර්ජන පනත් කෙටුම්පතට සම්බන්ධ කර ඉදිරිපත් කරනවා. ඒ අනුව, දැන් ඉදිරිපත් කර තිබෙන අතුරු සම්මත ගිණුමේ පළමුවැනි මාස 4 සඳහා පුනරාවර්තන වියදම් වශයෙන් පොලී හැර රුපියල් බිලියන 1,000කුත්, මූලධන නැත්නම් ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් බිලියන 425කුත්, විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයට අමතරව දේශීය ණය ඇතුළු අනෙකුත් ණය සේවාකරණය, පොලී හා වාරික ගෙවීම් සඳහා රුපියල් බිලියන 1,175කුත් අපට අවශ්‍ය වෙනවා. ඒ අනුව මුළු ඇස්තමේන්තුව රුපියල් බිලියන 2,600ක්. ඒ අනුව, ආණ්ඩුවේ ආදායම ඇස්තමේන්තු කරනවා, රුපියල් බිලියන 1,600කට. මූලික ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 1,000යි.

අපි කවුරුත් දන්නවා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කටයුත්තත් එක්ක ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාරණය ගැට ගැහිලා තිබුණා කියන එක. ඒක අසාමාන්‍ය පරිදි අවුරුදු දෙකහමාරකට වැඩි කාලයක් දික්ගැස්සිලා අවසාන අදියරට ඇවිල්ලා තිබෙනවා. ඒ අවසාන අදියරේදී, විශේෂයෙන්ම ද්විපාර්ශ්වීය ණය හිමියන් සහ ස්වෛරී බැඳුම්කර හිමියන් අතර ඇති වන එකඟතා මත ඒ ණය ප්‍රතිව්‍යුහගතකරණයේදී අලුතින් ණය පත්‍ර නිකුත් කරන්න අපට සිද්ධ වෙනවා. ඒ සඳහා කටයුතු කරන අවස්ථාවේදී අපි උත්සාහයක යෙදෙනවා, දෙසැම්බර් 31ට කලින් ඒ වැඩ කටයුත්ත අවසාන කරන්න. නමුත්, යම් තාක්ෂණික තත්ත්වයක් නිසා ඒක සතියක් හෝ දෙකක් ප්‍රමාද වීමේ ගැටලුවක් පැන නැඟුණොත්, ඒ අවිනිශ්චිතතාව සැලකිල්ලට භාජන කරලා තමයි, මේ යෝජනාවේ දෙවැනි වගුවේ ඉදිරිපත් කර තිබෙන ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන 4,000 දක්වා වැඩි කර තිබෙන්නේ.

අපි තේරුම් ගත යුතු තවත් කාරණයක් පිළිබඳව මම අපේ වැඩ පිළිවෙළට එන්න කලින් ඉදිරිපත් කරන්නම්.

ඇත්ත වශයෙන්ම අපි මේ රට භාර ගන්නකොට තිබුණු තත්ත්වය විවිධ නිර්ණායක මඟින් පිළිබිඹු වුණා. අපි කවුරුත් දන්නවා, රට ඉදිරියට ගෙන යන්න බැරි තැනක හිර වෙලා තිබුණු බව. ඇත්තටම ඊට පසුබිම වුණේ, අපි ඉතාම වැරදි දේශපාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීමයි. ඒ වාගේම තමයි වංචා හා දූෂණ පිළිබඳව තිබුණු චෝදනා. ඒවා මතුපිටින් පෙනුණාට වඩා විගණන වාර්තා, පැමිණිලි වාගේ ගැටලු ගණනාවක් ඇවිල්ලා සමාජගත වෙලා තිබුණා. ඒ තත්ත්ව හමුවේ ඇත්තටම බිඳ වැටුපු ආර්ථිකයක් තමයි තිබුණේ. ඒ බිඳ වැටුපු ආර්ථිකය විවිධ ආකාරයන්ගෙන් සමාජයට පිළිබිඹු වෙන්න ගත්තා. එහි ප්‍රධානම

[ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා]

අර්බුදය තමයි දරන්න බැරි ණය කන්දක අප හිරවීම. විශේෂයෙන් 1990 ඉඳලා කාල වකවානුව අරගෙන බැලුවත් මේ කාල පරිච්ඡේදයේදී සාමාන්‍යයෙන් ණය වර්ධනය වෙලා තිබෙනවා, වාර්ෂිකව සියයට 15කින්. හැබැයි, අපි ආර්ථික වෘද්ධිය බලපුවාම ඒ කාල පරිච්ඡේදයේ සාමාන්‍යයෙන් වාර්ෂිකව සියයට 4.5ක වාගේ ප්‍රමාණයක් තිබෙන්නේ. මේ නිසා තමයි අපි දිගින් දිගටම මේ කාරණා මතු කරමින් ආවේ. ණය ගන්නට ඕනෑ. ණය අරගෙන ආර්ථිකය සංවර්ධනය කරන්නට ඕනෑ. හැබැයි, ඒවා ඇතුළේ තිබුණු ගැටලු නිසා ඒ ණයවලින් ප්‍රමාණාත්මක වත්කම් හැදුණේ නැහැ. ඒ වාගේම අත්‍යවශ්‍ය වත්කම් හැදුණේ නැහැ. ණය භාවිත කරලා ආර්ථිකය සංවර්ධනය වුණේ නැහැයි කියන්න හොඳම උදාහරණය තමයි මේ දත්ත ටික; මේ ණය බර.

අපේ ණය බර කොච්චර දුරට විහිදිලා ගියාද කියනවා නම්, අවසානයේදී අර්බුදය පටන් ගන්න ඔන්න මෙන්න තිබියදී - 2023 වනවිට- ගෙවන්න තිබුණු පොලී ප්‍රමාණයත් ඉතා විශාලයි. ඇත්තටම අපි ගත්ත ණයවලින් හරි විධියට ආර්ථිකය ගොඩනඟලා, හදලා තිබුණා නම් මේ වනකොට එහි ප්‍රතිලාභ ලැබෙන්නට ඕනෑ. ඇත්තටම ඒවා නිෂ්පාදන ක්‍රියාවලියට සැබෑ ලෙසම සම්බන්ධ නොවුණු නිසා තමයි එය ණය බරක් විධියට විතරක් නොවෙයි, ප්‍රතිලාභ නොඑන තත්ත්වයක් ඇති වුණේ. අනික් පැත්තෙන් ඒ ගත්ත ණය පැටව් ගහලා, පැටව් ගහලා තමයි පොලිය නිර්මාණය වෙලා තිබෙන්නේ. මේ තත්ත්ව අපි තේරුම් ගන්නට ඕනෑ.

ඒ වාගේම තමයි උද්ධමනය. අපි කවුරුත් දන්නවා, වෙළෙඳ පොළේ පවතින විවිධ තත්ත්වයන්ගෙන් උද්ධමනය වැඩි වන බව. එහෙත් මෙන්න මේ වැරදි ප්‍රතිපත්ති නිසා ඇති වුණු උද්ධමනය දරා ගන්න බැරි මට්ටමකට ඉහළ ගියා. විශේෂයෙන් 2019 - 2022 කාල පරිච්ඡේදයේදී ආහාර උද්ධමනය සියයට 90ත් ඉක්මවා ගියා. දැන් යම් ආකාරයකට එය පාලනය වෙලා තිබෙන බව හැබෑව. හැබැයි, ඒ මහින් පීඩනයට පත් වුණේ විශේෂයෙන්ම සාමාන්‍ය ජනතාව. අපේ රටේ විශේෂයෙන්ම ආදායම් බෙදී යෑමේ විශාල විෂමතාවක් තිබෙනවා. විශේෂයෙන් ආහාර උද්ධමනය සියයට 80ට වඩා වැඩි වනකොට මූර්ත වැටුප -මූර්ත ආදායම- අඩු වනවා. ජනතාව ඒ පීඩනයට හසු වෙලා හිටියා, අපේ සමාජයේ ආදායම් බෙදී යෑමේ විෂමතාවත් එක්ක.

ගරු කථානායකතුමනි, ආණ්ඩු කරගෙන යනකොට, රාජ්‍ය පවත්වාගෙන යන්න ප්‍රමාණාත්මක ආදායමක් අවශ්‍ය බව අපි කවුරුත් දන්නවා. අපේ ආසියානු කලාපයේ අරගෙන බැලුවත්, දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ආණ්ඩුවේ ආදායම් සියයට 20කට වැඩියි. අපිත් යම් අවස්ථාවලදී මේ තත්ත්වයන් වාර්තා කරලා තිබෙනවා. විශේෂයෙන්ම 1990දී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ආණ්ඩුවේ ආදායම සියයට 23.2ක්. නමුත්, ක්‍රමිකව මෙය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 10ටත් වඩා අඩු මට්ටමකට පත් වෙලා තිබුණා.

ඒත් එක්කම අපි බලන්නට ඕනෑ තවත් දෙයක් තිබෙනවා. දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 10කට වඩා අඩු මට්ටමකට එනකොටත් අපි පනවන බදු අනුපාත, අය කරන බදු ප්‍රමාණ එන්න එන්න වැඩි කරලා තිබෙන්නේ. බදු අනුපාත වැඩි කරලා, බදු වැඩි කරලා තිබියදීත් බදු ආදායම පල්ලෙහාට යනවා නම්, මේක ඇතුළේ ගැටලු ගණනාවක් තිබෙනවා; රාජ්‍ය ආදායම කළමනාකරණය කිරීමේ විශාල ගැටලු ප්‍රමාණයක් තිබෙනවා. සමහර විට මේවා වංචා, දූෂණ හා ගැට ගැහිලා තිබෙන්න පුළුවන්. මම කලින් උදාහරණයකට අරගෙන පෙන්නුවේ, ආසියාවේ මේ ප්‍රමාණය සියයට 20ක සාමාන්‍යයක් පවත්වා ගෙන යනවා කියන එකයි.

ඒ වාගේම, අපේ විදේශීය අංශය ලෝකයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා. අපි දන්නවා රටකට, රාජ්‍යයකට හුදෙකලා වෙලා ගමන් කරන්න බැහැ කියලා. අපි රටක් විධියට විදේශීය අංශය ශක්තිමත් කර ගන්නට ඕනෑ. ඒ වාගේම, අපේ පසුගිය දශක දෙකක වාගේ කාලපරිච්ඡේදයේදී හැම තිස්සේම වෙළෙඳ ගිණුමේ අපට විශාල ප්‍රමාණයක හිඟයක් තිබුණා. ඒක සාමාන්‍ය සංඛ්‍යාවක් විධියට ගත්තොත්, ඩොලර් බිලියන 7ක - 8ක විතර ප්‍රමාණයක්. සමහර අවස්ථාවලදී ඒක ඩොලර් බිලියන 10ටත් ළඟා වෙලා තිබුණා. ඒ හිඟය පියවා ගන්න උදව් උපකාර වුණේ විදේශීය ශ්‍රමිකයන් එවන ප්‍රේෂණ. යම් අර්බුදකාරී තත්ත්වයකදී ඒ ප්‍රේෂණ උපයෝගී කරගෙන වෙළෙඳ ගිණුමේ ශේෂය පියවා ගත්තාට, යම් අර්බුදකාරී තත්ත්වයකදී මුහුණ දෙන්න පුළුවන් buffer එකක් අපට තිබුණේ නැහැ. මේ ආර්ථික අර්බුදය ඇතුළෙදී ඒ තත්ත්වයත් බලපෑවා. ඒ අනුව තමයි අපිට මේ ජනවරම ලැබෙනකොට අපේ ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ අපි විශේෂයෙන්ම අවධානය යොමු කළේ, අපට ලැබෙන්නේ සාමාන්‍ය මට්ටමේ ආර්ථිකයක් නොවෙයි කියලා. ඒක අපි දැනගෙන හිටියා.

මීට කලින් අවස්ථාවලත් ජාතික ජන බලවේගය විවිධ මැතිවරණවලදී අපේ ප්‍රතිපත්ති ප්‍රකාශන ඉදිරිපත් කළා. මේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ විශේෂත්වයක් තිබෙනවා. අපේ ආර්ථික ප්‍රතිපත්තියේ පළමුවැනිම කාරණය විධියට අපි ලිව්වේ ස්ථායීකරණ වැඩසටහන. සාර්ව ආර්ථික ස්ථායීකරණය, මූල්‍ය ස්ථායීකරණය, ජාත්‍යන්තර වශයෙන් මෙහි තිබෙන ඒ අංශයේ ස්ථායීකරණය, ඒ වාගේම සමාජයේ ස්ථායීකරණයට විශේෂ අවධානයක් යොමු කරලා ඒ වැඩ කටයුත්ත කළේ ඒ නිසායි. ඒක කරන්න අපට පුළුවන් වුණා. ඒ වුණාට වත්මන් විපක්ෂය -ඒ වෙලාවේදී ආණ්ඩු පක්ෂයේ හිටපු කණ්ඩායම- පසුගිය මැතිවරණවලදී සමාජයේ විශාල භයක් නිර්මාණය කළා, ජාතික ජන බලවේගය බලයට ආවොත් ව්‍යාපාරිකයන් එන්නේ නැහැ; රට අස්ථාවර වෙනවා; ගැටලු ගණනාවක් ඇති වෙනවා කියලා.

ඒ වාගේම, අපි කිව්වේ නැති දේවල් බොරු ප්‍රකාශ විධියට ඉදිරිපත් කළා. එවැනි ප්‍රකාශ ඉදිරිපත් කළාම අපි ඇත්තටම කිව්වේ නැති එකක් අපි කරන්නේ නැත්නම් අර ඉදිරිපත් කරන බොරුව ආයේ ඇත්තක් බවට පත් වෙනවා. එවැනි දේවල් ගොඩක් මේ සමාජයේ සිද්ධ වුණා. ඇත්තටම අපි වැඩ කළේ අනෙක් අයගේ න්‍යාය පත්‍රයට අනුව නොවෙයි, අපේ න්‍යාය පත්‍රයට අනුව. අපේ න්‍යාය පත්‍රයේ අංක එක වුණේ ස්ථායීකරණය නිසා ඒ ස්ථායීකරණයේදී අපට ගැළවෙන්න බැරි විධියට ගැට ගැහිලා තිබිච්ච ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඒ ගිවිසුම, එකඟතාව ඇතුළේ අපි සාකච්ඡා පැවැත්වුවා. අපි ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් කිව්වේ ඒ කාරණයම තමයි. අපි මූලික රාමුවෙන් එළියට යන්නේ නැහැ. හැබැයි, අපට උචිත පරිදි ඒ ඒ ක්ෂේත්‍රවලදී අපි ඒ සාකච්ඡාව - negotiations - පවත්වනවා. ඇත්තටම ඒ සාකච්ඡාව පැවැත්වුවා. ඒක සාර්ථක වුණා. ඒකේ අවසාන ප්‍රතිඵලය හැටියට අපි Staff-level Agreement එකේ මට්ටමට ඇවිල්ලා තිබෙනවා. ඒක අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කළා. බොහෝදුරට ජනවාරි, පෙබරවාරි වෙනකොට ඒ තත්ත්වය අපට දැනගන්න පුළුවන් වේවි.

ඔබතුමන්ලා කවුරුත් දන්නවා, අපි කථා කළේ නිෂ්පාදන ආර්ථිකයක් ගැන බව. අපි මොනවා කළත්; මෙය ස්ථායීකරණය කරලා මූලික ඉම පැන්නත්, රටේ අර්බුදයෙන් ගොඩයන්න නම් රටේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය අනිවාර්යයෙන්ම වැඩි කරන්න ඕනෑ. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය වැඩි කරනකොට රටේ මූල්‍ය ඉතා වැදගත් වෙනවා. ඒ මූල්‍ය නිෂ්පාදන ක්‍රියාවලියට අපි එන්න ඕනෑ. ආයෝජකයන් රටට එන්නට ඕනෑ. හැබැයි, ආයෝජකයන්ට අප පිළිබඳ විශාල බයක් මැව්වා. ඒ නිසා අපට කිසිම ඉඩකඩක් තිබුණේ නැහැ, සැකයකින්වත්, පුංචි වරදකින්වත්

අපි ආණ්ඩුකරණය කිරීමේදී, අපට විරුද්ධ බලවේග මවපු ආකාරයේ අවිශ්වාසයක් ආර්ථිකය තුළ නිර්මාණය වෙනවා දකින්න. ඒ නිසා තමයි අපි ඉතා සූක්ෂ්මව, නමුත් හෙමින්, ස්ථාවරව මේ ස්ථායීකරණය කර ගත්තේ. අපට කියන්න සන්තෝෂයි. මේ වනකොට දේශීය ආයෝජකයෝ විතරක් නොවෙයි, විදේශීය ආයෝජකයිනුත් පෙළ ගැහිලා ඉන්නවා, ඒ විශ්වාසය අනුව වැඩ කටයුතු කරමින් ඉදිරියට යන්න.

ඒ වාගේම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ කාරණයේදී එහි අවසාන අදියරට ළඟා වෙමින් තිබෙන්නේ. ඒ අනුව අපි උත්සාහයක යෙදී ඉන්නවා, ලබන දෙසැම්බර් 31 වෙනකොට ඒ ණය ප්‍රතිව්‍යුහගතකරණය අවසාන කරන්න. නමුත් එතැනදී මම මතු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. විශේෂයෙන් ස්වෛරී බැඳුම්කර ලබා ගැනීමේදී, මේ ණය ප්‍රතිව්‍යුහගත කරන ක්‍රියාවලිය විශාල ලෙස පමා වීම හේතුවෙන් පමණක්ම අමතර හිඟ පොලිය විධියට ඩොලර් බිලියන 1.7ක් අපට ගෙවන්න සිද්ධ වෙනවා. ඒ නිසාම තමයි අපි නිතරම කිව්වේ, අපි මහ පොළොවේ යථාර්ථය දකිමින් මේ වැඩ කටයුත්තට එන්නේ කියාත්, අපි විකල්ප Debt Sustainability Analysis එකක් ගැන සාකච්ඡා කරලා ඒක හදනවා කියාත්. අපි කිව්වේ නැහැ, බලහත්කාරයෙන් IMF එකට ඒක ඔබ්බවන්න යනවා කියන එක. අපි ඒක ගැන සාකච්ඡා කරනවා, ඒක හදනවා කියලා කිව්වා. තවත් කාරණා ගණනාවක් අපි කිව්වා. මොකද, යම් කේවල් කිරීමේ negotiation table එකකදී එක පාර්ශ්වයකට ඕනෑ සියල්ල කරන්න බැහැ. එහෙමනම් අපි ඒ negotiation එකෙන් අයින් වෙන්න ඕනෑ. අපි කිව්වා, "නැහැ. ඒකෙන් අයින් වෙන්නේ නැහැ. හැබැයි අපි සාකච්ඡා කරනවා" කියලා.

එහි ප්‍රතිඵල ඇවිත් තිබෙනවා. නමුත් අප මතු කරන්න ඕනෑ කාරණය තමයි, මේ negotiations පසුගිය අවුරුදු දෙකහමාර ඇතුළේ පමා කිරීම නිසා අනවශ්‍ය පොලී ප්‍රමාණයක් අපට ගෙවන්න සිද්ධ වුණා කියන එක.

ඒත් එක්කම මේ ස්ථායීකරණ වැඩසටහනේදී අපට වැදගත් වන කාරණයක් වුණේ, සමාජයේ ස්ථායීකරණය. මේ රට ගොඩ ගන්න කාරණයේදී ආයෝජකයන්ගේ විශ්වාසය අපි දිනා ගත්තා, දේශීය විදේශීය වශයෙන්. ඒත් එක්කම රටේ ඉන්න ශ්‍රම බලකාය මේ නිෂ්පාදන ප්‍රවාහයට එකතු කර ගන්න ඕනෑ. ඒක වේගයෙන් ගෙන එන්න ඕනෑ. හැබැයි, අපි කවුරුත් දන්නවා, රටේ ජනගහනයෙන් භාගයකට වඩා සහනාධාර ඉල්ලන මට්ටමක ඉන්නේ; ඔවුන්ගේ ආර්ථිකය බිඳ වට්ටලා ඔවුන්ව උස්සලා පොළොවේ ගහපු තත්ත්වයක් තිබෙන්නේ කියා. එහෙමනම් එකවර ඔවුන්ට අවස්ථා නිර්මාණය කරන ගමන්ම යම් ආකාරයක සහනාධාර සැපයීමක්, ඔවුන් එතැනින් උඩට ඔසවා තැබීමක් අවශ්‍ය කරනවා. අන්න ඒ නිසා තමයි අපි දැනට ක්‍රියාත්මක වෙමින් තිබෙන සහනාධාරවලට වඩා එහාට යමින්, විශේෂයෙන් සමහර ක්ෂේත්‍රවල නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීමේ චේතනාවෙන්; ගොවීන්ට, ධීවරයන්ට ඒ ඒ ක්ෂේත්‍රයේ නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා සහනාධාරත් ඒ වාගේම අන්ත දිළිඳුභාවයෙන් වාගේම ලෙඩ රෝගවලට පත් වෙලා ඉන්න අයට දෙන සහනාධාර වැඩි කරන්නත් ක්‍රියාමාර්ග ගත්තේ.

ඒ වාගේම පාසල් යන දුවා දරුවන් වෙනුවෙන් අධ්‍යාපන උපකරණවලට යන වැය බර දැරීම සඳහා අපි විශේෂ වැඩපිළිවෙළක් සකස් කර තිබෙනවා. දැනට අස්වැසුම ප්‍රතිලාභ ලබන කණ්ඩායම්වල ඉන්න පාසල් යන දරුවන් වෙනුවෙන් රුපියල් 6,000ක දීමනාවක් දෙන්නත් අපි යෝජනා කරලා තිබෙන්නේ ඒ කාරණය නිසායි. මොකද, අපට අවශ්‍ය කරනවා, හැමදාම ආධාර මත ජීවත් වන ජනතාවක් වෙනුවට, සැබෑ ලෙසම සවිබල ගැන්වුණු, ආර්ථික අවස්ථා ලබා ගත්තු ජන කොට්ඨාසයක් සහභාගිත්ව ආර්ථික කළමනාකරණයක් හරහා නිර්මාණය කරන්න.

ඒ වාගේම අපි අමතක නොකළ යුතු කාරණය තමයි, ලංකාවේ කාන්තාවෝ, කාන්තා ශ්‍රම බලකාය. කාන්තා ජනගහනය වැඩි ප්‍රමාණයක් වුණාට ශ්‍රම බලකාය හැටියට ඉන්නේ සියයට 30කටත් වඩා අඩු ප්‍රමාණයක්. මේ කාන්තා ශ්‍රම බලකාය විධිමත්ව සවිබල ගන්වමින් අපේ වැඩ පිළිවෙළට ඇතුළත් කිරීමටත් අපි යෝජනා කරලා තිබෙනවා. එහි මූලික පියවරක් විධියට තමයි අපි සුරැකුම් ආර්ථිකයක් අපේ ආර්ථිකය ඇතුළේ කොටසක් විධියට පිළිගන්නවා කියන කාරණය ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම අපේ -ජාතික ජන බලවේගයේ- වැඩ පිළිවෙළ ගත්තොත්, 2025 අය වැය ඇතුළේ ඊළඟට අපට පියවරෙන් පියවර අවධානය යොමු කරන්න තිබෙන ක්ෂේත්‍ර ගණනාවක් තිබෙනවා. ප්‍රමුඛතා අනුව ඒ ක්ෂේත්‍ර හඳුනා ගෙන අපි වැඩකටයුතු කරනවා. අපි කවුරුත් දන්නවා, කෘෂි කර්මාන්තය අපේ ජනතාවගේ ශිෂ්ටාචාරයත් එක්ක ගැට ගැහිලා තිබෙනවා වාගේම එහි සැලකිය යුතු විභවතාවක් තිබෙන බව. නමුත් අනෙක් පැත්තෙන් අපට යම් සීමා කිරීම් ප්‍රමාණයකුත් තිබෙනවා, ඉඩම් සහ අනෙකුත් දේවල් ඇතුළුව. ඒ නිසා අපි විශේෂ අවධානයක් යොමු කරනවා, නවීකරණය වූ කෘෂි කර්මාන්තයක් -නවීන කෘෂි කර්මාන්තයක්- ලංකාව ඇතුළේ ස්ථාපිත කරන්නේ කොහොමද කියලා.

ඒ වාගේම ඒ කෘෂි කර්මාන්ත ක්‍රියාවලිය ඇතුළේ හුදෙක් ප්‍රාථමික භාණ්ඩ නිෂ්පාදනය, පරිභෝජනය සහ අපනයනය වෙනුවට ඒ භාණ්ඩවලට වටිනාකම් එකතු කරලා සැපයුම්දාමය පුළුල් කිරීමේ වැඩ කටයුත්තටත්, වටිනාකම් එකතු කරලා භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කිරීමේ වැඩ කටයුත්තටත් අපි අත ගහලා තිබෙනවා. අපේ ඒ වැඩ පිළිවෙළ සඳහා අපට උදව් උපකාර කරන අංශ එකින් එක ගෙන බැලුවාම පෙනෙනවා, ඒවා හුදෙකලා අංශ නොවන බව. ඒවා එකක් මත එකක් ගැට ගැහුණු අංශයි. විශේෂයෙන්ම කෘෂි කර්මාන්තය, සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත, ධීවර කර්මාන්තය වැනි කටයුතු දියුණු කිරීමේ කාර්යයේදී ඒ සඳහා අපට උදව් දීමට, ඒ අංශ සවිබල ගැන්වීමට අපි තවත් ක්ෂේත්‍ර දෙකක් යෝජනා කරලා තිබෙනවා. එකක් තමයි පර්යේෂණ හා සංවර්ධන කටයුතු. එය ඉතා වැදගත් වෙනවා. මොකද, විශේෂයෙන්ම අපට නව විභවතා හොයන්නට වෙනවා. සාම්ප්‍රදායික ආකාරයටම භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරනවා වෙනුවට, සාම්ප්‍රදායික වෙළෙඳ පොළවලටම යනවා වෙනුවට අපට ඉන් එහා ගිය භාණ්ඩ හා සේවා නිෂ්පාදනයක් කරන්නට සිදු වෙනවා; අලුත් දේවල් සොයන්නට වෙනවා; නව නිපැයුම් කරන්න වෙනවා. ඒවා ආවාට ගියාට හිතේ ඉවට කරන්න බැරි බව අපි කවුරුත් දන්නවා. ඒ නිසා අපි එකී පර්යේෂණ හරහා නව වෙළෙඳ පොළ සොයා ගැනීමට, නව භාණ්ඩ නිෂ්පාදනය කිරීමට ප්‍රමුඛතාව ලබා දෙනවා.

ඩිජිටල්කරණයත් ඉතා වැදගත් කාරණයක්. ඒ මඟින් එක පැත්තකින් භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සිදු කරනවා. ඒ වාගේම ඩිජිටල්කරණය එක්ක ගැටගැහිලා තිබෙන තොරතුරු තාක්ෂණ, නැත්නම් IT ක්ෂේත්‍රය හරහා - "IT Allied Services" කියලා වෙනත් කර්මාන්තයකුත් නිර්මාණය වෙලා තිබෙනවා - අපට පුළුවන්, මුළු ලංකාවේම නිෂ්පාදන ක්‍රියාවලියත්, ආණ්ඩුකරණයේ කාර්යක්ෂමතාවත් ඉහළට ඔසවන්න. ඒ අර්ථයෙන් තමයි අපි ඩිජිටල්කරණය සඳහා වෙනමම අමාත්‍යාංශයකුත් යෝජනා කරලා තිබෙන්නේ.

ඒ වාගේම අපේ රටේ පිහිටීම අනුව නාවික ක්ෂේත්‍රයේ වෙළෙඳාමට විශාල විභවයක් තිබෙනවා. ඒ සඳහාත් අපේ විශේෂ අවධානය යොමු කරලා තිබෙනවා. ඒ වාගේම මේ කටයුතු අතරේ අපි විශේෂ යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා, "Clean Sri Lanka" කියලා. එය හුදෙක්ම ආර්ථික ක්‍රියාවලියත් එක්කම සිදු වන දෙයක්. මොකද, අපට අවශ්‍ය කරනවා, මේ සියලු සිදුවීම්, වර්ධනයන් එක හා සමානව ඉහළට එසවීමක්.

[ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා]

මා කලිනුත් සඳහන් කළ, රට ඇතුළේ ආදායම් බෙදී යෑමේ විෂමතාව පිළිබඳ ප්‍රශ්නයටත් අපි උත්තර සොයන්නට ඕනෑ. අප වාද විවාද කළත් අද සමහර ක්ෂේත්‍ර, සමහර කර්මාන්ත අරගෙන බැලුවාම, ඒ කර්මාන්ත ඇතුළේ සේවකයන්ට ලැබෙන වැටුප උපරිමයට ගෙනිච්චත් ඉන් එහා හොඳ ජීවිතයක් අත්පත් කර ගන්න ඔවුන්ට බැරි වෙනවා.

උදාහරණයක් විධියට වැවිලි කර්මාන්ත ක්ෂේත්‍රයේ වැටුප ගත්තොත්, එය රුපියල් 1,300 ද, 1,700 ද, 2,000 ද කියන වාදයට ගියත්, ඔවුන්ගේ වැටුප රුපියල් 1,700ක් හෝ 2,000ක් දක්වා වැඩි කළත් මේ තිබෙන ආර්ථික යථාර්ථයන් ඇතුළේ රුපියල් 1,700කින් හොඳ ජීවිතයක් ගත කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා අපට ඉන් එහාට යන්න වෙනවා, මේ ආදායම් බෙදී යෑමේ විෂමතාව නැති කරන්නේ කොහොමද කියන කාරණයේදී. අපි දන්නවා ඒක නීති, අණ පනත් මඟින් කරන්න බැරි බව. ඒ වැඩේ කරන්න නම් රටේ නිෂ්පාදන ඵලදායිතාව වැඩි කරන්නට ඕනෑ. ඒ කටයුත්තටත් අපි අනිවාර්යයෙන් මැදිහත් වෙනවා.

සමාජ සවිබල ගැන්වීමත්, රට තුළ සාමය ස්ථාපිත කර ගැනීමත් මේ ආර්ථික ක්‍රියාවලියට ඉතාම වැදගත් වෙනවා. ආර්ථික ක්‍රියාවලියට සම්බන්ධ වන මහ ජනතාවට දැනෙන්න ඕනෑ මේ ආර්ථික ක්‍රියාවලිය ඇතුළේ අපි ඇත්තටම පංගුකාරයෝ, අපි ජනනය කරන වටිනාකමින් සාධාරණ ප්‍රතිලාභයක් අපට එනවා කියන එක. ඒ ප්‍රතිලාභය ඔවුන්ට එන්නේ නැත්නම්, ඒ විශ්වාසය ඔවුන්ට ඇති වන්නේ නැත්නම් ඇත්තටම අපට මේ ආර්ථික ක්‍රියාවලිය ඉදිරියට අරගෙන යන්න බැහැ. ඒ සඳහා අනිවාර්යයෙන් වැඩ කටයුතු කරන්න අපට සිද්ධ වෙනවා.

ගරු කථානායකතුමනි, මා කලින් සඳහන් කළ පරිදි ගෝලීය සැපයුම් දාමයට වටිනාකම් එකතු කිරීමේ දාමය ඇතුළේ සාම්ප්‍රදායික නිෂ්පාදන දබඳතා වෙනුවට තාක්ෂණය යොදාගෙන නිෂ්පාදකයා, ආයෝජකයා, සේවකයා සහ අමු ද්‍රව්‍ය සපයන්නා අතර වඩාත් හොඳ නිෂ්පාදන සම්බන්ධතා ස්ථාපිත කරන්න අපි යෝජනා කර තිබෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා, ගැටලු සහිත වෙළෙඳ පොළක් ඇතුළේ සිද්ධ වෙන දේ. ඒ තමයි, තොරතුරු දෙන්නෙකු තුන්දෙනෙකු අතේ තියාගෙන වෙළෙඳ පොළ ඇතුළෙන් අනවශ්‍ය ප්‍රතිලාභ ලබා ගන්නා ඒකාධිකාරී තත්ත්වයන් නිර්මාණය කර තිබීම. වංචා, දූෂණ සම්බන්ධයෙන් ඇති වුණු චෝදනා සහ ගැටලු සහිත තැන් ගැන හරියට සොයාගෙන ගියාම ගොඩක් දුරට පෙනෙනවා, පොදුවේ මහ ජනතාව සතුව තිබිය යුතු තොරතුරු දෙන්නෙකු තුන්දෙනෙකු අතේ තියාගෙන පාවිච්චි කිරීමෙන් තමයි ගොඩක් අය ධනය ගොඩ ගසාගෙන ඉන්නේ කියා. අපි ඒකට කියනවා, information asymmetry කියලා. ඉන් එහාට යන ඉතාම හොඳ පාරදෘශ්‍ය නිෂ්පාදන සම්බන්ධතාවක් තිබුණොත්, මේ රටේ නිෂ්පාදනය ඉහළට ඔසවා ගන්න පුළුවන් කියා අපි විශ්වාස කරනවා. මොකද, මිනිස්සු ඇත්තටම වැඩ කරන්න කැමැතියි. ඒ මැදිහත්වීම කළ යුතුය කියා අපි යෝජනා කරනවා.

අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කළා වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ පාරදෘශ්‍යභාවය සහ වග වීම අපි අනිවාර්යයෙන් ඉෂ්ට කරනවා. ඒ වාගේම, ලෝකයත් එක්ක ගැටගැහිලා ඉදිරියට යන ගමනේදී සාම්ප්‍රදායික තත්ත්වයට වඩා එහා ගිය ප්‍රවේශයකුයි අප යෝජනා කරන්නේ. හවුල්කාරිත්වය, සහභාගිත්වය සහ සහයෝගිතාව අනුව තමයි වැඩ කටයුතු කරන්න වෙන්නේ. ජාතික වශයෙනුත්, ජාත්‍යන්තර වශයෙනුත් ඒ ආකාරයට වැඩ කටයුතු කරන්න අපට සිදු වෙනවා.

ඒ වාගේම, ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ඇතුළේ ආයෝජන කැඳවීමේදී සෘජු විදේශ ආයෝජනවලට විශේෂයෙන් වැඩි ඉඩ කඩක් අපට අවශ්‍ය කරනවා.

ව්‍යාපාරිකයන්ගේ විශ්වාසය අපි දැන් තහවුරු කර තිබෙනවා. නමුත් ඒක ප්‍රමාණවත් වන්නේ නැහැ. ඒ නිසා ඔවුන්ට ව්‍යාපාරික කටයුත්ත, නිෂ්පාදන වැඩි කිරීමේ කටයුත්ත සැකයෙන්, බයෙන් තොරව පහසුවෙන් කරගෙන යෑමේ පහසුකම නිර්මාණය කිරීම සඳහා වන වැඩ කටයුතු අපි යෝජනා කර තිබෙනවා.

රටේ පොලී අනුපාතය ස්ථායීකරණය ගැනත් සඳහන් කළ යුතුයි. ඔබට මතක ඇති සමහරු මහ මැතිවරණයට කලින් රට ඇතුළේ නිර්මාණය කරපු, රටට ඉදිරිපත් කරපු අදහස. ඒ අය ද්වේෂසහගත සහ වැරදි අදහසක් රටට ඉදිරිපත් කළා, ජාතික ජන බලවේගය බලයට පත් වුණාට පසුව රට අසාර්ථක වෙනවා; බිඳ වැටෙනවා; විදේශ විනිමය අනුපාතය 400ට, 500ට යනවා; එවැනි බිඳ වැටීමක් සිද්ධ වෙනවා කියලා. එහි ප්‍රධානම සාධකයක් වන්නේ පොලී අනුපාතයයි. නමුත් මේ වන කොට මේ කෙටි කාලය ඇතුළත අපට දකින්නට පුළුවන් නිවැරදි මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්තියත්, ඒ මැදිහත්වීමත් හරහා ක්‍රමිකව පොලී අනුපාතය ඇතුළුව මූල්‍ය වෙළෙඳ පොළේ තත්ත්වය ස්ථාවර වෙමින් තිබෙන බවක්. මේ ස්ථාවරත්වය සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, මම කලිනුත් සඳහන් කළ ආකාරයට රටේ නිෂ්පාදනයේ සැබෑ වර්ධන වේගය ක්‍රමක්‍රමයෙන් අඩු වෙමින් ආවා. එය එසේ අඩු වෙමින් ඇවිත් අවසානයේදී ඍණ වෘද්ධි අනුපාතයකටයි ගියේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත්, ලෝක බැංකුවත්, ආණ්ඩුවත් 2024දී ආර්ථික වර්ධනය පුරෝකථනය කර තිබුණේ සියයට 2ත්, 3ත් අතර ප්‍රමාණයකට. අවසානයේදී එය සියයට 2.2කට තමයි යෝජනා වෙලා තිබුණේ. ජනාධිපතිවරණයෙන් පසුව රට අපේ තාවකාලික භාරකාර ආණ්ඩුව යටතේ තිබියදීත් ඒ පුරෝකථනයන්මයි තිබුණේ. කාර්තු වශයෙන් ආර්ථික වර්ධනය තිබුණා. හැබැයි, මාසයක්, එකහමාරක් යන කොට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මැතිතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තමයි ඉතුරු වෙලා තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, එතුමාට ආණ්ඩු පක්ෂයේ වෙලාවෙන් තවත් විනාඩි පහක කාලයක් ලබා දෙන්න නීන්දු කර තිබුණා. ගරු නලින්ද ජයතිස්ස මැතිතුමා වෙනුවෙන් මා ඒ බව දැනුම් දෙනවා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, මා සඳහන් කරමින් සිටියේ මේකයි. ආර්ථිකයේ සමහර දේවල් අංක ගණිතය අනුවම සිද්ධ වෙන්නේ නැහැ. එකයි, දෙකයි එකතු කළාම තුනයි කියන විධිය නොවෙයි, ඒ කටයුතු සිදු වන්නේ. ආර්ථිකය දේශපාලනයත්, සමාජයත් එක්ක එකට එකතු වෙලා යන සමාජ විද්‍යාවක්.

ඒ නිසාම තමයි අපි ආණ්ඩු බලය අරගෙන මාස එකහමාරක් වැනි කාලයක් ඇතුළතදී විශේෂයෙන් ලෝක බැංකුව ඔවුන්ගේ

පුරෝකථන අනුව ඉදිරිපත් කළේ, 2024දී ආර්ථික වෘද්ධිය සියයට 4 ඉක්මවා යෑමේ හැකියාවක් තිබෙනවා කියන කාරණය. ඒක නිකම්ම කියපු එකක් නොව, මෙන්න මේ තිබෙන තත්ත්වයන් සැලකිල්ලට භාජන කරලා මතු කරපු කාරණයක්.

මා පැහැදිලි කරමින් ආවේ අපි මේ කෙටි කාලය ඇතුළත ආර්ථික සංවර්ධනයක් අත්පත් කර ගත්තාය, විශාල ඉලක්ක ජයග්‍රහණය කළාය කියන කාරණය නොවෙයි. ඒක වරදවා වටහා ගන්න එපා. ඔබට විවිධ අර්ථකථන තිබෙන්න පුළුවන්. ඒක ප්‍රශ්නයක් නොවෙයි. මම කිව්වේ මේ ස්ථාවරභාවය සමාජය ඇතුළේ පෙනෙනවා, එය ආයෝජකයෝ දකිනවා, ජාත්‍යන්තර සංවිධාන දකිනවා කියන එකයි.

ගරු කථානායකතුමනි, විශේෂයෙන් විරුද්ධ කණ්ඩායම බලාපොරොත්තු වුණා, කොළඹ කොටස් වෙළෙඳ පොළ බිඳ වැටෙයි, ආයෝජකයෝ පැනලා දුවයි කියලා. හැබැයි, මේ වනකොට කොළඹ කොටස් වෙළෙඳ පොළත් ක්‍රමයෙන් ස්ථාවර වෙමින්, එහි ආයෝජන ඉදිරියට එමින් තිබෙනවා. ඒ වාගේම අපි දැඩි විශ්වාසයෙන් කියනවා, මේ වර්ෂය අවසාන වනකොට අපට විදේශ ආයෝජන කැඳවීමට වාගේම නිෂ්පාදන කටයුතු ඉදිරියට අරගෙන යෑමට ජාත්‍යන්තර සහතිකකරණය ඉතාම වැදගත් වෙනවා කියලා. අපි කවුරුත් දන්නවා, ණය ශ්‍රේණිගත කිරීම්වලදී අවසානයේදී ලංකාව බුන්වත් කියන තැනට ආ බව. නමුත්, දැන් ක්‍රමිකව ඒ ණය ශ්‍රේණිගත කිරීම්වල පිබිදීමක් තිබෙනවා.

ඒ නිසා අපට දැඩි විශ්වාසයක් තිබෙනවා, මේ වර්ෂය අවසාන වනකොට ඒ බුන්වත්භාවය අයින් කරගෙන, ඉදිරි කාලයේදී - විශේෂයෙන් 2025 වර්ෂයේදී- ජාත්‍යන්තර ණය ශ්‍රේණිගතකිරීම්වලින් අපේ රට ක්‍රමිකව ඉදිරියට අරගෙන එන්න හැකියාව ලැබෙයි කියා. ඒ නිසා තමයි මා කිව්වේ, ස්ථායීකරණයෙන් සියල්ල සිදු වී නැහැ කියා. හැබැයි, අපි පැහැදිලිව සඳහන් කරන්නට ඕනෑ, අපට මේ අර්බුදයෙන් ගොඩ යන්න බැහැ කියලා රට ඇතුළේ අවිශ්වාසයක් හදලා, අපේ න්‍යාය පත්‍රය වෙනුවට වෙනත් න්‍යාය පත්‍රයක් හදලා, අප කිව්වේ නැති දේවල් බොරු දේවල් විධියට ප්‍රකාශ කරලා, වෙනත් පැත්තකට ගෙන යන්න උත්සාහ කළාට, ජාතික ජන බලවේගය වැඩ කරන්නේ කණ්ඩායමක් විධියටයි කියන කාරණය. අපේ න්‍යාය පත්‍රයට අනුව ඒ වැඩ කටයුත්ත ඉෂ්ට කරන්න, ඒ ස්ථායීකරණයේ මූලික පදනම දැන් දාලා අවසානයි.

දෙවැනි අභියෝගය මෙකයි. මා කලින් සඳහන් කළා වාගේ අපේ ආර්ථික ප්‍රතිපත්තියේ ගමන් මාර්ගය අනුව සියලු දේවල් 2025 වසරේ අය වැය ලේඛනයට ඇතුළත් කරන්න අපට බැහැ. නමුත්, 2025 අය වැය ලේඛනය තුළ ඔබට දකින්න ලැබේවි, ජාතික ජන බලවේගය ඉදිරිපත් කරපු "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන තේමාව යටතේ මේ රට ගොඩනැඟීමේ වැඩ පිළිවෙළේ අංගෝපාංග මුදල් බවට හැරවිලා අය වැය ප්‍රකාශනය ඇතුළේ ඉදිරියට එන්නේ කොහොමද කියලා.

ගරු කථානායකතුමනි, මේ විවාදය ආරම්භ කරමින් අදහස් දැක්වීමේ දී මම එහි මූලික අදහස් දැක්වීම මෙන්න මේ ආකාරයට අවසාන කරන්න කැමතියි. අපි මේ යන ගමන් මාර්ගයේ මේ මොහොතේ තිබෙන ප්‍රවිෂ්ටය තමයි, කලබල නොවී, ඉතාම සාවධානව හෙමින් ඉදිරියට ගමන් කරන එක. ඉතාම තිරසාර ලෙස - slowly, but steadily, we are progressing. ඒ අනුව අපට දැඩි විශ්වාසයක් තිබෙනවා මේ වැඩ කටයුත්ත කිරීමේ හැකියාව වාගේම ඒ සම්බන්ධතා පවත්වා ගෙන යෑමට හැකි බව. ඒ සඳහා ජාතික ජන බලවේගයේ කණ්ඩායම ඉදිරිපත් වෙලා තිබෙනවා. මගේ අදහස් දැක්වීමේදී පෙන්නුවා, රටක් ගොඩයනකොට ජාත්‍යන්තර ආයෝජකයන්, ජාත්‍යන්තර සංවිධාන ඔවුන්ගේ සහයෝගය හා එකඟතාව ලබා දීමට මේ වෙනකොට දැන් දිගු කිරීම සිද්ධ වෙමින් තිබෙන බව.

ඒ නිසා විශේෂයෙන් විපක්ෂය නියෝජනය කරන ඒ පක්ෂ කණ්ඩායම්වල අයටත් මම ආරාධනා කරනවා, යෝජනා කරනවා මේ වැඩ කටයුත්ත කිරීමේ දී අපි එකට එකතු වෙලා කටයුතු කරමු කියලා. ලෝකය විශාල ජයග්‍රහණ අත්පත් කර ගනිමින් තීන්දු-තීරණ ගන්නේ තාක්ෂණයේ ඉතා ඈතට ගිය තැනක මෙන්ම කෘත්‍රිම බුද්ධිය හරහා මිනිසුන්ගේ ජීවිත ඉතාම සැපවත් මට්ටමක තිබෙන තැනක. අපටත් එහෙම යන්න බැරි ජාතියක් නොවෙයි. අපට තිබෙන සම්පත් ප්‍රමාණය අනුව අපට එහෙම යන්න හැකියාව, දක්ෂතාව තිබෙනවා. විශාල මානව සම්පතක් තිබෙනවා. නමුත්, අපේ මේ දේශපාලන ක්‍රමය ඇතුළේ අප ගෙනැල්ලා හිර කරලා අගාධයකට වටිටපු ආර්ථිකයක් තිබුණේ, බිඳ වටිටපු ආර්ථිකයක් තිබුණේ. අපි දැන් ඒ අතීතයේ සියල්ල අමතක කරමු. දැන් අපට අභියෝගය වන්නේ මනුෂ්‍යත්වයට ගැළපෙන හොඳ ආර්ථිකයක් හදා ගන්න එක. ප්‍රජාතන්ත්‍රවාදී ආර්ථිකයක් හදා ගන්න එක. ඒ වාගේම වඩාත්ම ප්‍රායෝගික ප්‍රවිෂ්ටයකින් මේ කටයුතු සියල්ල සැලකිල්ලට භාජන කරලා ලාංකීය තත්ත්වයත්, දේශීය තත්ත්වයත්, ජාත්‍යන්තර තත්ත්වයත් තව අවුරුදු 10කින්, 20කින් ලෝකය කොහේද තිබෙන්නේ කියන තත්ත්වයත් කළමනාකරණය කරලා වැඩ කටයුතු කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ තිබෙනවා. එහි වාද-විවාද කරන්න දේවල් තිබෙනවා නම්, දේශපාලනික කාරණා තිබෙනවා නම්, අපි ඉතා කැමතියි විපක්ෂයේ මන්ත්‍රීවරුන් එවැනි කාරණා ඉදිරිපත් කරනවා නම්. එහෙම නැතිව මේ වැඩ පිළිවෙළ කඩාකප්පල් කිරීම හෝ අනවශ්‍ය තත්ත්වයේ දේවල් නිර්මාණය කර ගන්නවාට වඩා අපි අලුත් ප්‍රවේශයකට යමුයි කියලා යෝජනා කරමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, ගරු කථානායකතුමනි.

බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.39]

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි. විපක්ෂය වෙනුවෙන් මෙම විවාදය ආරම්භ කරන්නට මට අවස්ථාව ලබා දීම ගැන විපක්ෂයට මගේ ස්තුතිය පුද කරනවා.

ප්‍රථමයෙන්ම මගේ කෑගල්ල දිස්ත්‍රික්කයේ ජනතාවට ස්තුති කරන්න ඕනෑ. මොකද, දිගින් දිගටම පස්වතාවකට වැඩියෙන් දිස්ත්‍රික්කයේ පළමුවැනියා හැටියට මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත් කරන්නට කටයුතු කරපු, ඒ වාගේම මෙවරත් මා කෙරෙහි විශ්වාසය තබා ජයග්‍රහණය කරවන්නට කටයුතු කරපු කෑගල්ල දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවට මගේ ගෞරවනීය ස්තුතිය පළමුවෙන්ම පුද කරන්නට කැමැතියි.

Hon. Speaker, a Vote on Account represents only the expenditure side of the Government's Budget for a short period of time not exceeding four months. Articles 148 to 152 of our Constitution gives the constitutional basis for managing the country's public finance. Article 148 of our Constitution, which is a key provision, states, I quote:

"Parliament shall have full control over public finance."

[ගරු කබීර් හෂීම් මහතා]

So, irrespective of being the Government or the Opposition, we all have a responsibility to ensure that there is financial discipline and accountability. And we, as the Opposition, will exercise our responsibility with maximum diligence, work to maintain financial discipline and will be accountable to the people of Sri Lanka. We hope that the Government will also maintain financial discipline and be accountable to the people of Sri Lanka.

ගරු කථානායකතුමනි, විපක්ෂය වෙනුවෙන් මම අතුරු සම්මත ගිණුම පිළිබඳව කථා කරන්නට කලින් ඊට අදාළ කරුණු කිහිපයක් ගැන කථා කරන්න කැමැතියි.

ඊයේ සහ පෙරේදා තිබුණු විවාදය අතරතුර මම නිතරම සභාව ඇතුළට එනකොට අහගෙන සිටියා, රජයේ පාර්ශ්වය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරු කරපු කථා. මම ඒවාට ඇහුම් කන් දුන්නා. ඇත්තටම අපි සතුටු වුණා, අලුත් දේශපාලන සංස්කෘතියක් ඇති වෙයි කියලා. අපි සතුටු වෙනවා අලුත් මුහුණු, අලුත් මන්ත්‍රීවරු මේ සභාවට පත්වීම පිළිබඳව. හැබැයි, ඒ මන්ත්‍රීවරු කරපු කථාවලින් අපි මේ දවස් දෙක තුළ අහපු දේ තමයි, වෛරය, ක්‍රෝධය පතුරුවන්නට උත්සාහ දැරීම. මැතිවරණ කාලය තුළ සහ ඊට කලිනුත් ජනතා විමුක්ති පෙරමුණ මේ සමාජය තුළ වෛරය, ක්‍රෝධය පතුරුවන්නට උත්සාහ කළා. දිගටම කථා කළේ වෛරයයි, ක්‍රෝධයයි හිතේ තියාගෙන.

"අවුරුදු 76ක ශාපය" කියන මිථ්‍යාව සමාජගත කරන්නට දැඩි උත්සාහයක් දැරුවා. System change එක ගැන කථා කළා. ඒ system change එක ගැන දිගටම කථා කළා. හැබැයි, පවතින system එක නිසා තමයි මන්ත්‍රීවරු 150කට වැඩි පිරිසකට අද ආණ්ඩු පක්ෂයෙන් පත්වෙන්න හැකි වුණේ. නිදහස් අධ්‍යාපනයට පින්සිදු වෙන්න තමයි අ.පො.ස.(සාමාන්‍ය පෙළ), අ.පො.ස.(උසස් පෙළ), උපාධිය, පශ්චාත් උපාධිය, PhD උපාධිය පවා ලබා ගන්නට පුළුවන් අවස්ථාව මෙතැන ඉන්න අයට හිමිවෙලා තිබෙන්නේ. ඒ system එක යටතේ තමයි මෙතැන සිටින ගුරුවරුන්ට, විදුහල්පතිවරුන්ට, ආචාර්යවරුන්ට, මහාචාර්යවරුන්ට අවසානයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වෙන්නට පවා ඉඩකඩ, නිදහස, අයිතිය හිමි වෙලා තිබෙන්නේ කියන කාරණය මතක් කරන එක වැදගත් කියලා මම විශ්වාස කරනවා.

මේ ආණ්ඩුවට ඓතිහාසික, විශාලතම ජනතා වරමක් ලැබුණාය කියන එක කවුරුත් පිළිගනීවි.

ඔබතුමන්ලාට ලැබුණු ඒ වරම අනුව, පරණ system එකටම බැණ බැණ, පරණ system එකටම චෝදනා කර කර ඉන්න එක නොවෙයි මම හිතන විධියට ජනතාව බලාපොරොත්තු වුණේ. ඔවුන් ඔබට දීපු වරමින් බලාපොරොත්තු වුණේ ඔබ ගෙනෙන අලුත් system එකෙන් වැඩ කරයි, ජනතාවගේ අපේක්ෂා ඉටු වෙයි කියන එක. ඔබතුමන්ලා ගෙනෙන්නේ magic system එකක් වෙන්න පුළුවන්. ඔබතුමන්ලා *ඒ* magic system එකක් ගැන කථා කළා. දැන් ඔබතුමන්ලා ඒ ගැන කථා කරන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරපු මතවාදය, චින්තනය වන සමාජවාදය හෝ වාමවාදය තුළ ඔබ තවම ඉන්නවා නම්, ඔබ ඊයේ පෙරේදා විවේචනය කළ පවතින කෘෂිකර්ම ක්ෂේත්‍රය වැරදියි නම්, ඔබතුමන්ලාගේ සංකල්පය මත, සාමූහික ගොවිපළ ක්‍රමයට -collective farming system එකට- යන්න ඕනෑ. පවතින කර්මාන්ත ක්‍රමය වැරැදි නම් ඔබ යන්න ඕනෑ, රාජ්‍ය කර්මාන්ත පද්ධතියකට. ඔබ ඒ වෙනුවෙන් පෙනී සිටිනවා නම්, අපට මේ සභාවේදී කියන්න ඕනෑ, මේ ප්‍රතිපත්තිය, මේ චින්තනය තමයි අපි පිළිපදින්නේ කියලා. හැබැයි, ඔබතුමන්ලා ඒ ගැන කථා කළේ නැහැ.

ජනාධිපතිතුමා කරපු රාජාසන කථාවේ හෝ අද මහාචාර්ය අනිල් ජයන්ත මැතිතුමා ඉදිරිපත් කරපු අතුරු සම්මත ගිණුමේ හෝ මේ system change එක ගැන අබමල් රේණුවකවත් දෙයක් සටහන් වෙලා නැහැ කියන කාරණය මම කියන්න කැමතියි. අනිල් ජයන්ත මහාචාර්යතුමා අද අතුරු සම්මත ගිණුම -Vote on Account එක- ඉදිරිපත් කළාට, ඒ ගැන කිසි දෙයක් පැහැදිලි කළේ නැහැ මේ ගරු සභාවට. එතුමා කථා කළේ වෙනත් දේවල්. ඒකේ ගණන් හිලව්, එකෙන් වෙන් කරන මුදල, මොකටද වෙන් කළේ, කොයි ආකාරයටද වෙන් කළේ -කෝටි ගණනක් වෙන් කරගෙන තිබෙනවා- කියලා මේ සභාවට දැනුම් දුන්නේ නැහැ. That is accountability, that is financial discipline and it is your duty to explain that. But, you did not do that. ඒ නිසා system එකේ කිසිම change එකක් අපි ජනාධිපතිතුමාගේ කථාවේ දකින්නේ නැහැ. System change එක වෙනුවට "Anura change" එකක් දකින්නට ලැබෙනවා. එතුමාගේ change එකක් වෙලා තිබෙනවා; system එක නොවෙයි change වෙලා තිබෙන්නේ.

මම අතුරු සම්මත ගිණුම - Vote on Account එක - ගැන කියන්නම්, ඒක ඔප්පු කරන්න මේ කරුණු කාරණා මත.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
Sir, I rise to a point of Order.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I do not want my time to be taken.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මහාචාර්ය අනිල් ජයන්ත මැතිතුමා.

ගරු (මහාචාර්ය) අනිල් ජයන්ත මහතා
(மாண்புமிகு (பேராசிரியர்) அனில் ஜயந்த)
(The Hon. (Prof.) Anil Jayantha)
ගරු කථානායකතුමනි, ඒ ඉදිරිපත් කරපු අදහස නිවැරදි කරන්නයි මම මේ කාරණය කියන්නේ. එතුමා කිව්වා, සංඛ්‍යා ඉදිරිපත් කළේ නැහැ කියලා. මම කථාව පටන් ගන්නකොට ඔබතුමා අහගෙන සිටියේ නැද්ද දන්නේ නැහැ. මම මූලික සාරාංශය ඉදිරිපත් කළා. ඒකේ විස්තර ඉදිරිපත් කරන්න අවශ්‍ය නැහැ නේ. වියදම් ප්‍රමාණය මම ඉදිරිපත් කළා. එම නිසා ඔබතුමාගේ අදහස වැරදියි.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, ඒ සංඛ්‍යාලේඛන පිළිබඳව මම කියන්නම්.

මේ අතුරු සම්මත ගිණුමේ පළමු උපලේඛනය අනුව රුපියල් එක්දහස් හාරසිය දෙබිලියන අටසිය අසූහය මිලියන දෙසිය හැටතුන්දහසක්, නැත්නම් Rs. 1.4 trillion මුදලක් පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා මාස 4කට ඒකාබද්ධ අරමුදලෙන් නිදහස් කරන්න කියලා ඔබතුමන්ලා ඉල්ලා තිබෙනවා. හැබැයි, දෙවන උපලේඛනය අනුව ඒකාබද්ධ අරමුදලෙන් රුපියල් හාරදහස් එකසිය අනූහත් බිලියන එකසිය දහතුන් මිලියන හත්සිය තිස්හත්දහසක මුදලක් ලබා ගැනීමට 18 වන පිටුවේ ඒ ලේඛනය

අනුව ඔබතුමන්ලා ඉල්ලා සිටිනවා. මේ කියන මුදලෙන් සියයට 75ක්ම ගන්නේ ISBs, හොරා කාපු, කොමිස් ගහපු ණය කියලා ඔබතුමන්ලාම කියපු ණය ගෙවන්නයි. ඒක ඔබතුමන්ලා පසුව explain කරන්න. මම ඒක කියන්නම්. උපලේඛන 1 සහ 2 එකතු කළාම සම්පූර්ණ වියදම වශයෙන් රුපියල් බිලියන 5,600ක මුදලක් ඉල්ලා තිබෙනවා.

ඔබතුමන්ලා මේ අතුරු සම්මත ගිණුමේ 6 වැනි පිටුවේ (ඇ) ඡේදයේ පෙන්වා දීලා තිබෙනවා, ඒ අනුව දේශීය හෝ විදේශීය ණය රුපියල් බිලියන 4,000ක් - එහෙම නැත්නම් රුපියල් කෝටි හාරලක්ෂයක් - ණයට ගැනීමට ඔබතුමන්ලා ඉල්ලීමක් කරලා තිබෙනවා. දැන් system change එකක් නම් - මම කුහක වෙන්නේ නැහැ - ඔබතුමන්ලා කිව්වා ණය නැතුව මේ රට දුවන්න පුළුවන් කියලා, උගන්ඩාවෙන් හරි සල්ලි ගෙනැල්ලා මේ රට දුවවනවා කියලා. මැජික් කරලා හරි කරනවා කිව්වා. හැබැයි, රුපියල් කෝටි හාරලක්ෂයක ණයක් අතුරු සම්මත ගිණුමෙන් පළමු වතාවට දාලා තිබෙනවා. Hon. (Prof.) Anil Jayantha, please look at page No. 6.

මේ අතුරු සම්මත ගිණුමේ ප්‍රශ්න කිහිපයක් පැන නැහෙනවා. ඔබගේ මතවාදය, ඔබගේ චින්තනය, ඔබගේ පොරොන්දුවලට පටහැනිව මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා තිබෙනවා. අපට ඒකට උත්තර ඕනෑ. හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වරප්‍රසාද වැඩියි, එතුමාගේ වියදම් වැඩියි, එතුමා වොපර් එකක යනවා, වොපර් එක ගියාම එතැනට Mercedes Benz S400 එකක් යනවා, ඊට පසුපසින් තව Mercedes එකක් යනවා, එතුමාගේ ආරක්ෂක නිලධාරීන් වැඩියි, එතුමාගේ උපදේශකවරු වැඩියි කියලා දිගටම ජනතා විමුක්ති පෙරමුණ තමන්ගේ දේශපාලන වේදිකාවේ චෝදනා කළා. ඒ එක්කම ඒවා අඩු කරනවා කිව්වා. ඒවා අඩු කරලා ජනතාවට සාධාරණව ඒ වියදම් භාවිත කරනවා කිව්වා.

හැබැයි, අතුරු සම්මත ගිණුමේ එහෙම වෙනසක් පෙනෙන්නේ නැහැ.

2024 වසරේ ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය යටතේ රනිල් වික්‍රමසිංහ මැතිතුමාට වියදම් කර තිබෙනවා, රුපියල් ට්‍රිලියන 1.4ක්. ඒ කියන්නේ details දෙනවා නම්, රුපියල් එක්දහස් හාරසිය තිස්හය බිලියන නවසිය හතළිස් අට මිලියන නවසිය විසිනවදාහක් - Rs. 1.4 trillion.

2025දී අනුර කුමාර දිසානායක ජනාධිපතිවරයාට ජනවාරි මාසයේ සිට අප්‍රේල් මාසය දක්වා - මාස 4කට - ඒ වාගේම රුපියල් ට්‍රිලියන 1.4ක් වෙන් කරලා තිබෙනවා, මේ අතුරු සම්මත ගිණුමෙන්. ඒ ගණනමයි; වෙනසක් නැහැ. ඒ කියන්නේ, රුපියල් එක්දහස් හාරසිය දෙබිලියන අටසිය අසූහය මිලියන දෙසිය හැට තුන්දාහක්. මොකක්ද වෙනස? කොහෙන්ද අඩු කරලා තිබෙන්නේ? System එකේ, no change; අනුර changed ! අපට ඒ ගැන පැහැදිලි කරන්න.

ජනාධිපතිතුමා එතුමාගේ මූලාසන කථාවේ දී කිව්වා, IMF ගිවිසුම ඉස්පිල්ලක් පාපිල්ලක් නැර ඒ විධියටම ක්‍රියාත්මක කරනවා කියලා. හොඳයි. නමුත්, අපි - සජබෙ - කිව්වා, IMF ගිවිසුමේ රාමුවට එකඟ වුණාට ඒකේ අන්තර්ගත වෙලා තිබෙන සමහර දේවල් වෙනස් කරනවා කියලා. හැබැයි, අද ඔබතුමන්ලා අපට වඩා neoliberal වෙලා තිබෙන බව පෙනී යනවා. ණය ප්‍රතිව්‍යුහගත කිරීම, Debt Sustainability Analysis - DSA - එක සම්බන්ධව JVP එක තද, සෘජු සහ විරුද්ධ ස්ථාවරයක හිටියා. හරි හෝ වැරදි හෝ JVP එකේ ඒ තද ස්ථාවරයට අපි ගරු කරනවා. ඔබතුමන්ලාට ස්ථාවරයක්, ප්‍රතිපත්තියක් තිබුණා. වාණිජ වෙළඳ පොළෙන් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය ගත් ඩොලර් බිලියන 12.9, අපි පිළිගන්නේ නැහැ කියලා ඔබතුමන්ලා කිව්වා. ඒ ඩොලර් බිලියන 12.9 "odious debt" කියලා කිව්වා. That means, හොරා කාපු, කොමිස් ගහපු, රටට ආයෝජනය නොකරපු ඒ වාණිජ ණය පිළිගන්නේ නැහැ කියන එකයි.

සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. එතුමා දවසක් කියනවා මම දැක්කා, "හෙලෝ මචං, අපි මේවා ගෙවන්නේ නැහැ, අපට පුළුවන් ඒගොල්ලන්ට කථා කරන්න" කියලා. ගරු කථානායකතුමනි, හැබැයි අද ඉදිරිපත් කරන අතුරු සම්මත ගිණුමේ 18වැනි පිටුවේ දෙවැනි උපලේඛනයේ සඳහන් කර තිබෙනවා, රුපියල් ට්‍රිලියන 3.2ක්. ඒ කියන්නේ ඔබතුමන්ලා රුපියල් තුන් දහස් දෙසිය හැත්තෑ තුන් බිලියන එකසිය අසූඅට මිලියනයක් මේ අතුරු සම්මත ගිණුමට දමලා තිබෙනවා, මේ ණය ටික ගෙවන්න. තවම ගිවිසුමක්වත් අත්සන් කරලා නැහැ. හැබැයි, මේකට ඇතුළත් කරලා තිබෙනවා, පළමුවෙන්ම මේ ටික ගෙවන්න.

එතකොට ඇයි, ඔබතුමන්ලා වාණිජ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය ගිවිසුමකුත් අත්සන් කරන්නේ නැතිව මේ ටික ගෙවන්න මේක අස්සට දමන්නේ? ඒකත් මේකට ඇතුළත් කරලා තිබෙනවා. මම දැන ගන්න කැමැතියි, ඇයි එහෙම දෙයක් වෙලා තිබෙන්නේ කියලා. ඔබතුමන්ලා ඒකට කලින් විරුද්ධ වුණා. Hon. (Prof.) Anil Jayantha, I would like to say, මේ ISB ණය පිළිබඳව ඔබ දැනගත යුතුයි. මේ ප්‍රතිව්‍යුහගත කිරීමේදී සමගි ජන බලවේගයේ ස්ථාවරය මොකක්ද කියලා කිව්වා. අපේ ආර්ථික කමිටුව විසින් එවකට තිබුණු රජයට දිගින් දිගටම කිව්වා, සියයට 30ක වට්ටමක් - a 30 per cent discount - ලබා ගන්න, එහෙම නැත්නම් මේකට එකඟ වෙන්න එපා කියලා. හැබැයි, එවකට තිබුණු රජයට ඒක කරන්න බැරි වුණා. ඔවුන් අපොහොසත් වුණා. ඒගොල්ලෝ සියයට 26ක එකඟතාවකට - 26 per cent discount එකකට - ගියා. හැබැයි, ISB බැඳුම්කර සැලකිය යුතු ප්‍රමාණයක් Macro-Linked Bonds - MLBs - කියන කාණ්ඩයට දමලා අපේ දළ දේශීය නිෂ්පාදනයට ඒක link කළා. අපි ඒකට කැමැති වුණේ නැහැ. හැබැයි, එහෙම link කළා. ඒ කියන්නේ, අපේ දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 88.6ක් පමණක් නම් තමයි සියයට 26 discount එක රටට ලැබෙන්නේ. අපේ දළ දේශීය නිෂ්පාදනය - GDP එක - ඩොලර් බිලියන 94කට ගියා නම් වට්ටම - discount එක - සියයට 17.5කට අඩු වෙනවා. ඒ වාගේම අපේ දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 99කට ගියා නම් අපේ වට්ටම සියයට 14.6කට තවත් අඩු වෙනවා. සියයට 26ට තිබෙන එක සියයට 14.6ට අඩු වෙනවා. එතකොට මේක රටට ලොකු පාඩුවක් වෙනවා. මේ 2024 වර්ෂය. මේ වර්ෂය සඳහා අපේ දළ දේශීය නිෂ්පාදනයේ ඇස්තමේන්තුව රුපියල් බිලියන තිස්තුන් දාහයි. If you work it out in dollars, ඩොලර් බිලියන 99කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. ඒ කියන්නේ අද තිබෙන දළ දේශීය නිෂ්පාදනයේ වට්නාකම අනුව අපට සියයට 26ක වට්ටමක් ලබා ගන්න බැරි වෙනවා කියන එකයි.

බලන්න මේක කොච්චර අවදානම් ද කියලා. මේ ගිවිසුම තවම අත්සන් කරලාත් නැහැ. මේකට තමයි ජනාධිපතිතුමා ගිහිල්ලා එකඟ වෙන්නේ. මේකට තමයි ජනතා විමුක්ති පෙරමුණ; මේ රජය එකඟ වෙන්නේ. මේක හරියට සෝදිසි කරන්නේ නැතිව, බලන්නේ නැතිව, විශ්ලේෂණය කරන්නේ නැතිව, පාර්ලිමේන්තුවේ විවාද කරන්නේ නැතිව, මේ මතය විමසන්නේ නැතිව තමන්ම නිකම් ගිහිල්ලා හිතා ගන්නවා. මේ නිසා තමයි දයාසිරි ජයසේකර මැතිතුමා අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් වැදගත් කාරණාවක් මතු කළේ. මේවා කථා බහ කරන්න ඕනෑ. සාකච්ඡා කරන්න වෙලාව තිබෙන්න ඕනෑ.

[ගරු කබීර් හෂීම් මහතා]

Hon. Speaker, I would like to quote this. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ කථාවේ හත්වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"ඒ වාගේම වාණිජ වෙළෙඳපොළේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය පිළිබඳ සාකච්ඡා පටන් අරගෙන තිබුණා. ඒ සාකච්ඡා ඒ වෙලාවේ අපට මතකයි මාධ්‍ය හරහා ප්‍රකාශයට පත් කළා ජනාධිපතිවරණයට දින දෙකකට අවසන් වූ බව. ඒ නිසා අපිට යළි ණය ප්‍රතිව්‍යුහගත කර ගැනීම පිළිබඳ සාකච්ඡාවකට ඉඩ කඩක් විවෘත වෙලා තිබුණේ නැහැ."

එතුමා එහෙම තමයි කිව්වේ.

ඊළඟට එතුමා ආයෙත් මෙහෙම කියනවා:

"ඒ ප්‍රතිව්‍යුහගත කර ගැනීමේ යෝජනා හොඳද, නරකද, වාසිද, අවාසිද කියන එක දැන් විවාද කිරීමෙන් ඵලක් නැහැ."

ජනාධිපතිතුමා කියන එක වැරදියි. අපි ඒක පිළිගන්නේ නැහැ. එතුමාගේ ඒ ප්‍රකාශය වැරදියි. මොකද, එතුමා කියනවා ISB loan එක සාකච්ඡා කරලා ඉවරයි, දැන් මුකුත් කරන්න බැහැ කියලා.

හැබැයි, ISB loans ප්‍රතිව්‍යුහගත කිරීමේ ගිවිසුම අත්සන් කරලා නැහැ, තවම. මේක මේ රට දැනගත යුතුයි. දෙසැම්බර් 12වෙනි දා තමයි මේක අත්සන් කරන්න නියමිත වෙලා තිබෙන්නේ. ඇයි, ඔබතුමන්ලා මේකට එකතු වෙන්නේ? ඔබතුමන්ලා රෙදි ඇඳගෙනද ඕවා අත්සන් කරන්න යන්නේ? ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට කිව්වේ, මේවා හොරා කාපු, කොමිස් ගහපු සල්ලි කියලා. අපි ඉල්ලනවා, පාර්ලිමේන්තුවට මේ ගිවිසුම ඉදිරිපත් කරලා ඡන්දයක් විමසන්න කියා. මේ ගිවිසුම අත්සන් කරන්න පෙර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා මේ සම්බන්ධව අපට ඡන්දයක් දෙන්න. එතකොට අපි පෙන්වා දෙන්නම්, මෙහි හරි වැරදි තැන්. මේක නිකම් කරන්න දෙන්න බැහැ. We are accountable to the people.

ගරු කථානායකතුමනි, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා සහ ජනතා විමුක්ති පෙරමුණ දැන් රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවට වඩා neoliberal බව පෙනී යනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයාට වඩා බටහිර ගැති බවක් අද අපට පෙනී යනවා. මොකද, හරියට බටහිර ගැතියි. මම ඒක නිකම් කියන්නේ නැහැ. මම ඔප්පු කරන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
රනිල් එළවලා, රනිල් ඇවිල්ලා!

ගරු කබීර් හෂීම් මහතා
(*மாண்புமிகு கபீர் ஹஷீம்*)
(The Hon. Kabir Hashim)
ඔව්, රනිල් එළවලා, රනිල් ඇවිල්ලා!

මේ අතුරු සම්මත ගිණුමත් එක්ක දැම්මා, පරිපූරක ඇස්තමේන්තුවක්. අද ඔබතුමන්ලා මේ පරිපූරක ඇස්තමේන්තුවත් සම්මත කර ගන්නවා. මෙතැන ඉන්න ඊයේ-පෙරේදා කථා කරපු මන්ත්‍රීවරුන්ගෙන් මම අහනවා, මේ පරිපූරක ඇස්තමේන්තුවේ ශීර්ෂ 102 මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයෙන් දාලා තිබෙන වියදම්වල රුපියල් මිලියන 3,213ක් වෙන් කරලා තිබෙනවා. ඒ අනුව ඔබතුමන්ලා සම්මත කරන්න යනවා; අනුමත කරන්න යනවා, රුපියල් මිලියන 3,213ක්. මෙම පරිපූරකය සමඟ ජනාධිපතිතුමා අත්සන් කරලා යවපු ඒ ලේඛනයේ සඳහන් වෙනවා, "යෝජනාව සම්බන්ධයෙන් පැහැදිලි කිරීම - ණය ප්‍රතිව්‍යුහගතකිරීමේ ක්‍රියාවලියට අදාළව මූල්‍ය/නීති උපදේශකයන් වෙත ශ්‍රී ලංකා මහබැංකුව විසින් සිදු කරන ලද ගෙවීම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා රුපියල් මිලියන 3,213ක අතිරේක ප්‍රතිපාදන අවශ්‍ය වේ." යනුවෙන්.

ඔබතුමන්ලා ගෙවන්න යන්නේ අර බටහිරෙන්, ඇමෙරිකාවෙන් එන උපදේශකවරුන්ට. ඉතින් රුපියල් මිලියන 3,213ක් දෙන්නෙකුට, තුන්දෙනෙකුට ගෙවන්න යනවා. හැබැයි, වගා හානි වූ ගොවියන්ට රුපියල් ලක්ෂයක් ඔවුන්ගේ ගොවිපොළට දෙන්න බැහැ කියන ආණ්ඩුව ඒ මුදල රුපියල් හතළිස් දහසකට සීමා කරලා අර තුන් හතරදෙනෙක් වන උපදේශකවරුන්ට රුපියල් මිලියන 3,213ක් ගෙවන්නේ කොහෙන්ද? මේක සාධාරණද?

ගරු බිමල් රත්නායක මහතා
(*மாண்புமிகு பிமல் ரத்நாயக்க*)
(The Hon. Bimal Rathnayake)
"සීයා"ගෙන් තමයි අහන්න වෙන්නේ.

ගරු කබීර් හෂීම් මහතා
(*மாண்புமிகு கபீர் ஹஷீம்*)
(The Hon. Kabir Hashim)
සීයලා මෙතැනට ආයෙත් ඇවිල්ලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඒකයි කිව්වේ, "සීයා" ඇවිල්ලා කියලා.

ගරු කබීර් හෂීම් මහතා
(*மாண்புமிகு கபீர் ஹஷீம்*)
(The Hon. Kabir Hashim)
ඒ සීයලාමයි ඉන්නේ. "සීයා" වෙනස් වෙලා නැහැ, මට පෙනෙන හැටියට. [බාධා කිරීම්] මා ඒ ගැන කියන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
ඒ වෙනුවට මහප්පා ඇවිල්ලා.

ගරු කබීර් හෂීම් මහතා
(*மாண்புமிகு கபீர் ஹஷீம்*)
(The Hon. Kabir Hashim)
මම කියන්නේ මේකයි. එදා රනිල් වික්‍රමසිංහ මහත්තයා සහ එතුමාගේ රජය රට හදන්න වැල් පාලමේ ගියේ රෙදි ඇඳගෙන. හැබැයි, අද අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා සහ මේ කණ්ඩායම වැල් පාලමේ යන්නේ රෙදි නැතුව. ඕක තමයි වෙනස. වෙන වෙනසක් නැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*மாண்புமிகு தயாசிறி ஜயசேகர*)
(The Hon. Dayasiri Jayasekara)
කෝට් දාලා.

ගරු කබීර් හෂීම් මහතා
(*மாண்புமிகு கபீர் ஹஷீம்*)
(The Hon. Kabir Hashim)
ටයි-කෝට් දාලා, ඒ විධියටම තමයි ඒකේ යන්නේ.

ගරු කථානායකතුමනි, ජනාධිපතිතුමා ඇතුළු රජයට ලැබුණු ඓතිහාසික වරම වගකීමකින්, යුතුකමකින් යුතුව රට ගොඩගැනීම සඳහා යෙදවීමට ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති සහ

දර්ශනය ඉදිරිපත් කළ යුතුයි. පරණ කථා කිය කියා මෙහෙම යන්න බැහැ. හරිද? අපි ඔබතුමන්ලාට ගණන් හිලව් අනුව පෙන්නුවා, මේක වැරදිලා තිබෙන තැන් මොනවාද කියලා. ජනාධිපතිතුමාගේ කථාවේදී ප්‍රතිපත්ති සහ දර්ශනය ඉදිරිපත් කරමින් එතුමා ප්‍රතිපත්ති පරාමිතිය - policy parameters - ගැන සඳහන් කළා. සංවර්ධන ප්‍රතිපත්ති - development policies - නිර්මාණය කිරීමේදී, කළමනාකරණය කිරීමේදී එය සාර්ථක කර ගන්න නම්, තවත් අංග කිහිපයක් එකතු කරගත යුතුයි. ඒ සඳහා දර්ශනය හෝ ප්‍රතිපත්ති පරාමිතිය සැලැස්මකට පරිවර්තනය කළ යුතුයි. සැලැස්මකට පරිවර්තනය කළාට පස්සේ ඒක ව්‍යාපෘතිවලට - projectsවලට - කැඩී යා යුතුයි. එතැනින් ඒ ව්‍යාපෘති වැඩසටහන් - programmes - බවට පරිවර්තනය විය යුතුයි. ඊළඟට එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට - programme implementation unit එකකට - යොමු විය යුතුයි. එම ක්‍රියාත්මක කිරීමේ ඒකකයට නිශ්චිත ඉලක්ක සහ කාල රාමුවක් තිබිය යුතුයි. ඒ අතර අවසානයේදී ඒවා අධීක්ෂණය කරන්න සහ ඇගැයීම් කරන්න monitoring and evaluation unit එකක් තිබිය යුතුයි, මේ වැඩේ හරියට වෙනවා නම්. මම කොටින්ම කියන්නේ මේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන රාමුවක් හැදුවේ නැත්නම් ජනාධිපතිතුමා කරපු කථාව, ඉදිරිපත් කරපු දර්ශනය වචනවලට පමණක් සීමාවන සුරංගනා කථාවක්, දවල් සිහිනයක්, මැජික් කථාවක් බවට පත් වෙනවා කියන එකයි. එය මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තූතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 23ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.00]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Sunil Handunnetti - Minister of Industry and Entrepreneurship Development)

ගරු කථානායකතුමනි, මට විනාඩි 25ක් වෙන් කර තිබුණා. ගරු කථානායකතුමනි, මම ඉල්ලා සිටිනවා, මට ඒ විනාඩි 25ක කාලය ලබා දෙන්න කියලා. මොකද, අනවශ්‍ය කාලය කා දැමීම්වලට අපේ වැදගත් වෙලාව වෙන් කරන්න එපා. බොහොම ස්තූතියි.

ගරු කථානායකතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරයෙකු හැටියට අවුරුදු ගණනාවක් අතුරු සම්මත ගිණුම් සහ අය වැය පිළිබඳව කථා කළ කෙනෙකු හැටියට අද මම ඉතාම සතුටු වෙනවා, මේ අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාදයට ආණ්ඩු පක්ෂයේ ඇමතිවරයෙකු හැටියට එකතු වෙන්න ලැබීම පිළිබඳව.

ගරු කථානායකතුමනි, අද උදේත්, ඊයේත්, මීට කලිනුත් අතුරු සම්මත ගිණුම් ඉදිරිපත් කිරීමේ පූර්වාදර්ශ පිළිබඳව සාකච්ඡා වූ නිසා මම මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කැමැතියි, අතුරු සම්මත ගිණුම් පිළිබඳ ඉතිහාසය. අපේ රටේ අතුරු සම්මත ගිණුමක් මුලින්ම ඉදිරිපත් වුණේ 1931දී. 1931.09.22වැනි දා රුපියල් මිලියන 13.6කට තමයි පළමුවැනි අතුරු සම්මත ගිණුම ඉදිරිපත් වුණේ. එදා ඉඳලා අතුරු සම්මත ගිණුම් 14ක් මේ ගරු පාර්ලිමේන්තුවට ඉදිරිපත් වෙලා තිබෙනවා. ඉන් 10ක්ම ඉදිරිපත් වෙලා තිබෙන්නේ, ඒ ඒ මොහොතෙහි පැවති ජනාධිපතිවරණ සහ මහ මැතිවරණ නිසා නිසි පරිදි පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් කරන්න නොහැකි වූ නිසායි. ඒ, 1982දී ජනාධිපතිවරණය හා ජන මත විචාරණය පැවැත්වීම නිසාත්, 1988දී ජනාධිපතිවරණය පැවැත්වීම නිසාත්, 1994.08.16වන දින මහ මැතිවරණය සහ 1994.11.09වන දින ජනාධිපතිවරණය පැවැත්වීම නිසාත්, 1999.12.12වන දින ජනාධිපතිවරණය පැවැත්වීම නිසාත්. ඒ වාගේම 2000දීත්, මැතිවරණය පැවැත්වීම නිසා 2002.02.05වන දිනත්, මැතිවරණයෙන් පස්සේ ආණ්ඩුවට අය වැය ඉදිරිපත් කරන්න කාලය නොතිබුණු නිසා 2009.11.03වන දිනත්, 2018දී මැතිවරණය පැවැත්වීම නිසා 2019 වර්ෂයට අදාළ අය වැය ඉදිරිපත් කිරීමට කාලය නොතිබුණු නිසාත්, 2019.11.16වන දින ජනාධිපතිවරණය පැවැත්වීම නිසා 2020 වර්ෂයට අදාළව අය වැය ඉදිරිපත් කිරීමට කාලය නොතිබුණු නිසාත්, 2020දී කොවිඩ් වසංගතය පැන නැඟීමෙන් මහ මැතිවරණය පවත්වන්න ප්‍රමාද වූ නිසාත් අතුරු සම්මත ගිණුම් ඉදිරිපත් කරන්න සිදු වුණා.

ගරු කථානායකතුමනි, ඒ හැම වෙලාවකදීම මේ කාරණාව තර්කයක් විධියට මතු වුණා. එනම්, අතුරු සම්මත ගිණුම තුළින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 සහ 152 ව්‍යවස්ථාවලින් පාර්ලිමේන්තුවට දීලා තිබෙන බලය ආවරණය කරනවා ද කියන රීති ප්‍රශ්නය. එය දිගටම මතු වුණා. මමත් ඒ රීති ප්‍රශ්නය මතු කළ කෙනෙක්.

ඔබතුමන්ලාට මතකයි, හිටපු මුදල් අමාත්‍යතුමෙකු වූ සරත් අමුණුගම මහතා අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළ වෙලාවේ ඔබතුමන්ලාගේ පැත්තේ හිටපු ජෝශප් මයිකල් පෙරේරා මහතා මන්ත්‍රීවරයෙකු හැටියට මේ රීති ප්‍රශ්නය මතු කළ බව. එතුමා හිටපු කථානායකවරයෙක්. එම ප්‍රශ්නය මතු කරද්දී ඒකට සරත් අමුණුගම හිටපු ඇමතිතුමා උත්තර දුන් වෙලාවේ කථානායකතුමාත් පිළිගත්තා, ඒක ඉදිරිපත් කරන්න පුළුවන්, ඒක ව්‍යවස්ථානුකූලයි කියලා. ඒ, අවශ්‍යතාව අනුව. හැබැයි, ඒ අවශ්‍යතාවේ සීමාවක් තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා තමයි, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ වගන්තියක් ඉදිරිපත් කරලා, අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයක් පාර්ලිමේන්තුවට ගෙනාවේ. ඒක අපි පිළිගන්නවා. හැබැයි, මේ අවශ්‍යතාව හැම දාම තිබෙන්නේ රට පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවත් එක්ක; රට පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවත් එක්ක.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා කථා කරද්දී ඉදිරිපත් කළා, රට අරාජික කිරීම පිළිබඳ කථාවක්. ඔබතුමා කිව්වා නේ, වෛරී සහගත, සමාජය අවුස්සන දේශපාලනයක් අපි කළා කියලා. ඔබතුමන්ලාගේ එක්සත් ජාතික පක්ෂය ඉතිහාසය පුරාම පක්ෂවල නම වරද්දා ගන්නවා.ඒ ගැටලුව දිගටම ඇවිල්ලා තිබෙනවා. ජේ.ආර්. ජයවර්ධනත් "රොහාන් විජේවීරා" කියලායි කිව්වේ. ජනතා විමුක්ති පෙරමුණ කියලා කියන්න බැරි වුණා, එතුමාට මැරෙනකල්ම. එතුමා "ජාතිකද" මොකක්ද කථාවක් කිව්වා. දැන් ඔබතුමාටත් පැටලිලා තිබෙනවා. මම හිතන්නේ ඒක ඉතිහාසයේ වැරැද්දක්.

ගරු කථානායකතුමනි, අතුරු සම්මත ගිණුම් සම්බන්ධව පාර්ලිමේන්තුවේ Research Division එකෙන් දුන් වාර්තාවක් මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

මේක හරි වැදගත් වාර්තාවක්. අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ඉතා හොඳින් දැනගෙන තමයි අපි මෙම අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරන්නේ.

හැබැයි, අතුරු සම්මත ගිණුමේ අවශ්‍යතාව මොකක්ද කියලා ගරු පාර්ලිමේන්තුවේ ඉන්න අපි හැමෝම දැන් දන්නවා. අපට නොවෙයි, මේ වෛරය තිබෙන්නේ. ජනතාවත් එක්ක කේන්තිය තිබෙන්නේ දැන් ඔබතුමන්ලාට. ලබන වසර සඳහා වූ අය වැය ඉදිරිපත් කරන කල් අතුරු සම්මත ගිණුමක් මඟින් මේ කාරණා ඉදිරිපත් කරන්න බැරි වුණොත්, රජයේ සේවකයන්ගේ වැටුප් ගෙවන්න විධියක් නැති වනවා; රාජ්‍යය පවත්වාගෙන යන්න විධියක් නැති වනවා; අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යන්න විධියක් නැති වනවා. ඒක ඔබතුමන්ලා හොඳටම දන්නවා. ඒ ඇත්ත දැනගෙන තමයි ඔබතුමන්ලා මේ කාරණය මතු කරන්නේ.

මේ ජනාධිපතිතුමා පත් වුණාට පසුව අපේ ආණ්ඩුවේ කටයුතු පටන් ගත්තේ නොවැම්බර් 23වැනි දා. විශේෂයෙන්ම මුදල් අමාත්‍යාංශයේ වගකීම් දරපු අය හැටියට ඔබතුමන්ලා හොඳින්ම දන්නවා, අය වැය කටයුතුවලට -අය වැයක් සම්මත කර ගන්න- ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අඩු තරමින් දින 72ක් ගත වන බව. ජනාධිපතිවරයාගේ ආණ්ඩුවේ කටයුතු නොවැම්බර් 23වැනි දා පටන් අරගෙන අපි ක්‍රමවේදය අනුව අය වැයක් ඉදිරිපත් කරන්න ගියා නම්, අපට අඩු තරමින් පෙබරවාරි මාසයේ තමයි අය වැය ඉදිරිපත් කරන්න වෙන්නේ. එතකොට දෙසැම්බර් 31 දක්වා තමයි පසුගිය අය වැයෙන් මුදල් සම්පාදනය කරලා තිබෙන්නේ. එතකොට, දෙසැම්බර් 31න් පසුව කටයුතු කරගෙන යන්නේ කොහොමද? ආණ්ඩුවේ කටයුතු කරගෙන යන්න බැහැ. ආණ්ඩුවේ කටයුතු කියන්නේ මොනවාද? රටේ කටයුතු. රාජ්‍ය සේවකයන්ට පඩි ගෙවන්න වෙන්නේ නැහැ; ආරක්ෂක හමුදාවේ කටයුතු පවත්වාගෙන යන්න වෙන්නේ නැහැ. අන්න එතකොට ඔබතුමන්ලාට ලැබෙනවා සටන් පාඨයක්, "රට අරාජික වෙලා" කියලා. දැන් අපි කරලා තිබෙන්නේ මොකක්ද? ඒ සටන් පාඨයට ඉඩක් නැති කරලා, ක්‍රමවේදයට අනුව අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ අතුරු සම්මත ගිණුම සම්බන්ධයෙන් නම් මේ සාකච්ඡාව තිබෙන්නේ, 14 වතාවක් අතුරු සම්මත ගිණුම් ඉදිරිපත් කරලා, 11 වතාවක්ම ජනාධිපතිවරණය සම්බන්ධයෙන් සහ මහ මැතිවරණ සම්බන්ධයෙන් අතුරු සම්මත ගිණුම් ඉදිරිපත් කරලා, අතුරු සම්මත ගිණුමක අවශ්‍යතාව හොඳටම දැනගෙන තමයි, විශේෂයෙන්ම අය වැයක් භදන්න පාර්ලිමේන්තුවට තිබෙන කාලය පිළිබඳව අවබෝධයක් ඇතිව ඔබතුමන්ලා මේ කාරණාව මතු කරන්නේ.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළා ISB ණය පියවීම සම්බන්ධයෙන් මුදල් වෙන් කරලා තිබෙනවා කියන කාරණාව. ඇත්තටම ISB ණය පියවීම සම්බන්ධයෙන් රුපියල් බිලියන 3,000ක් වෙන් කරලා තිබෙනවා. හැබැයි, ඒ රුපියල් බිලියන 3,000 වෙන් කරලා තිබෙන්නේ මෙම අතුරු සම්මත ගිණුමෙන් විතරක් නොවෙයි; 2024 අය වැයෙනුත් මේ පාර්ලිමේන්තුව ඒ ප්‍රමාණය වෙන් කරලා තිබෙනවා. ඔබතුමා බලන්න, 2024 අය වැයෙන් පාර්ලිමේන්තුවට එය ඉදිරිපත් කරලා, ඒ ප්‍රමාණය වෙන් කරලා තිබෙනවා. අපට තිබෙන ප්‍රශ්නය මොකක්ද? අපි බලාපොරොත්තු වෙනවා, රජය හැටියට 2024 දෙසැම්බර් 31වන දා වනකොට ඒ ගෙවීම් සම්බන්ධයෙන් එකඟතාවකට එන්න. එතකොට අපට මේ මුදල අවශ්‍ය වෙන්නේ නැහැ. එතකොට මේ අතුරු සම්මත ගිණුමෙන් වෙන් කරන රුපියල් බිලියන 3,000 අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, 2024 අය වැය ලේඛනයෙනුත් එය වෙන් කරලා තිබෙනවා. හැබැයි, දෙසැම්බර් 31වන දාට කලින් අපට ඒ එකඟතා අවසන් කර ගන්නට බැරි වුණොත්, ගෙවීම් පියවා ගන්න බැරි වුණොත් මොකද වෙන්නේ? ඒ අවදානම දෙසැම්බර් 31වන දායින් එහාට, ඊළඟ අය වැයට කලින් අප්‍රේල් මාසය දක්වා කාලයට යන නිසා තමයි අපි අතුරු සම්මත ගිණුමෙන් මේ වෙන් කිරීම කරලා තිබෙන්නේ. ඔබතුමා ඒක හොඳින්ම දන්නවා. එය නොදන්න කෙනෙක් නොවෙයි, ඔබතුමා. මොකද, අපට දෙසැම්බර් 31වන දාට කලින් ඒ එකඟතා අවසන් කර ගන්න පුළුවන් වුණොත් අපටත් මේ රුපියල් බිලියන 3,000 අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද අතුරු සම්මත ගිණුමකින්,-

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු කථානායකතුමනි, මම ඇහුවේ DSA එකේදී, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණය ප්‍රතිව්‍යුහගත කිරීම රනිල් වික්‍රමසිංහ මැතිතුමා එකඟ වූ කොන්දේසිවලට යටත්වම ඔබතුමන්ලාත් එකඟ වෙන්න යනවාද, නැද්ද කියලායි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, ඒක වෙන කාරණාවක්. ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව මම හොඳින් අහගෙන හිටියා. ඔබතුමා වෙන් කිරීම් ගැන කිව්වේ. ඔබතුමා හොඳටම දන්නවා, අපට කර ගහන්න සිද්ධ වුණු පරණ පව් කොටසක් තිබෙන බව. ඒ, ඔබතුමන්ලාත් එකඟ වුණු, ඔබතුමන්ලාගේ රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එකඟ වුණු කොටසක්. ISB ණයවලට ඔබතුමන්ලා තමයි 2021 ඉඳලා වැඩියෙන්ම කර ගැහුවේ. ඔබතුමන්ලා තමයි ISB ණය වැඩිපුරම ගත්තේ; වැඩිම පොලියට ගත්තේ; බිලියන17ක් ගත්තේ. ඒ ඔක්කෝම දැනගෙන තමයි අපි ඒකට යන්නේ. රනිල් වික්‍රමසිංහ නැත්නම් ISB ණය එන්නේ නැහැ, මේ රටට. ඔබතුමන්ලා ඒ ගත්ත ණයවල පොලිය තමයි දැන් අපට ගෙවන්න වෙලා තිබෙන්නේ. අපට කියන්නේ, මේ රටේ ජනතාවට. ඔබතුමා කිව්වා නේ, මේ ගෙවන්නේ දුක් විඳින ජනතාවගේ බදු මුදල් කියලා. ඒ දුක් විඳින ජනතාවගේ බදු මුදල්වලට ගිවිසුම ගැහුවේ කවුද? කොරියාවට දෙන පොලියට වඩා වැඩි පොලියට අපට ගන්න ගිවිසුම් ගැහුවේ කවුද? ඒ ගිවිසුම් ගහපු ඒවායේ පාපය මේ රටේ බදු ගෙවන ජනතාවගේ ඒ බදු මුදල්වලින් නේ ගෙවන්න සිදු වෙලා තිබෙන්නේ. ඒක වෙනම කථාවක්. මම කියන්නේ ඒක නොවෙයි. අතුරු සම්මත ගිණුමක,-
[බාධා කිරීමක්]

ගරු කථානායකතුමනි, අතුරු සම්මත ගිණුමකින් වෙන්නේ මොකක්ද කියලා හොඳටම දැනගෙන තමයි මෙතුමන්ලා මේ කථා කරන්නේ. අතුරු සම්මත ගිණුමකින් වෙන් කරන සියලු මුදල් වියදම් කරන්නේ නැහැ, ගරු කථානායකතුමනි. අතුරු සම්මත ගිණුමෙන් මුදල් වෙන් කරන්නේ, අය වැය දක්වා අවදානමක් ඇති

වේ යැයි සැක කරන දේවල්වලට. ඒ ඔක්කෝම වියදම් කරනවා කියලා හිතාගෙන අපි කවදාවත් විවාද කරන්නේ නැහැ; අය වැයෙන් වෙන් කරන මුදලුත් ඔක්කෝම වියදම් කරනවා කියලා හිතාගෙන අපි කවදාවත් විවාද කරන්නේ නැහැ. ඒක මේ ගරු පාර්ලිමේන්තුවේ මූල්‍ය කළමනාකරණය පිළිබඳ අඛණ්ඩ රේණුවක් හරි දැනුමක් තිබෙන, කුහක නොවන හැමෝම දන්නවා. අතුරු සම්මත ගිණුමෙන් මුදල් වෙන් කරන්නේ, පාර්ලිමේන්තුවේ අය වැයක් සම්මත කරලා නැති නිසා ඒ ඉතිරි කාලය තුළ අවදානමක් ඇති වේ යැයි සිතන නිසායි. එතකොට අපි ISBsවලට මුදල් දැනට වෙන් කරලා තිබෙනවා, 2024 ගිවිසුම්වලින් එකඟතාවට ඒ යැයි සිතන ප්‍රමාණයට. හැබැයි, 2024 දෙසැම්බර් මාසයේ 31වන දා වෙනකොටම එකඟතාවට එන්න පුළුවන් වුණොත්, මේ අතුරු සම්මත ගිණුමෙන් වෙන් කරන රුපියල් බිලියන 3,000 අපට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ මුදල ඉතිරි වෙනවා.

ඒ වාගේම ඔබතුමන්ලා කිව්වා, මේ අතුරු සම්මත ගිණුමෙන් ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයට අව්වර වෙන් කරගෙන, මෙව්වර වෙන් කරගෙන කියලා. නමුත්, මේ 2024 අය වැයට වෙන් කරලා තිබෙන මුදල්වලින් commitment fees අඩු කර ගත්තොත්, අපට ඒවා ගෙවාගෙන බේරා ගන්න පුළුවන් වුණොත්, අපේ හැම අමාත්‍යාංශයකම, හැම ආයතනයකම සැලකිය යුතු මුදලක් රජය විධියට අපට ඉතිරි කර ගන්න පුළුවන්. අපි ඒ නිසා විශේෂයෙන්ම රජයේ අමාත්‍යාංශ සියල්ල සම්බන්ධයෙන්ම කැබිනට් මණ්ඩලයේදී තීරණයක් ගත්තා. හුහක් වෙලාවට සාමාන්‍ය භාවිතාව තමයි, දෙසැම්බර් මාසය වෙනකොට ඉතිරි වෙන මුදල් වෙන වෙන වැය ශීර්ෂවලට මාරු කරලා, ඒ වාගේම අනවශ්‍ය වියදම්වලට, commitment feesවලට ගෙවා දමන එක. මේ ගරු ඇමතිතුමන්ලා, ගරු නියෝජ්‍ය ඇමතිතුමන්ලා ඔක්කෝම දන්නවා, අපි කැබිනට් මණ්ඩලයේදී තීරණයක් අරගෙන තිබෙනවා, ඒ ඉතිරි වෙන සියලු මුදල් භාණ්ඩාගාරයට එවන්න කියලා. ඒවායින් යම් ප්‍රමාණයක් අපට ඉතිරි කරන්න පුළුවන්. අනවශ්‍ය නාස්තිකාර වියදම්වලින් යම් ප්‍රමාණයක් ඉතිරි කරන්න පුළුවන් වුණොත්, backup රථවලට ගිය වියදම්වලින්, අධි ආරක්ෂකයින් පිරිවරාගෙන නටපු නාඩගම්වලින් යම් මුදල් ප්‍රමාණයක් ඉතිරි කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් ජනාධිපතිතුමාම අවශ්‍ය ආදර්ශය පළමුවෙන්ම ලබා දීලා තිබෙනවා. එතකොට මේ අතුරු සම්මත ගිණුමෙන් වෙන් කරන මුදල් ප්‍රමාණයම අපට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒකයි ඇත්ත තත්ත්වය.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමනි, ඔබතුමා විෂය භාර ඇමතිවරයෙක් ලෙස කටයුතු කළ කෙනෙක් හැටියට මේකේ තිබෙන සත්‍ය තත්ත්වය හොඳටම දන්නවා. අපි සාමාන්‍යයෙන් ගත්තොත්, 2024 අවුරුද්දේ පළමු මාස 8ට රුපියල් බිලියන 562ක් වියදම් කරලා තිබෙනවා. ඒක විශේෂයෙන්ම අධ්‍යාපනය, සෞඛ්‍ය, පෝෂණ කටයුතුවලට වෙන් කරලා තිබෙන රුපියල් බිලියන 1,055න්, රුපියල් බිලියන 562ක්. නමුත්, ඒ අත්‍යවශ්‍ය සේවා අනිවාර්යයෙන්ම පවත්වාගෙන යන්න ඕනෑ. "අස්වැසුම" සහනාධාරයට රුපියල් බිලියන 112ක්; පාසල් උපකරණවලට රුපියල් බිලියන 9.5ක්; පෙළ පොත්වලට රුපියල් බිලියන 4.4ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම, පාසල් නිල ඇඳුම්වලට වීන රජයෙන් අපට ආධාරයක් ලැබුණා. එතකොට නිල ඇඳුම්වලට වෙන් කරන ප්‍රමාණයේ ඉතුරුවක් වෙනවා. ඒ සඳහා වියදම් වන මුදල් ඉතිරි වෙනවා. ඒ ආධාරය වෙනදා නොලැබිච්ච දෙයක්. එම නිසා ඒ වෙනුවෙන් වැය කරන මුදල් ඉතිරි වෙනවා. එලෙස ඉතිරි වෙන ප්‍රමාණයන්ගෙන් විශාල ප්‍රමාණයක් අපට ඉතිරි කරන්න පුළුවන් වෙයි කියලා මම විශ්වාස කරනවා.

ජනාධිපතිවරයා දිවුරුම් දීමේ උත්සවයේදීම ආදර්ශයක් දුන්නා. රනිල් වික්‍රමසිංහ මහත්මයාට වෙන් කරපු මුදල් ප්‍රමාණයම මේකේ ඉලක්කමකින් තිබෙනවා කියලා ඔබතුමන්ලා සමාජයට මතයක් හදන්න හැදුවාට, ඇත්තටම ඒ මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයේ ඉතිරි වෙලා තිබෙනවා. මොකද, රනිල් වික්‍රමසිංහ මහතා හෝ සජිත් ප්‍රේමදාස මහතා ජනාධිපතිවරයා විධියට දිවුරුම් දුන්නා නම් අද ඔය තත්ත්වය නොවෙයි තිබෙන්නේ. ඇමතිවරු වැඩ බාර ගන්නකොට ගිය වියදම කීයද? ඔබතුමන්ලා ඇමතිවරු විධියට වැඩ බාර ගත්තා නම් පිළිගැනීමේ උත්සව තියලා අදටත් ගම් පුරාම රජයේ වියදම්වලින් බැනර් දානවා. ඒ මුකුත් අපේ ආණ්ඩුවේ නැහැ. අමාත්‍යාංශ කාර්යාලවලට ගිහිල්ලා වැඩ බාර ගන්නකොට මොකක්ද දරපු වියදම්? ඔබතුමන්ලාගේ වැඩ භාර ගත්ත අය දන්නවා, ඒ වෙනුවෙන් කොච්චර වියදමක් දරන්න වෙනවාද කියලා. ඒ ගැන කල්පනා කරලා බලන්න. ඒ වාගේම, වාහන, backup රථ, ආරක්ෂක වියදම් අද නැහැ. අපේ ඇමති මණ්ඩලයේ 24දෙනාම අමාත්‍ය නිල නිවාසවලට ගියේ නැහැ. ඒ අයගෙන් දෙදෙනෙක් මාදිවෙල මන්ත්‍රී නිල නිවාසවලට ගියා. අපි කවුරුවත් අමාත්‍ය නිල නිවාසවලට ගිහිල්ලා නැහැ. ඒ නිසා ඒවාට යන වියදම ඉතුරුයි. විදුලි බිලේ ඉඳලා, වතුර බිලේ ඉඳලා ඔබතුමන්ලාට වෙච්ච ඒ වියදම මේ රටේ ජනතාවගේ බදු මුදල් ඉතිරි කිරීමක්. රජයේ ආයතන බොහොමයක් -අපේ අමාත්‍යාංශයේත් ගොඩක් ආයතන- කුලියට ඉන්නේ. ඔබතුමන්ලා ඉඳලා තිබෙන්නේ එහෙමයි.

මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ මාසික කුලිය රුපියල් මිලියන 5යි. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 50යි. මාසයකට රුපියල් ලක්ෂ 50ක කුලියටයි ඉන්නේ.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
වෙළෙඳ අමාත්‍යාංශයේ මාසික කුලිය රුපියල් ලක්ෂ 65යි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
වෙළෙඳ අමාත්‍යාංශයේ මාසික කුලිය රුපියල් ලක්ෂ 65යි. ඉතින් කොහොමද? අපි දැන් තීරණය කරලා තිබෙනවා, ඒවා රජයේ ආයතනවලට ගන්න. 2024 අය වැයෙන් මේ මුදල් වෙන් කරලා තිබෙන්නේ ඒ කුලිය ගෙවන්න. අපට පරණ පව් ටිකක් ගෙවන්න වෙනවා, අපි කැමැත්තෙන්, අකැමැත්තෙන් කෙසේ වෙතත්, ඒ ගහලා තිබෙන ගිවිසුම් අනුව. දැන් කියනවා, ක්ලිෆර්ඩ් චාන්ස් සමාගමට ගෙවන කුලිය මිලියන මෙච්චරයි, අව්වරයි කියලා. ඒක කවුද ගෙනාවේ? ඒක ගෙනාවේ අපි නොවෙයි. හැබැයි, අපි හෙට ක්ලිෆර්ඩ් චාන්ස් සමාගම අයින් කර දාලා ප්‍රතිව්‍යුහගතකරණයට වෙන නීති සමාගමක් ගත්තොත්, ක්ලිෆර්ඩ් චාන්ස් සමාගම අපට නඩු දමනවා. නඩු දැම්මොත් ඒ නඩු ගාස්තු ගෙවන්න වෙන්නේ කාටද? ඒක නිසා අපට සමහර බැඳියාවන් තිබෙනවා, ඒවා නීත්‍යානුකූලව ගෙවන්න සිද්ධ වෙනවා. නමුත්, අපේ කැමැත්ත ඒක නොවෙයි. ඒක හොඳටම දැනගෙනයි තමුන්නාන්සේලා මේ කථා කරන්නේ. මම කියන්නේ ඒකයි. මෙතැන අද ඇමතිවරු විධියට ඉන්නේ හර්ෂ ද සිල්වා මැතිතුමා නම්, කබීර් හෂීම් මැතිතුමා නම්, රවි කරුණානායක මැතිතුමා නම්, ඒ අය මේ කථාව අනෙක් පැත්තටයි කියන්නේ. එතකොට කියන්නේ මොකක්ද? එතකොට මේක අනෙක් පැත්තට කියන්නේ. ඒක තමයි දේශපාලන කුහකකම. එහෙම එපා. ක්ලිෆර්ඩ් චාන්ස් නීති සමාගමක් හැටියට, IMF එකේ නීතිඥයෝ හැටියට බඳවා ගත්තේ අපි නොවෙයි. ඒ ගොල්ලන්ගේ නීතිඥ

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ගාස්තුව තීරණය කළේ අපි නොවෙයි. ඒවා සම්පූර්ණයෙන් තමුන්නාන්සේලා කරපු දේවල්. දැන් අපෙන් අහනවා, ඒකට ගමේ නීතිඥ මහත්තයෙක් බඳවා ගන්න බැරිද කියලා. ගමේ නීතිඥ මහත්තයෙක් නොවෙයි, මේ ගිවිසුම් ගහන්න ඕනෑම නැහැ, මේ ණය ගිවිසුම් ඕනෑම නැහැ, ඒ ක්ලිෆර්ඩ් චාන්ස්ලා ගේන්න ඕනෑම නැහැ, මේ විධියට මේ රට අනතුරට දැම්මේ නැත්නම්. මම ඊළඟට කියන්නම්, මේ රට අනතුරට දැම්මේ කොහොමද කියලා. මේ රට මේ ණය උගුලට දැම්මේ නැත්නම් මොන ක්ලිෆර්ඩ් චාන්ස්ලාද මෙහෙට එන්නේ. ඒකයි ඇත්ත කථාව.

මම කියනවා, අද රටේ බදු ගෙවන ජනතාව, විශේෂයෙන් ව්‍යාපාරික ප්‍රජාව, කර්මාන්තකරුවන්, අපේ මේ වැඩ පිළිවෙළ පිළිගෙන තිබෙන බව. ඔවුන් මේ වැඩ පිළිවෙළත් එක්ක හිටගෙන තිබෙනවා. ඒක අපට ලොකු ශක්තියක්. රාජ්‍ය සේවකයෝ සියයට 80ක් මේ ආණ්ඩුවේ වැඩ පිළිවෙළ අනුමත කරලා අපට ඡන්දය පාවිච්චි කරලා තිබෙනවා. ඔවුන් අපට ලොකු ශක්තියක්. මට මතකයි, -මුදල් නියෝජ්‍ය ඇමතිතුමාටත් මතක ඇති- බදු ගෙවන්න දිනයක් තිබුණා පසුගිය සැප්තැම්බර් මාසයේ 30වැනි දා ලෙස. ඒ දවසේ පෝලිම් තිබුණා, කැමැත්තෙන් බදු ගෙවන ජනතාව බදු ගෙවන්න. ඒ වාගේම Internet එක හරහා බදු ගෙවීම් සඳහා වන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ online App එක හිර වෙලා තිබෙනවා, බදු ගෙවන්න මිනිස්සු ගොඩක් මැදිහත් වීම තුළ. දෙසැම්බර් 31ට කලින් බදු ගෙවන්න ඒ ගොල්ලෝ ඉදිරිපත් වෙලා තිබෙනවා. බදු ගෙවන ව්‍යාපාරිකයෝ මට කියලා තිබෙනවා, "සැප්තැම්බර් 15ට, සැප්තැම්බර් 30ට බැංකුවල වෙනම queue එකක් ඇති කරලා දෙන්න, අපට බදු ගෙවීමේ පහසුව සඳහා" කියලා. ඒ, කැමැත්ත. ඒ කැමැත්ත ඇති වෙලා තිබෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි. ගරු ජනාධිපතිතුමා, ඇමතිවරු ඇතුළු අපේ ආණ්ඩුව දීපු ආදර්ශය නිසා.

මෙහිදී තිබුණු ලොකුම ප්‍රශ්නය මේකයි. අපේ රටේ ව්‍යාපාරිකයන්ට, කර්මාන්තකරුවන්ට, ව්‍යවසායකයන්ට බදු ගෙවන්න අකැමැත්තක් නොවෙයි තිබුණේ. ඔවුන් ගෙවන බදුවලට මොකද වෙන්නේ කියලා ඔවුන්ට සහතිකයක් තිබුණේ නැහැ, ඔවුන්ට විශ්වාසයක් තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. ඒ නිසා ඔවුන් නිතරම කියපු දේ තමයි, "අපි බදු ගෙවන්න අකැමැති නැහැ. අපි බදු ගෙවන්න කැමැතියි. හැබැයි, අපේ බදුවලට වෙන්නේ මොකක්ද කියලා සාධාරණයක් කියන්න, ප්‍රතිපත්තියක් කියන්න" කියන එක. අද ඒක සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අපි මේ වෙන් කර තිබෙන මුදල් සියල්ල වියදම් කරන්න නොවෙයි, මේවා නාස්ති නොකර ඉතුරු කරන ප්‍රමාණයට ජනතාව අපට මේවාට තවත් සහයෝගය දෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, වෙන මොනවා නැතත් ජනතාවගෙන් ඒ වරම අපට ලැබිලා තිබෙනවා, ජනතාවගෙන් ඒ කැමැත්ත අපට ලැබිලා තිබෙනවා කියලා, ගරු කථානායකතුමනි.

මේ වැඩ පිළිවෙළ තව විධිමත් කිරීම සඳහා තමයි ගරු අනුර දිසානායක ජනාධිපතිතුමා "Clean Sri Lanka" වැඩ පිළිවෙළ සහ digital economy ආර්ථික වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි විශ්වාස කරනවා, ඒ වෙනුවෙන් වන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙද්දී රස්තියාදු නොවී, කාලය ඉතුරු කරලා මිනිස්සුන්ට මේ ව්‍යාපාර කරගෙන යන්න පුළුවන් බදු ක්‍රියාවලියකට එන්න පුළුවන් කියලා. ඒ වාගේම තමන් ගෙවන බදුවලට ප්‍රතිලාභයක් ලැබෙන වාතාවරණයක්, ව්‍යාපාරික පරිසරයක්, කර්මාන්ත පරිසරයක් අපේ රටේ අනිවාර්යයෙන්ම නිර්මාණය වෙනවා. ඔබතුමන්ලා හුඟදෙනෙක් ව්‍යාපාරිකයෝ. ඒ නිසා ඔබතුමන්ලාටත් අනිවාර්යයෙන් ගෙදර ඉඳගෙන බදු ගෙවන්න පුළුවන්කම තිබෙනවා. රස්තියාදු වෙන්න ඕනෑ නැහැ. එතකොට රටේ ඉන්ධන ඉතුරු වෙනවා, කාලය ඉතුරු වෙනවා, නාස්තිය නැති වෙනවා. මොකද, මේ හැම දෙයක්ම මීට කලින් සිද්ධ වුණේ, කොමිස් ක්‍රියාවලියක් ඇතුළේ, හොරකම් ඇතුළේ පගාව දීලා කරගන්න ඕනෑ වැඩ විධියට. පගාව දීලා වැඩ කරගන්නවා වෙනුවට, ක්‍රමානුකූලව තාක්ෂණයත් එක්ක මුහුකරගෙන කාර්යක්ෂම රාජ්‍ය සේවයක්, පෞද්ගලික අංශයක් හැදුණාට පස්සේ මේ ප්‍රශ්නය නිරාකරණය වෙනවා කියන විශ්වාසය අපට හොඳටම තිබෙනවා.

ඊළඟට, ගරු මුදල් නියෝජ්‍ය ඇමතිතුමාත් මතු කරපු කාරණය මේකයි. අපේ ආර්ථිකයේ දිශානතිය මොකක්ද? අපි අපේ ආර්ථිකයේ දිශානතිය පිළිබඳ සම්පූර්ණ වාර්තාව, විග්‍රහය අය වැයේදී ඉදිරිපත් කරනවා. හැබැයි, ඊට කලින් මම මේ කාරණය කියන්න ඕනෑ. අපේ රට වැටුණේ, ISBsවලට යන්න සිද්ධ වුණේ, ආර්ථිකය මෙච්චර බංකොලොත් වුණේ වෙන මොකක්වත් හින්දා නොවෙයි, අපි හැමදාමත් කියන විධියට අපේ නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටුණු නිසා. නිෂ්පාදන ආර්ථිකය බිඳ වැටිච්ච නිසා අපට ආනයන අපනයන දෙගුණයක පරතරයක් තිබෙන වෙළඳ ශේෂයක් හිමි වුණා. ඒක ඔබතුමන්ලා අපි කවුරුත් දන්නවා, කැමැති වුණත්, අකැමැති වුණත්. අපේ වෙළඳ ශේෂය අඩු කරන්න අපට හුඟක් ආනයන සීමා කරන්න බැහැ. මොකද, අපේ පරිභෝජන සංස්කෘතිය අනුව විවෘත ආර්ථිකය ඇතුළේ තමුන්නාන්සේලා පුරුදු පුහුණු කරපු ජනතාව වැඩිපුරම ආනයන භාණ්ඩ පරිහරණයට පුරුදු වෙලා තිබෙන නිසා. අත්‍යවශ්‍ය බෙහෙත් ටික අපි ගේන්න ඕනෑ, පොහොර ගේන්න ඕනෑ, අතවශ්‍ය උපකරණ ගේන්න ඕනෑ, යන්ත්‍ර සූත්‍ර ගේන්න ඕනෑ. ඒවා අනිවාර්යයෙන්ම වියදම් හැටියට අපට තිබෙනවා. ඒවා වළවක්වන්න බැහැ. හැබැයි, දේශීය නිෂ්පාදනය දියුණු කරන්න ඒ ආනයනය කරන භාණ්ඩවලින්, අමුද්‍රව්‍යවලින් කොච්චර ප්‍රමාණයක් යොදා ගත්තාද කියන එක බැලුවොත්, ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්.

අපේ අපනයන ආර්ථිකය අපි කොච්චර දියුණු කර තිබෙනවාද? ඒ ගැන බැලුවොත් ඉතාම කනගාටුදායක තත්ත්වයක් තිබෙන්නේ. මම එක උදාහරණයක් කියන්නම්. මම මීට කලිනුත් කිව්වා, ලංකාවේ අපනයන ආදායමට දායක වෙච්ච ප්‍රමාණය පිළිබඳව. ඩොලර් බිලියන 10කට දායක වෙලා තිබෙන්නේ, 474යි. මම ඒක තව විස්තාරණය කරලා කියන්නම්, ගරු කථානායකතුමනි. මේ ලේඛනය මම හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 22කට අපනයන ආදායම ඩොලර් බිලියන 15යි. හැබැයි, ඒ අපනයන ආදායමට එක පුද්ගලයකුගේ දායකත්වයේ ප්‍රමාණය ඩොලර් 680යි. ඒ කියන්නේ, එක පුද්ගලයෙක් අපේ අපනයනවලට දායක වෙලා තිබෙන්නේ, ඩොලර් 680කින්. මේක ඉන්දියාවේ ජනගහනයට අනුව බැලුවොත්, එක පුද්ගලයෙකුගේ දායකත්වය -ඉන්දියාවේ ජනගහනය වැඩි නිසා- ඩොලර් 538යි. පාකිස්තානයේ ජනගහනයට අනුව ඩොලර් 118යි. පාකිස්තානයේ ජනගහනය මිලියන 240යි. හැබැයි, සිංගප්පූරුවේ මේ ප්‍රමාණය ඩොලර් 133,722යි. වියට්නාමයේ මේ ප්‍රමාණය ඩොලර් 3,776යි. තායිලන්තයේ මේ ප්‍රමාණය ඩොලර් 4,752යි. එතකොට වෙනස මොකක්ද? සිංගප්පූරුව අපෙන් ආදර්ශ ගත්තේ. සිංගප්පූරුව කොළඹ දිහා බලා ගෙන කිව්වා, "කොළඹ වාගේ සිංගප්පූරුව හදනවා" කියලා. තායිලන්තය වාගේ රටක් ගත්තොත්, අපේ ජනගහනයට වඩා විශාල ජනගහනයක් -මිලියන 71ක්- ඒ රටේ

** කථාව අවසානයේ පළ කර ඇත.*

** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of speech.*

ඉන්නවා. හැබැයි, තායිලන්තය, අපේ සංස්කෘතියත් එක්ක, කෘෂි කර්මාන්තයත් එක්ක බැඳිච්ච රටක්. ඒ රටේ එක පුද්ගලයෙක් අපනයනය කරනවා, ඩොලර් 4,752ක. අපි අපනයනය කරන්නේ, ඩොලර් 680ක. අපි අගය එකතු කර තිබෙන්නේ මොනවාටද? අපි කොහොමද අගය එකතු කර තිබෙන්නේ, අපේ අපනයනවලට? අපේ තේ කර්මාන්තය, කුරුඳු වගාව, ගම්මිරිස්, ඛනිජ සම්පත්, මැණික් කියන ඒවායින් මොනවාටද අගය එකතු කර තිබෙන්නේ? එතකොට විදේශ ශ්‍රමිකයන්ට? ඒත් අගය එකතු කරලා නැහැ. අපේ ශ්‍රමිකයෝ දුප්පත්කම නිසා කොරියාවට, ඊශ්‍රායලයට, යුද්ධය තිබෙන යුක්‍රේනයට ගිහිල්ලා හරි කමක් නැහැ රස්සාවක් හොයා ගන්නවා කියලා මුහුදේ පනිනවා, වෙන උත්තරයක් නැති නිසා. ඒක තමයි තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්තිවල ප්‍රතිඵලය. මේකයි ඇත්ත. මේ ගැන මම වැඩිදුර කථා කරන්නේ නැහැ. මගේම අමාත්‍යාංශය යටතේ තිබෙන ආයතනවලින් මම කියන්නම්.

පුල්මුඩේ ඛනිජ වැලි නිධිය - පුල්මුඩේ තිබෙනවා ඛනිජ වැලි, ඉල්මනයිට්- ගත්තොත්, අදටත් එහි මෙට්‍රික් ටොන් 180,000ක් හිරවෙලා තිබෙනවා. මොකද, රජයට විකුණා ගන්න බැහැ. තමුන්නාන්සේලා ගනුදෙනු කරපු ඒ ව්‍යාපාරිකයා රජයට විරුද්ධව නඩු දාලා තිබෙනවා. ඒ කියන්නේ, තනි ව්‍යාපාරිකයෙක් දෙන්නෙක් හොයා ගන්නවා. ව්‍යාපාරිකයන්ට ඕනෑ විධියට ගිවිසුම් ගහනවා. අන්තිමට රජයේ ආයතනවලට විරුද්ධව ව්‍යාපාරිකයෝ නඩු කියනවා. උසාවියේ stay order එකක් තිබෙනවා, රජයට විරුද්ධව නඩු කියලා. ඒ වාගේම තමයි, පොස්පේට් නිධියත්, Paranthan Chemicals එකත්. "Paranthan Chemicals" කියලා කියනවා. නමුත්, පරන්තන්වල chemicals හදන්නේ නැහැ. රත්මලානේ තමයි office එක තිබෙන්නේ; හොරණ තමයි chemicals ටික හදන්නේ. "Paranthan Chemicals" නොවෙයි, දැන් ඒක "Ratmalana Chemicals" වෙලායි තිබෙන්නේ. දැන් අපට සිද්ධ වෙලා තිබෙනවා, ඒක නැවතත් "Paranthan Chemicals" කරන්න. ඒ වාගේම තමයි, කහටගහ පතල. මම මේ කිව්වේ, ටිකක් විතරයි. අද අපේ රටට ඕනෑ කරන chemicals කොච්චර ප්‍රමාණයක් අපි පිටරටින් ගේනවාද? පොහොර ටිකත් පිටරටින් ගේනවා. හැබැයි, අපට පොස්පේට් ටිකයි, යූරියා ටිකයි හදාගන්න පුළුවන්, Paranthan Chemicals එකයි, එප්පාවල පොස්පේට් නිධියයි හරියට පාවිච්චි කළොත්.

නියෝජ්‍ය මුදල් අමාත්‍ය හර්ෂණ සූරියප්පෙරුම මැතිතුමාත් එක්ක අපි අද සාකච්ඡා කරලා මේ වෙනුවෙන් ඉදිරියේදී කැබිනට් පත්‍රිකාවක් ගේන්න බලාපොරොත්තු වෙනවා, විනිවිදභාවයකින් යුතුව ජාත්‍යන්තර tenders call කරලා මේ ආයතන සඳහා යම් වැඩ පිළිවෙළක් හදන්න. අපේ පොහොර ටික අපි හදාගන්න, අපේ ඛනිජ වැලි ටිකට අපි අගය එකතු කරගන්න කටයුතු කරන්න ඕනෑ. මේවා, විකුණන්න තිබ්බිච්ච ආයතන.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මම ඉක්මනින් කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමනි, මගේ අමාත්‍යාංශය සහ කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ තිබෙනවා, කර්මාන්තපුර - industrial zones - 50ක්. හැබැයි, කරලා තිබෙන්නේ මොකක්ද? ඇමතිවරයා පත්වෙච්ච පැත්තෙන් කවුරුහරි ගන්නවා. තමන්ගේ මන්ත්‍රීවරයෙකු ඉන්න පැත්තට දෙනවා, එකක්. සාමාන්‍යයෙන් අපි පාර්ලිමේන්තුවේදී කථා කරනකොට දන්නවා නේ, "මටත් එකක් දෙන්න" කියලා ඉල්ලන්නේ. ගත්තාට පසුව මොකක්ද කරන්නේ? ඒ zone එකේ ඔක්කොම දානවා. ඒකෙ කන්න බොන්න හදන ඒවාත් තිබෙනවා, මාළු ඇති කරන ඒවාත් තිබෙනවා, ගල් කොරියකුත් තිබෙනවා, ලී බඩු හදන ඒවාත් තිබෙනවා. ඇයි? ඇමතිතුමාගේ යාළුවෝ එනකොට කීය කීය හරි දාලා දෙනවා. "ඔයත් ගන්න, ඔයත් ගන්න" කියලා වෙන්දේසියේ දානවා. එහෙම තමයි දීලා තිබෙන්නේ. කර්මාන්ත පිළිබඳව සැලැස්මක් නැහැ. අවසානයේ පරිසර ප්‍රශ්න ඇවිත් තිබෙනවා. මන්නාරමේ තිබෙනවා -නිටපු ඇමතිතුමාත් දන්නවා- කර්මාන්තපුරයක්. එක ආයෝජකයායි ඉන්නේ.

රුපියල් මිලියන 200ක් වියදම් කරලා බට අත කාර්මික ජනපදයක් හදලා තිබෙනවා, පාරවල් ආදි ඔක්කෝම ඉදි කරලා. නමුත් ආයෝජකයන්ට එතැනට යන්න විධියක් නැහැ. හේතුව මොකක්ද? ඒකට යන්න ප්‍රධාන පාරක් නැහැ. ගමේ මිනිස්සු නඩු දාලා. ඒකට යන්න ප්‍රධාන පාරක් නැහැ. එහෙම සැලැස්මක් නැති ඒවායි හදලා තිබෙන්නේ. දැන් අප බලාපොරොත්තු වන්නේ මොකක්ද? හඳුනා ගත්තු එක කර්මාන්තයකට - industry එකකට - කර්මාන්තපුරයක් බැගින් සැලසුම් කරන්නයි අපි බලාපොරොත්තු වන්නේ. එතකොට මේ ප්‍රශ්නය විසඳන්න අපට පුළුවන්. හැබැයි, ඒකට යම් කාලයක් යනවා. දැන් ආයෝජකයෝ එනවා. ආයෝජකයෝ ඇවිල්ලා අපට කියනවා, අරක කරන්න, මේක කරන්න කියලා. ඔබතුමන්ලා හොයාගෙන ආයෝජකයන් ඇවිල්ලා තිබෙන්නේ එහෙමයි කියලා අපට දැන් තේරෙනවා. ආයෝජකයෝ එනවා, ආයෝජකයන් ආවාම ඒ ආයෝජකයන්ගෙන් කීයක් හරි අරගෙන ඉඩම් කැබැල්ලක් දෙනවා. එහෙමයි කරලා තිබෙන්නේ. ඒ ප්‍රතිපත්තිය අපට නැහැ. ඒ ප්‍රතිපත්තිය අපට කොහෙත්ම නැහැ.

ඒ වාගේම තමයි, සීනි කර්මාන්තශාලා ගත්තත්. මා හැමදාම කියනවා වාගේ ලංකාවට විතරක් නොවෙයි, ආසියාවටම සීනි දෙන්න පුළුවන් සීනි කර්මාන්තශාලා තිබෙනවා. දැන් ඒවා ඔක්කෝම යාළුවෝ අරගෙනයි තිබෙන්නේ. සීනි මිල දී ගන්නා කෙනා තමන් ගන්නා සීනි තොග ගෙන යන්නේත් නැහැ. ඒ stock එක තියා ගන්නවා සෙවනගලම, පැල්වත්තේම. ඒ අය දැන් අපේ stores ම පාවිච්චි කරනවා. සීනි තොග මිල දී ගත්තාට ටික ටික තමයි ඒවා නිදහස් කර ගන්නේ. එහෙම ක්‍රමවේදයක් තමයි මෙච්චර කාලයක් හදාගෙන තිබෙන්නේ. ඒ ආයතන අන්ත දුෂිත තැන් බවට පත් වෙලා තිබෙනවා. සීනි වාගේම තමයි අනෙක් හැම දෙයක්ම. සිමෙන්ති කම්හල් ගත්තත් එහෙමයි. සිමෙන්ති කම්හල් ඔක්කෝම පාවිච්චි කරන්නේ, ලංකාවට සිමෙන්ති ගෙනෙන කට්ටිය. ඔබතුමන්ලා විශ්වාස කරන්න, ඒ කාලයේ නිටපු අපේ නායකයෝ කන්කසන්තුරේ සිමෙන්ති කම්හල හදලා තිබෙන්නේ, ලංකාවට සිමෙන්ති හදන්න විතරක් නොවෙයි, පිට රටවලටත් යවන්න -අපනයනය කරන්න. කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ අද මෙගාවොට් 32ක විදුලි බලාගාරයකුත් තිබෙනවා, උතුර පළාතට විදුලිය දෙන්න. එහෙම තමයි හදලා තිබෙන්නේ. හැබැයි, එහෙම හදපු ඒවා තමයි ඔබතුමන්ලා තුට්ටු දෙකට විකුණන්න සැලසුම් කළේ. ඒකට ඇඳා ගත්තා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල. ඔබතුමන්ලා හැමදාම ලොකුවට කිව්වේ, "ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන නිසා අපට වෙන කරන්න දෙයක් නැහැ" කියලායි. හැබැයි, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ පීටර් බෲවර් ඇතුළු කණ්ඩායම තුන්හතර වතාවක් හමු වුණා. ඒ ගොල්ලන්ව හමු වුණු මෙහි දැන් ඉන්න ඇමතිවරු මේ කාරණය දන්නවා. අප ඒ ගොල්ලන්ගෙන් ඇහුවාම ඒ ගොල්ලන් කිව්වේ මොකක්ද? ඒ ගොල්ලන් කිව්වේ, "ඔයගොල්ලන්ට අපි යෝජනා කරන්නේ නැහැ, විකුණන්න කියලා. ඔයගොල්ලන්ගේ ආණ්ඩුව තමයි අපට යෝජනා කරන්නේ, විකුණන්න කියලා. අපි යෝජනා කරන්නේ ආදායම වැඩි කර ගන්න කියලා" යනුවෙන්. ආදායම වැඩි කර ගැනීමේ එකම ක්‍රමය විකිණීම කියලා කිව්වේ කවුද? ආදායම වැඩි කර ගැනීමේ එකම ක්‍රමය විකිණීම කියලා කිව්වේ ඔබතුමන්ලා

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

කියලායි ඒ ගොල්ලෝ කියන්නේ. නමුත් ඔබතුමන්ලා හැමදාම රටට ඒත්තු ගැන්වූයේ මොකක්ද? ඔබතුමන්ලා හැමදාම රටට ඒත්තු ගැන්වූයේ, "විකිණීම හැර වෙන මහක් නැත" කියලායි; "විකිණීම ගැන තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල අපට කියන්නේ. එහෙම නොකළොත් ඒ ගොල්ලෝ තරහා වෙලා යනවා. ඒ ගොල්ලෝ යන නිසා අපට වෙන කරන්න දෙයක් නැහැ. ඒ ගොල්ලෝ තියා ගන්න අපට විකුණන්න වෙනවා" කියලායි. නමුත් ඒක ඇත්ත කථාව නොවෙයි. එහෙම කියලා මෙච්චර කාලයක් මේ රටත්, ජනතාවත් නොමඟ යැව්වා. ඒකෙන් මම කියන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හරි, ඒ අය සුජාතභාවයකින් මැදිහත් වෙනවා කියලා නොවෙයි. ඒ ගොල්ලන්ට ඒ ගොල්ලන්ගේ න්‍යාය පත්‍ර ඇති. තමන්ගේ න්‍යාය පත්‍ර නැතුව නොවෙයි ඒ ගොල්ලෝ එන්නේ. හැබැයි ඒ මොන න්‍යාය පත්‍ර තිබුණත් රටේ ජාතික ආර්ථිකයේ උන්නතිය වෙනුවෙන් ඒවා සකස් කර ගැනීමේ වගකීම අපට තිබෙනවා; ඒවා පෙළ ගස්වා ගැනීමේ වගකීම අපට තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි සහතික වෙනවා, මේ රට අසරණ කරන්නේ නැතුව අප බලාපොරොත්තු වන, රටේ ජනතාව බලාපොරොත්තු වන පුනරුදය යුගය කරා මේ රට ගෙන යනවා කියලා. ඒ සඳහා අපට අවස්ථාවක් දෙන්න කියලා මේ රටේ ජනතාවගෙන් මා ඉල්ලා සිටිනවා. ඔබ හැම දෙනාට බෙහෙවින් ස්තුතියි.

**සභාමේසය මත තබන ලද ලියවිල්ල :*
සභාපීඨයේ තබන ලද ලිඛිත ප්‍රකාශය:
Document tabled:

	Population Mn	Exports US$ Bn	Exports per Capita US$
Sri Lanka	22	15.1	680
India	1428	769	538.66
Pakistan	240	28	118.46
Bangladesh	172	62	359.44
Singapore	6	804	133,722.22
Vietnam	98	373	3776.85
Thailand	71	341	4752.34

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. Gnanamuththu Srineshan. You have nine minutes.

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිබරකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [මාණ්පුමිකු (ව෈ත්තිය කලානිධි) ෆිස්වි සාලි] තලෙමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.

[மு.ப. 11.28]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அண்மையில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் தனது கொள்கை விளக்க உரையை இச்சபையில் நிகழ்த்தியிருந்தார். தற்பொழுது அது தொடர்பான விடயங்கள் இச்சபையில் விமர்சனத்துக்கு உட்பட்டுக்கொண்டு இருக்கின்றது.

இலங்கையின் வரலாற்றை எடுத்துக்கொண்டாலும் சரி, பாராளுமன்ற வரலாற்றை எடுத்துக்கொண்டாலும் சரி, ஒவ்வொரு கட்சியினருக்கும் பிரச்சினைகளைத் தீர்ப்பதற்கான சந்தர்ப்பங்களை மக்கள் அளித்திருந்தார்கள். குறிப்பாக, ஐக்கிய தேசியக் கட்சி, ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி, ஸ்ரீ லங்கா பொதுஜன பெரமுன போன்ற கட்சிகளுக்கு மக்கள் அவ்வப்போது பாராளுமன்றத்தினூடாகச் சந்தர்ப்பங்களை வழங்கியிருந்தார்கள். அவ்வாறு வழங்கப்பட்ட எந்தச் சந்தர்ப்பமும் முறையாகப் பயன்படுத்தப்படவுமில்லை; பிரச்சினைகள் தீர்க்கப்படவுமில்லை. அதன் விளைவாக, அன்று இப்பாராளுமன்றத்தில் அசுரப் பெரும்பான்மையோடு இருந்த பல கட்சிகள் இன்று 3, 4, 5 ஆசனங்களுக்குள் சுருங்கி, எதிர்க்கட்சி வரிசையில் அமரவேண்டி ஏற்பட்டிருக்கிறது.

1977ஆம் ஆண்டு இடம்பெற்ற பொதுத் தேர்தலில் வெற்றிபெற்ற ஜே.ஆர். ஜயவர்த்தன அவர்களுடைய கட்சி பாராளுமன்றத்தில் 168 ஆசனங்களில் 140 ஆசனங்களைக் கைப்பற்றி, 5/6 பெரும்பான்மையைப் பெற்றிருந்தார். அவர் இந்த நாட்டில் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினைக்குத் தீர்வு காணவில்லை. அவரும் சாதாரண ஓர் அரசியல்வாதியாக இருந்துவிட்டுச் சென்றுவிட்டார். அதேபோல், 1994ஆம் ஆண்டு சந்திரிக்கா பண்டாரநாயக்க குமாரதுங்க அவர்களுக்கு ஒரு சந்தர்ப்பம் வழங்கப்பட்டது.

அவருக்கு ஏறத்தாழ 62.28 சதவீதமான வாக்குகளை மக்கள் வழங்கி, தேசிய இனப் பிரச்சினையையும் தேசிய ரீதியிலான பிரச்சினைகளையும் தீர்ப்பதற்கு ஒரு வாய்ப்பளிக்கப்பட்டது. ஆனால், அவரும் அந்தச் சந்தர்ப்பத்தைத் தவறவிட்டிருந்தார். துரதிருஷ்டவசமாக அவரது கட்சிக்குப் பாராளுமன்றத்தில் கிடைத்த ஆசனங்கள் 105 மட்டுமே ஆகும். அடுத்த கட்டமாக, 2015ஆம் ஆண்டு மைத்திரிபால சிறிசேன அவர்களுக்கும் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் வாய்ப்பளிக்கப்பட்டது. அவர்களும் அதைத் தவறவிட்டிருக்கின்றார்கள். சுருக்கமாகச் சொல்லப்போனால், இந்த நாட்டின் பிரதான கட்சிகளாகக் கருதப்படுகின்ற ஐக்கிய தேசிய கட்சி, ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சி அடுத்ததாக வந்த ஸ்ரீ லங்கா பொதுஜன பெரமுன போன்ற கட்சிகளுக்கு வாய்ப்புகள் அளிக்கப்பட்டபோதும், அவர்கள் அதைப் பயன்படுத்திக்கொள்ளவில்லை; சரித்திரத்தில் பெயர் குறிப்பிட்டுச் சொல்லுமளவிற்கு எவரும் எதனையும் சாதிக்கவில்லை.

ஆனால், இந்த ஆண்டு இடதுசாரி கட்சியான தேசிய மக்கள் சக்திக்கு ஒரு சந்தர்ப்பம் கிடைத்திருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்களை பெரும்பாலானவர்கள் தெரிவு செய்திருக்கின்றார்கள். அந்தக் கட்சி மக்கள் அளித்த வாக்குகளினால் இந்த பாராளுமன்றத்தில் 159 ஆசனங்களைக் கைப்பற்றி இருக்கின்றது. மாண்புமிகு சனாதிபதி அவர்கள் குறிப்பிட்டதுபோல, வடக்கு, கிழக்கு, தெற்கு, மேற்கு என்ற பேதமில்லாமல் எல்லா மக்களும் அவர்களுக்கு வாக்களித்

திருக்கின்றார்கள். இந்தச் சந்தர்ப்பத்தை தேசிய மக்கள் சக்தியினரும் ஜனாதிபதியும் எவ்வாறு பயன்படுத்தப் போகின்றார்கள் என்பதை உள்நாட்டிலும் வெளிநாடுகளிலும் உள்ள மக்கள் உன்னிப்பாகப் பார்த்துக் கொண்டிருக் கின்றார்கள். நான் சொல்லப்போகும் விடயம் என்ன வென்றால், பச்சைக் கட்சி, நீலக் கட்சி என்பன தமது காலத்தில் எதனையும் சாதிக்கவில்லை. ஆனால், பல துன்பங்களையும் கஷ்டங்களையும் அனுபவித்த சிவப்புக் கட்சியான இடதுசாரி கட்சிக்கு இம்முறை மக்களின் துன்பங்களைத் தீர்ப்பதற்கு நல்ல சந்தர்ப்பம் கிடைத்திருக்கின்றது. எனவே, எதிர்வரும் ஐந்து ஆண்டுகளில் இந்தச் சந்தர்ப்பத்தை முறையாகப் பயன்படுத்திக் கொண்டால், வரலாற்றில் - சரித்திரத்தில் - அவர்களுடைய பெயர் நிலைத்திருக்கும் என்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதற்கு முன்பு நான் அவர்களுக்கு வாழ்த்துகளைத் தெரிவித்துக் கொள்கிறேன். இங்கே இன்னுமொரு விடயத்தைச் சொல்ல மறந்துவிட்டேன். மட்டக்களப்பு மாவட்டத்தில் குறிப்பாக கல்குடா, பட்டிருப்பு, மட்டக்களப்பு ஆகிய தேர்தல் தொகுதிகளிலிருந்து எனக்கு வாக்களித்து என்னைத் தெரிவுசெய்த அன்பர்கள், ஆதரவாளர்கள் அனைவருக்கும் இந்த இடத்தில் நன்றியையும் பாராட்டையும் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது நாட்டின் மாண்புமிகு சனாதிபதி அவர்கள் வித்தியாசமானவர்; எளிமையாக நடந்துகொள்ளக்கூடியவர். தன்னுடைய வெற்றியை ஆடம்பரமாகக் கொள்ளாதவர். கொண்டாட்டங்கள் மூலமாக திண்டாட்டங்களை மக்களுக்கு விளைவிக்காத ஒருவரே இன்று ஆட்சிபீடம் ஏறியிருக்கின்றார். அவருடைய செயற்பாடுகள் மிகவும் எளிமையாகவும் அர்ப்பணிப்போடும் காணப்படுகின்றன. உண்மையில் இந்தச் செயற்பாடுகள்மூலம் மக்களுக்கு பயன் கிடைக்க வேண்டும். அவருடைய கொள்கைப் பிரகடன உரையை நான் முழுமையாக வாசித்துப் பார்த்தேன். இந்த இடத்தில் அனைத்து விடயங்களையும் விளக்கமாகக் கூற முடியாது. இருந்தாலும், குறிப்பிட்ட சில விடயங்களைச் சொல்ல முடியும். இனி அரசியலில் இனவாதம், மதவாதம், அடிப்படைவாதம் இருக்காது. அடிப்படைவாதத்தைப் பயன்படுத்துபவர்களுக்கு இங்கு அனுமதியளிக்கப்படாதென்ற கருத்தை அவர் குறிப்பிட்டு இருந்தார். அதேபோன்று, சுகாதாரம் மற்றும் வெகுசன ஊடக அமைச்சரும் அமைச்சரவைப் பேச்சாளருமான கௌரவ (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ அவர்களும் இனவாதம், மதவாதத்திற்கு இனி இடமில்லை என்று கூறியிருந்தார். நாம் அதை வரவேற்கின்றோம்; பாராட்டு கின்றோம். இங்கு இன்னுமொரு விடயத்தையும் சுட்டிக்காட்ட வேண்டும். அதாவது, மாண்புமிகு ஜனாதிபதி அவர்கள் சட்டவாட்சியைப் பலப்படுத்த வேண்டுமென்று கூறியிருக்கின்றார். சட்டவாட்சி பலவீனமாக இருப்பதை அவர் உணர்த்திருக்கின்றார். சட்டவாட்சி பலவீனமாக இருந்த காரணத்தால் பல குற்றச் செயல்கள் இங்கு நடைபெற்றிருக் கின்றன. 'ஈஸ்டர்' குண்டுத்தாக்குதல்கூட அந்தச் சட்டவாட்சியின் பலவீனத்தினால் ஏற்பட்ட ஒன்றாகும்.

அடுத்து, மஹிந்த ராஜபக்ஷ அவர்கள் ஆட்சி செய்த 2005 - 2015இற்கும் இடைப்பட்ட காலத்தில் நடைபெற்ற படுகொலைகளைப் பற்றிச் சொல்வதாக இருந்தால், இன்றைய நாள் போதாது. அந்தக் காலத்தில் நாற்பதுக்கும் மேற்பட்ட ஊடகவியலாளர்கள் படுகொலை செய்யப்பட்டிருந்தார்கள். அது மாத்திரமல்லாமல், எமது தமிழ்த் தேசியக் கூட்டமைப்பை அழிப்பதற்காக எமது கட்சியின் சிரேஷ்ட தலைவரான யோசப் பரராஜசிங்கம் ஐயா அவர்கள் படுகொலை செய்யப்பட்டார். 'மாமனிதன்' என்று பாராட்டக்கூடிய ரவிராஜ் அவர்கள் கொழும்பில் வைத்து படுகொலை செய்யப்பட்டிருந்தார். அம்பாறை மாவட்டத்தின் முன்னாள் பாராளுமன்ற உறுப்பினரும் எனக்கு அண்மையில் அமர்ந்திருக்கும் கோடீஸ்வரன் அவர்களின் பெரியப்பாவுமான சந்திரநேரு அவர்கள் படுகொலை செய்யப்பட்டிருந்தார்.

அதுமட்டுமல்லாமல், வன்னியில் சிவநேசன் அவர்கள் படுகொலை செய்யப்பட்டிருந்தார். இலங்கையில் போற்றக் கூடிய ஒரு கல்வியாளரும் கிழக்குப் பல்கலைக் கழகத்தின் உபவேந்தராகவும் இருந்த பேராசிரியர் ரவீந்திரநாத் அவர்கள் கடத்திச் செல்லப்பட்டு படுகொலை செய்யப்பட்டிருந்தார். அதுமட்டுமல்ல, ஆய்வு ரீதியாக ஊடக விடயங்களைத் தரக்கூடிய சிவராம் அவர்கள் படுகொலை செய்யப்பட்டிருந்தார்; நடேசன் அவர்கள் படுகொலை செய்யப்பட்டிருந்தார்; சிரேஷ்ட விரிவுரையாளர் தம்பையா அவர்கள் படுகொலை செய்யப்பட்டிருந்தார். இவ்வாறு எக்னெலிகொட அவர்கள், லசந்த விக்கிரமதுங்க அவர்கள் போன்றோரும் படுகொலை செய்யப்பட்டிருந்தார்கள். சட்டம், சட்டவாட்சி என்பன பலவீனமாக இருந்ததன் காரணமாக இவை அனைத்தும் நடைபெற்றன. ஆனால், இவற்றுடன் சம்பந்தப்பட்ட குற்றவாளிகள் இதுவரை கைதுசெய்யப் படவில்லை. இவ்வாறான நிலையில், இந்த நாட்டில் ஜனநாயகம் இருக்கின்றதா? என்ற கேள்வி காணப்பட்டது. சுருக்கமாகச் சொல்லப்போனால், 'பண நாயகம்' நாட்டை ஆட்சி செய்தது; வீதிகளெல்லாம் பிணங்கள் குவிந்து காணப்பட்டன. எனவே நான் சொல்ல வருகின்ற விடயம் என்னவென்றால், பாரிய குற்றங்களை இழைத்துவிட்டு கௌரவர்களாக, தண்டிக்கப்படாதவர்களாக உலாவிவந்த அந்தக் குற்றவாளிகள் இந்த ஆட்சியில் சட்டத்தின் முன்னிலையில் நிறுத்தப்பட வேண்டும். அவர்களுக்கு முறையான தண்டனைகள் வழங்கப்படுவதன் மூலமாக சட்டவாட்சியைப் பலப்படுத்த வேண்டுமென்று நான் இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

அதேவேளை, குற்றங்களைப் புரிந்தவர்கள் ஒரு காலத்தில் இந்தப் பாராளுமன்றத்தைக்கூட அலங்கரித்துச் சென்றதை எங்களால் அவதானிக்கக்கூடியதாக இருந்தது. 'ஈஸ்டர்' குண்டுத் தாக்குதல் என்பது அப்பாவி மக்களைப் படுகொலை செய்த செயற்பாடாக அமைந்திருந்ததை நாங்கள் அறிவோம். அதுசம்பந்தமாக அஸாத் மௌலானா என்பவர் மிகவும் விபரமாக பல சாட்சியங்களைக் கூறியிருக்கின்றார். அந்தச் சாட்சியங்கள் கருத்திற்கொள்ளப்பட வேண்டும். அது சரியாக ஆராயப்படுமாகவிருந்தால், இந்தக் கொலைக் குற்றவாளிகள் அல்லது குண்டுத் தாக்குதலுக்குரிய சூத்திரதாரிகள் யார் என்பதை நாம் கண்டுகொள்ளமுடியும். சட்டவாட்சி என்று நாம் சொல்லுகின்றோம். எனவே, அந்த விடயங்களைக் கண்டறிந்து குற்றவாளிகளைச் சட்டத்தின் முன்னிலையில் கொண்டுவந்து அவர்களுக்கு உரிய தண்டனைகளைப் பெற்றுக்கொடுக்க வேண்டும்.

இன்னுமொரு விடயத்தை இச்சந்தர்ப்பத்தில் குறிப்பிட விரும்புகின்றேன். மயிலத்தமடு, மாதவனை போன்ற பிரதேசங்களில் அத்துமீறிய குடியேற்றம் காணப்படுகின்றது. மாவட்டம் கடந்து அவர்கள் குடியேறியிருக்கின்றார்கள். ஆனால் அந்த விடயம் சம்பந்தமாக நீதிமன்றம் 3 தடவை தீர்ப்பளித்திருக்கின்றது. அதாவது, அத்துமீறிக் குடியேறியவர்களை - அந்தக் காணிகளை அபகரித்து, பண்ணையாளர்களை நடுத்தெருவில் விட்டவர்களை, அவர்களுடைய வாழ்வாதாரத்தை அழித்தவர்களை - வெளியேற்றுமாறு 3 தடவை நீதிமன்றம் தீர்ப்பளித்திருக் கின்றது. ஆனால், கடந்த ஆட்சியாளர்கள் கிஞ்சித்தும்கூட

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

අන්ත විඩයත්තිල් නඩවඩික්කෙ එඩුක්කවිල්ලෙ. ආකවේ, මයිලත්තමඩු, මාතවනෙයිල් කාණප්පඩුකින්ර ඉන්තච් චෙයර්පාඩුකළ් තොඩර්පාක නඩවඩික්කෙයෙඩුක්ක වේණ්ඩු මෙන්රු කේට්ඩුක්කොළ්ළ විරුම්පුකින්රේන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gnanamuththu Srineshan, your time is up.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuththu Srineshan)
Sir, please give me one more minute.

මාණ්පුමිකු චනාතිපති අවර්කළ් මුර්පෝක්කාන පල විඩයඞ්කළෛප් පර්රික් කූරිනාර්. ආනාල්, තේචිය ඉනප් පිරච්චිනෛ චම්පන්තමාකවෝ, අතන් තීර්වු චම්පන්තමාකවෝ කූරාමෛ, මත විවකාරම් එන්කින්ර විඩයත්තිර්කු ඔරු පොතුවාන අමෛච්චෛ එර්පඩුත්ති චකල මතඞ්කළෛයුම් චමත්තුවමාක අවතානික්කක්කූඩිය ඔරු නිලෛමෛයෛ එර්පඩුත්තාමෛ එඞ්කළුක්කු එමාර්රත්තෛත් තරුවතාක අමෛන්තිරුක්කින්රතු.

අතේවේළෛ, ඉන්නුමොරු විඩයත්තෛයුම් චුට්ටික්කාට්ට වේණ්ඩුම්. උඞ්කළුක්කුත් තෙරියුම්, මරණිත්තවර්කළෛ නිනෛවුකූරක්කූඩිය උරිමෛ ඉරුක්කින්රතු එන්රු චනාතිපති අවර්කළ් අණ්මෛයිල් කුරිප්පිට්ටිරුන්තාර්. අතනෛ වරවේර්කින්රෝම්. ආනාල්, කොක්කට්ටිච්චෝලෛයෛච් චේර්න්ත නාරායණන් එන්පවර් පෝරාට්ටත්තින්පෝතු උයිරිෆන්ත තනතු තඞ්කෛයෛ නිනෛවු කූර්න්තතර්කාක අවරෛ පයඞ්කරවාතත් තටුප්පුප් පිරිවු කුර්රප්පුලනාය්වු අතිකාරිකළ් 4ආම් මාටික්කු අෆෛත්තිරුක්කින්රාර්කළ්. නාන් ඔන්රෛච් චොල්ල විරුම්පුකින්රේන්. අතාවතු, අරචාඞ්කම් චිලවේළෛකළිල් නල්ලතෛච් චෙය්ය නිනෛත්තාලුම්, චිල අතිකාරිකළ් ඉන්ත අරචාඞ්කත්තිර්කු මාචු එර්පඩුත්තක්කූඩිය විතත්තිල් අල්ලතු කරිපූචක්කූඩිය විතත්තිල් චිල චෙයර්පාඩුකළෛච් චෙය්කින්රාර්කළෝ එන්ර චන්තේකම් එමක්කු ඉරුක්කින්රතු. එනවේ, අප්පාවි මක්කළෛ අච්චුරුත්තුකින්ර චෙයර්පාඩුකළ් මුටිවුක්කුක් කොණ්ඩුවරප්පඩ වේණ්ඩුම්.

ඉන්නුමොරු විඩයත්තෛයුම් චොල්ලියාක වේණ්ඩුම්. 1986ආම් ආණ්ඩු කාලප්පකුතියිල් මට්ටක්කළප්පු විමාන නිලෛයත්තිර්කු අරුකාමෛයිල් ඉරුන්ත පාතෛ අටෛපට්ටුවිට්ටතු. අන්රෛය කාලම් යුත්ත කාලමාක ඉරුන්තතු. ඉන්රු යුත්තම් මුටින්තු 15 ආණ්ඩුකළ් කටන්තිරුක්කින්රතු. අන්තප් පාතෛ ඉන්නුම් තිරක්කප්පටවිල්ලෛ. අන්තප් පාතෛ මූඩප්පට්ටතන් කාරණමාක මක්කළ් 8 වළෛවුකළෛච් චන්තිත්තුප් පයණික්ක වේණ්ඩිය තුර්ප්පාක්කිය නිලෛ කාණප්පඩුකින්රතු. අන්තප් පාතෛයෛත් තිරප්පතන් මූලමාක මක්කළ් පයනටෛවතර්කු වාය්ප්පළික්ක වේණ්ඩුම්. මට්ටක්කළප්පිල් විමාන නිලෛයත්තිර්කුප් පක්කමාක ඉරුක්කුම් පොතු වීති මූඩප්පට්ටුක් කාණප්පඩුවතාල් මක්කළ් පාරිය කෂ්ටඞ්කළෛ අනුපවිත්තුක් කොණ්ඩිරුක්කිරාර්කළ් එන්ර විඩයත්තෛයුම් ඉන්ත චපෛයින් කවනත්තිර්කු නාන් තරුකින්රේන්.

අතුමට්ටුමල්ලාමල්, ඉන්නුමොරු විඩයත්තෛච් චොල්ලියාක වේණ්ඩුම්. අණ්මෛයිල් එර්පට්ට වෙළ්ළත්තින් කාරණමාක විවචායිකළ්, මීනවර්කළ්, ඉරාල් වළර්ප්පාළර්කළ්, අප්පාවික් කූලිත්තොෆිලාළර්කළ් පෝන්රෝර් අතිකමාකප් පාතික්කප්පට්ටිරුක්කිරාර්කළ්. අවර්කළ් පෝක්කුවරත්තුච් චෙය්කින්ර පාතෛකළ්, පාලඞ්කළ් කූඩ උටෛන්තු කාණප්පඩුකින්රන. එනවේ, ඉවර්රුක්කු ඔරු පරිකාරම් චෙය්ය වේණ්ඩුම්. මක්කළින් වාෆ්ක්කෛයෛච් චුට්ටියෙෆුප්පුවතර්කු උතව වේණ්ඩුම් එන්රු කූරික්කොණ්ඩු, එනතු උරෛයෛ නිරෛවු චෙය්කින්රේන්. නන්රි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Najith Indika. You have 14 minutes.

[පූ.භා. 11.41]

ගරු නජිත් ඉන්දික මහතා
(மாண்புமிகு நஜித் இந்திக்க)
(The Hon. Najith Indika)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මම සූදානම් වෙලා ආව කථාව කරන්න කලින්, විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් කියපු කාරණයක් ගැන කථා කරලා ඉන්නම්. ඊයේ සහ පෙරේදා දවස් දෙකේම දිගින් දිගටම මේ කාරණය කථා කළා; උත්තර දුන්නා. ඒ තමයි ජාතික ජන බලවේගය විසින් සමාජ වෛරය වැපිරුවා කියන කථාව. ඒකට අපි ඊයේත් උත්තර දුන්නා. ජාතික ජන බලවේගය සහ විපක්ෂය මැතිවරණ campaign එක කරද්දී සමාජ වෛරයක් වැපිරුවේ කවුද කියන එකට උත්තර දුන්නා. ඉතා පැහැදිලිව සමාජ වෛරයක් වැපිරුවා කියලා ඒ අය හඳුන්වලා දුන්නේ අවුරුදු 76ක පාලනය ගැන, මේ රටේ ආර්ථිකය කඩා වැටිටවීම ගැන අපි ඉදිරිපත් කළ අදහස. අවුරුදු 76ක පාලනය ගැන, ආර්ථිකය කඩා වැටිටවීම ගැන අපි කියන අදහස සමාජ වෛරය වැපිරවීමක් නොවෙයි, ඒ මේ රටේ ආර්ථිකයට වෙච්ච දේ කියපු හැටි. ඇත්තටම සමාජ වෛරයක් වැපිරුවේ ඒ ගොල්ල. ඒ රැස්වීම් දිහා බැලුවොත් පේනවා ඒ කියපු දේවල්. "අපි දිනුවොත් ලේ වැගිරීම් වෙනවා, පහුවදා රට ලේ විලක් වෙනවා, ආගම් නැති වෙනවා, පේය නැති වෙනවා, කයින නැති වෙනවා, පෙරහැර නැති වෙනවා, මුස්ලිම් අයට රැවුල කපන්න වෙනවා" කිව්වා. ඕවා තමයි සමාජ වෛරය. එම නිසා නැවතත් ඉල්ලනවා ඒ බොඳ කිරීම කරන්න එපා කියලා. තමන් කරපු දේවලට වග කියන්න ඕනෑ. අපි කරපු දේවලට අපි වග කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දවස් දෙකේ මේ සාකච්ඡාවේදී විශේෂයෙන්ම කථා වුණේ, වැඩිහරියක්ම විපක්ෂයෙන් අපට චෝදනා එල්ල වුණේ රනිල් ගිය පාරේම යනවා කියලා. ඒ හින්දා මගේ කථාව යොමු කරන්නේ ඒකට. ඇත්තටම රනිල් ගිය පාර මොකක්ද කියන එකට. රනිල් වික්‍රමසිංහ මහත්මයා එතුමාගේ දේශපාලනයේ ගිය පාර මොකක්ද කියන එකට. ඒක කිව්වාට පස්සේ තමයි අපි යන්නේ මොන පාරේද කියලා පැහැදිලි වෙන්නේ.

විශේෂයෙන්ම රනිල් වික්‍රමසිංහ ආණ්ඩු කරපු කාල 4ක් අපට හඳුනා ගන්න පුළුවන්. පළමුවෙනි එක, තමයි 1977න් පටන් අරගෙන 1994 වෙනකම් කාලය, ජේ.ආර්. - ප්‍රේමදාස යුගය. දෙවෙනි එක, 2001 ඉඳලා 2003 වෙනකම් කෙටි කාලයකට කරපු ආණ්ඩුව, අගමැති වශයෙන්. තුන්වෙනි එක, 2015 සිට 2019 දක්වා යහ පාලන ආණ්ඩුවේ අගමැති වශයෙන් කටයුතු කරපු කාලය. හතරවෙනි එක තමයි, පසුගිය අවුරුදු දෙක -2022 ජූලි මාසයේ පටන් අරගෙන පසුගිය සැප්තැම්බර් 21වෙනි දා පරාජය වෙනකම්- ජනාධිපති වශයෙන් කටයුතු කරපු කාලය.

මේ කාල හතරෙන් පළමුවෙනි එකෙන් මම ආරම්භ කරන්නම්. රනිල් ගිය පාර මොකක්ද කියලා මතක් කර ගන්න අවශ්‍ය නම්, එතුමාගේ මාමා 1977 ඡන්දය දිනුවාට පස්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා මුලින්ම විදේශ කටයුතු නියෝජ්‍ය ඇමති, තරුණ කටයුතු ඇමති, ඊළඟට 1980 වෙද්දී අධ්‍යාපන ඇමති, ඊළඟට 1989 වෙද්දී එතුමා කර්මාන්ත ඇමති විධියට කටයුතු කරනවා. මීට කලින් අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කර්මාන්ත ඇමතිලාගේ නම් ලැයිස්තුවක් කිව්වා. කර්මාන්ත ඇමතිලාගේ නම් ලැයිස්තුව කියලා 1977න් එහාට කියන්නේ නැහැ කියලාත් කිව්වා. නමුත්, ඊට කලින් හිටපු පිලිප් ගුණවර්ධන, ටී.බී. සුබසිංහ, වින්සන්ට් සුබසිංහලාගේ නම් කිව්වා. එහෙම බලනකොට රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එක කර්මාන්ත ඇමති කෙනෙක්. 1977න් පස්සේ පළමුවෙනි කර්මාන්ත ඇමති වෙන්නේ සිරිල් මැතිව් මහත්මයා. ඊළඟට, ඩෙන්සිල් ප්‍රනාන්දු මහත්මයා, 1989දී රනිල් වික්‍රමසිංහ මහත්මයා.

මේක මට කියන්න ඕනෑ වුණේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා 1989දී කර්මාන්ත ඇමති වෙලා කළේ මොකක්ද, ඒ ගිය පාර මොකක්ද කියන එක කියන්නයි. ඒක 2022දී ගිය පාරට වඩා වෙනස් එකක් නොවෙයි. ටී.බී. සුබසිංහ 1975 ආණ්ඩුවේ කර්මාන්ත ඇමති විධියට ඉන්නකොට ලංකාවේ පළමුවෙනි පොහොර කම්හල පටන් ගන්නවා. ඒ පළමුවෙනි සහ අවසාන එක, දැනට. ඒක පටන් ගන්නේ මහවැලි ව්‍යාපෘතියට පමණක් දෙවෙනි ආයෝජනය විධියට, ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර යටතේ. ඒක පටන් අරගෙන වසර 4කින්, වැඩ කටයුතු කරගෙන යනකොට ඒ ආණ්ඩුව පෙරළිලා. ජේ.ආර්. ජයවර්ධන, රනිල් වික්‍රමසිංහ ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂ රජය බලයට ඇවිල්ලා. ඒ පොහොර නිෂ්පාදනය ආරම්භ කළත්, ඒ මොහොතේ ලෝක වෙළෙඳ පොළේ තිබුණු තත්ත්වයත් එක්ක ඒකේ cost එක වැඩියි, පිට රටින් ගෙන්වනවාට වඩා පාඩුයි. ඒ නිසා ඒකට මොකක්ද කරන්නේ කියන සංවාදයේ දී ආසියානු සංවර්ධන බැංකුවෙන්ම - ඒකට ප්‍රධාන මූල්‍ය දායකත්වය ලබා දුන් අය - උපදෙස් දුන්නා, පොහොර කම්හල වසර 5ක් වැනි කාලයකට වසා තබන්න, එතකොට ලෝක වෙළෙඳ පොළේ තත්ත්වය හරි ගිහින් තියේවි, ඊට පසුව නැවත නිෂ්පාදන කටයුතු ආරම්භ කරන්න පුළුවන් කියලා. මේකේ අරමුණ වෙන්නේ ලංකාවේ කෘෂිකාර්මික ආර්ථිකයක් පදනම් වෙලා තිබෙන තත්ත්වයක් තුළ දිගටම පිට රටින් පොහොර ගෙන්වීම සඳහා විදේශ විනිමය විධියට වැය වන මුදල අවම කිරීමයි. නමුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කරන්නේ එය වසා දැමීමයි. හැබැයි, මතක් කළ යුතු දෙයක් තිබෙනවා. 1987දී කර්මාන්ත ඇමති විධියට වැඩ භාර ගෙන රනිල් වික්‍රමසිංහ කළ පළමු වැනි වැඩේ තමයි සපුගස්කන්දේ හදලා වසා දමා තිබුණු යූරියා කර්මාන්තශාලාව ඇවර කිරීම. එහෙම තමයි ඔහු කර්මාන්ත සහ ආර්ථිකය සම්බන්ධව වැඩ පටන් ගත්තේ. ඒ, 1987. ඒක තමයි රනිල් ගිය පාර.

ඒක ඇවර කළේ නිකම් නොවෙයි. මම ඒ සම්බන්ධව උපුටා දැක්වීමක් කරන්නම්. "බටලන්දට ගිනි තැබුවෙමු" කියන්නේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී නන්දන වීරරත්න මහත්මයා විසින් රචිත පොතක්. එතුමාත් පසුගිය කාලයේ තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී ගැටලු නිසා ස්වයං පිටුවහලට ලක්වෙලා සිටි කෙනෙක්. දැන් ලංකාවට ඇවිත් ඉන්නවා. මේ පොතේ එක පරිච්ඡේදයක ඔහු පැහැදිලි කරනවා, ඒක විකුණුවේ කොහොමද කියලා. ඔහු එහි සඳහන් කර තිබෙනවා,

"...අනතුරුව ටෙන්ඩර් කැඳවා එහි තිබුණු අගනා යන්ත්‍ර සූත්‍ර අබලි යකඩවලට විකුණා දැමුණේය. කම්හලේ තිබුණු අගනා සන්නිවේදන පද්ධතිය පැරණි වයර් මිලට වෙන්දේසි කෙරුණේය. කම්හල පරණ යකඩවලට මිලදී ගත්තේ අඩුම ලංසුව තැබූ එස්.පී.අයි.සී. නමැති ඉන්දීය සමාගමය. ඉන්දියානුවෝ කම්හල ගලවා ගෙන ගොස් එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ජබීර් අලි ආයෝජන කලාපයේ සවි කළේය. එහි යූරියා නිෂ්පාදනය කර ලංකාවට විකිණීම ආරම්භ කෙරිණි. 1975 යූරියා කම්හල වෙනුවෙන් රට ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 6,000කි. අද මේ රට පොහොර ආනයනය වෙනුවෙන් වාර්ෂිකව මේ මුදල වියදම් කරන්නේය" යනුවෙන්. ඕක තමයි රනිල් වික්‍රමසිංහ ගමන යන්න ආරම්භ කරපු පාර.

විශේෂයෙන්ම 1976 වෙනකොට ලංකාවේ දේශීය ණය තිබුණේ රුපියල් බිලියන 12.6යි. විදේශීය ණය තිබුණේ රුපියල් බිලියන 4.9යි. ඒ කියන්නේ මුළු ණය රුපියල් බිලියන 17.6යි. ඒක එවකට දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 58.5ක්. ඒ, 1976දී. හැබැයි, රනිල් වික්‍රමසිංහ මහතාගේ ප්‍රතිපත්තිය අනුව යන එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව රට භාර ගත්තාට පසුව 1978 වෙද්දී අර 17.6ට තිබුණු මුළු ණය ප්‍රමාණය බිලියන 30.9 දක්වා වැඩි වුණා. ඒ කියන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 72.6ක්. 1989 වෙද්දී දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 108.7ක් දක්වා එය වැඩි වුණා. මේක තමයි 1977න් පසුව පටන් අරගෙන විවෘත ආර්ථිකය තුළ නැත්නම් ලිබරල් ආර්ථිකය තුළ ලංකාව අරගෙන ගිය තැන. මේවාත් එක්ක තමයි මේ ආර්ථික අර්බුදයට අපට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන්නේ. එතැනින් පසුව රට පාලනය කරපු ආණ්ඩු මේ පිළිවෙළ තමයි අඩු වැඩි වශයෙන් දිගටම අරගෙන ගියේ. ඒක තමයි රනිල් වික්‍රමසිංහ වැඩ පිළිවෙළ. ඊට පසුව චන්ද්‍රිකා මැතිනිය ජනාධිපතිනිය වෙන්න කලින් කාලය තුළ රනිල් වික්‍රමසිංහ සහ ඩී.බී. විජේතුංග මහත්මයා පාලනය කළ කාලයේ රාජ්‍ය ආයතන 48ක් විකුණුවා, 1991 ඉඳලා. චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ ආයතන 46ක් විකුණුවා. 2002 යළි පුබුදමු ශ්‍රී ලංකා වැඩ පිළිවෙළ එක්කත් රනිල් වික්‍රමසිංහ ආයතන විකුණුවා; ලාභ ලබන ආයතන විකුණුවා. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විකුණුවා. ඒක නඩු තීන්දුවකින් තමයි නැවත හරවා ගත්තේ. ඕක තමයි රනිල් ගිය පාර.

ඊට පසුව, පසුගිය වසර දෙක ගත්තාම ඒ කාලයේත් සියලුම දේ විකුණන ප්‍රතිපත්තියක තමයි හිටියේ. සුනිල් හඳුන්නෙත්ති ඇමතිවරයාත් මේ ගැන කලින් පැහැදිලි කළා. මේක තමයි ගිය පාර. ඒකට විදුලිබල මණ්ඩලයද, පෙට්‍රෝලියම් එකද, අපට ආර්ථික වශයෙන් වැදගත් තවත් එකක්ද කියන එක අදාළ වුණේ නැහැ. වත්තේ කැලි, කැලි විකුණා ගෙන තුන්වේල කනවා වාගේ වැඩක් කළේ. ඒක තමයි යෝජනා කරපු ආර්ථිකය. ඒක තමයි ලංකාවේ ණයබර වැඩි වෙන්නත්, ආර්ථිකය නොහැදෙන්නත් හේතුව. මෙහෙම ගිහිල්ලා විශේෂයෙන්ම අපි වෙනස් වෙන තැන කිව්වොත් එහෙම - මම එක උදාහරණයක් කියන්නම්. "විදුලිබල මණ්ඩලය ප්‍රතිව්‍යුහගතකරණය" නමින් විදුලිබල මණ්ඩලයේ ඉතුරු කොටසුත් විකුණා දමන්න, ඇවර කරන්න තීරණයක් ගත්තා, ඒකට පනතක් සම්මත කළා. අපේ ජනාධිපතිතුමා බලයට පත් වෙලා ආණ්ඩුවක් හැදිලා නොතිබුණු තත්ත්වයක් තුළ - එතුමා බලයට පත් වෙලා සති 6ක් ඇතුළත - ඒ තීරණය නැවැත්වූවා. විදුලිබල මණ්ඩලය කාර්යක්ෂම කරන්න ප්‍රතිව්‍යුහගතකරණය අවශ්‍යයි. නමුත් ඒක කළ යුත්තේ ඉතුරු වුණු සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම විකිණීමෙන් නොවෙයි. නොවැම්බර් 04 වැනි දා විදුලිබල මණ්ඩලයෙන් ප්‍රසිද්ධ මාධ්‍ය නිවේදනයක් ඇතුළේ ප්‍රකාශයට පත් කළා, එහෙම කරන්නේ නැහැ කියන එක. ඉදිරියේදී ඒවාට අදාළ දේවල් සම්මත කර ගත යුතුයි. එහෙම තමයි, අපි වෙනස් වෙන්නේ එතැනින්.

ඒ තිබුණු ගිවිසුම්වලට රාජ්‍යයක් විධියට එකඟ වුණු සමහර දේවල් මේ ආණ්ඩුවට continue කරන්න වෙන එක "රනිල් කරපු දේ කරනවා, රනිල් කරපු දේ කරනවා" කියලා හඳුන්වනවා නම්, ඒක දේශපාලනමය වශයෙන් බොහොම වැරදි සහ බොහොම ප්‍රාථමික ප්‍රකාශයක්. රනිල් වික්‍රමසිංහ ගිය පාරෙන් වෙනස් වෙන

[ගරු නජිත් ඉන්දික මහතා]

නිසා තමයි ජනතාව අපට බලය දුන්නේ. රනිල් වික්‍රමසිංහ ගිය පාරට වඩා වෙනසින් වැඩි පාරක් සමඟ ජන බලවේගය හෝ සිලින්ඩරය හෝ පොහොට්ටුව හෝ යෝජනා කළේ නැහැ. ඒක තමයි අපට මේ ඡන්ද ප්‍රතිඵලය හිමි වෙන්නේ. ඊට වඩා වෙනස් මූලධාර්මික ආර්ථික උපාය මාර්ගයක් සහිත පාරක යන්න ජාතික ජන බලවේගය යෝජනා කරපු නිසායි ආසන 159ක් අපට හිමි වෙන්නේ. අපි වෙනස් කළේ ඒකයි. අපි ඒක ගැන බොහොම ආඩම්බරයෙන් කියනවා. මොකද, ඒ වෙනස් කිරීම තුළ තමයි මේ ලෝකයේ; තුන්වැනි ලෝකයේ රටවල් පසුගිය දශක 3-4 තුළ ගොඩ නැඟුණේ. අපේ කලාපය තුළ දකුණු කොරියාව, වියට්නාමය, චීනය, සිංගප්පූරුව වාගේ රටවල් උදාහරණයකට ගත්තොත්, ඒ රටවල් වෙනස් වුණේ; ඒ රටවල් දියුණු වුණේ රනිල් වික්‍රමසිංහ මහත්මයා සහ ඔහුගේ ගෝලබාලයන්, සමඟි ජන බලවේගයේ අය හිතාගෙන සිටින ආකාරයේ අසීමිත වෙළෙඳ පොළ විසින් රට පාලනය කරන තත්ත්වයක් ඇතුළේ නොවෙයි.

රාජ්‍යය සැලසුම්කරණයට මැදිහත් වෙනවා. පෞද්ගලික අංශය ආයෝජනය කරනවා. රාජ්‍ය අංශය සතුව තබා ගන්න අවශ්‍ය දේවල් තිබෙනවා. ඒ තමයි බල ශක්තිය, විදුලිය වාගේ තීරණාත්මක දේවල්. ඒ වාගේම සමුපකාර වාගේ අංශයකට බලයක් තිබෙනවා. රජයේ මහ පෙන්වීමත්, සැලසුම්කරණයක් එක්ක පෞද්ගලික අංශයද, රාජ්‍ය අංශයද, සමුපකාර වාගේ අංශද හරියට යොදා ගෙන රට දියුණු කරන සැලැස්මක් තමයි, ජාතික ජන බලවේගය ඉදිරිපත් කළේ කියලා මම කියන්නේ ඒකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එතැනින් තමයි මූලික වශයෙන් රනිල් වික්‍රමසිංහගේ සහ ඔහුගේ ගෝල බාලයන් වන සමඟි ජන බලවේගයේ ආර්ථික උපදේශකයන්ගෙන් අපි වෙනස් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ සභල් වෙළෙඳ පොළ තුළ ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා නේ. ආණ්ඩුවක් අලුතින් ගත්ත පිරිසක් විධියට අපි මුහුණ දීලා ඉන්න අර්බුදයක් තිබෙන්නේ. රනිල් වික්‍රමසිංහ ගිය පාරේ ගියා නම්, ඒක තමයි හෙට විදුලියට වෙන්නේ. ඒක තමයි හෙට බල ශක්තියට වෙන්නේ. ඒක තමයි හෙට පෙට්‍රල් හා ඩීසල් වෙළෙඳ පොළට වෙන්නේ. ඒක තමයි අපි වෙනස් කරලා තිබෙන්නේ. හැබැයි, අපි හැර වෙන කවුරුත් බලයට ආවා නම්, ඒක වෙනස් වෙන්නේ නැහැ. මොකද, ඔවුන්ට එහෙම වෙනස් ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. ඒ නිසා ඒ වෙනස්කම අපි සනිටුහන් කරන්න ඕනෑ. ඒ වෙනස සඳහා තමයි ජනතාව අපිට ජනවරමක් දීලා තිබෙන්නේ. එතකොට අවුරුදු 76ක පාලනය කියලා අපි කියන්නේ, 1977න් පස්සේ පාලන කාලය තුළ අනුගමනය කළ ප්‍රතිපත්ති තුළින් තමයි දවසින් දවස, වසරින් වසර රට අගාධයට ගිහිල්ලා, බංකොලොත් රටක් බවට පත් වුණේ. ඒ නිසා තමයි, මූලධාර්මිකව අපට තිබෙන ප්‍රතිපත්තිය තුළින් මේ රට හදන්න, මේ රටේ ආර්ථිකය ගොඩ ගන්න මේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම රනිල් ගිය පාර ගැන කථා කරද්දි, රනිල් ගිය පාර තමයි මම කලින් කිව්වේ.

ඒ වාගේම ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු වැඩ පිළිවෙළ තමයි පසුගිය දවසක අපි සාකච්ඡා කළේ. ඒ වාගේම ජාතික ජන බලවේගය මැතිවරණයට පෙර ඉදිරිපත් කරපු ප්‍රතිපත්ති ප්‍රකාශන දෙක තිබෙනවා. ඒ සියල්ලගෙන්ම රනිල් ගිය පාරෙන් අපි වෙනස් වෙන්නේ කොහොමද කියන එක ඉතා පැහැදිලිව විස්තර කරලා තිබෙනවා. ඒ නිසා ඒ පැරණි ක්‍රමයේම තවදුරටත් යන්න නොවෙයි, ඒ පැරණි ක්‍රමය වෙනස් කරන්න, ඒ පැරණි ක්‍රමය වෙනස් කරලා මේ රටේ ආර්ථිකය ඉදිරියට ගන්න, ඒ කියන්නේ මේ රටේ නීතියේ ආධිපත්‍යය, දේශපාලන සංස්කෘතිය හා අනෙක් පිරිහීම් සියල්ල වාගේම මේ රටේ කොඳු නාරටිය වාගේ තිබෙන ආර්ථිකය මෙතැනින් වෙනස් ආර්ථික මූලෝපායන් එක්ක ඉදිරියට ගන්න තමයි මේ රටේ ජනතාව අපට බලය ලබා දුන්නේ. ඒ නිසා ගරු සුනිල් හඳුන්නෙත්ති ඇමතිවරයා කිව්වා වාගේම පසුගිය ආණ්ඩුවෙන් අපට කර ගහන්න තිබෙන පව් දිහා බලලා, ඒවාට හවුල්කාරයෝ වෙච්ච විපක්ෂයේ මන්ත්‍රීවරුන්, විපක්ෂයේ පක්ෂ ඒ සම්බන්ධයෙන් අපට චෝදනා කිරීම ඉතාම වැරදියි. ඒක දේශපාලනිකවත් වැරදියි, ඒක සදාචාරාත්මකවත් වැරදියි.

ඒ නිසා, අපේ වෙනස්කම අපි මැතිවරණ ප්‍රකාශන තුළ පෙන්වලා තිබෙනවා. අපි හංගලා මොනවත් කළේ නැහැ. අපි ඇත්ත දේවල් කිව්වා. කරන්න පුළුවන් දේවල් කිව්වා. ඒක අපේ වැඩ පිළිවෙළ තුළ ලියලා තිබෙනවා. මැතිවරණය දිනුවාට පස්සේ, ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවේ ගෞරවනීය සභාව ඉදිරියේ ඒක නැවත වතාවක් ඉදිරිපත් කළා. ඒ වැඩ පිළිවෙළ තමයි අපේ ඇමති මණ්ඩලය ඇතුළු අපේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන්නේ. ඒ නිසා රනිල් වික්‍රමසිංහ ගිය පාර සහ අපි යන පාර අතර වෙනස මොකක්ද කියන එක හරියට වටහා ගන්න කියලා මේ සියලුදෙනාට ආරාධනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. මට කාල වේලාව ලබා දුන්නාට බොහොම ස්තූතියි.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Rohitha Abeygunawardhana?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් විනාඩියක පැහැදිලි කර ගනීමක් කර ගන්න තිබෙනවා.

ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාටත් ආණ්ඩුවටත් ස්තුතිවන්ත වෙනවා, ඊයේ දවසේ පසුගිය රජය විසින් වයින් ස්ටෝර්ස් 361කට ලබා දීපු මත්පැන් බලපත්‍ර නාම ලේඛනය ඉදිරිපත් කිරීම ගැන. මම හිතන විධියට ඔබතුමාත් මමත් නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයට හයකට වැඩිය නව මත්පැන් බලපත්‍ර ලබා දීලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඒ බලපත්‍රය ලබා ගත්ත කෙනා වාගේම, ඒ බලපත්‍රය ලබා දෙන්න නිර්දේශ කරපු යම් මහජන නියෝජිතයෙක්, මන්ත්‍රීවරයෙක්, ඇමතිවරයෙක් හෝ වෙනත් කෙනෙක් ඉන්නවා නම්, ඒ අයගේත් නම සහ එම ලේඛනය මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න. විශේෂයෙන් ඔබතුමාත් මමත් නියෝජනය කරන කළුතර දිස්ත්‍රිකයේ ඒවා ගැන. අනෙක් ඒවා ගැනත් ඒ විධියට දෙන්න පුළුවන් නම් හොඳයි. ඔක්කොම අය මේකට පච්කාරයෝ බවට පරිවර්තනය වෙන්න කැමැති නැති නිසායි මම ඔබතුමාගෙන් ගෞරවයෙන් මේ ඉල්ලීම කරන්නේ. ඒ නිසා, ඉතා ඉක්මනින් ඒක මේ ගරු සභාවට ඉදිරිපත් කරනවා නම් හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය විමර්ශනය කරමින් පවතිනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒ කටයුතු අවසන් වූ වහාම මුළු රටේම ජනතාවට දැනගන්න පුළුවන් විධියට අපි ඒ ලේඛනය ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්නම්.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன)
(The Hon. Rohitha Abegunawardhana)
බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ravi Karunanayake. You have 12 minutes.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, I have 14 minutes.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The list before me states that it is 12 minutes. It has been reduced.

[පූ.භා. 11.56]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
That is okay, Sir.

මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස හත් වතාවක් පත් වුණා. ඒ වාගේම "ගෑස් සිලින්ඩරය" ලකුණෙන් යුතු නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණට ඡන්දය දීම සම්බන්ධයෙන් අපේ සියලු එක්සත් ජාතික පාක්ෂිකයන්ටත් මේ අවස්ථාවේදී මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. මේ ඓතිහාසික මොහොතේ ලලිත් පෙරමුණේ නිල මණ්ඩලයට හා විධායක කමිටුවට ලලිත් ඇතුලත්මුදලිගේ ගෝලයෙකු වශයෙන් නව ප්‍රජාතන්ත්‍රවාදී පෙරමුණට හිමි ජාතික ලැයිස්තු මන්ත්‍රී ධුරය යූඑන්පීකාරයෙකු වූ මට ලබා දී මේ පාර්ලිමේන්තුව නියෝජනය කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මගේ හෘදයංගම ස්තුතිය පුද කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ අතුරු සම්මත ගිණුම -Vote on Account - ඉදිරිපත් කළ අද දිනයේ මටත් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. දසවැනි පාර්ලිමේන්තුවට ඉතාම අපූරු ආකාරයට ජනතාව විසින් මන්ත්‍රීවරුන් පත් කරලා තිබෙනවා. අප එම පණිවුඩය ඉගෙන ගත යුතුයි. අපි අලුත් වෙමු; අලුතෙන් හිතමු; ජනතාවගේ විශ්වාසය තහවුරු කරන්න අපි කැප වෙමු. Maintaining quality in Parliament is essential. ඒකේ වටිනාකමක් තිබෙනවා. අවුරුදු 27ක්, 28ක් පාර්ලිමේන්තුවේ හිටපු අය හැටියට අපට පෙනෙනවා, එහි යම් කාන්දුවීමක් තිබෙන බව. ඒක නැවත යථා තත්ත්වයට පත් කිරීම අප සියලුදෙනාගේම කාර්යභාරයක් කියා මා සලකනවා.

2022 අප්‍රේල් මාසයේදී බංකොලොත් වූ මේ රට IMF එකත් සමඟ සාකච්ඡා කරලා ණය ගෙවීම ප්‍රතිව්‍යුහගත කිරීමට - restructure කිරීමට - කටයුතු කළා. 2028දී නැවත ණය ගෙවීම ආරම්භ කිරීමට එකඟතාවක් ඇති කර ගැනීම රටක් වශයෙන් අප ලැබූ ජයග්‍රහණයක් බව මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරන්න කැමැතියි. ගරු අනිල් ජයන්ත ප්‍රනාන්දු අමාත්‍යතුමා කථා කරපු අවස්ථාවේදීත්, ගරු සුනිල් හඳුන්නෙත්ති අමාත්‍යතුමා කථා කරපු අවස්ථාවේදීත් යම් යම් කරුණු කාරණා පෙන්වා දුන්නා. එය මේ ශේෂ පත්‍රයේ එක කොටසක් ලෙස මම පෙන්වන්නම්. මේ අවස්ථාවේදී අපි එක පැත්තකට බැණලා අනෙක් පැත්තට හොඳ කියන එක නොවෙයි අවශ්‍ය වන්නේ. නමුත්, සැබෑ විශ්ලේෂණයක් කළොත් මේ කටයුතු ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ කොහොමද කියලා අපට දැනගත හැකියි. මේ රට භාර ගන්නා අවස්ථාවේදී ලැබෙන්නේ බංකොලොත් රටක්. වෙනත් ආණ්ඩු රට භාර ගත් අවස්ථාවක වාගේ නොවෙයි ඔබතුමන්ලාට මේ රට ලැබිලා තිබෙන අවස්ථාව. මේ මුදල් අමාත්‍යාංශයේ ඉන්නවා, දක්ෂ ලේකම්වරයෙක්. එතුමා මා එක්ක මුදල් අමාත්‍යාංශයේ වැඩ කරපු කාලයේ ඉඳන් එතුමා පිළිබඳව මම දන්නවා. බැංකු අයිරාවකින් සාමාන්‍යයෙන් රුපියල් බිලියන 800ක් භාර දෙනවා. ඔබතුමාට මේ අවස්ථාවේදී භාර දීලා තිබෙන්නේ ඉතාමත් වර්ධනාත්මක ශේෂයක්. බැංකු අයිරාවක් නොවෙයි, ඒක positive එකක්. මම මේ කියන්නේ අපි දෙපැත්තම balance කරලා ඉදිරියට යන එක තමයි අවශ්‍ය වෙන්නේ කියන එකයි. ඒ වාගේම මේ රටේ ආයතන 455ක් පමණ තිබෙනවා. මීට පෙර අවුරුදු 15ක්, 20ක් දෙස බැලුවොත් ඒ හැම අවස්ථාවකදීම රුපියල් බිලියන 900ක පමණ අලාභයක් තිබෙනවා. 2022දී රුපියල් බිලියන 800ක අලාභයක්, 2023දී රුපියල් බිලියන 450ක ලාභයක්, 2024 මෙතෙක් දුර රුපියල් බිලියන 300ක ලාභයක් තිබෙනවා. ඉතින් මේවා තමයි ආණ්ඩුවකට යම් විධියකට වැදගත් වෙලා මූල්‍ය කළමනාකරණය තුළ ඇති වෙලා තිබෙන ප්‍රතිලාභ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම ඡන්ද වේදිකාවේ මොනවා කථා කළත්, අනුර දිසානායක ජනාධිපතිතුමා නොවැම්බර් 21වෙනි දා පාර්ලිමේන්තුවට ඇවිල්ලා යූඑන්පී එකේ රනිල් වික්‍රමසිංහ මහතා ගෙනා IMF ගිවිසුම ඉදිරියට ගෙන යාම සම්බන්ධව කරපු ප්‍රකාශය මේ අවස්ථාවේදී අපි අගය කරන්න අවශ්‍යයි. වෙනින් විකල්පයක් නැහැ. ටික කලකට වහ වුණත් පසු කලකට රහ වෙන්න පුළුවන්. ඒක තමයි මා හිතන විධියට අපි පිළිගත යුතු දේ. මෙතැන අපි එක්සත් ජාතික පක්ෂයට බැන්නා කියලා ඒකෙන් ප්‍රශ්න විසඳෙන්නේ නැහැ. ජේ.ආර්. ජයවර්ධන මහතා 1977දී මේ රටට විවෘත ආර්ථිකය ඉදිරිපත් කරලා සුවිශේෂ වෙනසක් ඇති කළා. අවුරුදු 40ක්, 50ක් ගත වෙලාත් ඊට විකල්පයක් ඇති වෙලා නැහැ. අපට බැණ බැණ ඉන්න පුළුවන්. මම හිතන විධියට, හොඳ ගුණාංග පාවිච්චි කරලා, වැරදි දේවල් නිවැරැදි කරලා ඉදිරියට යන්න කියන එක තමයි එක්සත් ජාතික පක්ෂය මේ රටට දීලා තිබෙන ලොකුම දේ. එක්සත් ජාතික පක්ෂය කිව්වාම, මීට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමාත් යම් යම් දේවල් මතක් කළා. ඒ වාගේම මම මතක් කරන්න කැමැතියි, මහවැලි ව්‍යාපාරය, විවෘත ආර්ථික ක්‍රමය, මහපොළ ශිෂ්‍යත්ව ක්‍රමය, අධ්‍යාපන ක්ෂේත්‍රය, mobile telephone systems, කර්මාන්ත ක්ෂේත්‍ර, වරායන්, රන්දෙනිගල, වික්ටෝරියා යන ජල විදුලිය සපයන ප්‍රමුඛ ජලාශ වාගේම මාවුරු ඔය යන ව්‍යාපෘති බැලුවාම එක්සත් ජාතික පක්ෂය වැඩ කරලා නැද්ද කියන එක. මේ දෙපැත්තෙන්ම වැරදි වෙන්න පුළුවන්. නමුත්, රට ඉලක්ක කරගෙන වැඩ කරන්න පුළුවන් අවස්ථාව තමයි අපට ඇවිල්ලා තිබෙන්නේ. මේ අවස්ථාවේදී අපේ රට ඉදිරියට ගෙන යන්නේ කොහොමද කියන එක පිළිබඳව අපි අවධානය යොමු කළ යුතු වෙනවා.

I myself was the Finance Minister when we negotiated on the 16th loan from the IMF, and that was no easy task. There was no necessity to go for that, but we thought it was necessary for financial discipline. It was the then Prime Minister Ranil Wickremesinghe who encouraged us, and we went for that. We must realize that during those negotiations, the IMF may try to have their say, but the Government must have its way. That should be the difference between us.

[ගරු රවි කරුණානායක මහතා]

මේ රට බංකොලොත් වුණාට පස්සේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ එක්ව අතිවිශේෂ රටක් විධියට මේ රට ඉදිරියට අරගෙන යන්න ඕනෑ. ඔවුන් එක්ක සෙල්ලම් කිරීම ඉතාම භයානකයි. නමුත් IMF එක කියන හැම දේම අපි පිළිගන්න අවශ්‍ය නැහැ. මම හිතන විධියට සුද්දන්ට වැඩිය ජාතික වශයෙන් අපට මේ යෝජනාවලිය සඳහා අදහස් දෙන්න පුළුවන්. මම එක නිදසුනක් ඉදිරිපත් කරන්නම්.

අපි කිව්වොත්, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 15ක ආදායමක් මේ රටට අවශ්‍යයි කියලා, ඒ ප්‍රමාණය සොයා ගන්න පුළුවන් ක්‍රමවේදය හදන්න අපට භාර දිය යුතුයි. අපේ රටේ මුදල් අමාත්‍යාංශයේ ඉතාම දක්ෂ පිරිසක් ඉන්නවා. 2015දී මම මුදල් අමාත්‍යාංශය භාර ගන්නකොට අපේ දළ දේශීය ආදායම සියයට 8.2යි. අපට මාස 30කින් එම ප්‍රමාණය සියයට 15 දක්වා වැඩි කර ගන්න පුළුවන් වුණා. සුද්දා කියපු දේ නොවෙයි අපි කළේ. ශ්‍රී ලාංකියන් කියපු දේවල් තමයි අපි ඒ අවස්ථාවේ ක්‍රියාත්මක කළේ.

මේ අවස්ථාවේ උදාහරණයක් හැටියට PAYE system එක ගත්තොත්, එය බොහොම අසාධාරණ මට්ටමකයි තිබෙන්නේ. ඒගොල්ලන් ඇවිල්ලා කිව්වොත්, අපි රුපියල් බිලියන 160ක් සොයන්න ඕනෑ කියලා, ඒ රුපියල් බිලියන 160 සොයන කටයුත්ත අපට භාර දුන්නා නම් මීට වැඩිය සාර්ථකව අපට එය සොයා ගැනීමේ හැකියාව තිබෙනවා. මූල්‍ය කළමනාකරණ අවස්ථාවේ පළමුවැනි වතාවට Vote on Account එකක් නීතිමය අයුරින් ඉදිරිපත් කරලා පාවිච්චි කරන්නේ ඔබේ ආණ්ඩුවයි. ඒකේ එදා තිබුණු දුර්වලතා දැනගෙන රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒක නිවැරැදි ස්ථාවරයකට ගෙනාවේ එම නිසායි. ඉතින්, අපි මෙහි තිබෙන හොඳ ගුණාංගත් මතක් කළ යුතුයි. ශ්‍රී ලංකාව රෝගියෙක් නම්, ඒ වාගේම IMF එක ඒ රෝගියාගේ ශල්‍යකර්මය කරපු දොස්තර නම්, රෝගියාට දැන් drip එක ගහලා තමයි තිබෙන්නේ. ඒකෙන් කියන්නේ, ප්‍රශ්න ඔක්කෝම විසඳිලා කියන එක නොවෙයි. අපි දැන් ක්‍රියා කළ යුත්තේ කොහොමද, අපේ මූලික ප්‍රශ්නය මොකක්ද කියන එක මම මේ අවස්ථාවේ කියන්න ඕනෑ. අසීමිත ඉල්ලීම් තුළ සීමිත සම්පත් බෙදා ගන්න පුළුවන් වෙන්නේ කොහොමද?

මම හිතන විධියට අපි කිසිසේත්ම 2022දී අපේ බංකොලොත්භාවය ප්‍රකාශ කිරීම කළ යුතුව තිබුණු දෙයක් නොවෙයි. නමුත් එය සිදු වුණා. එසේ බංකොලොත්භාවය ප්‍රකාශ වුණාට පසු රුපියල් 130, රුපියල් 140, රුපියල් 150 මට්ටමේ තිබුණු ඩොලර් එක රුපියල් 376ට වැඩි වුණා. ඒ තුළින් අන්තිමට වුණේ, අපේ purchasing power, එහෙම නැත්නම් මූර්ත ආදායම කඩා වැටීමයි. එසේ කඩා වැටීමෙන් පසු අපේ ආර්ථිකය තවමත් හරියාකාරව ස්ථාවර කර ගන්න බැරිවෙලා තිබෙනවා. ඒක ඉංග්‍රීසියෙන් කිව්වොත්, the operation was successful, but the patient died. නමුත්, ඒ නැති වීමෙන් පසු ආර්ථිකය සවිශක්තිමත් මට්ටමකට හදලා දුන් නිසා දැන් ඔබතුමන්ලාට ඒ වාසිය ලබා ගන්න පුළුවන් හැකියාව තිබෙනවා. ඒක තමයි දේශපාලනය. මා හිතන විධියට අපි හැම අවස්ථාවේදීම දේශපාලනය කළ යුත්තේ රට ඉදිරියට අරගෙනයි. එහෙම නැතුව ඉදිරියේ එන මැතිවරණයක් ගැන හිතාගෙන නොවෙයි. එම නිසා අපි මේ අවස්ථාව උපයෝගී කර ගනිමු, මේ රට ඉදිරියට අරගෙන යන්න. අපේ purchasing power එක, නැත්නම් මූර්ත ආදායම නිවැරදි ආකාරයට වැඩි කළ යුතුමයි. ජීවත් වීම සඳහා ලැබෙන අදායම ප්‍රමාණවත් නොවන ප්‍රශ්නය තමයි අද උග්‍ර මට්ටමක තිබෙන්නේ. එම නිසා මම ඔබ සියලුදෙනාගෙන් එක දෙයක් ඉල්ලනවා. මේ යන ගමන ඔය ආකාරයෙන්ම යා යුතුමයි. එසේ ගෙන යෑම තුළින් තමයි මේ රටේ ආර්ථිකය සවිශක්තිමත් වෙන්නේ. මේකට කිසිම shortcut එකක් නැහැ.

අද ගරු මහාචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු ඇමතිතුමා, චතුරංග අබේසිංහ නියෝජ්‍ය ඇමතිතුමා, ඒ වාගේම සුනිල් හඳුන්නෙත්ති සහ බිමල් රත්නායක ඇමතිවරු කථා කරනවා මම අහගෙන හිටියා. මම එක දෙයක් ඉල්ලනවා. වමට signal දාලා, දකුණට හරවන්න එපා. මේ යන ගමන යන්න. අපි තමයි ඒක කියන්නේ. මොකද, රටේ ආර්ථිකය හදන්න යන ගමන තමයි නිවැරදිව ඉදිරියට ගමන් කළ යුතුව තිබෙන්නේ. ඒ නිසා තමයි මේ වෙනකොට ඔබතුමන්ලා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල පිළිගෙන තිබෙන්නේ. ඒ, වෙනත් විකල්පයක් නැති නිසායි. එම ගිවිසුමට සංශෝධන ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ආදායම අඩු කරන්න බැහැ. ආදායම වැඩි කරලා ලැබෙන ප්‍රතිලාභවලින් වෙනත් දේවල් කරන්න පුළුවන් කියන කාරණය තමයි කියන්න තිබෙන්නේ. එතකොට මේ සඳහා තිබෙන විසඳුම මොකක්ද?

දෙසැම්බර් මාසයේ 17වැනි දා වෙනකොට ඔබතුමන්ලා 2025 වර්ෂය සඳහා ඉදිරිපත් කරනු ලබන අය වැය සඳහා revenue proposals ඉදිරිපත් කරන්න ඕනෑ. එතකොට තමයි ගිවිසුම අත්සන් කරලා ඒක නීත්‍යානුකූලභාවයට පත් වෙන්නේ. ඒක අනිවාර්යයෙන්ම කළ යුතුයි. ඔබතුමන්ලා ඒක කරන්න. ඊට පස්සේ 2025 වර්ෂයේ පෙබරවාරි, මාර්තු මාස අතර අය වැය ඉදිරිපත් කළාට පසුව තමයි සැබෑ අයුරින් අපි ඔබතුමන්ලාගෙන් ප්‍රශ්න කරලා, සංවිධානාත්මකව විවේචන ඉදිරිපත් කරලා රට හරි තැනට අරගෙන යන්න පුළුවන් වෙන්නේ.

දැන් අවුරුදු 76ක ඉතිහාසය ගැන කථා කරනවා. දැන් අපට කරන්න තිබෙන්නේ රට ඉදිරියට ගෙනියන්නේ කොහොමද කියලා බලන එකයි. මේ රට ආයෙත් වැටෙන්න ඉඩ දෙන්න බැහැ. වැටිලා තිබෙන රට ඉතාම අමාරුවෙන් ගොඩ එනකොට නැවත එවැනි තත්ත්වයකට ගෙනයන්න හිතන්නවත් බැහැ. අපි සියලුදෙනාගේම යුතුකම වෙන්නේ ආර්ථිකය සවිශක්තිමත් මට්ටමට අරගන්න අවශ්‍ය ඉදිරි කටයුතු කරන එකයි. අපි අදහස් ඉදිරිපත් කරන්නේ ඒ චේතනාවෙන් මිස වෙනත් අදහසකින් නොවෙයි.

අපි දැන් 2025 වර්ෂය ගැන කථා කරමු. අපි ආදායම ගැන ඔබතුමන්ලාගෙන් අහලා වැඩක් නැහැ. මොකද, Vote on Account කියන්නේ වියදම සම්බන්ධයෙන් තාවකාලිකව ඉදිරිපත් කරලා තිබෙන දෙයක්. අපේ උද්ධමනය සියයට 5ට සීමා කිරීම කළ යුතුයි. ඒක සාර්ථකව සිදු වෙලා තිබෙනවා. Primary surplus එක සියයට 2.5ට තබා ගත යුතුයි. එතකොට වියදමට වැඩි ආදායමක් තිබෙනවා, 2028න් පසුව ණය ටික ඉදිරියට ගෙනයන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, you have two minutes left.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, I had the concurrence of the Hon. Gayantha Karunatilleke to utilize another three minutes. So, I can use that time.

දළ දේශීය නිෂ්පාදනයෙන් - GDP එකෙන් - සියයට 15ක් revenue තිබිය යුතුයි. අපේ දළ දේශීය නිෂ්පාදනය රුපියල් බිලියන 33,000යි. මේ දළ දේශීය නිෂ්පාදනය ඉදිරියට ගෙනයන්න අවශ්‍යයි. මේ අවස්ථාවේදී අපට ඇමෙරිකානු ඩොලර් බිලියන හයක reserves තිබෙනවා. 2028 ගෙවන්න තිබෙන

ණයත් සමඟ බැලුවාම අපට අඩු ගණනේ reserves US Dollars 15 billion තිබිය යුතුයි. අපි ඒ වෙනුවෙන් වැඩ කරන්නේ කොහොමද? ඒ කියන්නේ හැම අවුරුද්දේම ඩොලර් බිලියන තුනක් එකතු කළේ නැත්නම් නැවතත් 2028දී අඳුරු යුගයක් එනවා. මේ ගත්ත එකෙන් තාවකාලික තෘප්තියක් ලැබීම නොවෙයි කරන්න තිබෙන්නේ. ඉදිරියට යන ගමන අපි කොහොමද සවිශක්තිමත් කර ගන්නේ කියලා සිතා බැලිය යුතුයි.

මේ අවුරුද්දේ -2024 අවුරුද්දේ- ආදායම වශයෙන් ඇස්තමේන්තු කරලා තිබුණේ රුපියල් බිලියන 4,200යි. නමුත් සත්‍ය වශයෙන් උපයන්න පුළුවන් වුණේ රුපියල් ට්‍රිලියන 3.8යි. ඒ කියන්නේ, රුපියල් බිලියන 3,800යි. එතකොට රුපියල් බිලියන 500ක පමණ ඌනතාවක් තිබෙනවා. ලබන අවුරුද්දේ - ඒ කියන්නේ 2025 අවුරුද්දේ - ආදායම පුරෝකථනය කරලා තිබෙන්නේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 15ක් ලෙසයි. ඒ කියන්නේ රුපියල් බිලියන 4,500යි. මේ රුපියල් බිලියන 500ත් එක්ක රුපියල් බිලියන 5,000ක් සොයන එක ලෙහෙසි කාර්යභාරයක් නොවෙයි. කොහොමද අපි ඒ මුදල හොයා ගන්නේ? නිකම් ආදායම සොයනවා කියලා හරියන්නේ නැහැ. ඒකට මාර්ගයක් තිබෙන්න ඕනෑ. There should be a way forward; there should be a road map. මේ ගැන තමයි අපි කථා කරන්න අවශ්‍ය වන්නේ.

ඊළඟට, ලබන වසරේ වියදම රුපියල් බිලියන 9,000යි. මේ අවුරුද්දේ වියදම රුපියල් බිලියන 6,800ට ඔබතුමන්ලා රුපියල් බිලියන 250ක Supplementary Estimate එකක් ගෙනැල්ලා තිබෙනවා. ඒ කියන්නේ රුපියල් බිලියන 9,000ට වැඩි වෙනවා. රුපියල් බිලියන 9,000න් සාමාන්‍යයෙන් interest වශයෙන් රුපියල් බිලියන 2,000යි; ප්‍රාග්ධන වියදම් සඳහා රුපියල් බිලියන 800යි; රජයේ සේවකයින්ට වැටුප් ගෙවීමට රුපියල් බිලියන 1,200යි; Pension ගෙවීම සඳහා රුපියල් බිලියන 300යි; අස්වැසුම සහ අනෙකුත් සහනාධාර සඳහා රුපියල් බිලියන 205යි. මේවා ගෙවනකොට රුපියල් බිලියන 9,000ක් වෙනවා. එසේ මෙසේ කාර්යභාරයක් නොවෙයි කරන්න තිබෙන්නේ. අපි කොහොමද මේ වියදම පියවා ගන්නේ? වියදම රුපියල් බිලියන 9,000යි, ආදායම රුපියල් බිලියන 5,000යි. එතකොට හිඟය රුපියල් බිලියන 4,000ක් තිබෙනවා. අපි කොහොමද ඒ වෙනස පියවා ගන්නේ?

ඔබතුමන්ලා මේ අවස්ථාවේදී ආණ්ඩුව භාර අරගෙන තිබෙනවා. ඒ වෙනුවෙන් මම ඔබතුමන්ලාට සුබ පතනවා. දැන් තෘප්තියක් තිබුණත් තව මාස තුන හතරක් යනකොට මොන තරම් අමාරුවක් තිබෙනවාද කියලා තේරෙනවා. දැන් කොච්චර සුන්දර දේවල් ගැන කථා කළාද? විපක්ෂයට බණින්න පුළුවන්. නමුත් ආණ්ඩුව පවත්වාගෙන යනකොට තමයි ඒකේ තිබෙන අමාරුව තේරෙන්නේ. අන්න ඒ අවස්ථාවේදී මේ කියන දේවල් කොහොමද වුණේ කියන එක තේරුම් ගන්න පුළුවන් වෙන්න ඕනෑ.

හොඳට මතක තියා ගන්න, අපේ රටේ ලක්ෂ 16ක් රජයේ සේවයේ ඉන්න බව. රජයේ ප්‍රතිපත්ති ගෙනයන්න තිබෙන්නේ ඒගොල්ලන් තුළින්. ඔබතුමන්ලා කොතරම් හොඳ උදාහරණ ගත්තත්, කොතරම් හොඳ අදහස් ගෙනාවත් ඒවා ක්‍රියාත්මක කරලා මාස හයක්, මාස නවයක් ගත වුණාම අමාරු වෙනවා. මේ කරුණු තමයි අපට අත්දැකීමෙන් ඔබතුමන්ලාට කියන්න පුළුවන් වෙන්නේ. මේ රුපියල් බිලියන 5,000 හොයනකොට,- අද මේ කථා කරන අවස්ථාව වනවිට ශ්‍රම බලකාය ලෙස ලක්ෂ 75ක් ඉන්නවා. ඒ ලක්ෂ 75න් අද corporate taxes ගෙවන්නේ 98,000යි. Individual Income Tax ගෙවන්නේ 851,000යි. PAYE ගෙවන්නේ 17,000යි. මේ ලක්ෂ 75න් බදු ගෙවන්නේ 17,000 නම් මේක සැබෑ මට්ටමින් කරන්න පුළුවන් දෙයක්ද?

මම මුදල් අමාත්‍යාංශය භාරව කටයුතු කළ අවස්ථාවේදී ෆයිල් ලක්ෂ 17ක් තිබුණා. ඒක අද ලක්ෂ 9කට අඩු වෙලා තිබෙනවා. මේවා තමයි ඔබතුමන්ලාට හදාගන්න ඕනෑ. මේවා තමයි එදා එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි ඉදිරියට ගෙනිච්චේ. ඉතින්, යූඑන්පී එකට නිකම් බැණලා හරියන්නේ නැහැ. මොකද, රටට ඉමහත් සේවයක් කරලා තිබෙනවා. ඒ අතර ප්‍රශ්න දෙක තුනක් වෙන්න පුළුවන්. නමුත් කොහොමද අපි ඉදිරියට යන්නේ?

ඒ වාගේම තමයි ගෙවුම් ශේෂය. මම මේ කාරණය මතක් කරන්නේ මේ හේතුව නිසායි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියලා තිබෙනවා, වාහන ආනයනය සම්බන්ධයෙන් පනවා ඇති තහනම ඉවත් කරන්න අවශ්‍යයි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වාහන ආනයනය විවෘත කරන අවස්ථාවේදී මම එක දෙයයි ඉල්ලන්නේ. මේ සඳහා ඇමෙරිකානු ඩොලර් බිලියන 1.52ක් විතර වැය වෙනවා. එතකොට රුපියල දෙදරන්න පුළුවන්. ඒ දෙදරීම නිසා මේ කටයුත්ත ඉතාම ආරක්ෂාකාරීව ඉදිරියට ගෙනියන්න අවශ්‍යයි.

අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 10යි, 11යි, 12යි වාගේ මට්ටමේ තිබෙන්නේ. දැන් ඩොලර් බිලියන 13කට ගිහිල්ලා තිබෙනවා. නමුත් මේ මොහොත, අපට ඩොලර් බිලියන 25ක් විතර අවශ්‍ය වන අවස්ථාවක්. සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා මීට පෙර සන්සන්දනය කරමින් කිව්වා, දළ දේශීය නිෂ්පාදනය හා සැසඳීමේදී අපනයන ආදායමට දායක වුණු ඒක පුද්ගල ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් 600ක් කියලා. ඒක වැරදියි. අපට ඒ කාලයේත් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 38ක් අපනයනයට තිබුණා. ඒක තමයි කඩා වැටිලා තිබෙන්නේ. තරගකාරී තත්ත්වයක් ඇතිව තිබියදීත් මේක කොහොමද වෙනස් වෙලා තිබෙන්නේ? කොහොමද, අපි ඒක වැඩි කරගෙන තිබෙන්නේ? ඉතින්, මම කිව්වා වාගේ යම් විධියකින් මේ ගෙවුම් ශේෂයේ දෙදරීමක් ඇති නොවන විධියට කටයුතු කිරීම තමයි ඔබතුමන්ලා කැබිනට් මණ්ඩලයේ තීන්දු ගන්නකොට,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, your time is up.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, give me one more minute and then, I will certainly honour your request.

ඒ වාගේම අපි කොහොමද වාහන ආනයනය විවෘත කරන්නේ? මේවාට ඩොලර්වලින් ගෙවන්න පුළුවන් නම්, dutyත් ඩොලර්වලින් ගෙවන්න පුළුවන් හැකියාවක් ඇති කරන්න කියලා මම යෝජනා කරනවා. ඩොලර්වලින් ගෙව්වාම මේ මුදල් යන්නේ කොහේටද කියලා හොයා ගන්න පුළුවන් මාර්ගයක් තිබෙන්න ඕනෑ. නැත්නම් ඔය ප්‍රශ්නය ඇති වෙනවා.

ඒ වාගේම තමයි ආර්ථික උද්ධමනය පාලනය කිරීම. මේකේ supply side එකත් බලන්න. උද්ධමනය පාලනය කරන්න කියලා ආර්ථිකය සංකෝචනය කළොත් ඕක තමයි තිබෙන ලොකුම ප්‍රශ්නය. ඒ නිසා අපි supply-side management එකත් බලන්න ඕනෑ.

SME loan system එක ගත්තොත්, කරුණාකර ඒ ගොල්ලන් දෙස ඉතාම මනුෂ්‍යභාවයෙන් බලන්න, කොහොමද අපි ඒ කටයුතු කරන්න ඕනෑ කියලා. 2028දී ණය ගෙවන්න නම් අපි කළ යුතු දේ මොකක්ද? 2028 සිට 2033 වෙනකොට දැනට ගෙවන ඩොලර්

[ගරු රවි කරුණානායක මහතා]

බිලියන 3ට අමතරව තවත් ඩොලර් බිලියන 3ක් එකතු වෙනවා. ඊට පස්සේ 2033 ඉඳලා තව ඩොලර් බිලියන 3ක් එකතු වෙනවා. ඉතින්, අපි ඒකට ලැහැස්ති වෙන්න අවශ්‍යයි. අපි ඩොලර් වැඩි කරගන්න අවශ්‍යයි. ඒ සඳහා අපනයනය වැඩි කරන්න ඕනෑ. ප්‍රේෂණ - remittances - වැඩි කරගන්න අවශ්‍යයි. FDI වැඩි කරන්න අවශ්‍යයි. සංචාරක කර්මාන්තය දියුණු කළ යුතුයි.

ඒ වාගේම තමයි පාඩු ලබන රජයේ ආයතන. ඔබතුමන්ලා යන ගමන බැලුවාම, SriLankan Airlines එක අනිවාර්යයෙන්ම privatize කරන්න ඕනෑ කියන මතයට ඔබතුමන්ලා ඒවි. Japanවලට, Londonවලට යන flightsවලින් SriLankan Airlines එක පාඩු විඳිනවා නම්, මොකක්ද රටට තිබෙන benefit එක? මේක පෞද්ගලීකරණය කරලා ඒ අලාභය ඇති නොවන විධියට කටයුතු කිරීම තමයි කරන්න අවශ්‍ය වන්නේ. ඒ නිසා මම කියන්නේ කොහොමද කරන්නේ කියලා මේ යෝජනා සලකා බලන්න කියන එකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, please wind up.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay, Sir. I will wind up in a second.

ඒ වාගේම තමයි මේ ලක්ෂ 16ක රජයේ සේවකයන්. රාජ්‍ය සේවය පිළිබඳව quality management එකක් කරන්න: cost-benefit analysis එකක් කරලා බලන්න, ඔවුන්ගෙන් රටට වන සේවය කොහොමද බලන්න. මොකද, මේ අයට රුපියල් බිලියන 1,700ක් ගෙවනකොට ඒකට වටිනාකමක් තිබෙන්න ඕනෑ. දැන් බොහොම අගය කරනවා; දැන් rag කරන්නේ නැහැ කියනවා, universitiesවල; protest කරන්නේ නැහැ කියනවා. අන්න, එහෙම තමයි තිබෙන්න ඕනෑ වන්නේ. දැන් පෙනෙනවා නේ ඒවා තිබෙනකොට කොතරම් අමාරුද, ඒවා නැති වුණාම ඔබතුමන්ලාට කොතරම් ලෙහෙසි වෙනවාද කියලා. ඒවාත් සමඟ තමයි මේ ආයෝජන ඉදිරියට ගෙනයන්න අවශ්‍ය වන්නේ. අපේ අභිලාෂය වන්නේ ජනතාවට මේ තිබෙන පීඩනය නැති කර ජීවත් වෙන්න පුළුවන් මාර්ගයක් ඇති කරන එකයි. රට වැටෙන්න දෙන්න බැහැ. ග්‍රීසිය වාගේ තුන් හතර ගමනක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක සෙල්ලම් කරන්න ගිහිල්ලා වැටිලා, අවුරුදු තුනෙන් කරන්න පුළුවන් දේ අවුරුදු 20ක් ඇදගෙන යන්න ලංකාවට සිදු නොවන විධියට කටයුතු කරන්න අවශ්‍යයි. 2028දී ණය ගෙවන්න අපි දැන් ඉඳලාම සූදානම් වෙමු. එතැනට ඇවිල්ලා කියන්න බැහැ, ගෙවන්න විධියක් නැහැයි කියලා. මම ඉතාම අගය කරනවා, මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මට කියන්න පුළුවන් ඇමෙරිකාවේ හිටපු ඒබ්‍රහම් ලින්කන්,- රටටත්, ජාතියටත් සිදු වූ තුවාල සුව කරගන්න ඕනෑ නම් අපි ඔක්කොම එකට ඒක රාශි වී එක ගමනක් යා යුතුයි, රට ගොඩනඟන්න එකතු විය යුතුයි.

Thank you. දෙවි පිහිටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Chathuranga Abeysinghe. You have 18 minutes.

[අ.භා. 12.14]

ගරු චතුරංග අබේසිංහ මහතා (කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ - கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Chathuranga Abeysinghe - Deputy Minister of Industry and Entrepreneurship Development)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විශේෂයෙන්ම ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට පසුව මට කථා කිරීමට ලැබීම දෛවෝපගත සිද්ධියක් විධියටත් මම දකිනවා. මොකද, අපි ආර්ථිකය ගැන ඇහුවේ හිටපු මුදල් ඇමතිවරුන්ගෙන්. ඒ වාගේම දැන් විපක්ෂයේ සිටින; 2015 ආණ්ඩුවේ හිටපු මැති ඇමතිවරුන් ISBs ගැන කථා කරනකොට කොහොම හිනා වෙන්නද කියලා තරුණයෙක් විධියට හිතන්න මට ටිකක් අපහසුයි. මොකද, අපේ රට මේ ආර්ථික අර්බුදයට ලක් වෙන්න ප්‍රධානම හේතුව තමයි ලංකාව වෙළෙඳ පොළ ණයවලට යෑම. සියයට 7.2ක දරුණු පොලියකට ලංකාව ගෙනැල්ලා තමයි මේ බංකොලොත්භාවයට පත් කරගත්තේ. ඉතින්, මේක ඉතාම විහිළුසහගතයි. සමහර මන්ත්‍රීවරු Debt Sustainability Analysis ගැන කථා කරනවා. මම අහන්න කැමැතියි, ඔය ආර්ථිකය ගැන දන්නා ගොඩක් අය 2015දී සියයට 7ක පොලියකට ISBsවලට යනකොට Debt Sustainability Analysis එකක් කළාද කියලා. මොකද, අපි හොඳටම දන්නවා, ඒ ගෙනාපු ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ; ආර්ථික වර්ධනය ඇතුළේ ඒ ණය ප්‍රමාණය කවදාවත් ලංකාවට ගෙවාගන්න බැහැ කියන එක.

ඒ වාගේම අද සිදු වෙච්ච සාකච්ඡා අතරේ විපක්ෂයෙන් වැරදි කාරණයක් මතු කළා, විශේෂයෙන්ම වර්තමාන ආණ්ඩුව රුපියල් බිලියන 3,000ක ණයක් ගන්න සූදානම් වෙනවා කියලා. ඇත්තටම මූල්‍ය සාක්ෂරතාව පිළිබඳ සමස්ත රටටම තිබෙන අර්බුදය විපක්ෂයෙත් තිබෙනවාද කියලා අපට තේරුම් ගන්න වෙනවා. මොකද, අපේ ගරු මහාචාර්යතුමා පැහැදිලි කළා, ඒ තිබෙන්නේ ණය හුවමාරුව සම්බන්ධයෙන් මේ ගිණුමට ඇතුළත් කරපු transaction එකක්, එහෙම නැතිව ඒක මුදල්මය වශයෙන් වෙන දෙයක් නොවෙයි, ඒක book entry එකක් කියලා. මොකද, මේ අවුරුද්ද ඇතුළත අපට ණය ප්‍රතිව්‍යුහගත කර ගන්න බැරි වුණොත් ඒ ණය හුවමාරුව සිද්ධ වෙන්නේ ජනවාරි මාසයේ. ඒ සඳහා තමයි ඒ බිලියන 3,000ක අගය දමලා තිබෙන්නේ කියලා.

ඇත්තටම රට මේ අර්බුදයෙන් ගොඩ ගන්න නම් අපි යන්න ඕනෑ ආර්ථික මාර්ගය වෙනස් කරන්නම වෙනවා. එහෙම වෙනස් කරද්දී අපට තේරුම් ගන්න වෙනවා, අනෙක් රටවල් මේ ආර්ථික වර්ධනය ළඟා කර ගත්තේ කොහොමද, තමන්ගේ අපනයන ප්‍රමාණය වැඩි කර ගත්තේ කොහොමද කියන එක. දැන් රවී කරුණානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ අපි කොහොමද 2028 වෙනකොට ඩොලර් සංචිත ප්‍රමාණය වැඩි කර ගන්නේ, මේ රට මෙතැනින් එහාට ගෙනියන්න? පළමුවැනි කාරණය, හැම රටකම ජාතික ප්‍රතිපත්තියක් - national policy එකක්, development policy එකක් තිබුණා. නමුත්, අපේ රටේ තරුණයෙක්වත්, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්වත්, මේ පාර්ලිමේන්තුවවත් දන්නේ නැහැ අපේ රටේ national policy එක මොකක්ද, විවිධ ක්ෂේත්‍ර දියුණු කරන්න industrial development policy එකක් අපේ රටට තිබෙනවාද කියලා. එහෙම ප්‍රශ්නයක් තිබෙනවා.

ඒ වාගේම තමයි රාජ්‍ය සහාය. පෞද්ගලික අංශයෙන් විතරක් දියුණු කරපු රටවල් ලෝකයේ නැහැ. පෞද්ගලික අංශයට රාජ්‍ය සහාය ලැබුණාට පස්සේ තමයි ඒ පෞද්ගලික අංශය ජාත්‍යන්තරය

අතික්‍රමණ කර ගත්තේ. ඒ වාගේම තමයි මානව සම්පත. රටක මානව සම්පත දියුණු කර ගන්න බැරි නම්, මානව සම්පතට අවශ්‍ය කුසලතා දෙන්න බැරි නම් ඒ රටේ දළ දේශීය නිෂ්පාදිතය වැඩි කර ගන්න, නිෂ්පාදන හැකියාව වැඩි කර ගන්න හැකියාවක් නැහැ. ඒ වාගේම තමයි නීතියේ සාධාරණත්වය. වංචාව, දූෂණය තුරන් කරන්නේ නැතිව අපට ආර්ථික සාධාරණත්වය - economic democracy එක- හදා ගන්න බැහැ. එවැනි රටකට මේ දියුණුව ළඟා කර ගන්න වෙන්නේ නැහැ. ඊට පස්සේ ජාත්‍යන්තර වෙළඳ පොළට ඇතුළු වෙන්න අවශ්‍ය කරන වෙනස්කම් ටික, සෘජු විදේශ ආයෝජන ගෙන්වා ගැනීමට අවශ්‍ය කරන වෙනස්කම් ටික රටක් හැටියට කර ගන්න ඕනෑ. අපි මේ කාරණා පහ ළඟා කර ගන්නා වේගය අනුව තමයි අපේ රට සංවර්ධන මාවතකට දමන්න පුළුවන් වන්නේ.

මම දැන් පැහැදිලි කරන්න හදන්නේ, රනිල් වික්‍රමසිංහ ගෙන ගියපු, 1977 ඉඳලා ලංකාව එක එක උපදේශකයන්ගේ, ඔස්තාර්ලාගේ අනුදැනුම ඇතිව ගෙනිච්ච නව ලිබරල් ආර්ථික ක්‍රමයෙන් අපේ ආර්ථික වැඩ පිළිවෙළ වෙනස් වෙන්නේ කොහොමද කියලායි. පළමුවැනි දේ තමයි මම කියපු policy consistency එක. අපේ රට කාලෙන් කාලෙට ආර්ථික ප්‍රතිපත්ති වෙනස් කරනවා, බදු ප්‍රතිපත්ති වෙනස් කරනවා, කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්ති වෙනස් කරනවා. නමුත් කර්මාන්තකරුවට හෝ ආයෝජකයාට ඒ ස්ථාවරභාවය ළඟා කර දෙන්න බැරි වුණා. උදාහරණයක් ගත්තොත්, ඉන්දියාවේ Planning Commission එක 1956 ඉඳලා තමන්ගේ රටේ ප්‍රතිපත්ති හදනවා. ලංකාවේ Planning Commission එක වෙලා තිබුණේ අවුරුදු පහෙන් පහට පත්වෙන මැති ඇමතිවරු. තම තමන්ට කැමැති කැමැති ව්‍යාපෘති ලංකාව පුරා අටවනවා. අපේ රට බංකොලොත් වෙන්න ප්‍රධානතම හේතුව තමයි අපේ රටට ජාතික ප්‍රතිපත්තියක්, කර්මාන්ත පිළිබඳ ප්‍රතිපත්තියක් නැති වෙච්ච එක.

අද සිංගප්පූරුවට ගියොත්, ඒ ගොල්ලන්ගේ ආණ්ඩුවේ website එකට ගියොත් දකින්න තිබෙනවා, "Singapore Green Plan" කියලා 2030 වෙනකන් හදපු වැඩපිළිවෙළ. අන්න ඒ plan එකට තමයි ඒ රට සමස්ත ආර්ථිකයම, සමස්ත අධ්‍යාපනයම, සමස්ත විශ්වවිද්‍යාල පද්ධතියම මෙහෙය වූවේ. අන්න ඒ වෙනස අපි කරනවා. ඒ වාගේම තමයි ආයතනික ව්‍යුහය - institutional structure එක- රටේ සංවර්ධනයට දායක කර ගන්නේ කොහොමද, කර්මාන්ත නිෂ්පාදනය වැඩි කර ගන්න දායක කර ගන්නේ කොහොමද කියන එක. අපි සතුටින් කියන්න කැමැතියි, මේ නව ආණ්ඩුවත් එක්ක කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතට IDB එක, EDB එක, SEDD එහෙමත් නැත්නම් Small Enterprises Development Division එක, NEDA එක සහ ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය -NPS එක- ලැබිලා තිබෙනවා. ඉතින්, මේක ශක්තිමත් ආයතනික ව්‍යුහයක්. නමුත් මේ ශක්තිමත් ආයතනික ව්‍යුහයන් වෙනත් රටවලට සාපේක්ෂව ලංකාවේ අණ පනත්වලින් බිහි කරලා තිබුණාට මේවා කවදාවත් තමන්ගේ අරමුණුවලට ගියේ නැහැ. ඒ අරමුණු ඉෂ්ට කර ගන්න බැරි වෙන්න ඒ සමස්ත රාජ්‍ය යන්ත්‍රණයම අකාර්යක්ෂම කරලා අපේ කර්මාන්තකරුවන්ට, නිෂ්පාදකයාට, ව්‍යවසායකයාට ලබා දෙන්න ඕනෑ සහාය අපේ රටේ ලබා දෙන්න බැරි වුණා. අපි හිතනවා, අලුත් ආණ්ඩුවේ, අලුත් Budget එක ඇතුළේ මේ ආයතන ඉතාම ශක්තිමත්ව පෞද්ගලික අංශයට මේ අවශ්‍ය කරන සහාය දෙයි කියලා.

විශේෂයෙන්ම මම කථා කරන්න ඕනෑ, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය පිළිබඳව. ඒ වාගේම මේ මගේ අතේ තිබෙන "Great Quality Korea" කියන පොත ගැනත් කියන්න ඕනෑ. ඔබතුමන්ලාට හැකි නම් මේ පොත අරගෙන කියවන්න. මොකද, මේකේ කථා කරනවා, තම තමන්ගේ එක් එක් පෞද්ගලික කර්මාන්තවල, රාජ්‍ය කර්මාන්තවල, රාජ්‍ය සේවයේ ඵලදායිතා වැඩි කරන්න අවශ්‍ය ආකාරය ගැන. අපි ලෝකය එක්ක තරගකාරී වෙන්න නම්, අපි දවසින් දවස අපේ cost competitiveness වැඩි කර ගන්න ඕනෑ. අපේ ආයතනවල ඒ ඵලදායීතාව ජාතික ප්‍රතිපත්තියක් ඇතුළේ වැඩි කරන්නේ කොහොමද කියලා, ඒ වාගේම ඒ එක් එක් කර්මාන්තයේ ඵලදායීතාව මාස හයෙන් හයට, අවුරුද්දෙන් අවුරුද්දට වැඩි කරන්නට කොහොමද ඒ රටවල් දියත් වුණේ කියන කාරණය තේරුම් ගැනීමේ අවශ්‍යතාවක් අපට තිබෙනවා. ඒ වාගේම තමයි government support for business කියන එක; රාජ්‍යය කොහොමද, facilitator කෙනෙක් විධියට පෞද්ගලික අංශයට සහාය දෙන්නේ කියන එක.

මෙතැන නව ලිබරල් කථාවක් කියැවුණා. "ආණ්ඩුව මොකුත් කරන්න ඕනෑ නැහැ; පෞද්ගලික අංශය වෙළඳපොළ යටතේ ක්‍රියාත්මක වෙනවා" කියලා කිව්වා. එහෙම ලෝකයේ කොහේවත් වෙලා නැහැ. වේගයෙන් සංවර්ධනය වෙච්ච රටවල් හැම එකටම රාජ්‍ය යන්ත්‍රණය මැදිහත් වෙලා තමයි ඒ අවශ්‍ය කරන වෙනස්කම් ටික කර ගත්තේ. එක පැත්තකින් නිෂ්පාදන පිරිවැය අඩු කරලා දෙන්න රාජ්‍ය යන්ත්‍රණයට විශේෂ වගකීමක් තිබෙනවා. ඒ නිසා තමයි රාජ්‍ය යන්ත්‍රණය බලශක්තිය, සන්නිවේදනය, ප්‍රවාහනය, බැංකුකරණය වාගේ ක්ෂේත්‍රවලට මැදිහත් වෙලා ඉන්නේ. ඒ වාගේම තමයි කර්මාන්තවලට සුදුසු බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ගන්න වෙනවා. වර්තමානයේ තිබෙන බදු ප්‍රතිපත්තිය කිසිම කර්මාන්තකරුවෙකුට ඔළුව උස්සන්න බැරි තරමට හිර කරලා තිබෙනවා. ඒ නිසා IMF වැඩපිළිවෙළ ඇතුළේ අපි මේ වෙනස්කම් කරන්න සූදානම් වෙලා ඉන්නවා. ඒ වාගේම තමයි අවශ්‍ය කරන මානව සම්පත සහ පර්යේෂණ සඳහා අවශ්‍ය කරන දායකත්වය රජය ලබා දෙන්න ඕනෑ. අපේ රටේ කිසිම රජයකට පර්යේෂණ සඳහා අවශ්‍ය කරන ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ.

ඒ වාගේම තමයි Ease of Doing Business කියන එක. ලංකාව, එම සමස්ත index එකේ කොච්චර දුරට ගිහිල්ලා තිබෙනවාද කියන එක. අපේ කර්මාන්තකරුවෙකුගෙන් ඇහුවොත් තේරෙනවා, කොහොමද නගර සභාවෙන් අවශ්‍ය ලේඛනයක් ගැනීමේ ඉඳලා තමන්ගේ ලයිසන් එකක් ගන්න යන තැනකට වෙනතුරු, අපනයන සහනිකයක් ගන්න තැනට වෙනතුරු කර්මාන්ත කරන්න එපා කරලා, බිස්නස් කරන්න එපා කරලා තිබෙන මේ දූෂිත දේශපාලනය. අපි එය වළක්වලා එතැනින් එහාට ගිහිල්ලා කර්මාන්තකරුවන්ට single window එකක් යටතේ තමන්ගේ ප්‍රශ්න ටික විසඳා ගන්න පුළුවන් වන විධියේ ආයතනික සහාය අපට ලබා දෙන්න පුළුවන්.

ඊළඟට, capital formation එකට රජය මැදිහත් වෙන්න ඕනෑ. ප්‍රාග්ධනය ළඟා කර ගන්න, පෞද්ගලික අංශයේ සංවර්ධන කටයුතු, ආයෝජන කටයුතුවලට අවශ්‍ය කරන ප්‍රාග්ධනය ලබා ගන්න රාජ්‍ය මැදිහත්වීමක් ඕනෑ. බ්‍රසීලය, දකුණු කොරියාව, වියට්නාමය, ඉන්දියාව වාගේ රටවල සමස්ත ආර්ථිකය දියුණු වුණේ සංවර්ධන බැංකු හරහා. ඉන්දියාවේ මේ වෙනකොට සංවර්ධන බැංකු 11ක් ක්‍රියාත්මක වෙනවා. ලංකාවේ තිබුණු සියලු සංවර්ධන බැංකු ටික විනාශ කරලා දැම්මේ, ඔය නව ලිබරල් ආර්ථිකය. ඒ ආර්ථිකයෙන් වෙනස් වෙන්නේ අපි ඒ විධියට. ඊළඟට ජාත්‍යන්තර වෙළඳපොළ පැත්තෙන් බැලුවොත්, වෙළඳපොළ සම්පූර්ණයෙන් විවෘත කරලා දියුණු වෙච්ච රටක් කොහේවත් නැහැ. තමන්ගේ කර්මාන්තවලට ආරක්ෂණය දෙන ගමන් කෙමෙන්, කෙමෙන් තමයි රටවල් දියුණු වුණේ, වෙළඳපොළ ආර්ථිකය එක්ක. වල්බූරු විධියට ආර්ථිකය විවෘත කරලා තමන්ගේ කර්මාන්ත බිඳ වැටෙන්න හැරලා, ඒ කර්මාන්තවල ඵලදායිතාවට උදව් කරන්නේ නැතුව, ආර්ථිකය අත හැරලා කටයුතු කිරීම නිසා තමයි අද අපට මේ උද්ධමනයට

[ගරු චතුරංග අබේසිංහ මහතා]

පවා මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඉතින් මෙන්න මේ කාරණා ටිකෙන් ඔය නව ලිබරල් ආර්ථික ක්‍රමයෙන් අපේ ආර්ථික ක්‍රමය අනිවාර්යයෙන් වෙනස් වෙනවා.

ඉතින් මම කියන්න කැමැතියි, මේ පුනරුද යුගයේ නිෂ්පාදනය සහ ව්‍යවසායකත්වය හෙට ඉඳලා වෙනස් වෙන්නේ කොහොමද කියලා. පළමුවෙනි දේ තමයි vision එක. මේ වාගේ vision එකක් මේ කිසිම රජයකට, මට මතක ඇති කාලයේ - පසුගිය අවුරුදු 20 ඇතුළතම - පත් වෙච්ච රජයකට තිබුණේ නැහැ. කොහොමද අපේ ආර්ථිකය දියුණු කරන්නේ, කොහොමද අපේ නිෂ්පාදනය වැඩි කරන්නේ, කොහොමද අද තිබෙන ඩොලර් බිලියන 17ක අපනයනය ඩොලර් බිලියන 45කට අරගෙන යන්නේ කියන මේ චින්තනය පාසල් දරුවෙකුට දෙන්න, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුට දෙන්න, කර්මාන්තකරුවෙකුට දෙන්න, ආයෝජකයෙකුට දෙන්න පුළුවන් vision එකක් නැත්නම් දැක්මක් මේ පාලනය කරපු කිසි කෙනෙකුට තිබුණේ නැහැ. හැමෝටම තිබුණේ තම තමන්ගේ පෞද්ගලික අරමුණු. ඒ වාගේම අරමුණක්, ඉලක්කමක් දක්වා තමන්ගේ කර්මාන්තය ගෙනියන්නේ කොහොමද කියන එක ගත්තොත්, අපනයන කර්මාන්ත ලංකාවේ තිබෙනවා; IT ක්ෂේත්‍රයේ බිලියන 1.2ක සිට බිලියන 5කට ගෙනියන්න vision එකක් අපට තිබෙනවා. ඇඟලුම් කර්මාන්තය බිලියන 5 සිට 7කටත්, කෘෂිකාර්මික නිෂ්පාදන අපනයන බිලියන 2.5කින් 4කටත්, වරාය ආශ්‍රිත ඉපැයීම් බිලියන 3කටත්, tourism sector එක බිලියන 8කටත් ගෙනියන්න පුළුවන් දැක්මක් අපට තිබෙනවා. ඒ ආකාරයට අපට ළඟා කර ගන්න පුළුවන් targets දමාගෙන, ඒ සඳහා රාජ්‍ය අංශයයි, පෞද්ගලික අංශයයි එකට සම්බන්ධ කර ගැනීමේ කාර්යය කර ගන්න ලබන මාස කිහිපය ඇතුළත අපට පුළුවන්කම ලැබෙනවා.

මේ සෑම කර්මාන්තයක්ම ප්‍රශ්න තොගයක් පිටින් තමයි අපට භාර දුන්නේ. ඒක නිෂ්පාදන කර්මාන්තය වෙන්න පුළුවන්, සේවා කර්මාන්තය වෙන්න පුළුවන්, එහෙම නැත්නම් අගය එකතු කරන කර්මාන්ත වෙන්න පුළුවන්. ඒවා සම්පූර්ණයෙන් බිඳ වැටිලා තමයි මේ රාජ්‍යය අපට භාර දුන්නේ. ඒ ගොල්ලන්ගේ අමු ද්‍රව්‍ය පිළිබඳ ගැටලු තිබෙනවා. අමු ද්‍රව්‍යවලට බදු ගහලා තිබෙනවා. අමු ද්‍රව්‍යවල සුලබත්වය නැති වෙලා තිබෙනවා. ප්‍රාග්ධන සම්පාදනයේ ගැටලු තිබෙනවා. ඒ ගොල්ලන්ට අඩු පොලී ණයක් ගන්න තැනක් නැති වෙලා තිබෙනවා. සියලුම යෙදවුම්වලට බදු ගහලා, නිමි භාණ්ඩ බදු නැතිව ලංකාවට ගෙනෙන්න පුළුවන් ක්‍රමයක් හදලා තිබෙනවා. සේවකයන් ගත්තොත්, මේ සෑම කර්මාන්තයටම අවශ්‍ය කරන තාක්ෂණික ශිල්පීන් අපේ අධ්‍යාපන ක්‍රමයෙන් ලැබෙන්නේ නැති තත්ත්වයක් තුළ තමයි මේ කර්මාන්ත මේ වන කොටත් කරගෙන යන්නේ.

Trade services ගත්තොත්, අපේ අපනයන වෙනත් රටවලට ගෙන යන්න පුළුවන් රාජ්‍යතාන්ත්‍රික සේවා අකර්මණ්‍ය කරලා රට කරගෙන ගිහින් දැන් අපෙන් අහනවා, ඔයගොල්ලන් කොහොමද රනිල් වික්‍රමසිංහට වඩා වෙනස් වෙන්නේ, ඔයගොල්ලන් කොහොමද මේ ආර්ථික ක්‍රමය වෙනස් කරන්නේ කියලා. මේ ක්‍රියා මාර්ග ටික පිළිවෙළකට ගන්න තමයි **අය වැයක්** ඉදිරිපත් කරලා, ඒ ආයතන පද්ධතිය වෙනස් කරගෙන අපේ රටේ ආයතනවලට කැබිනට් එක විධියට, එක අරමුණකට අනුව සහාය දෙන්න අප උත්සාහ කරන්නේ. අපි ඒ බව විශේෂයෙන් කියන්න කැමැතියි.

අපේ දැක්ම තමයි ව්‍යවසායකත්වය පුළුල් කරන එක. මොකද, ව්‍යවසායකත්වය තුළින් තමයි, ආදායම් බෙදී යෑමේ විෂමතාව අවම කරන්න අපට පුළුවන් වන්නේ. ඒකට වෙනත් ක්‍රියා මාර්ගයක් නැහැ. ලෝකයේ දියුණු වෙච්ච රටවල සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සියයට 85ක් විතර ආර්ථිකයට දායකත්වය ලබා දෙනවා. නමුත්, අද අපේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සියල්ල බිඳ වැටිලා අවසානයි.

අප කොහොමද ඒ අංශය දියුණු කරන්නේ කියන කාරණය ගත්තොත්, ලබන මාසයේ ඉඳලා කර්මාන්තකරුවන්ට, ඒ ව්‍යවසායකයන්ට තමන්ගේ ඉල්ලීම් අරගෙන කර්මාන්ත අමාත්‍යාංශයට හෝ ආණ්ඩුවේ තැන්වලට යන්න අවශ්‍ය වෙන්නේ නැහැ. මොකද, අපි තමයි ඉල්ලීම් අරගෙන ඔබතුමන්ලාගේ කර්මාන්තවලට එන්නේ. ඔබතුමන්ලාගේ මේ අවුරුද්දේ target එක කීයද, ඒක තව වුට්ටක් වැඩි කරන්න පුළුවන්ද කියලා ඇවිල්ලා අහන්නේ, ඇමතිතුමායි. ඔබතුමන්ලාගේ ඵලදායිතාව කොච්චරද, එක unit එකකට වැය වන පිරිවැය කොච්චරද, ඒ පිරිවැය ලබන අවුරුදු පහ ඇතුළත අප අඩු කර ගන්නේ කොහොමද, ඔයගොල්ලන්ගේ කර්මාන්තයට තාක්ෂණය ගෙනෙන්නේ කොහොමද කියන ප්‍රශ්න අහන්නේ, රාජ්‍ය යන්ත්‍රණය මඟින්. ඒ මිස තමතමන්ගේ ගැටලු උස්සාගෙන ආණ්ඩුවේ නිලධාරීන් පසුපස, එහෙම නැත්නම් ආණ්ඩුවේ ඇමතිවරුන් පසුපස ගිය කාලය අපි මෙතැනින් අවසන් කරනවා.

මම මෙහිදී පුංචි උදාහරණ ටිකක් දෙන්නම්. මේ හදලා දීපු අර්බුදය කොහොමද සමනය කර ගන්නේ කියන එක ගැන කථා කරන කොට, මේ අර්බුදයේ ගැඹුර තේරුම් ගන්න ඕනෑ. Policies තිබුණාට විතරක් වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව කොච්චර වෙලාවක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have three minutes more.

ගරු චතුරංග අබේසිංහ මහතා
(மாண்புமிகு சதுரங்க அபேசிங்ஹ)
(The Hon. Chathuranga Abeysinghe)
Okay. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියාගෙන ආවේ මෙකයි. ගිය අවුරුද්දේ අපේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආර්ථික අර්බුදය හින්දා බිඳ වැටුණා. ආර්ථික අර්බුදය හින්දා ව්‍යාපාර බිඳ වැටෙන කොට වෙනත් රටවල් නම්, stimulus package එකක් දීලා තමන්ගේ කර්මාන්ත ටික ගොඩ ගන්නවා. නමුත්, අපේ ආර්ථිකය බංකොලොත්, අපේ අය වැය බංකොලොත්. ඒ වාගේ සහනයක් දෙන්න බැරිව රනිල් වික්‍රමසිංහ ආණ්ඩුවෙන් රුපියල් බිලියන 350ක ප්‍රශ්නයකට රුපියල් බිලියන 20ක සොච්චමක් දුන්නා බැංකුවලට, ණය ලබා දෙන්න කියලා. අපි මේ document එක අතට අරගෙන බලන කොට, ගිය සතියේ තොරතුරු ගෙන්වා ගෙන බලන කොට පෙනුණා, කර්මාන්ත අමාත්‍යාංශයෙන් සහතික කරලා දුන් ආයතන 140න් 4දෙනකුට පමණයි ඒ සහනදායී ණය ලැබිලා තිබෙන්නේ කියලා. ඒ කියන්නේ, ඒ ප්‍රතිපත්ති තීරණය කළාට වැඩක් නැහැ, තීරණ ගත්තාට වැඩක් නැහැ, රාජ්‍ය යන්ත්‍රණය ක්‍රියාත්මක කර ගන්න ප්‍රායෝගික සැලසුමක් නැත්නම්. ආණ්ඩුව රුපියල් බිලියන 20ක ඉතාම සොච්චම් මුදලක් දුන්නත්, ඒ NPL category එකේ තිබෙන ආයතනවලට ලැබෙන්න තිබෙන රුපියල් බිලියන 5 පවා තවම දී ගන්න බැරි වෙලා තිබෙනවා.

අනෙක් පැත්තෙන් ගත්තොත්, සමස්ත කර්මාන්ත පද්ධතියම - හැම කර්මාන්ත ක්ෂේත්‍රයම - අර්බුදයකට ලක් කරලා තමයි අපට රට බාර දුන්නේ. ලංකාවේ දැවැන්ත ලෝහ කර්මාන්තයක්

තිබෙනවා. ප්‍රතිවක්‍රීකරණ ලෝහවලින් තමයි ඒ සියලු දේ කරන්නේ. නමුත්, අපේ galvanizing cost එක තුන්ගුණයක් වෙලා තිබෙනවා. ඒකට මොකක්ද දෙන විසඳුම? ඔබතුමන්ලා පසුගිය අවුරුදු 10 තුළ දුන්නු විසඳුම මොකක්ද? අපි ඒ විසඳුම් හොයන්න ඕනෑ.

ඒ වාගේම තමයි SVAT ප්‍රශ්නය. IMF එක කියන විධියටම කළා නම් ජුනි මාසයේ SVAT එක අයින් කරනවා. එතකොට සමස්ත අපනයන කර්මාන්තය බිඳ වැටෙනවා. නමුත්, ඒකට විසඳුමක් සොයා ගන්න රාජ්‍ය මැදිහත්වීමක් කරන්න ඕනෑ. තාක්ෂණය ගෙනැල්ලා වැඩි කාලයක් යන්නේ නැතුව VAT refund එක ගන්න පුළුවන් පද්ධතියක් හදාගෙන තමයි අපට ඒ වෙනස්කම කරන්න වෙන්නේ.

මම ඊයේත් කථා කළා anti-dumping law එක ගැන. අපේ රටේ තිබෙන්නේ වල් බූරු විවෘත ආර්ථිකයක් කියලා, අපේ Sri Lanka Customs එක හරහා ඕනෑම කුණු ගොඩක් ලංකාවට ගෙනැල්ලා ගොඩ බානවා. මට බැලුම් නිෂ්පාදකයෙක් හමු වුණා. ඔහුට පුළුවන් ස්වාභාවික රබල්වලින් ලංකාවටම බැලුම් නිෂ්පාදනය කරන්න. නමුත්, ඔහුට ඒක කර ගන්න බැහැ. මොකද, synthetic rubberවලින් නිෂ්පාදනය කරන සත 10, සත 25 මිල ගණන්වලට බැලුම් කන්ටේනර් ගණන් ගෙන්වනවා. පාවහන්, electronic items ගත්තත් ඒ වාගේම තමයි. ඒවා මේ රටේ හදන නිෂ්පාදකයාට **සම බිමක්** නැති කරලා තිබෙනවා. මොකද, කිසිම standard එකක් නැතුව, කිසිම මිල කිරීමක් නැතුව, අගය කිරීමක් නැතුව භාණ්ඩ ලංකාවට ගෙන්වනවා. අපි මේක ලබන මාසයේ - ලබන quarter එකේ - නවත්වනවා, අලුත් පනත් කෙටුම්පතක් ගෙනැල්ලා.

දේශීය රෙදි පිළි කර්මාන්තයට VAT ගහලා තිබෙනවා; ආනයනය කරන රෙදි පිළිවලින් VAT ඉවත් කරලා තිබෙනවා. මේ වන කොට අපේ jewellery කර්මාන්තයේ අපනයන ප්‍රමාණය සියයට 32කින් අඩු වෙලා තිබෙනවා. මොකක්ද හේතුව? කිසිම දැක්මක්, සැලැස්මක් හෝ විද්‍යාත්මක ප්‍රතිපත්තියක් නැතුව අත්තනෝමතික විධියට බදු පැනෙව්වා. අන්න එසේ බදු පනවපු නිසා එම කර්මාන්තය ලංකාවෙන් විතැන් වෙලා තිබෙනවා. ලංකාවේ packaging industry එකට අවශ්‍ය කරන අමු ද්‍රව්‍යවලට, අවශ්‍ය කරන යෙදවුම්වලට බදු පනවා තිබෙනවා. මේවා තමයි අපට වෙනස් කරන්න වෙන්නේ. ඔබතුමන්ලා අපට භාර දීලා තිබෙන්නේ කර්මාන්ත අකර්මණ්‍ය කරපු රටක්; කර්මාන්ත අර්බුදවලට ලක් කරපු රටක්. ඒ වගකීම තමයි අපේ කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයට පැවරී තිබෙන්නේ.

අපේ mineral sector එක ගත්තත් එහෙමයි. සමස්ත mineral sector එකේ licensing process එක ගත්තොත්, දන්නා කියන කිසිම කෙනෙක් ඒ ක්ෂේත්‍රයට එන්නේ නැහැ. Licence එක මාසයෙන් මාසයට ගන්න ඕනෑ. අවුරුද්දෙන් අවුරුද්දට ආයතන පහක් හරහා එය අලුත් කරන්න ඕනෑ. එහෙම නොකළොත් ඒ කර්මාන්තය කරගෙන යන්න බැහැ. අපි කිව්වාට, අපි ලිබරල්, අපි ආර්ථිකය විවෘත කරනවා කියලා, වේගයෙන් දියුණු වන රටවල් එහෙම විවෘත කරන්නේ නැහැ. ඉන්දියාව දැන් ගෙනැල්ලා තිබෙනවා Bureau of Indian Standards - BIS - කියලා national standards body එකක්. අපේ රටෙන් භාණ්ඩ අපනයනය කරමින් හිටපු කර්මාන්තකරුවන් දැන් අර්බුදයට ලක් වෙලා ඉන්නවා, ඒ standards meet කර ගන්න බැරිව. ඒ නිසා අපි කියන්නේ, quality standards දාලා මේ රටේ කර්මාන්ත ටික ආරක්ෂා කර ගන්න අපට අවශ්‍යතාවක් තිබෙන බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථාව අවසන් කරන්න වෙන්නේ මෙහෙමයි. දැන් මේ නව ලිබරල් ඔස්තාර්ලා TV channelsවලට සහ හැම තැනම කිය කියා යනවා, මේ තරගකාරීත්වය ගැන. ලෝකයේ රටවල් නිෂ්පාදන කරන්නේ තරගකාරීත්වය අනුව ලු. තරගකාරීත්වය - competitiveness - වැඩි භාණ්ඩය නිෂ්පාදනය කරලා වෙනත් රටවලට යවනවා ලු. ඒ රටවල competitiveness තිබෙන භාණ්ඩ හදලා මෙහේට එවනවා ලු. ඒක තමයි ලු, න්‍යාය. නැහැ. Competitiveness කියන එක ඉබේ ඇති වන එකක් නොවෙයි. Competitiveness ඇති කර ගන්නේ කර්මාන්තයි, රාජ්‍යයයි, රටේ සමස්ත ජනතාවයි එකතු වෙලායි.

දැනට අපනයන කර්මාන්ත 4,226ක් තිබෙනවා. දේශීයව නිෂ්පාදන සිදු කරන කර්මාන්ත දැවැන්ත ප්‍රමාණයක් තිබෙනවා. අන්න ඒ සමස්ත කර්මාන්ත පද්ධතියේ එලදායිතාව ඉහළ නංවලා ලෝකයේ තරග කරන්න පුළුවන්, ලෝකයේ අගයදාමය එකතු කරන්න පුළුවන් ආර්ථික ක්‍රමයක්, රාජ්‍ය, පෞද්ගලික, සමුපකාර කියන ක්‍රම තුනම මැදිහත් වෙලා කරගෙන යන ආර්ථික ක්‍රමයක් තමයි අවශ්‍ය. ජනතාවට කියන්න තිබෙන්නේ, මෙච්චර කල් ගෙන ගිය වැරදි ආර්ථික ක්‍රමය අපි ආපසු හරවනවා; ඉන්දියාව, දකුණු කොරියාව, වියට්නාමය වාගේ රටවල් ළඟා කර ගත්තු දැවැන්ත ආර්ථික ප්‍රවර්ධනය අපි ළඟා කර ගන්නවා කියලායි. එසේ කියමින්, මගේ වචන ස්වල්පය නිමා කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! The Sitting is suspended till 1.00 p.m. for lunch.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නැවත පවත්වන ලදී.
அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.00 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.
Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. D.V. Chanaka. You have seven minutes.

[අ.භා. 1.00]

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැක්කා ඊයේ ගරු සභානායකතුමා ප්‍රකාශයක් කරනවා, අපි දෙකයි පනහේ කණ්ඩායම කියලා. ඒ, මීට මාස 3කට කලින් තමයි අපි දෙකයි පනහේ කණ්ඩායම. අපි දැන් සියයට 3 කණ්ඩායම වෙලා තිබෙන්නේ. සභානායකතුමනි, වැඩිය අමතක කරන්න එපා. මොකද, අපටත් අමතක වෙච්ච නිසා තමයි ඔබතුමන්ලා සියයට 42 දක්වා ගියේ. දැන් අපි දශම 5කින් වැඩි වෙලා තිබෙන්නේ.

ඊයේ මේ ගරු සභාවේදී අපි වගා හානි ගැන කථා කළා. ඒ වෙලාවේ අපේ කෘෂිකර්ම අමාත්‍යතුමා සභාවේ හිටියේ නැහැ. නියෝජ්‍ය ඇමතිතුමා තමයි සභාවේ හිටියේ. මම නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා. ගරු කෘෂිකර්ම ඇමතිතුමනි, ඒ ඉල්ලීම ගැන ඔබතුමා හොඳටම දන්නවා. ඔබතුමා අනෙක් අමාත්‍යවරු වාගේ නොවෙයි කෙළින් කථා කරනවා. ඔබතුමා දන්නවා, කුඹුරු අක්කරයක් වගා කරන්න අවම වශයෙන් වියදම යනවා, රුපියල් 90,000ක්. ප්‍රදේශය අනුව අක්කරයක් වගා

[ගරු ඩී.වී. චානක මහතා]

කරන්න රුපියල් 80,000ත්, 90,000ත් අතර මුදලක් වැය වෙනවා. මේ වෙද්දී රුපියල් 70,000ක් විතර ඒ කුඹුරු වෙනුවෙන් වියදම් කරලා ඉවරයි. ඒක නිසා අපි කියා සිටියා, මේ ගෙවන රුපියල් 40,000ක වන්දිය මදි කියලා. මොකද, රුපියල් 70,000ක් වියදම් කරපු කුඹුරු අක්කරයකට වන්දි විධියට ලැබෙන්නේ රුපියල් 40,000යි. මේ රුපියල් 40,000න් ඒ ගොවි පවුල මාස 6ක් ජීවත් වෙන්න ඕනෑ. මේක කරන්න පුළුවන් ද කියලා අපි නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ප්‍රශ්න කළා. එතුමා ඒ ප්‍රශ්නයට උත්තරය දෙන්න ඕනෑ එක්කෝ, "මේ වෙලාවේ ආණ්ඩුවේ මුදල් නැහැ. එහෙම නැත්නම්, අපට මේක දෙන්න ක්‍රමයක් නැහැ, මේ ඉල්ලීම අසාධාරණයි" කියලා. ඒ මොනවා හරි විධියකින් එතුමා උත්තරය දෙන්න ඕනෑ. හැබැයි, එතුමාගේ උත්තරය වුණේ මොකක්ද? චානක, හොඳට අහගන්න කිව්වා. 2012දී මෙහෙමයි කිව්වා; 2014දී මෙහෙමයි කිව්වා; 2019දී මෙහෙමයි කිව්වා; වන්දි දුන්නේ මෙහෙමයි කිව්වා. වන්දි ගන්න අපිට ගෙවල් වට කරන්න වුණා කිව්වා. මම අහපු එක ප්‍රශ්නයකටවත් එතුමා උත්තර දුන්නේ නැහැ. මම එතුමාගෙන් ඇහුවේ මේක දෙන්න පුළුවන් ද, බැරිද කියලායි. එහෙම නැත්නම් මේක සාධාරණ ද, නැද්ද කියලා. හැබැයි, ඒ වෙනුවට එතුමා විපක්ෂයේ කාර්යභාරය කරනවා. දැන් එතුමා කියන්නේ අපිටත් ඇමතිතුමාගේ ගේ වට කරන්න කියලා ද? එහෙම නැත්නම් එතුමාගේ ඉල්ලීම නියෝජ්‍ය ඇමතිතුමාගේ ගේ වට කරන්න කියලාද? "අපි වට කරලා ගත්තා. ඒක නිසා මේක දෙන්න" වාගේ දෙයක් ද මේ කියන්නේ? ගරු අමාත්‍යතුමනි, මම පෙනී ඉන්නේ ගොවියා වෙනුවෙන්. ගිය ආණ්ඩුවත්, අපේ ආණ්ඩුවත් වගා වන්දි අඩුවෙන් දෙන වෙලාවේ මම ගොවියා වෙනුවෙන් පෙනී සිටියා; මේ පාර්ලිමේන්තුවේදී ඒ වෙනුවෙන් පෙනී හිටියා. අපේ ආණ්ඩුව, ඒ ආණ්ඩුව, මේ ආණ්ඩුව කියලා නැහැ, රටේ ගොවියාට අසාධාරණයක් වෙනවා නම් මම පෙනී ඉන්නවා.

කෘෂිකර්ම ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්න නිසා මම මේකත් කියන්න ඕනෑ. දැන් අපේ පැත්තේ කුඹුරුවලට යූරියා එක මුරයක් ගහලාත් ඉවරයි. නමුත්, තවම පොහොර සහනාධාරය දෙන්න බැරි වෙලා තිබෙනවා. ඒ වාගේම තමයි, අර්ධ හානි වෙච්ච කුඹුරු තිබෙනවා. නියර කැඩිච්ච කුඹුරු තිබෙනවා. මේ පිළිබඳව කිසිම සමීක්ෂණයක් මේ වෙනකම් කරලා නැහැ. ඔවුන් පිළිබඳ වැඩ පිළිවෙළක් නැහැ. ඒක නිසා අමාත්‍යතුමනි, මේ පිළිබඳව මැදිහත් වෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම, දැන් තිබෙන වෙළෙඳ මාෆියාව ගැනත් මම කියන්න ඕනෑ. ලෝකයේ හැමතැනම වෙළෙඳ මාෆියා තිබෙනවා. හැබැයි, ලංකාවේ මේ වෙලාවේ වෙළෙඳ මාෆියාව අහසටත් වඩා උඩට ගිහිල්ලා තිබෙනවා. මොකද, මේ වෙළෙඳ මාෆියාව දැකලා තිබෙනවා, මේ ආණ්ඩුවේ අසාර්ථකත්වය. මේ ආණ්ඩුවට දැනීමක් නැති හින්දා තමයි වී පිළිබඳ ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙන්නේ. ගිය අවුරුද්ද උදාහරණයකට ගන්නකෝ. ගිය අවුරුද්දේ වගා කළේත් මේ ප්‍රමාණයම තමයි. ගිය අවුරුද්දේ වී අස්වැන්න ලැබුණේත් මේ ප්‍රමාණය තමයි. මේ මහ කන්නය ගැන කථා කරලා වැඩක් නැහැ. මේ මහ කන්නය කියන්නේ ඉස්සරහට අපට ලැබෙන අස්වැන්න. මේ ගංවතුර බලපෑවේ මේ මහ කන්නයට. දැන් යල කන්නයේ අස්වැන්න තමයි ලැබිලා තිබෙන්නේ. එහෙම නම් මේ අස්වැන්න කෝ? යල කන්නයේ අස්වැන්න ගිය අවුරුද්දේ ප්‍රමාණවත් වුණා නම්, නාමල් කරුණාරත්න මහත්මයා කියන විධියට ලංකාවේ බත් කන එකත් අඩු වෙලා නම්, කෝ ඒ වී ටික? අමාත්‍යතුමනි, මේක හොයන්න. මේ වෙළෙඳ මාෆියාව ගැන හොයන්න. ඉස්සර සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා කිව්වා, "මේවා විසඳන්න එක රතු පැන් ඉරයි; එක පැන් ඉරයි යන්නේ" කියලා. දැන් පැනේ තින්ත ඉවර වෙලා ද? එහෙම නැත්නම් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ වී ටික හොයනවා වෙනුවට මොකක්ද දැන් කරන්න යන්නේ? මම දැක්කා අද වෙළෙඳ ඇමතිතුමා කියා තිබෙනවා, "අපි සහල් කිලෝග්‍රෑම් ලක්ෂ දෙකක් සතොස හරහා දෙනවා" කියලා. මොකක්ද මේ විහිළුව? දවසක සහල් අවශ්‍යතාව කිලෝග්‍රෑම් කීයද? එක දවසේ සහල් අවශ්‍යතාව කිලෝග්‍රෑම් ලක්ෂ 40ක්. සති දෙකකට වෙළෙඳ පොළට සතොසෙන් සහල් කිලෝග්‍රෑම් ලක්ෂ දෙකක් නිකුත් කරනවා, කිලෝග්‍රෑම් එකක් රුපියල් 220ට. ඒ ප්‍රශ්නය විසඳෙනවා ද? එතැනින් ප්‍රශ්නය විසඳෙන්නේ සියයට 3යි. එක දවසේ අවශ්‍යතාවෙන් සියයට තුනයි දෙන්න පුළුවන්. මෙහෙම ප්‍රශ්න විසඳන්න එපා. මම දැක්කා, මාලිමාවේ සමාජ මාධ්‍ය නම්, අනේ මේක අගයනවා. හොඳයි. දැන් හාල් කිලෝ ලක්ෂ දෙකක් දෙනවා; ප්‍රශ්නය විසඳුණා!

ඒ වාගේම තමයි පොල් ප්‍රශ්නයත්. ගිය අවුරුද්දේ, පොල් රිළවි කෑවේ නැද්ද, වදුරෝ කෑවේ නැද්ද? මේ අවුරුද්දේ විතරද රිළවි පොල් ටික කාලා තිබෙන්නේ? එහෙම ප්‍රශ්නයක් නොවෙයි තිබෙන්නේ. පොල් ටිකත් හංගලා තිබෙන්නේ, වී ටිකත් හංගලා තිබෙන්නේ. ආණ්ඩුව අසාර්ථක වෙලා තිබෙනවා. මේ මාෆියාවට උත්තර ලබා දෙන්න ආණ්ඩුවට බැරි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ජීවන් තොණ්ඩමන් මන්ත්‍රීතුමාගේ වෙලාවෙන් විනාඩි දෙකක කාලයක් ගන්නවා. ඒක එතුමාට දැනුම් දීලා තිබෙන්නේ.

මේ වෙළෙඳ මාෆියාවට උත්තර දෙන්නත් මේ ආණ්ඩුව අසාර්ථක වෙලා තිබෙනවා. මෙතුමන්ලා එදා කියපු දේවල් වුණා නම් අපට මේ ප්‍රශ්න ටික විසඳාගන්න හැකියාව ලැබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා දීපු පොරොන්දු කීපයක් මම මතක් කරන්න අපි කැමැතියි. PAYE Tax එකේ tax-free threshold එක ලක්ෂයේ ඉඳන් ලක්ෂ දෙක දක්වා වැඩි කරනවා කියලා මෙතුමන්ලා කිව්වා. ඒ වාගේම තමයි VAT එක. අත්‍යවශ්‍ය බෙහෙත්වලට, පාසල් උපකරණවලට ඒ බද්ද නැති කරලාම දානවා කිව්වා. ඊට අමතරව VAT එක සියයට 15 දක්වා අඩු කරනවා කිව්වා. ඔබතුමන්ලාට අමතක වෙලා ඇති කියලා හිතලා මම පොඩ්ඩක් මතක් කරන්න කැමැතියි. ඒ වාගේම තමයි පඩි වැඩිකිරීම් පිළිබඳව. දැන් මාස 4කට කලින් ඔබතුමන්ලාගේ මහින්ද ජයසිංහ මැතිතුමන්ලා පාරට ආවේ රුපියල් 25,000ක පඩි වැඩි කිරීමක් දෙන්න කියලා. අපි හිතනවා, ඔබතුමන්ලා විපක්ෂයේ ඉද්දී කරපු ඉල්ලීම් ආණ්ඩුවට ආවාම ඉටු කරයි කියලා. එදා ආණ්ඩුව කිව්වාම තව සති දෙකක් ඉවසන්න කියලා, "බැහැ, අපට සති දෙකක් ඉවසන්න බැහැ" කිව්වා. හැබැයි ඒ සති දෙකක් ඉවසන්න බැරි වෙච්ච ආණ්ඩුව ඇවිල්ලා දැන් මාස තුනයි. ඔබතුමන්ලා ජනාධිපතිකම ඉල්ලුවා; දුන්නා. ඊට පස්සේ ඔයගොල්ලෝ තුනෙන් දෙකක බලයක් ජනතාවගෙන් ඉල්ලුවෙත් නැහැ කිව්වා. හැබැයි ජනතාව ඒකත් දුන්නා. දැන් ඔබතුමන්ලාට පාර්ලිමේන්තුවේ බලය තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලාට VAT අඩු කරන්නත් පුළුවන්, PAYE Tax එක අඩු කරන්නත් පුළුවන්, tax-free threshold එක වැඩි කරන්නත් පුළුවන්, පඩි වැඩි කරන්නත් පුළුවන්. ඔබතුමන්ලාට ඒකට බලය දීලා තිබෙනවා. ඒ බලය පාවිච්චි කරන්න. හරි ලේසියි. දැන් අග්‍රාමාත්‍යතුමිය වාහන පාවිච්චි කරන්නේ නැහැ; එතැන ඉතුරුවක් තිබෙනවා. දැන් ලංකාවේ හොරකම නැහැ කියනවා; එතැන ඉතුරුවක් තිබෙනවා.

එදා කිව්වා, ලංකාවේ ට්‍රිලියන පහක ආදායමින් තුනෙන් එකක හොරකමක් වෙනවා කියලා. හැබැයි මේ තුනෙන් එකත් දැන් ඉතුරුයි. ඒ මුදල පාවිච්චි කරලා දෙන්න මේ පඩි වැඩිකිරීම්. දෙන්න වගා හානි වන්දි ටික. ප්‍රශ්නයක් නැහැ නේ. හැබැයි ඒක වෙන්නේ නැත්තේ ඇයි? එහෙම නැත්නම් දැනටත් හොරකම් ටික ඒ විධියටම වෙනවාද? එහෙම නැත්නම් මොකක්ද වෙලා තිබෙන්නේ කියලා මේ ආණ්ඩුව අපට උත්තර දෙන්න ඕනෑ.

අපේ නලින්ද ජයතිස්ස ඇමතිතුමාත් මේ මොහොතේ සභාවට එනවා. ගරු ඇමතිතුමනි, අපි දකිනවා, ඔබතුමන්ලා වැනි හොඳ කණ්ඩායමක් ඉන්නවා. ඒක හින්දා මේවාට මැදිහත් වෙන්න.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(මාණ්පුමිකු කේ.ඩී. ලාල් කාන්ත - කමත්තොෆිල්, කාල්නඩෙ වළංගුකළ, කෘෂි, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
වෙළෙඳ ඇමතිතුමාත් ආවා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටී.වී. චානක)
(The Hon. D.V. Chanaka)
වෙළෙඳ ඇමතිතුමනි, මේකට උත්තර දෙන්න. වෙළෙඳ මාෆියාව ගැන ඔබතුමා තරම් කථා කරපු කෙනෙක් නැහැ. හැබැයි මේ වෙලාවේ හාල් ආනයනය කරනවා, සීමාවක් නැතුව. ඔබතුමන්ලා කිව්වේ හාල් මෙට්‍රික්ටොන් 70,000ක් ආනයනය කරනවා කියලා.

ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ - වර්ත්තක, වාණිප, උණවුප් පාතුකාප්පු මර්‍රුම් කූට්ටුරවු අපිවිරුත්ති අමైච්සර්)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Wasantha Samarasinghe?

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
අපේ ඩී.වී. චානක මන්ත්‍රීතුමා සඳහන් කරමින් හිටියා, හාල් මාෆියාව ගැන. එතුමා කියනවා, මාෆියාවක් පිළිබඳ කථාවක් තිබෙනවා කියලා. ඔව් අපි ඒක පිළිගන්නවා. හාල්වල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම, ඒ ප්‍රශ්නයට උත්තරයක් හොයන්න අපේ ආණ්ඩුව සති දෙකක් තිස්සේ අදාළ තීරණ අරගෙන, ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. විශේෂයෙන් කියන්න ඕනෑ, මේ මොහොතේ ජනතාවට ලබා දෙන්න වෙළෙඳ පොළට කඩිනමින් හාල් වුවමනා වෙලා තිබෙන බව. අපේ රටේ දවසකට හාල් මෙට්‍රික්ටොන් 6,500ක් වුවමනායි. ඒක හරි. හැබැයි ඒ හාල් මෙට්‍රික්ටොන් 6,500 අඩුව ඇති වෙලා තිබෙන තත්ත්වය පිළිබඳ සාධක, සාක්ෂි සොයාගෙන ගියාම, මේ කරුණු අනාවරණ වුණා. අපේ රටේ හාල් නිෂ්පාදනය තිබුණාට අපේ රටේ මිනිස්සුන්ට විතරක් නොවෙයි, තව ක්ෂේත්‍ර ගණනාවකට හාල් අවශ්‍ය වෙනවා. අපේ රටේ කුකුළු කෑම නිෂ්පාදනයට දෙන ප්‍රමාණය කොහෙන්ද ගෙනැල්ලා තිබෙන්නේ කියලා බැලුවොත් එහෙම එකක් ගෙනැල්ලා නැහැ. එතකොට රටේ අවශ්‍යතාවට අවශ්‍ය ප්‍රමාණයට හාල් නිෂ්පාදනය කරලාද කියන ප්‍රශ්නයත් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒකත් එක්ක මේ ඇති වෙන shortage එකට- අපේ රටට ගිය අවුරුද්දේ හාල් මෙට්‍රික්ටොන් 780,000ක් ගෙනැල්ලා තිබෙනවා. මේ අවුරුද්දේ අපි තවම එහෙම ගේන්න පටන් ගෙන නැහැ. අපි මේ මොහොතේ ඇති වෙලා තිබෙන තත්ත්වය සමනය කිරීම ඉලක්ක කරගෙන හාල් මෙට්‍රික්ටොන් 70,000ක් ගේන්න තීරණය කර තිබෙනවා. ඒ සඳහා අපි මේ දවස් 20 ඇතුලත අවසර දීලා තිබෙනවා. ඒක ඇතුළේ අපි අපේක්ෂා කරනවා, හාල් මෙට්‍රික්ටොන් 50,000ක පමණ ප්‍රමාණයක් එයි කියලා. එතෙක් ලංකාවේ අර ඔබතුමා කියපු මෝල්වල තිබෙනවා කියන හාල්වලින් වෙළෙඳ පොළට දවසට හාල් කිලෝ ලක්ෂ දෙකක් ගේන්න තමයි දැන් කටයුතු කරලා තිබෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. මේ වෙනකොට සතොස හරහා හාල් කිලෝ ලක්ෂ දෙකක් බෙදා හැරීමට ලෑස්ති වෙනකොටම, දැන් මෝල්වලින් සතොසට තවත් හාල් එන්න පටන් ගෙන තිබෙනවා.

මිල වැඩි වීම හරහා සමහර මෝල් හිමියන් අමතර ලාභ ලබන්න අපේක්ෂා කළා. වෙළෙඳ පොළෙහි සහල් හිඟයක් මවා පාන්න උත්සාහ කළා වාගේම යම් හිඟයකුත් තිබෙනවා. ඒ හිඟයට උත්තරයක් හොයන්නත් ඕනෑ. අපි කෙටි කාලීනව ඒ සඳහා උත්තර හොයලා තිබෙනවා. ඔබතුමා කියනවා වාගේ දීර්ඝ කාලීනව උත්තර හොයන්න ඕනෑ. සමහර අයට ණය දීලා තිබෙනවා. සමහර පක්ෂවල ජාතික ලැයිස්තුවල හිටපු අයට ණය දීලා තිබෙනවා. මම හෙට දවසේ විස්තර එක්ක ඒ ගැන කියන්නම්. ඒ ණය දීපු අය හාල් මාෆියාවක් හදන්න උත්සාහ කරනවා. අපේ ආණ්ඩුව ඒක කඩලා, මීට පස්සේ ජනතාව පීඩාවට ලක් වෙන්න දෙන්නේ නැතුව සහල් සුලබ කරන්නට කටයුතු කරනවා කියන කාරණය මම බොහොම වගකීමෙන් කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Hon. D.V. Chanaka, you have only one more minute.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටී.වී. චානක)
(The Hon. D.V. Chanaka)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.

රුපියල් 90ට ගත්තු වී කිලෝ එකෙන් තමයි ඔබතුමා හාල් කිලෝ එකක් රුපියල් 220ට හාල් මෝල්වලින් ගන්න යන්නේ. සහල් ආනයනය කරන්න අවශ්‍ය නම් ආනයනය කරන්න. මේ වෙලාවේ වෙන කරන්න දෙයක් නැත්නම්, අදාළ අස්වැන්න නැත්නම් සහල් ආනයනය කරන්න. ජනතාව බඩගින්නේ තියන්න එපා. අපේ දිස්ත්‍රික්කයේ තිබෙන ප්‍රශ්නය මෙයයි. එක කඩයකින් හාල් කිලෝ එකයි ගන්න පුළුවන්. පොල් ගන්න නැහැ. අපි දැක්කා, හරිනි අගමැතිතුමිය කීල්ස් එකට යනවා. මේ වෙලාවේ කීල්ස් එකට ගිහිල්ලා බැලුවොත්, එහි පොල් නැහැ; පිටිකළ පොල් කිරිත් නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(මාණ්පුමිකු වසන්ත සමරසිංහ)
(The Hon. Wasantha Samarasinghe)
අද ඉඳන් සතොසේ පොල් තිබෙනවා.

ගරු ඩී.වී. චානක මහතා
(මාණ්පුමිකු ටී.වී. චානක)
(The Hon. D.V. Chanaka)
ඔබතුමා කියනවා, අද ඉඳන් සතොසේ පොල් තිබෙනවා කියලා. සති දෙකකට පොල් ගෙඩි ලක්ෂ දහයක් නිකුත් කරනවා

[ගරු ඩී.වී. චානක මහතා]

කියලා ඔබතුමා කියනවා. හැබැයි, දෛනික පොල් අවශ්‍යතාව ගෙඩි ලක්ෂ 40ක්. මෙහෙම ගියොත් අපට තව පොල් පෝලිමකුත් බලා ගන්න පුළුවන්. ඔබතුමන්ලා ප්‍රශ්නය විසඳනවා නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, චානක මන්ත්‍රීතුමා පටලවා ගෙන ඉන්නේ. චානක මන්ත්‍රීතුමනි, රටේ පොල්වල ප්‍රශ්නයක් තිබෙන්නේ වෙන කිසිවක් නිසා නොවෙයි. පොල්වලත් හිඟයක් හදන්නයි හදන්නේ. මේ අවුරුද්දේ අපේ රටේ සමස්ත පොල් නිෂ්පාදන අපේක්ෂාව පොල් ගෙඩි මිලියන 2,684යි. ගිය අවුරුද්දට වඩා මේ අවුරුද්දේ පොල් නිෂ්පාදනයේ සියයට 14ක අඩුවක් තිබෙනවා, චානක මන්ත්‍රීතුමනි. ඒක නිසා අපේ රටේ පරිභෝජනයට තිබෙන පොල් ප්‍රමාණයේ කිසි අඩුවක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ මොහොතේ පොල් වෙළෙඳ පොළේ මාෆියාවක් හදන්න හදනවා. වෙළඳ පොළ තුළ ප්‍රශ්නයක් හදන්න හදනවා. ගරු මන්ත්‍රීතුමනි, ඒක සමනය කිරීමට තමයි ආණ්ඩුව මැදිහත් වුණේ. මොකක්ද කරන්නේ? රජය සතු වතුවල තිබෙනවා, පොල් නිෂ්පාදනයන්. වෙළඳ පොළේ කර්මාන්තකරුවාටත් ප්‍රශ්නයක් ඇති නොවන විධියට අපි ඒ පොල් ටික ගෙනැල්ලා වෙළඳ පොළ හරහා බෙදන්න පටන් ගත්තු එකට විතරයි අපි ලක්ෂ දහයක් කියලා කිව්වේ. කලබල වෙන්න එපා. වෙළෙඳ පොළ තුළ පොල් ගෙඩියක් රුපියල් 200ට යන එක නවත්වන්න, අපි රුපියල් 130ට පොල් ගෙඩියක් දෙනවා. මේ වනවිට ටෙන්ඩර් එක අනුව යන්නේ පොල් ගෙඩියක් රුපියල් 110ට. ඒ රුපියල් 110ට යන පොල් ගෙඩිය තමයි ලෙලි ගහලා ගෙනැල්ලා අපි වෙළඳ පොළේ බෙදා හරින්නේ. කොළඹ සතොස ශාඛා ජාලා 140ක් තිබෙනවා. තදාසන්න ප්‍රදේශවලටත් අපි සතොසෙන් පොල් දෙනවා. අපි රුපියල් 130ට පොල් ගෙඩියක් දෙනවා. අපි අද එය පටන් ගන්නවා. ලක්ෂ 10ක් නොවෙයි, අද වෙනකොට ලක්ෂ 15ක් දක්වා ඒක වැඩි කළා. පොල් සංවර්ධන මණ්ඩලයත් පොල් ගෙඩි ලක්ෂ පහක් අපට දෙනවා. මේ සති දෙකට අපි බෙදන පොල් ප්‍රමාණවත් නැත්නම් තව වැඩි කරනවා. බය වෙන්න එපා. අපි පොල් දෙනවා.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

ගරු ඇමතිතුමනි, අපි ස්තුතිවන්ත වෙනවා. ඔබතුමන්ලා ප්‍රශ්නය විසඳනවා නම් ගැටලුවක් නැහැ. සතියක්, දෙකක් තුළ තිබෙන ප්‍රශ්නය ගැනයි මම මේ කියන්නේ. මේ මොහොතේ ගියොත් බලන්න පුළුවන්, පොල් ගෙඩිය රුපියල් 240යි.

ගරු වසන්ත සමරසිංහ මහතා
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)

සතොසට යන්න.

ගරු ඩී.වී. චානක මහතා
(மாண்புமிகு டி.வி. சானக)
(The Hon. D.V. Chanaka)

අපි බලන්නම්. පෝලිමක් නැතුව යන්න පුළුවන් වුණොත් අපි සතොසටත් යන්නම්. හාල් ප්‍රශ්නයත් තිබෙනවා. පොල් ප්‍රශ්නයත් තිබෙනවා. ඔබතුමන්ලා මාස තුනකට කලින් ආණ්ඩුව ගත්තු වෙලාවේ මේ ගැන හෙව්වා නම් ප්‍රශ්නය විසඳන්න තිබුණා. දැන් ඇමතිතුමා පත් වෙලා ඉන්නේ. හැබැයි, ඔබතුමන්ලා මේ ආණ්ඩුව ගත්තු වෙලාවේ මේ ප්‍රශ්නයට හරියට attend වුණා නම් මේක විසඳන්න පුළුවන්කම ලැබෙනවා. ඔබතුමන්ලාට ඒ ප්‍රශ්නය විසඳන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. එහෙම නැති වුණොත් අපේ පාරිභෝගිකයන්ට තමයි ප්‍රශ්නයක් වෙන්නේ. හැබැයි, මේ වෙනකල් ඒ ප්‍රශ්නයට කිසිම විසඳුමක් ලැබිලා නැහැ.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. K.D. Lal Kantha. You have 20 minutes.

[අ.භා. 1.14]

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට මගේ ගෞරවය සහ ස්තුතිය පළ කරන්න මම කැමැතියි. මහනුවර දිස්ත්‍රික්කයෙන් මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් 12දෙනෙකු පත් වෙලා තිබෙනවා. ඒ 12දෙනාගෙන් නවදෙනෙකුම ජාතික ජන බලවේගයේ - මාලිමාවේ - මන්ත්‍රීවරුන් වීම අප ලැබූ විශිෂ්ට ජයග්‍රහණයක්. ඒ ජයග්‍රහණය වෙනුවෙන් මැදිහත් වුණු, දිස්ත්‍රික්කයේ මන්ත්‍රී සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකටත් වඩා අපේ පක්ෂයට ලබා දීලා මේ පාර්ලිමේන්තුව ශක්තිමත් කරන්න දායක වුණු ඒ පුරවැසියන්ට මගේ ගෞරවනීය ස්තුතිය නැවතත් පළ කරන්න කැමැතියි.

මහනුවරින්ම මම පටන් ගත්තොත්, මහනුවර දිස්ත්‍රික්කයේ දේශපාලන කටයුතු කරද්දී මෙච්චර කාලයකට විසඳුණේ නැහැ කියන ප්‍රධාන ප්‍රශ්න කිහිපයක් දිස්ත්‍රික්කය තුළින් අපට මතු කරලා තිබෙනවා. එකක් තමයි, වන සතුන්ගෙන් වන හානිය. මේක අද ලංකාව පුරාම බරපතළම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. කෘෂි කර්මාන්තය ගැනත්, ගොවි ජන ජීවිතය ගැනත්, පොදු ජන ජීවිතය ගැනත් කථා කරද්දී මේ ප්‍රශ්නය විසඳන්නේ නැතුව ඉස්සරහට යන්න බැහැමයි. ඒක අද ලංකාවේ බරපතළ ප්‍රශ්නයක්. එය කෘෂි කර්මාන්තයේ දී විතරක් නොවෙයි, පොදු ජන ජීවිතයේදීත් බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ දිස්ත්‍රික්කයේ ජනතාව අපට බොහෝ වෙලාවට කිව්වේ, "මන්ත්‍රීතුමා, සහෝදරයා, අපට මේ ආණ්ඩුවලින් මොකක්වත් ඕනෑ නැහැ, මේ ප්‍රශ්නය විසඳලා දෙන්න" කියලායි. ඒ, එක ප්‍රශ්නයක්. රිළා ප්‍රශ්නය බරපතළම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. ඇත්තටම බොහෝ අය කථා කරන්න පටන් ගෙන තිබෙනවා, මේක රිළා ත්‍රස්තවාදයක් කියලා. ජාතික ප්‍රශ්නයක් බවට මේක පත් වෙලා තිබෙනවා. පොදුවේ ගත්තොත්, වන සතුන්ගෙන් වන හානි රට තුළ බරපතළම ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා.

මේ වෙලාවේ ගොවි ජනතාවට කියන්න ඕනෑ කාරණයක් තිබෙනවා. තමන්ගේ වගාවට වන වෙනත් හානි සම්බන්ධයෙන් කටයුතු කරනවා වාගේම තමන්ගේ වගාවට හානි කරන මේ සත්තු සම්බන්ධයෙනුත් තමන්ගේ ඉඩම තුළදී, ගොවිපොළ තුළදී ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට ගොවි ජනතාවට කිසිම නීතිමය බාධාවක් නැහැ. ඒ වෙනුවෙන් ගන්න පුළුවන් ඕනෑම ක්‍රියාමාර්ගයක් ගන්න කියලා අපි කියනවා. ඒ අතර මේ ප්‍රශ්නයට උත්තර සෙවීමේ වගකීම කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය

භාර ගෙන තිබෙනවා. මහනුවර ජනතාව ඇතුළු මේ ප්‍රශ්නයෙන් බැට කන සියලුම ජන කණ්ඩායම්වලට මේ ප්‍රශ්නය අපි අපි වැඩිකල් යන්න කලින් විසඳනවා කියන පණිවුඩය මුලින්ම දෙන්න කැමැතියි.

මතු වුණු දෙවැනි කාරණය මෙයයි. අකුරණින් ජනතාව පත් කර එවූ අපේ රියාස් ෆාරුක් මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ ගරු සභාවේ ඉන්නවා. අකුරණ ජනතාව අපෙන් ඉල්ලපු ප්‍රධාන ඉල්ලීමක් තමයි, ගංවතුර ප්‍රශ්නය විසඳා දෙන්න කියන එක. ඒක ප්‍රධාන ප්‍රශ්නයක්. හැමදාම ගියොත්, කථා කළොත්, මුණ ගැසුණොත්, සාකච්ඡාවකට ගියොත්, රැස්වීමකට ගියොත්, ඒ පැත්තේ ජනතාව මත දක්වන්නේම මේ ප්‍රශ්නය පිළිබඳවයි. වෙන මොකක්වත් ඉල්ලුවේ නැහැ. එච්චරමයි ඉල්ලුවේ. ඒ නිසා වාරිමාර්ග අමාත්‍යාංශය භාර - වාරිමාර්ග සම්බන්ධ කාරණා භාර - ඇමතිවරයා විධියට මම අකුරණ ඉන්න පොදු ජනතාවට කියන්න කැමැතියි, අපි විශේෂ ව්‍යාපෘතියක්, project proposal එකක් සකස් කරලා ඒ ප්‍රශ්නය විසඳීමටත් වහාම පියවර ගන්න බව. ඒ සම්බන්ධයෙන් විවිධ අය වාර්තා ගණනාවක් දැනටත් අපට ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව තවත් ප්‍රශ්න ගණනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ ප්‍රශ්නවලටත් කඩිනමින් විසඳුම් හොයන්න අපි කටයුතු කරනවා. ඒ වාගේම අප සම්බන්ධයෙන් තබපු විශ්වාසයත් කඩ නොකරන බවට මා ප්‍රකාශ කරනවා. මේ ජාතික වගකීම අපි ඉෂ්ට කරන අතරම ඔවුන් මතු කරපු ප්‍රශ්නවලට උත්තර සෙවීම අනිවාර්යකොට සලකනවා.

දාර්ශනිකයෙක් කියලා තිබෙනවා, විසඳුම් නැති ප්‍රශ්න මිනිස්සු ඉස්සරහට එන්නේ නැහැ කියලා. ඉතිහාසය දෙස ආපසු හැරිලා බැලුවොත්, මුළු මානව ඉතිහාසය පුරාම විසඳුම් නැති ප්‍රශ්න ඇවිල්ලා නැහැ. ප්‍රශ්නයක් ආවොත් විසඳනවා. එහෙම වෙලා තිබෙනවා. කොවිඩ් වසංගතය පැවති පසුගිය කාලයේදීත් අපි ඔක්කෝම බය වුණා; ලෝකයම බය වුණා; ගැස්සුණා. මමත් හිතුවා, මැරිලා යයි කියලා. ඇත්තටම එහෙම හිතුවා. පොඩි අදහසකුත් තිබුණා, ඒ කාලයේ රටේ තිබුණු තත්ත්වයත් එක්ක එහෙම වුණත් කමකුත් නැහැ කියලා. කොහොම වුණත් ඒ ප්‍රශ්නයටත් මානව වර්ගයා උත්තරයක් හෙව්වා. පසුගිය කාලයේ අපි වේදිකාවලත්, ජනතාව එක්ක කළ සාකච්ඡාවලදීත් කථා කරපු මූලික කාරණා හතරක් තිබෙනවා. පොදුවේ ගත්තාම අපි කිව්වා, රට කඩා වැටිලා තිබෙන්නේ, රට ගොඩ නඟන්න ඕනෑ, ඒකට අපට බලය දෙන්න, අපි රට ගොඩ නඟනවා කියලා. ඕක තමයි අපි කියපු මූලික කාරණය. හැබැයි, ඒ කඩා වැටීමට බලපෑ කරුණු හතරක් සම්බන්ධව අපි සාකච්ඡා කළා. එකක් තමයි, දේශපාලන සංස්කෘතියේ කඩා වැටීම. ඒක තමයි පළමුවැන්න. අපි ජනතාව එක්ක ඒ දේවල් සාකච්ඡා කළ අනුපිළිවෙලක් තිබුණා. ඒ අනුපිළිවෙළ අනුව දීපු පොරොන්දුත් තිබෙනවා. අපි කියපු පළමුවැනි දේ තමයි, මේ රටේ දේශපාලන සංස්කෘතිය බිඳ වැටිලා තිබෙනවා, එය සකස් කරන්න ඕනෑය කියන එක. දෙක, ආර්ථිකය කඩා වැටිලා තිබෙනවා, ඒක හදන්න ඕනෑය කියන එක. තුන, සමාජය බිඳ වැටිලා තිබෙනවා, ඒක සකස් කරන්න ඕනෑය කියන එක. හතර, මේ රටේ සංස්කෘතිය කඩා වැටිලා තිබෙනවා, එය නැවත ගොඩ නඟන්න ඕනෑය කියන එක. ඒ තමයි මූලික කරුණු හතර. ඒ කරුණු හතර ඇතුළේ තමයි අපි ප්‍රශ්න කථා කරන්නේ. අර මම කලින් කළ ප්‍රකාශය, අප ඉස්සරහ තිබෙන ප්‍රශ්නවලට අපට උත්තර හොයන්න පුළුවන්ය කියන දාර්ශනික මහ පෙන්වීම කළේ, අපේ ශ්‍රේෂ්ඨ දාර්ශනිකයෙක් වෙච්ච කාල් මාක්ස්. මිනිසා ඉදිරියට විසඳුම් නැති ප්‍රශ්න එන්නේ නැහැ. ඒ මතවාදය, දර්ශනය අපි පිළිගන්නවා. මූලික වශයෙන් ගත්තොත් ඒ අනුව තමයි අපිත් වැඩ කරන්නේ. නමුත් තවත් කාරණාත් තිබෙනවා.

ඊළඟට, මේ බිඳ වැටිච්ච රට ගොඩනැඟීම ගැන ඔය ක්ෂේත්‍ර හතර ඔස්සේ අපි වේදිකාවේදී විග්‍රහ කරලා ජනතාවට දීපු පොරොන්දුවක් තිබුණා. ඒ දෙවැනි කාරණය වන ආර්ථිකය, තුන්වැනි කාරණය වන සමාජය, හතරවැනි කාරණය වන සංස්කෘතිය ගොඩනඟන්න නම්, පළමුව දේශපාලන සංස්කෘතිය හරියට ගොඩනැඟිය යුතුයි. ජනතාවට දැන් අපි කියනවා, ඒ දිහා හොඳින් බලන්න කියලා. අනුර කුමාර දිසානායක සහෝදරයා ජනාධිපති ධුරයට පත් වුණාට පස්සේ පළමුවෙන්ම අපි දේශපාලන සංස්කෘතිය වෙනස් කළා. රජ කාලයේ පවා පැරදිච්ච මිනිහාගෙන් පළි ගත්තා. අපි ආපහු හැරිලා බැලුවොත්, අපේ රටේ මුළු ඉතිහාසය පුරාම රජ්ජුරුවෝ දිනුවාට පස්සේ පැරදිච්ච අයගෙන් පළිගෙන තිබෙනවා. 1948න් පස්සේ චිතරක් නොවෙයි, සුද්දාගේ කාලයෙන් පස්සේ චිතරක් නොවෙයි, ඊට එහාට ගියත් අපේ රටේ ඉතිහාසය පුරාම දේශපාලන සංස්කෘතිය තුළ මිනිස්සුන්ගෙන් පළිගෙන තිබෙනවා. නමුත් ඉතිහාසය පුරා පැවති ඒ දේශපාලන සංස්කෘතිය අපේ ජනාධිපතිවරයා පත් වෙච්ච දිනයේ සිට මුළුමනින්ම වෙනස් කළා. ඒක දේශපාලන සංස්කෘතියේ system change එකක්. අපි ඒ system change එක දේශපාලන සංස්කෘතියෙන් ආරම්භ කරලා තිබෙන්නේ. ඊළඟට, මහ මැතිවරණය ඉවර වුණා. නමුත් ඒ ක්‍රම වෙනස - system change එක - එහෙමම ඉදිරියට අරගෙන ආවා. ජනතාව ඒ දේවල් සම්බන්ධයෙන් සතුටෙනුයි ඉන්නේ. ජනතාව අපට ඡන්දය දීපු එක ගැන සතුටෙනුයි ඉන්නේ. ඔවුන්ට දැන් පෙනෙනවා, අපි මේ දේවල් වෙනුවෙන් ආරම්භයක් අරගෙන තිබෙනවාය කියලා.

ඊළඟට මේ රටේ තිබුණා, උත්සව පිළිබඳ ගායක්. ඇමතිවරුන්ට, ජනාධිපතිවරයාට, අගමැතිට උත්සව ගායක් තිබුණා. ඒක දේශපාලන සංස්කෘතියේ බරපතළ කඩා වැටීමක් බවට පත් වෙලා තිබුණා. ඒක මේ රටේ මහජන ධනය නාස්ති කිරීමක් බවට පත් වෙලා තිබුණා. අපි ජනතාවට කියනවා, ඒ දිහා බලන්න කියලා. අපි ඒ ක්ෂේත්‍රයේත් ක්‍රම වෙනසක් ඇති කරලා තිබෙනවා. ඒ නිසා මාලිමාවට ඡන්දය දීම සම්බන්ධයෙන් ජනතාව අද සතුටෙනුයි ඉන්නේ. පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරු 159ක් පත් කිරීම, ඒ වාගේම ජනාධිපති අනුර දිසානායක සහෝදරයා බලයට ගෙන ඒම සම්බන්ධයෙනුත් මේ රටේ ජනතාවට පෙනෙනවා, මේ රටේ ඒ වෙනස්කම ආරම්භ වෙලා තිබෙන බව, රට අලුත් මාවතකට ගිහිල්ලා තිබෙන බව.

ඊළඟට මැති ඇමතිවරුන්ට තිබුණා, බරපතළ රථගායක්. ඒක ගැන විවිධ විවිධ විධියට කථා වෙනවා. බරපතළ රථගායක් තිබුණා. දැන් ඒ රථගාය මුළුමනින්ම සනීප කරලා තිබෙනවා. ජනාධිපතිතුමා ඇතුළු නව ආණ්ඩුව, බලයේ ඉන්න මැති ඇමතිවරු සියලුදෙනා ලාංකීය සමාජයේ මුල් බැහැලා තිබුණු, ඔඩු දුවලා තිබුණු දේශපාලනඥයන්ගේ රථගායට උත්තරය ලබා දීලා තිබෙනවා, ඒ ප්‍රශ්නය විසඳලා තිබෙනවා. ඒවා ජයග්‍රහණ. ඒවා ආර්ථිකයට එකතු වෙලා එනවා. කලින් කථා කළ වානක මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒවා එකතු වෙලා එනවා, එමින් තිබෙනවා නේ. දැන් මහජන නියෝජිතයෝ ඉන්නේ පාර්ලිමේන්තුවේයි, ඊට පිටින් ඉන්නේ ජනාධිපතිතුමායි විතරයි, මහජන ඡන්දයෙන් පත් වුණු. එහෙම නැතිව මහජන නියෝජිතයෝ රටේ ඕනෑ තරම් ඉන්නවා. දැන් පාර්ලිමේන්තුව තුළත්, ජනතාව ඉල්ලා සිටින දේශපාලන සංස්කෘතියේත්, එහෙම නැත්නම් system change එකේ - එම ධාරාවේ - කටයුතු හොඳට සිද්ධ වෙනවා. තවමත් අර පරණ, කාලයක් තිස්සේ හුරු පුරුදු වෙච්ච ඒ ලක්ෂණ මත සමහර මන්ත්‍රීවරු ක්‍රියා කරන බව මේ දවස් කිහිපයේදීත් එහෙන් මෙහෙන් යන්තම් දකින්න ලැබුණා. ඒ සියලුදෙනාගෙන් අපි ඉල්ලනවා, විශේෂයෙන්ම අපි පාර්ලිමේන්තුවේ දේශපාලන සංස්කෘතියක් හදා ගනිමු කියලා. එය බොහෝදුරට - සියයට 90ක් පමණ - හැදිලා තිබෙනවා. ඒ වෙනුවෙන් මැදිහත් වන විපක්ෂ මන්ත්‍රීවරුන් සියලුදෙනාටත් ජන වරමේ ගෞරවය හිමි වෙනවා.

[ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා]

අපි දැන් අතගහන්න ඕනෑකම තිබෙනවා, ආර්ථිකයේ වෙනස්කම්වලට, පරිවර්තනයන්ට. දේශපාලනඥයන්ගේ කොටස දැන් සම්පූර්ණ කරලා තිබෙන්නේ. රටට ඒ වෙනුවෙන් දැවැන්ත බලාපොරොත්තුවක් තිබුණා. මූලික වශයෙන් ඒ බලාපොරොත්තුව අපි ඉෂ්ට කරලා තිබෙන්නේ. ඒක පොරොන්දුවක්. ඒ පොරොන්දුව අපි ඉෂ්ට කරලා තිබෙන්නේ. දේශපාලනඥයාගේ හොරකම නතර කරලා තිබෙනවා, දේශපාලනඥයාගේ නාස්තිය නතර කරලා තිබෙනවා, දේශපාලනඥයාගේ අකාර්යක්ෂමභාවය නැති කරලා තිබෙනවා. අපි ඒ ටික සම්පූර්ණ කරලා තිබෙනවා. ඕවාටනේ ජනතාවගේ දැවැන්තම, ප්‍රබලම විරෝධයක් එල්ල වෙලා තිබුණේ.

ඊළඟට කියන්න ඕනෑ, රාජ්‍ය සේවය ගැන. රාජ්‍ය සේවයේ තවමත් අකාර්යක්ෂමභාවයක් තිබෙනවා. රාජ්‍ය සේවයේ යම් යම් තැන්වල තවමත් අකටයුතුකම් සිද්ධ වෙනවා. තවමත් මහ ජනතාවගේ කටයුතු එහාට මෙහාට දාලා පරක්කු කරනවා, යම් යම් දේවල් බලාපොරොත්තුවෙන්. ඒ නිසා දේශපාලන සංස්කෘතියේ ඇති කර ගත් මේ වෙනසත් එක්ක ජනතාවට ඇත්තටම සේවය කරන, වේගයෙන් වැඩ කරන රාජ්‍ය සේවයක් පත් කර ගැනීමේ අත්‍යවශ්‍ය වුවමනාවක් ඇති වෙලා තිබෙනවා. නැත්නම් රට ඉදිරියට ගෙන යන්න බැහැ. හැබැයි රාජ්‍ය සේවකයෝ නැපැල් ඡන්දවලින් පෙන්වූවා, ඒ අයත් මේ system change එකට කැමැතියි කියලා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ රාජ්‍ය සේවයත් එක්ක කාර්යක්ෂම ගමනක් අපට ඉදිරියට යන්න පුළුවන් කියලා. රාජ්‍ය සේවයේ විශාලත්වය ගැනත් බොහෝ වෙලාවට කථා වෙනවා. *[බාධා කිරීමක්]*

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු නියෝජ්‍ය කථානායකතුමාටත්, අමාත්‍යතුමාටත් මම ස්තුතිවන්ත වෙනවා, මේ කාරණය කියන්න අවස්ථාව ලබා දීම ගැන. ගරු ඇමතිතුමා රාජ්‍ය සේවකයන් ගැන කථා කරපු නිසායි මම මේක අහන්නේ. ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක දුමින්ද හුලංගමුව මහත්මයා කියලා තිබෙනවා, රාජ්‍ය සේවකයෝ ලක්ෂ පහමාරක් ඉවත් කළ යුතුයි, නැත්නම් අමාරුවේ වැටෙනවා කියලා. ඔබතුමා මේ කාරණයත් එක්ක එකඟ වෙනවාද? ඔය කාරණාත් එක්කම ඒ පැහැදිලි කිරීම ලබා දුන්නොත් ලොකු දෙයක්.

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

රාජ්‍ය සේවය කියන වචනය ඇහුණා විතරයි ඔබතුමා නැඟිට්ටා, මොකුත් කියන්න හම්බ වුණේත් නැහැ. හොඳයි, කමක් නැහැ.

රාජ්‍ය සේවයේ වැඩිකමක් ගැන කථා කරනවා වාගේම අත්‍යවශ්‍ය තැන්වලට රාජ්‍ය සේවකයෝ නැති ප්‍රශ්නයකුත් තිබෙනවා. මම සරලම උදාහරණයක් කියන්නම්. වනජීවී එකට වනජීවී නිලධාරීන් නැහැ. විශේෂයෙන් අලි ප්‍රශ්නය ඇති වෙන ප්‍රදේශවල. අපි හමුදාවටත් කථා කළා, සිවිල් ආරක්ෂක බලකායටත් කථා කළා, විවිධ ක්ෂේත්‍රවල පිරිස් සම්බන්ධ කරගෙන තාවකාලික විසඳුමක් විධියට වගා බිම්වලින් පොඩ්ඩක් ඈතට අලි ටික තල්ලු කරලා දා ගන්න.

ඒ අයව සම්බන්ධ කරගන්න බැහැ, වනජීවී නිලධාරියෙක් සම්බන්ධ කරගන්නේ නැතුව. ඒකට අවශ්‍ය කරන වනජීවී නිලධාරීන් ප්‍රමාණය ලංකාවේ නැහැ, හිඟයි.

මම තවත් උදාහරණයක් කියන්නම්, ඒකත් ඔය ප්‍රශ්නයටම අදාළ නිසා. රිළා ප්‍රශ්නය ගැන මතු කළ නිසාත්, වන්ධ්‍යාකරණ ගැන සාකච්ඡාවක් යන නිසාත් මම ඒ ගැන කියන්නම්. මොකද, ඒකත් මේකටම අදාළ එකක්. පශු වෛද්‍යවරු කියන්නේ මොකක්ද? "රාජ්‍ය සේවය තුළ සිටින පශු වෛද්‍යවරුන්ගේ සංඛ්‍යාව ප්‍රමාණවත් නැහැ; ඒ වැඩෙටවත් ප්‍රමාණවත් නැහැ" කියලා.. සේවකයින් වැඩි තැන් තිබෙනවා. විවිධ ආයතනවලට එක එක ඇමතිවරුන් තමන්ගේ දිස්ත්‍රික්කවල අය පුරවා තිබෙනවා. ඇත්තටම ඒ තනතුරු ගත්තාම ඒවා අර ප්‍රධාන පෙළේ ඒවාම නොවෙයි. සමහර තැන්වල සේවකයින් ගොඩ ගසා තිබෙනවා. මගේ අමාත්‍යාංශයේත් සේවක සංඛ්‍යාවක් ඉන්නවා. මම බලද්දී ඒ ඔක්කෝම නාවලපිටියේ කට්ටිය. ඔක්කෝම නාවලපිටියේ. ඒගොල්ලන් දැන් ආයතනය ඇතුළේ කරකියා ගන්න දෙයක් නැතුව ඉන්නවා. එහෙම බඳවාගෙන තිබෙනවා. ඒ සියලුදෙනාම නාවලපිටියේ. ඒ වාගේ විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ විධියට රාජ්‍ය සේවයට බඳවා ගත් අය ඉන්නවා. මම නම් කිව්වා, ඒ අය ස්ථිර කරන්න කියලා. ඒ සියලුදෙනාම වාගේ නාවලපිටියේ මහින්දානන්ද හිටපු මන්ත්‍රීතුමා දමපු අය. ඒත් මම කිව්වා, මේගොල්ලන් ස්ථිර කරන්න, ස්ථිර නොකරන්න හේතුවක් තිබෙනවා නම්, හේතුව මොකක්ද කියලා දැනුම් දෙන්න කියලා. *[බාධා කිරීමක්]*

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Rohana Bandara?

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් කිව්වා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සේවක මහත්වරුන් නැහැ කියලා. අර රැකියා ලක්ෂයේ වැඩසටහන යටතේ බඳවා ගත් විශාල පිරිසක් අනුයුක්ත කර ඉන්නවා, අලිවැට සම්බන්ධ රාජකාරි කිරීමට. වනජීවී එකට අනුයුක්ත කරපු ඒ කිසිම කෙනෙක් රාජ්‍ය සේවයට, ඒ ආයතනවලට ස්ථිර කර ගැනීමට මේ දක්වා කටයුතු කර නැහැ. ඔබතුමා අන්න ඒ කාරණය ඉෂ්ට කළා නම්, අවශ්‍ය සේවක සංඛ්‍යාවක් ඒ හරහා ලැබෙනවා නේද?

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)

හොඳයි. එහෙන් මෙහෙන් අහන ඒවාට උත්තර දෙන්න ගියොත්, කථාව කරගන්න ටිකක් අමාරු වෙනවා. එතකොට වෙලාව මදි වෙනවා නේ. කොහොම හරි ගොවි ජනතාවගේ ප්‍රශ්න ගැනත් කථා කළා. වන්දි ගැනත් කථා කළා. කෙටියෙන්ම කිව්වොත් මෙහෙමයි. 40,000ද, කීයද, ගණන කුමක්ද කියන එක නොසලකා ගොවි ජන ජීවිතය නහා සිටුවන්නට අවශ්‍ය කරන සියලුම පියවර අපි ගන්නවා. ඒක ස්ථිරයි. ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ.

කෘෂිකර්ම අමාත්‍යවරයා විධියට මම ගොවි ජන ජීවිතය ගැන වචනයක් දෙකක් කියන්න ඕනෑ, මෙන්න මෙහෙම. අපි වාරිමාර්ගයට විශාල මුදලක් කාලයක් තිස්සේ වැය කර තිබෙනවා. කලා වැව ඉදි කළ කාලයේ ඉඳලා ගත්තත්, වාරිමාර්ගය

වෙනුවෙන් ලංකාව විශාල මුදලක් වැය කර තිබෙනවා. අපි මහවැලියත් සම්බන්ධ කර ගනිමුකෝ. ඒවාට අතිදැවැන්ත මුදලක් ආයෝජනය කර තිබෙනවා.

ඊළඟට, ගොවින්ට ඉඩම් දීලා තිබෙනවා, පොහොර දීලා තිබෙනවා, විවිධ දේවල් කර තිබෙනවා. කොච්චර කළත් අන්තිමට මොකද වෙලා තිබෙන්නේ? ගොවි ජනතාව දුප්පත්, වාරිමාර්ගයට එච්චර ආයෝජනයක් කරලා තිබුණත්, අදාළ ආයතනවල රාජ්‍ය සේවකයෝ විශාල ප්‍රමාණයක් සිටියත්. නිලධාරීන් ඉන්නවා, ඒගොල්ලන්ට පඩිනඩි ගෙවනවා, වාහන තිබෙනවා. නමුත් අන්තිමට ගත්තාම ගොවියා දුප්පත්. ඒ නිසා මම කල්පනා කරන්නේ මගේ කාලය තුළ මේ ගොවියා ශක්තිමත් කරන්නයි. වී ගොවියා විතරක් නොවෙයි, එළවලු ගොවියා විතරක් නොවෙයි, සතුන් ඇති කරන අයත් ඉන්නවා. මේ ගොවීන් ඔක්කෝම දුප්පත්. මෙන්න මේ ජන කණ්ඩායම මෙතැනින් ඉදිරියට ඔසවා තැබීම වෙනුවෙන්ම තමයි සියලුම project proposals සකස් වෙන්නේ. සියලු දේවල් සකස් වෙන්නේ ඒ ජන කණ්ඩායම ඉලක්ක කරගෙන, ඔවුන්ගේ ජීවිතය නහාසිටුවීම අරමුණු කරගෙනයි.

මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න කලින් මේ ආසන්න කාලයේ, මැතිවරණ කටයුතු පැවැති කාලයේ මේ රටේ පෞද්ගලික අංශයේ අය, මේ ක්ෂේත්‍රයට සම්බන්ධව ඉන්නා අය විශාල පිරිසක් ආවා, project proposals අරගෙන. මම කෘෂිකර්ම ඇමති වෙයි කියලා ඒ අය කොහොම දැනගෙන හිටියාද දන්නේ නැහැ. ඒ අය එහෙම ආවා. ඒ වාගේ දැනුත් ඔවුන් අමාත්‍යාංශය වටා නිතරම කැරකෙනවා. මේ සංවර්ධනය වෙනුවෙන් මැදිහත් වෙන්න විවිධ අය විශාල වශයෙන් එනවා. ඒවා ඔක්කොම බැලුවාම තිබෙන්නේ ගොවියාගේ කොටස අත්හැරපු ඒවා. ගොවියාගේ කොටස අත්හැරලා තිබෙන්නේ, සතුන් ඇති කරන අයගේ කොටස අත්හැරලා තිබෙන්නේ, ඒ ඔක්කොම අත්හැරලා තිබෙන්නේ. Project proposal එක මුළුමනින්ම සකස් වෙලා තිබෙන්නේ ඒ ජන කණ්ඩායමට ලැබෙන ප්‍රතිලාභය මොකක්ද කියන එක සලකා නොවෙයි. ඒ නිසා මම කිව්වා, ඒ කොටස ඇතුළු කරගෙන project proposals හදාගෙන එන්න කියලා. එහෙම නැත්නම් අපි එකක්වත් අනුමත කරන්නේත් නැහැ; ගන්නේත් නැහැ; ක්‍රියාත්මක කරන්නේත් නැහැ; මුදල් වෙන් කරන්නේත් නැහැ.

ඊළඟ කොටස තමයි, පාරිභෝගිකයාගේ ප්‍රශ්නය. වාරිමාර්ග සංවර්ධනයට මෙච්චර වියදම් කරලා තිබෙනවා, රාජ්‍ය ආයතන මෙච්චර තිබෙනවා. සතොස තිබෙනවා, වී අලෙවි මණ්ඩලය තිබෙනවා. ඒ ඔක්කොම තිබෙනවා. හැබැයි, ඒවා අකාර්යක්ෂමයි. ඒ ආයතන විශාල ප්‍රමාණයක් බිඳ වට්ටලා තිබෙනවා. අපි භාර ගත්තේ වී ඇටයක් නැති වී අලෙවි මණ්ඩලයක් නේ. ඊට වඩා මොනවාද කථා කරන්න තිබෙන්නේ? ඊට වඩා කථා කරන්න දෙයක් ඇත්තේම නැහැ. අනෙක් පැත්තෙන් ගත්තාම පාරිභෝගිකයාත් පීඩාවට පත් වෙලා නම්, ගොවි ජනතාවත් දුප්පත් නම්, කෘෂිකර්ම අමාත්‍යාංශය මේවා කරගෙන යන එකේ තේරුම මොකක්ද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. මේවා භාරව හිටපු මැති ඇමතිවරු දියුණු වෙලා තිබෙනවා. නිලධාරීන් වුණත් යාන්තම් පණ ගැටගහගෙන ජීවත් වෙනවා. හැබැයි, ඒකට සම්බන්ධ කේන්ද්‍රීය මනුස්සයා, අත්‍යවශ්‍ය කෙනා සම්පූර්ණයෙන් දුප්පත් ගොඩට වැටුණු ජනතාවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ අමාත්‍යාංශය භාරව සිටින කාලය තුළ මම උත්සාහ කරනවා, අපේ රටේ මෙන්න මේ ජන කණ්ඩායම දුප්පත්භාවයෙන් මුදා ගැනීම සඳහා අවශ්‍ය කරන සියලු පියවර ගන්න. ගරු ජනාධිපතිතුමා එක්ක ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා තිබෙනවා. ඇමති මණ්ඩලය එක්ක ඒ කාරණය සාකච්ඡා කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් වන වැඩ කටයුතු සාර්ථකව කරගෙන යන්න, ඒ වෙනුවෙන් දක්වන්න පුළුවන් සියලු සහයෝග දක්වන්න ජනාධිපතිවරයාත්, අමාත්‍ය මණ්ඩලයත් එකඟ වෙලා තිබෙනවා කියන කාරණය ජනතාව වෙනුවෙන් මේ ගරු සභාවට මම කියන්න කැමැතියි.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Rauff Hakeem, you have 11 minutes.

[1.38 p.m.]

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
No, Hon. Deputy Speaker, I have 12 minutes. The problem is, unfortunately, the Government Ministers are attempting to reply everyone who is raising questions here and that time must be cut off from the Government's time, not from ours because our time is getting limited. - *[Interruption.]* Let us not get into an argument and let me start my speech.

මගේ දිස්ත්‍රික්කයේ ජාතික ජන බලවේගයේ නායක, ගරු කේ.ඩී. ලාල් කාන්ත ඇමතිතුමාගේ කථාවෙන් පස්සේ කථා කිරීමට ලැබීම භාග්‍යයක් කොට මම සලකනවා. එතුමාගේ ඒ විශිෂ්ට ජයග්‍රහණය පිළිබඳව මගේ ශුභාශිංසනය පළ කරන අතර, එතුමාගේ කථාවේදී අපේ දිස්ත්‍රික්කය මුහුණපාන කාලීන ප්‍රශ්න දෙකක් පිළිබඳව කථා කළා. විශේෂයෙන්ම වන සතුන්ගේ ප්‍රශ්නය ගැන කථා කළා. ඒ වාගේම වන්ධ්‍යාකරණය පිළිබඳව තිබෙන ගැටලු අපි කවුරුත් දන්නවා. සත්ව ආරක්ෂාව පිළිබඳව තිබෙන නොයෙකුත් සමීති අපිත් එක්ක ඝට්ටනයකට ඒවි. නමුත්, ඊට විසඳුමක් හැටියට පෙර පරිදි ගොවීන්ට ලබා දෙන තුවක්කු අවසරපත් පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය එක්ක සාකච්ඡා කරලා, ඒ පිළිබඳව යමක් කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ඒ වාගේ තවත් කාරණාවක් තිබෙනවා. ඒක කාලීන ප්‍රශ්නයක්. ඒ තමයි අකුරණ ජල ගැල්මේ ප්‍රශ්නය. ඒ ප්‍රශ්නයට මැදිහත් වුණු කෙනෙක් හැටියටත්, මීට පෙර සිටි අමාත්‍යවරයෙක් හැටියටත්, මන්ත්‍රීවරයෙක් හැටියටත්, ඒ පිළිබඳ ඉතිහාසය හා ඒ පිළිබඳ තිබෙන අධ්‍යයන වාර්තා පිළිබඳවත් ඔබතුමා එක්ක සාකච්ඡාවක් කරන්න අපි අවස්ථාවක් ඉල්ලනවා. ඒ වාගේම මේ මාසයේ 11වැනි දාට සම්බන්ධීකරණ කමිටුව පවත්වන්න නියම කරලා තිබෙනවා. ඒ කමිටුවේදී මේ කාරණය මතු කරද්දි ඔබතුමාත් ඊට සහභාගී වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ පිළිබඳව අකුරණ ප්‍රදේශයේ ජීවත් වන ඉංජිනේරුවන්ගේ සංගමය ඉදිරිපත් කරපු යෝජනාවක් තිබෙනවා. ඒක වැදගත් යෝජනාවක්. ඒ පිළිබඳවත් ඔබතුමා එක්ක සාකච්ඡා කරන්න අවකාශය ලැබෙයි කියලා මා බලාපොරොත්තු වෙනවා. එසේ කියමින්, ඔබතුමාත් මාතෘකාවෙන් පිට කථා කරපු පරිදි මමත් මාතෘකාවෙන් පිට කාරණයක් කියන්න කැමැතියි. විශේෂයෙන්ම ඉලංගෙයි තමිළ් අරසු කච්චි පක්ෂයේ දුන පිරිසක් ජනාධිපතිතුමා එක්ක සාකච්ඡාවක් පවත්වලා තිබෙනවා. ඒ සාකච්ඡාවෙන් පසුව පාර්ලිමේන්තුවෙත් කථාවක් කරලා තිබුණා, කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය පිළිබඳ ප්‍රශ්නය විසඳීමට එතුමා මැදිහත් වෙනවා කියලා පොරොන්දු වුණාය කියලා. නමුත්, ඒ ප්‍රශ්නය පිළිබඳව එතැන ජීවත් වෙන මුස්ලිම් ජනතාවටත් ගැටලුවක් තිබෙනවා. ඒ ගැන නිවැරදිව සාකච්ඡා කරලා සාකච්ඡා

[ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා]

මාර්ගයෙන් ඒකට විසඳුමක් ලබා ගනිමු කියලා මම යෝජනාවක් කරනවා. දැනට මම ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා එක්කත්, ගරු පත්මනාදන් සත්යලිංගම් මන්ත්‍රීතුමා එක්කත් කතා කර අපේ ගැටලු පිළිබඳව පැහැදිලි කර තිබෙනවා. අපි අනිවාර්යයෙන්ම ඒ වාගේ ගැටලු සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගනිමු කියන එක මතක් කරනවා. විශේෂයෙන්ම ඒ පිළිබඳව දැන් නඩුවක් පවරලා තිබෙනවා. නඩුවට අමතරව සීමා නිර්ණය පිළිබඳ කමිටු රාශියකුත් තිබෙනවා. ඒ සියල්ල සැලකිල්ලට ගනිමින් අපි තීරණයකට එළැඹෙමු කියලා මම යෝජනා කරනවා.

ඒ වාගේම නින්දවූර් පල්ලිය පිළිබඳව ගත්තොත්, ඒ පල්ලියේ දැන් අතුරු භාරකාර මණ්ඩලයක් ඡන්දයකින් තොරව පත් කිරීමට උත්සාහයක් තිබෙනවා කියලා ආරංචියි. අපි එවැනි ක්‍රියාදාමවලින් වැළකිලා ඡන්දයකට ගිහින් ඒ වාගේ භාරකාර මණ්ඩල පත් කිරීම තමයි ඉතා යෝග්‍ය. කලින් ඒ ඡන්දය පැවැත්වීමට උත්සාහ කරද්දී, කලින් භාරකාර මණ්ඩලයට විශේෂයෙන්ම අපේ ඡන්ද කොමිසමෙන් නියෝගයක් ලබා දීලා තිබුණා, ඒ ඡන්දය පසුව පැවැත්වීමට ඉඩ දෙනවා කියලා. ඊට පෙර දැන් වෙනත් කණ්ඩායමක් ගිහිල්ලා එතැන අතුරු භාරකාර මණ්ඩලයක් පත් කිරීමට උත්සාහයක් දරා තිබෙන බව මට දැන ගන්න ලැබී තිබෙනවා. නීත්‍යානුකූලව ඒ ඡන්දය පවත්වලා භාරකාර මණ්ඩලයක් පත් කරන්න කටයුතු කළ යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා.

Now, let me move on to the subject. Sir, we are gathered here today to deliberate on the Vote on Account. I must draw the attention of this esteemed House to a matter of critical importance embedded within the numbers presented - outflows tied to Sri Lanka's recent debt restricting. While it is undeniable that reaching an agreement with bondholders and commercial creditors was crucial to steering our nation out of this economic crisis, troubling questions linger about the integrity of this process. It is concerning that the Agreement with bondholders was finalized merely two days before the Presidential Election, raising doubts about whether that, too, was exploited to serve the interests of a selected few.

History reminds us of the controversial 500 million dollar bond repayment saga under a former Governor of the Central Bank executed amidst an empty Treasury. Similarly, the current debt restructuring raises a spectre of insider trading, where investors potentially armed with privileged information acquired Sri Lanka Bonds at deep discounts only to negotiate settlements at face value, possibly in collusion with the administration. I particularly raise that issue.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉදිරිපත් කර තිබෙන අතුරු සම්මත ගිණුමේ, දෙවැනි උපලේඛනයේ සඳහන් වෙලා තිබෙන ආකාරයට Treasury Operations Department එකට ට්‍රිලියන 4කට වැඩි ගණනක් වෙන් කරලා තිබෙනවා. විශේෂයෙන්ම මේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණය එක්ක ගෙවීමට තිබෙන ඒ මුදල පිළිබඳව මෙතැන සඳහන් වෙලා තිබෙනවා. මේ පිළිබඳව විශාල සැක සංකාවක් මතු වෙලා තිබෙනවා. මැතිවරණයට දවස් දෙකකට පෙරදී මේ එකඟතාවට එළැඹීම උඩ මේ පිටුපස,-

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මොන මැතිවරණයද?

ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு சட்டத்தரணி றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
ජනාධිපතිවරණයට දවස් දෙකකට පෙරදී එළැඹුණු මේ එකඟතාව උඩ හැංගුණු වෙනත් හස්තයන් තිබුණාද? මොකද, මේකේ වටපිටාව පිළිබඳව හොඳටම හොයා ගෙන ගියාම මීට පෙරත් අර ඇමෙරිකානු ඩොලර් මිලියන 500ක බැඳුම්කරය, රට බංකොලොත් වෙලා තිබෙන අවස්ථාවක එවකට හිටිය මහ බැංකු අධිපතිතුමා ඒ බැඳුම්කරයට - settlement of that Bond was done when the Treasury was bankrupt. Similarly, with regard to this attempt, there is a serious doubt that there was privileged information being passed on to people to buy those Bonds from the secondary market. ද්විතීය වෙළෙඳ පොළේ ඉතාම අඩු මිලකට මේ බැඳුම්කර ලබාගෙන, ඒකේ මුල් වටිනාකමට තමන්ට අවශ්‍ය මුදල් සම්භාරයක් ලබා ගැනීමේ චේතනාවෙන් මේක කරලා තිබෙනවාද කියලා සැක සංකා මතු වෙනවා. ඒ පිළිබඳව විමර්ශනයක් කළ යුතුයි කියලා මම ඉල්ලා සිටිනවා. So, it is a serious doubt that has arisen and it must be looked into. The same thing happened earlier also. I must say I was ashamed that we were a part of the Cabinet when in 2015, a similar thing happened. One billion rupees worth of Bonds were to be auctioned, but it was increased to Rs. 10 billion and finally, the entire Government was blamed for that. There were a few who were behind this and now, there are cases pending. There is also a former Central Bank Governor who is absconding from the country. So, all those issues have to be looked into since these are poor people's money.

Similarly, the domestic debt restructuring too have to be looked into. ඔබතුමන්ලා දන්නවා, DDO එක ක්‍රියාත්මක කිරීමෙන් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ බඩට ගහන වැඩක් තමයි කළේ කියලා. වර්තමාන ජනාධිපතිතුමන් ඒ පිළිබඳව මේ පාර්ලිමේන්තුවේදී කථා කරලාත් තිබෙනවා. ඒ පිළිබඳව විමර්ශනයක් කළ යුතුයි. That was also done. A few primary bond dealers made massive profits. If you look at the mid-year accounts of the primary dealers, you will see the massive profits each primary bond dealer had made. In fact, only two primary bond dealers are listed companies. Their accounts, we have looked at. They had made massive profits, if you compare it with the earlier quarter! In the second quarter ending 30th June, those two primary bond dealers, who are already listed companies, had to disclose their accounts. They have shown massive profits compared to the previous quarter. Similarly, other bond dealers have also made a massive windfall out of the DDO. So, Domestic Debt Optimization was done to benefit a few, having deprived the poor working population of this country.

Sir, I wish to raise specific questions from the Hon. Minister of Finance in this House relating to these Bond issues, the fraud and the fraudulent activities that took place behind it and those few who have made massive windfall profits at the expense of poor public and the poor working people of this country. Therefore, I wish to

say that I will soon be tabling a few Questions expecting a proper reply to get behind this conspiratorial action for which the former President and his cronies will have to answer.

Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Aravinda Senarath. You have 12 minutes.

Order, please! Before that, will an Hon. Member propose the Hon. Sanjeewa Ranasingha to the Chair?

ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා
(மாண்புமிகு கே.டீ. லால் காந்த)
(The Hon. K.D. Lal Kantha)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු සංජීව රණසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු සංජීව රණසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சஞ்ஜீவ ரணசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER left the Chair, and THE HON.SANJEEWA RANASINGHA took the Chair.

ගරු අරවින්ද සෙනරත් මහතා
(மாண்புமிகு அரவிந்த சேனரத்)
(The Hon. Aravinda Senarath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතුරු සම්මත ගිණුම පිළිබඳවයි අපි අද දවසේ පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා කරමින් ඉන්නේ. 2025 වර්ෂයට අදාළ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීමට සූදානම් වෙමින් තිබියදී එහි කොටසක් විධියටයි අපි අද දවසේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරනු ලැබුවේ.

අපේ රට දැවැන්ත ආර්ථික අර්බුදයකට ලක් වුණු රටක්. සමාජ, ආර්ථික සෑම ක්ෂේත්‍රයක්ම කඩා වැටුණු රටක්. අපි භාර ගත්තේ ඉතා හොඳින් ආර්ථිකය ශක්තිමත්ව තිබුණු, ජනතාවගේ ප්‍රශ්න විසඳපු, ජනතාව සංවර්ධනය දිශාවට ගෙන ගිය රටක් නොවෙයි. අපි මේ ආණ්ඩුව ස්ථාපිත කරලා මේ වෙනකොට දින 14ක වගේ කාලයක් තමයි ගත වෙන්නේ. ජනාධිපතිතුමා දිවුරුම් දීලා දින 75ක් වගේ කාලයක් ගත වෙන්නේ. හැබැයි, මට හිතෙන විධියට මේ කාලය තුළ විපක්ෂයේ බොහෝ අය කථා කරගෙන යද්දී උත්සාහ කරන්නේ, මේ දැවැන්ත අර්බුදය නිර්මාණය කළේ අපියි කියලා කියන්නයි. විපක්ෂය නහන තර්ක දිහා බැලුවාම එහෙම කිව්වොත් ඒ පිළිබඳව පුදුම වෙන්න අවශ්‍යත් නැහැ. හැබැයි, මේ සියලු අර්බුදවල නිර්මාණකරුවෝ තමයි විපක්ෂය නියෝජනය කරන්නේ. රටක් විධියට සෑම ක්ෂේත්‍රයක්ම, ඒ වාගේම පද්ධතියක් විධියට සෑම ක්ෂේත්‍රයක්ම කඩා වැටුණු රටක්. ඒ රට ගොඩනහන්න අපට නිශ්චිත කාලයක් අවශ්‍ය වෙනවා. හැබැයි, ගරු ලාල් කාන්ත අමාත්‍යතුමා කිව්වා වගේ අපි බලය ගත් මොහොතේ සිට ඒ සමාජ, ආර්ථික පරිවර්තනය සඳහා අවශ්‍ය කරන වෙනස්කම් ටික අපි කරමින් යනවා. ඒ වාගේම ආර්ථිකය වෙනස් කරන්නත් අපි කටයුතු කරමින් යනවා. එම නිසා අවුරුදු 4ක්, 5ක් ගියාට පස්සේ අපෙන් අහන්න ඕනෑ ප්‍රශ්න අද අහන විපක්ෂයට අපට කියන්න තිබෙන්නේ, "කනගාටුයි, ඔබේ ප්‍රශ්න කිරීම්, ඔබේ ප්‍රජාතන්ත්‍රවාදී ඒ අයිතිය පාවිච්චි කර ගන්නේ ඉතිහාසයේ තිබුණා වාගේම ඉතා කැත, අවලස්සන තැනකට මේ පාර්ලිමේන්තුව, මේ සංවාද ගෙන යන්නයි" කියන එකයි.

මේ ලිබරල් ආර්ථිකය ඇතුළේ රනිල් වික්‍රමසිංහ මහත්මයලා, මහින්ද රාජපක්ෂ මහත්මයලා; 1977න් පස්සේ ගෙන ගිය සමාජ, ආර්ථික ක්‍රියාවලියේ ප්‍රතිඵල විධියට තමයි මිලියන 21ක් වන සමස්ත පුරවැසියෝ, මේ ලාංකීය භූමිය මේ තරම් අර්බුදයකට ලක්වෙලා තිබෙන්නේ. ආර්ථිකයේ කිසිවක් නැහැ, නිෂ්පාදනය කඩාගෙන වැටිලා, කෘෂි කර්මාන්තය කඩාගෙන වැටිලා. ඒ කෘෂි කර්මාන්තය, ආර්ථිකය ගොඩනහන්න සැලැස්මක් තිබුණේ නැහැයි කියන එකේ හොඳම ප්‍රතිඵලය තමයි අපේ රට ලෝකයේ බංකොලොත් රටක් වීම. තව මොනවාද, අපට සාකච්ඡා කරන්න තිබෙන්නේ?මේ රට ගොඩනැඟීම සඳහා තමයි ජාතික ජන බලවේගයට ජන වරමක් ලැබුණේ. ඒ ජන වරම පාවිච්චි කරමින් මේ අමානුෂීය වෙළෙඳ පොළ ආර්ථික ක්‍රමය වෙනුවට මේ රට නිෂ්පාදන ආර්ථිකයක් කරා මෙහෙයවන්න ජාතික ජන බලවේග ආණ්ඩුවේ අපි කටයුතු කරමින් ඉන්නවා. ඒ සඳහා වන සියලු සැලසුම් ආණ්ඩුවක් විධියට ක්‍රියාත්මක කිරීමට අපි සූදානම්ව සිටිනවා.

සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරද්දී පැවැති ආණ්ඩුවලට තිබුණේ නැහැ, නිවැරැදි අරමුණක්. ඔවුන්ට තිබුණේ ලාභයේ අරමුණ විතරයි. බල්ලෝ මරලා හරි සල්ලි හම්බ කරන්න ඕනෑ කියන මේ ආර්ථිකය ඇතුළේ ඒ අය පරිසරය ගැන හිතුවේ නැහැ; ජන සහභාගිත්ව ආර්ථිකයක් දෙසට මේ රට මෙහෙයවුයේ නැහැ. නිෂ්පාදනය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් ඒ අයට තිබුණේ නැහැ. ජනතාවට ජීවත් වෙන්න බැරි, තුන්වේල කන්න බැරි රටක් නිර්මාණය කරපු ඒ පාලකයින් ඡන්දයෙන් පරාද වෙලා ගිහින් නෂ්ටාවශේෂ ටිකක් මෙතැන තිබියදී. ඔවුන් තර්ක කරමින් ඉන්නවා, අපි ගෙන යන්නේත් පැවැති ආර්ථික ක්‍රමයමයි කියලා. නැහැ, ස්ථිරවම අපි මේක වෙනස් කරනවා.

තමන්ගේ දරු පැටවුන්ට කන්න දෙන්න බැරුව තමන්ගේ දරුවන්ට වස දීලා අම්මාත් වස බීලා මැරුණු පුරවැසියන් ජීවත් වන සමාජයක් මේ රට ඇතුළේ නිර්මාණය කළා. ඒ රට තමයි වෙළෙඳ පොළ ආර්ථිකය ඇතුළේ අවසානයේදී අපට ඉතිරි කළේ. හැබැයි, ජාතික ජන බලවේගය ආණ්ඩුව ආවේ මේ රට ඒ විධියටම ඉස්සරහට ගෙන යන්න නොවෙයි; මේ රට වෙනස් කරන්නයි. අපි බලය ගත්තු මොහොතේ සිට මේ දක්වා ඒ සඳහා අවශ්‍ය සියලු සැලසුම්, සියලු ක්‍රියා මාර්ග ගනිමින් ඉන්නේ.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමහර මන්ත්‍රීවරු පළමුවැනි වතාවට පාර්ලිමේන්තුවට ආවා වාගෙයි මෙතැනට ඇවිත් කථා කරන්නේ. හැබැයි, වසර 20ක ඉතිහාසය ඇතුළේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ නායකයන් දිස්ත්‍රික්කය පාලනය කරලා, රට පාලනය කරලා අත් කර දුන් ඉරණමේ බෙදවාචකය තමයි අද දවසේ මේ දිග හැරෙමින් තිබෙන්නේ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ උග්‍ර හාල් හිඟයක් තිබෙනවා කියලා අපි දන්නවා. කිලෝවක් රුපියල් 245 ගණනේ හාල් කිලෝ දෙකයි දෙන්නේ. අද පොල් ගෙඩියක් රුපියල් 175යි, 180යි, 190යි. මේ දැවැන්ත අර්බුදයට වගකිව යුතු පාලකයන්, වගකිව යුතු කණ්ඩායම් තමයි අද පරද්දලා විපක්ෂයේ 10, 12 කණ්ඩායම්වලට සීමා කරලා තිබෙන්නේ. අපි මේ තිබෙන ප්‍රශ්න විසඳන්න ඕනෑ. ඔය කියන නායකයෝ තමයි මේ වෙළෙඳ පොළ ආර්ථිකය ඇතුළේ හාල් මාෆියාව නිර්මාණය කළේ. නිසි සැලැස්මක්, වැඩ පිළිවෙළක් හදලා තිබුණා නම්, ව්‍යාපාරිකයන් අද බත් පතත් එක්ක සෙල්ලම් කරන්නේ නැහැ.

[ගරු අරවින්ද සෙනරත් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ ජනතාව ඛේදවාචකයකට, ලොකු අර්බුදයකට මුහුණ දෙමින් සිටිනවා. හැබැයි, අපි ආණ්ඩුව අරගෙන දින කිහිපයයි. ඒ අය අපෙන් අහනවා, හාල් මාෆියාව විසඳන්න ගන්නා ක්‍රියා මාර්ගය මොකක්ද කියලා. ශක්තිමත් වී අලෙවි මණ්ඩලයක් හදලා අපට තරග කරන්න පුළුවන් ප්‍රමාණයට වී මිල දී ගෙන තිබුණා නම්, කිසිදු සහල් මාෆියාවකට අපි ඉඩ තියන්නේ නැහැ; ජනතාවට තුන්වේල සතුටින් කන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි අපේ ආණ්ඩුවේ ආරම්භක දවසේ ඉඳන් හදනවා. හැබැයි, අද අපට ඒක කරන්න බැරි වෙලා තිබෙනවා, පසුගිය ආණ්ඩුව අනුගමනය කළ ක්‍රියාවලිය ඇතුළේ.

පොල් නිෂ්පාදනය ගත්තත් එහෙමයි. අපි ගොවි ගම්මානවල මිනිස්සු; ගොවියන්ගේ දරුවෝ. අපි දන්නවා, අස්වැන්නට සිද්ධ වන දේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද පොල් ගහක ගෙඩි 100ක් හැදුණොත්, ගෙඩි 90ක් බිම; ගෙඩි 10යි අස්වැන්න වශයෙන් ගන්නේ. ඒකට ප්‍රධාන හේතුවක්, රිළවුන්ගේ, වඳුරන්ගේ ප්‍රශ්නය. පොල් වගාවට මයිටා රෝගය හැදුණා; සුදු මැස්සාගේ රෝගය හැදුණා. හැබැයි, හම්බන්තොට වෙන්න පුළුවන්, කුරුණෑගල වෙන්න පුළුවන්, පුත්තලම වෙන්න පුළුවන් රට පුරා පොල් වගාව ආරක්ෂා කර ගන්න ඒ කිසිදු පාලකයෙක්, පැවති කිසිම ආණ්ඩුවක් කිසිදු ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. හැබැයි, අද? අද ප්‍රශ්න කරනවා, දින 75ක මාලිමාවේ ආණ්ඩුවෙන්. මේ ළඳරු ආණ්ඩුව පුංචි දරුවෙක් වාගෙයි. මේ ආණ්ඩුවෙන් ප්‍රශ්න කරනවා, මොනවාද ගෙනාපු උත්තර කියලා. මේවාට උත්තර ගේන්න තමයි අපේ ආණ්ඩුව මේ රටේ පාලන බලය භාර ගත්තේ. අපි මේ රටේ පුරවැසියන්ට විශ්වාසයෙන් තහවුරු කරලා කියනවා, අපි මේ ප්‍රශ්න විසඳනවා, අපි ක්‍රමානුකූලව පියවරෙන් පියවර මේවාට උත්තර ගේන්න සූදානම් වෙලා ඉන්නවා කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ පාලකයෝ හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආර්ථිකය වැට්ටුවා. අපි අද කථා කරන්නේ අතුරු සම්මත ගිණුම ගැන. අතුරු සම්මත ගිණුමෙන් මුදල් වෙන් කර ගන්නේ මේ රටේ ජනතාවගේ, මේ රටේ පුරවැසියන්ගේ එදිනෙදා ජීවිත පවත්වා ගෙන යන්න අවශ්‍ය කරන කටයුතු කිරීම, රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවීම, ආර්ථිකයේ එක් එක් ක්ෂේත්‍රවලට අදාළ කරන ව්‍යදම් සිදු කිරීම ආදිය සඳහායි. හැබැයි, දිස්ත්‍රික්කයක් විධියට හම්බන්තොට දිස්ත්‍රික්කය මේ ආර්ථිකයට බද්ධ කර ගනිද්දී හිටපු හැම පාලකයාම හම්බන්තොට ආර්ථිකයත් එක්ක සූදු කෙළියා. සමහර නිෂ්පාදන ක්ෂේත්‍ර බින්දුවට වට්ටලා දැම්මා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිබුණා, ඉතාම සශ්‍රීක පැහිරි වගාවක්. ඒ පාලකයන් හිතුවක්කාර, අත්තනෝමතික ක්‍රියා මාර්ග අරගෙන හම්බන්තොට දිස්ත්‍රික්කයේ පැහිරි වගාව බින්දුවට වට්ටලායි තිබෙන්නේ. අපේ ලංකාවේ කෙරෙනවා ලෝකයේ හොඳම ගම්මිරිස් වගාව. හැබැයි, ගම්මිරිස් වගාවත් එක්ක එකතු කළ අගය මත නිෂ්පාදන වැඩි කරලා ආදායමක් ගෙනැල්ලා ගොවියාට සාධාරණයක් කරන්න මේ පාලකයන් කටයුතු කළේ නැහැ. අපේ රටේ කරුංකා තිබුණා. නමුත්, කරුංකා ආනයනය කරලා ප්‍රතිඅපනයනය කරද්දී, කූට වෙළෙඳ උපක්‍රම පාවිච්චි කරලා අපේ වෙළෙඳ පොළ වට්ටලායි තිබෙන්නේ.

අද පරාද වෙලා විපක්ෂයට සීමා වෙලා 10ක්, 12ක් ඉන්න කණ්ඩායම් මාලිමාව ආණ්ඩුවෙන් -ජාතික ජන බලවේගය ආණ්ඩුවෙන්- ප්‍රශ්න කරමින් ඉන්නවා, ආර්ථිකයට මොකක්ද කරන්නේ කියලා. බලාගෙන ඉන්න. අපි මේ රට ගොඩ නහනවා. ඒ සඳහා දැවැන්ත හයියක් තිබෙන, දැවැන්ත ධෛර්යයක්, සැලැස්මක්, කැපවීමක් තිබෙන අපේ පාර්ලිමේන්තු කණ්ඩායමේ 159 දෙනෙක් ඉන්නවා. ඒ වාගේම අපට නායකත්වය දෙනවා, අනුර සහෝදරයා. ඒ නිසා අපි විශ්වාසයෙන් තහවුරු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රට වැටුණු රටක්, ලෝකයේ දුප්පත් රටක්, කඩා වැටුණු, අර්බුදයට ලක් වුණු රටක්. මෙය ගොඩ නහන වගකීම අපට පැවරිලායි තිබෙන්නේ. ඒ නිසා අපි කලබල වෙන්නේ නැහැ. අපි මේ ප්‍රශ්න සියල්ල ක්‍රමානුකූලව විසඳමින් යනවා.

අපේ රටේ කර්මාන්ත පද්ධතිය ගත්තාම, ඇඟලුම් කර්මාන්තයේ සිට ඉදිකිරීම් කර්මාන්තය දක්වා සමස්තය කඩා වැටිලායි තිබෙන්නේ. ඉදිකිරීම් කර්මාන්තය වසර තුනහතරක් තිස්සේ දැවැන්ත අර්බුදයකට ලක් වෙලා තිබෙනවා. හැබැයි, මේ වසරේ සැප්තැම්බර් 21 වැනි දා වනකල් තිබුණු ආණ්ඩුවට, එහෙම නැත්නම් නොවැම්බර් 14 වැනි දා වනකල් පවත්වා ගෙන ගිය ආණ්ඩුවට ඒවාට සැලසුම් තිබුණේ නැහැ. එම ක්ෂේත්‍ර වැටෙද්දී ඒ අය බලාගෙන හිටියා. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලක්ෂ හතක් විතර වෙච්ච සේවකයන්ට අද තමන්ගේ රැකියාව කර ගන්න බැරි වෙලා තිබෙනවා. කෘෂි කර්මාන්තය තුළ හිටපු සාතිශය බහුතරයක් ගොවියන් අද අසරණ වෙලා ඉන්නවා. ගොවියාගේ ආර්ථිකය කඩා වැටෙනවා කියන්නේ ගොවියාගේ දුප්පත්කම වැඩි වීම විතරක් නොවෙයි. ඒකත් එක්ක ගැට ගැහුණු ඔවුන්ගේ අධ්‍යාපනය, ඒකත් එක්ක ගැට ගැහුණු සෞඛ්‍යය, ජනජීවිත ආදී සියල්ල අර්බුදයකට ලක් වෙනවා. එසේ වෙද්දී හිටපු පාලකයෝ කිසිදු උත්තරයක් සැපයුවේ නැහැ. ඒ නිසා අපට වගකීමක් තිබෙනවා. අපි මේක හදන්න ඕනෑ.

ජාතික ජන බලවේගය මේ ආණ්ඩුව භාර ගත්තේ ගොවියාගේ, කම්කරුවාගේ, රාජ්‍ය සේවකයාගේ -සමස්ත පුරවැසියාගේ- ප්‍රශ්න විසඳන්නයි. අපි මේ වෙලාවේ සතුටින් මැදිහත් වෙමින් සිටිනවා මේ කඩා වැටුණු රට නැවත ගොඩනහන්න. විපක්ෂය අදත් පොඩි ආතල් එකක් ගන්න සූදානම් වෙලා ඉන්නවා, හාල් මිල වැඩි වෙලා, පොල් මිල වැඩි වෙලා තිබියදී. අපි කිසි දවසක ප්‍රාර්ථනා කළේ නැහැ අපේ, ඔබේ, මේ සමස්ත රටවැසියාගේ මානෘ භූමිය මෙහෙම වැටෙන්න කියලා. හැබැයි, අපි අපේ අත් දෙකෙන් මේ රට ගොඩනඟනවා. ඒ සඳහා අපි සැලසුම් සකස් කරමින් තිබෙනවා. ඒ සඳහා මාස හතරකට අවශ්‍ය මුදල්, අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරගැනීම තමයි අද දවසේ අපි මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කිරීම හරහා සිදු කරමින් තිබෙන්නේ. අපි මේ සියල්ල ඉතාම නිවැරදිව කරගෙන යනවා.

සමහර මන්ත්‍රීවරු මේ අතුරු සම්මත ගිණුම ගැන මහා විශාල තර්ක නඟද්දී අපට මතක් වෙනවා, ඉතිහාසයේ අපේ රට ඛේදවාචකයට ඇදගෙන ගිය හෙජින් ගිවිසුම, ග්‍රීසියේ බැඳුම්කරවල මුදල් ආයෝජනය වාගේ දේවල් මේ රට ඇතුළේ සිදු වෙද්දී ඔය කියන ගොඩක් මන්ත්‍රීවරු අත් දෙක හකුළාගෙන, ඇස් දෙක පියාගෙන, සාටක අස්සේ, කෝට් අස්සේ රිංගලා රැකවරණය ලබපු හැටි. ඒකේ ප්‍රතිඵලයක් විධියට අද රටේ මිනිස්සු දුක් විඳිනවා. තමන්ගේ බලය රැකගන්න ගෙනාපු ව්‍යවස්ථා සංශෝධන හැම එකකටම අත ඔසවපු ඔය සමහර මහත්වරු, සමහර මන්ත්‍රීවරු අද උදේ මේ අතුරු සම්මත ගිණුම වෙනුවෙන් විවිධ තර්ක ගෙනැල්ලා එහෙම වෙන්න දෙන්න බැහැ කිව්වා. රට වට්ටලා තමයි දැන් මේ තර්ක ඔක්කොම ගෙනෙන්නේ. අපි ප්‍රජාතන්ත්‍රවාදීව, නීත්‍යානුකූලව මේ දේවල් සියල්ල කරන්නේ රට ගොඩනැඟීම සඳහා. අපට සැලැස්මක් තිබෙනවා; වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ වැඩ පිළිවෙළත් එක්ක අපි මාස 6ක්, අවුරුද්දක් යද්දී මේ රට ලස්සනට පියවරින් පියවරට ඉස්සරහට ගෙන යනවා. මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන් වාගේම, මේ රට වැටෙයි කියලා බලාපොරොත්තු වෙන කවුරුහරි ඉන්නවා

නම් ඒ මහත්වරුන්ට අපි කියනවා බලාගෙන ඉන්න කියලා. අපි ගොඩනඟන පොහොසත් රටේ ලස්සන ජීවිතයක් ලබා දෙන මේ ආණ්ඩුවේ ක්‍රියාවලිය අපි අවසන් කරන්නේ මේ රට ජයග්‍රහණය කරවලායි. ඒ සඳහා සියලුදෙනාගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලනවා. විපක්ෂයට කරන්න කිසිවක් නැහැ. දැන් විවේචනය කරන කාර්යභාරය අවසන්. ඔවුන්ට තිබෙන්නේ එක අවස්ථාවයි. මේ මල් වට්ටියට අත ගහන්න අපි ඔවුන්ට ආරාධනා කරනවා. මේක තමයි අපේ රට ගොඩනඟන්න තිබෙන අවසන් අවස්ථාව. ඒ අවස්ථාවේ අපි දැන් ඉන්නේ. අපි සියලුදෙනා එකතු වෙලා මේ රට ගොඩනඟමු කියන ආරාධනය කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ලක්මාලි හේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.00]

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මගේ කථාව ආරම්භ කරද්දීම මම මේ කාරණය කියන්න කැමැතියි. මම උදේ ඉඳලාම අහගෙන හිටියා, විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මේ ජාතික ජන බලවේග රජය ගමන් ගන්නා මාර්ගය පිළිබඳව ඉතාම දැවැන්ත, බරපතළ ප්‍රකාශ කිහිපයක් කළා. නමුත්, අපි හැමෝම දන්නවා අපට බලය ලබා දීලා තිබෙන්නේ, ජාතික ජන බලවේගයට බලය ලබා දීලා තිබෙන්නේ මේ රටේ සාමාන්‍ය, වැඩ කරන, දුප්පත් පන්තියේ ජනතාව බව. ඒ ජනතාව අද ඉන්න තත්ත්වය මොකක්ද කියන එක ගැන මේ පාර්ලිමේන්තුවේ විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරුන්ට වඩා, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට, මන්ත්‍රීවරියන්ට ඉතාම හොඳ දැනුමක් තිබෙනවා. අපි ඒක සංඛ්‍යාත්මකව ගන්නවා නම්, පසුගිය වසර කිහිපය තිස්සේම ලංකාවේ දුගී බවේ සිටින ජනතාව සියයට 25ක් දක්වා වසර 4ක් තිස්සේ වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම, අපේ රටේ ආර්ථිකයේ විෂමතාව -ඒ කියන්නේ ඇති නැති පරතරය, දුප්පත් පොහොසත් පරතරය- එන්න එන්න වැඩි වෙලා තිබෙනවා. විශේෂයෙන් පසුගිය අවුරුදු දෙක තුළ ඒක වැඩිවෙලා තිබෙනවා. සෞඛ්‍යයට, අධ්‍යාපනයට, ප්‍රවාහනයට, රැකියාවලට ඇති ප්‍රවේශය පසුගිය වසර කිහිපය තුළ ජනතාවට අහිමි වෙලා තිබෙනවා. ලංකාවේ ජනතාව ඉන්නේ ආර්ථිකයෙන් පීඩා විඳිමින්. ලංකාවේ ජනතාව ඉන්නේ අමාරුවෙන්, වේදනාවෙන්, දරාගත නොහැකි පීඩාවකින් කියන එක විපක්ෂයේ මන්ත්‍රීවරුන් අපට කියන්න අවශ්‍ය නැහැ. ඒක අපි හොඳටම දන්නවා. ඒක අපි දන්නා නිසා තමයි ජනතාව අද අපව මෙතැනට එවලා තිබෙන්නේ. මේ රජය පත් කරලා තිබෙන්නේ අපි ජනතාවගේ පැත්තේ හිටපු නිසා. අපි ජනතාව වෙනුවෙන් කථා කරපු නිසා. අපි ජනතාව සමඟ හිටපු නිසා. ඒ නිසා විපක්ෂයේ මන්ත්‍රීවරු අපට ඒක නැවත වරක් මතක් කරලා දෙන්න අවශ්‍ය නැහැ. අප මත තිබෙන දේශපාලන වගකීමේ බරපතළකමත් අපි ඒ නිසාම දන්නවා. මම ඊයේත් කිව්වා, අපේ රටට දෙවැනි අවස්ථාවක් හම්බවෙලා තිබෙනවා කියලා. නිදහසින් පසු අවුරුදු ගණනාවක් මේ රට ගමන් කරපු මාර්ගය, විශේෂයෙන් 1977න් පස්සේ ලංකාව ගමන් කරපු මාර්ගය නැවත හරවන්න, එය නිවැරදි දිශාවට ගෙනෙන්න, අපේ රටේ ජාතික නිෂ්පාදන ආර්ථිකයක් ගොඩනඟන්න, ආර්ථික ස්වෛරී බව ගොඩනඟන්න අපට අවස්ථාවක් ලැබිලා තිබෙනවා.

ඒක බොහොම විරල අවස්ථාවක්. අපි වාගේ දේශපාලන ව්‍යාපාරයකට, ලංකාවේ සාමාන්‍ය ජනතාවට බලය එනවා කියන එක විරල දෙයක්. ගෝලීය දේශපාලනය තුළ බැලුවත් ඉතාම විරල දෙයක්. ඒකේ තිබෙන දේශපාලන වගකීම, අපි ඒකට කොච්චර වගවෙන්න ඕනෑද කියන එක හැමෝම දන්නවා. ඒ නිසා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට තිබෙන හදිසිය; විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට අපට වරද්දවන්න තිබෙන හදිසිය ගැන අපි බොහොම දැනුවත්.

අද උදේ වරුවේ විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් කථා කළා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන, ස්වෛරී බැඳුම්කර ගැන. ඒ කථා කියන ගමන්ම ඔවුන් පෙන්වන්න හදනවා, මේ රජයත් රනිල් වික්‍රමසිංහ ගිය මාර්ගයේම යනවා, ඒ හැර වෙන විකල්පයක් නැහැ, ඒ මහේම තමයි යන්න හදන්නේ කියලා. මම මුලින්ම මතක් කරන්න කැමැතියි, විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු මැතිවරණයට පෙර රජය -ජාතික ජන බලවේගය ගැන- ගැන මොකක්ද කිව්වේ කියන එක. ඇත්තටම ඔවුන් අපේක්ෂා කළේ මොකක්ද කියන එක මම මතක් කරන්න කැමැතියි. ඇත්තටම මේවා අපි කියපු දේවල් නොවෙයි. ජාතික ජන බලවේගයේ ප්‍රතිපත්ති ප්‍රකාශය අරගෙන බැලුවොත්, අපි ඉතා පැහැදිලිව සහ බොහොම නිශ්චිතව කියලා තිබෙනවා, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ගනුදෙනු කරන්න ලෑස්තියි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වැඩසටහන තුළ රැඳෙන්න ලෑස්තියි, අපි එහෙම තමයි ඉස්සරහට යන්නේ කියලා. අපි ඒක ජනාධිපතිවරණයට පෙරත් ප්‍රකාශ කරලා තිබෙනවා. ඒක, අලුතින් කියන කථාවක් නොවෙයි. ජනාධිපතිතුමා නොවැම්බර් 21වැනි දා පාර්ලිමේන්තුවට ඇවිල්ලා පළමුවැනි වතාවට නොවෙයි ඒ කථාව කිව්වේ. මැතිවරණ ව්‍යාපාර දෙකක් තුළ අපි බොහොම නිවැරදිව ඒ කථාව කියලා තිබෙනවා. එහෙම නොකියපු පක්ෂ ලංකාවේ හිටියා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලංකාව ඉවත් විය යුතුයි කියලා කියපු පක්ෂ ලංකාවේ හිටියා. අපි එහෙම පක්ෂයක් නොවෙයි. අපට මේ වෙලාවේ ලංකාවේ තිබෙන ආර්ථික අර්බුදය ගැන, අපට කරන්න වෙලා තිබෙන දේවල බරපතළකම ගැන බොහොම පැහැදිලි අවබෝධයක් තිබෙනවා. අපි නිකම් කියන්නම් වාලේ කතන්දර කියන්නේ නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ගැන මොන තරම් විවේචන තිබුණත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දේශපාලනය ගැන මොන තරම් විවේචන තිබුණත් අපි නිකම් කියන්නම් වාලේ කතන්දර කියන්නේ නැහැ. මේ විපක්ෂයේ මන්ත්‍රීවරු වාගේ අපි කථා කරන්නේ නැහැ. අපි බොහොම පැහැදිලිව කියලා තිබෙනවා, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක දිගටම වැඩ කරන්න ලෑස්තියි කියලා. ඒ නිසා දැන් ඔබතුමන්ලා එහෙම කියන්න එපා. ජාතික ජන බලවේගය දිගටම කියපු ප්‍රතිපත්තියක් මත වැඩ කරගෙන යනකොට විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු ඇවිල්ලා කියනවා, අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අයින් වෙන්න හිටිය ලු, ඒකත් එක්ක වැඩ කරන්න කැමැති වෙලා හිටියේ නැහැ ලු. එහෙම එකක් තිබුණේ නැහැ. එහෙම ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

අපි කියනවා, they are fighting a straw man. That is what they are fighting with, Hon. Presiding Member, a straw man. They expected us to become something; they thought we would become something, but we are not that. We are a responsible political party. We are responsible for the people of this country. We have to take care of the people of this country. We are not here to destroy the economy; we are not here to break down the social fabric. There is a burden on our shoulders and we are fully aware of that. We are going to move forward slowly; just as the Hon. (Prof.) Anil Jayantha said in the morning, we are moving forward slowly and steadily in the right

[ගරු ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

direction. That is what we are doing. So, we do not need these senior MPs from the Opposition to tell us how to be leftists or socialists; we do not need the right-wing parties to tell us how to be leftists. We are fully aware of what it means to be leftists. Leftism is not hooliganism. වාමාංශිකයෙක් වෙනවා කියන්නේ විනාශය කරා රට ඇදගෙන යනවා කියන එක නොවෙයි. අපි ඒ ගැන හොඳින් ම දන්නවා. වාමාංශික රජයක් කියන්නේ, ජනතාව විනාශය කරා ගෙන යන රජයක් නොවෙයි. ඒ නිසා මේ වාගේ ප්‍රකාශ කරමින් ජනතාවට අසත්‍ය කියන්න එපා. මැතිවරණයට පෙරත් මේකම නේ කළේ. මැතිවරණයට පෙරත් විපක්ෂයේ මන්ත්‍රීවරු දිගටම කළේ අසත්‍ය දේවල් කියපු එක. දැන්, ඔවුන්ම කියපු අසත්‍ය කාරණා ඔවුන් විශ්වාස කරන්න පටන් අරගෙන අපට ඇවිල්ලා කියනවා, අපි IMF එකත් එක්ක වැඩ කරන්න කැමති වෙලා හිටියේ නැහැ ලු, අයින් වෙන්න හිටිය ලු කියලා. මේවා අසත්‍ය.

ඒ වාගේම තව කථාවක් කියනවා, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන්. එතුමන්ලා කියනවා, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේදී අපි රනිල් වික්‍රමසිංහගේ ගිවිසුම අත්සන් කරන්න ඕනෑ නැහැ කියලා. දැන් ගිවිසුමක් නැහැ ලු. ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු තමයි මේ විධියට කියන්නේ. ආර්ථික විද්‍යාව සම්බන්ධව දන්නවා කියලා අපිත් හිතාගෙන හිටපු ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු තමයි මෙහෙම කියන්නේ. ජනාධිපතිවරණයට දවස් දෙකකට පෙර රනිල් වික්‍රමසිංහ මහතාගේ රජය විදේශීය බැඳුම්කර හිමියන් සමඟ - පුද්ගලික බැඳුම්කර හිමියන් සමඟ - in principle, agreement එකකට ඇවිල්ලා තිබෙනවා. ඒ කියන්නේ ප්‍රතිපත්තිමය එකඟතාවකට ඇවිල්ලා තිබෙනවා. එතකොට අපි තීරණය කරන්නට අවශ්‍යයි, අපි ඒ එකඟතාවෙන් ඉවත් වෙනවාද, ඉවත් වෙලා අපි ලෝකයට, market එකට negative signal එකක් දෙනවාද, එහෙම නැත්නම් අපි කොහොම හරි මේ අභියෝගය භාර අරගෙන ඉස්සරහට යනවාද කියන එක. ජනතාවට වග කියන රජයක් හැටියට අපි ඒ අභියෝගය භාර අරගෙන ඉස්සරහට යන්න තීරණය කරලා තිබෙනවා. අපි ඒ අභියෝගය භාර ගන්නවා.

ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු අනිල් ජයන්ත මැතිතුමා අද උදේ බොහොම පැහැදිලිව කිව්වා, මේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය කල් යෑම නිසා ඩොලර් බිලියන 1.7ක් අපට වැඩිපුර පොලිය හැටියට ගෙවන්න සිදු වෙලා තිබෙනවා කියලා. ඒවා ජනතාව ගෙවන්න ඕනෑ මුදල්; බදු මුදල්. අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය කඩා වැටිච්ච, කන්න නැතුව ළමයි ඉන්න රටක තමයි අපි මේවා ගෙවන්නේ. මේවා, ඒ වෙනුවෙන් වියදම් කරන්න ඕනෑ මුදල්. තවදුරටත් අවුරුද්දක්, දෙකක් මේ ක්‍රියාවලිය තවත් ඇදගෙන ගිහිල්ලා ඒ මුදල් පොලී හැටියට ණය හිමියන්ටම ගෙවනවා ද? එහෙම නැත්නම් මේ ක්‍රියාවලිය මෙතැනින් අවසන් කරලා, අපි මේ අභියෝගය භාර -රට ගොඩනගන අභියෝගය- භාර අරගෙන ඉස්සරහට යනවාද කියන එක ගැන අපි තීරණය කරන්නට අවශ්‍යයි. ජාතික ජන බලවේගය රජය හැටියට අපි ඒ අභියෝගය භාරගෙන තිබෙනවා.

මම හිතන විධියට ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු, පෞද්ගලිකව මමත් බොහෝම කාලයක් කථා කරලා තිබෙනවා. අපි ඒ ගැන දන්නවා. නමුත් ඒකේ තිබෙන අවදානම් ගැනත් අපි දන්නවා. ඒ නිසා මේ ආණ්ඩුව වටිටන්නයි මේ කථා කරන්නේ. ආණ්ඩුව කරයි කියලා ඒ ගොල්ලන් හිතාගෙන හිටපු දේවල් නොකරන නිසා දැන් ආණ්ඩුව වටිටන්නයි මේ කථා කරන්නේ. ඒ ගොල්ලන් හිතාගෙන ඉන්නවා අපි මෝඩයෝ කියලා. විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරු හිතාගෙන ඉන්නේ එහෙමද? ඒ ගොල්ලන් හිතාගෙන ඉන්න ඇති අපි එහෙම කරාවි කියලා. අපි එහෙම කරන්නේ නැහැ. අපි බොහොම උපායමාර්ගිකව, සැලසුම් සහගතව, පිළිවෙළකට මේ රට ගොඩනැඟීමේ කටයුත්ත ඉස්සරහට කරගෙන යනවා. ඒ නිසා මම මේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට මතක් කරන්න කැමැතියි, තමනුත් හිටපු රජයන්වලින්, තමනුත් සහභාගී වෙච්ච රජයන්වලින් තමයි මේ රට මේ තරම් ණය කරන තැනකට ගෙනැල්ලා තිබෙන්නේ කියන එක. ඒ වගකීම භාරගන්නේ නැතුව, ඒ වගකීම ජනතාව ඉදිරියේ ප්‍රකාශ කරන්නේ නැතුව, හෙළි කරන්නේ නැතුව, රට ගොඩ නැඟීමට ජනතාව අලුතෙන් වරමක් ලබා දීලා තිබෙන රජයක් මතට ඒක පටවන්න ලැහැස්ති වෙන එක ඉතාම විහිළු සහගතයි. එසේ නොවිය යුතුයි. මේ පාර්ලිමේන්තුවේ එහෙම කරන්න අවශ්‍යතාවක් නැහැ. වගකීම භාර ගන්න. තමන් කරපු පංගුවේ වගකීම භාර ගන්න.

ඒ වාගේම ජනාධිපතිවරයාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් උදේ චෝදනාවක් නැඟුවා. එම වැය ශීර්ෂය සම්බන්ධයෙන් චෝදනා කරමින් කියනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වැය ශීර්ෂය තරම්ම අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂයත් තිබෙනවා කියලා. නමුත් අපි මතක් කරන්න කැමැතියි, අනුර කුමාර දිසානායක මැතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන් කරලා තිබෙන වැය ශීර්ෂය සියයට 64කින් අඩු වෙලා තිබෙන බව. පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා වෙන් කරන වැය ශීර්ෂය. ඒ කියන්නේ ජනාධිපතිතුමාගේ පෞද්ගලික කටයුතු සඳහා එතුමාගේ ඒ කාර්ය මණ්ඩලය වෙනුවෙන් වෙන් වූ වැය ශීර්ෂය සියයට 64කින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම ඒ වියදම ඇතුළේ තිබෙනවා, ලෝක ආහාර වැඩසටහන මඟින් අපට ලබා දීලා තිබෙන ඩොලර් මිලියන 1,300ක්. එය ජනාධිපති ලේකම් කාර්යාලයට තමයි ලබා දීලා තිබෙන්නේ. ඒ වියදමත් මේක තුළ තිබෙනවා. ඒ සියල්ල එකතුව තමයි ඔය කියන සමානකම් ඇති වෙලා තිබෙන්නේ. ඉතින්, අපි ගැන මේගොල්ලන් නැවත නැවතත් පෙන්වන්න හදනවා, "වරප්‍රසාද කපන්නේ නැහැ; ඒ අය ගිය පාරේම තමයි මේ අයත් යන්න හදන්නේ" කියලා. නමුත් අපට එහෙම අවශ්‍යතාවක් නැහැ. අපි මෙතැනට ඇවිල්ලා ඉන්නේ; ජනතාව ඉදිරියට ඇවිල්ලා ඉන්නේ, හිටපු රජයන් සහ ඔවුන් ගිය ඒ පාරවල්වල යන්න නොවෙයි.

විශේෂයෙන්ම මම මෙහිදී රනිල් වික්‍රමසිංහ මහත්මයා පිළිබඳව මතක් කරන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රජය සහ ඒ කැබිනට් මණ්ඩලය සමස්තයක් ලෙස ජනතාව පරාජයට පත් කරලා තිබෙනවා. ඒ කැබිනට් මණ්ඩලය නියෝජනය කළ මන්ත්‍රීවරුන්ගෙන් අද මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ මා දන්නා තරමින් ජීවත් තොණ්ඩමන් මන්ත්‍රීවරයා විතරයි. එතුමාගේ සමස්ත කැබිනට් මණ්ඩලයම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා. ඒක අතිවිශාල ප්‍රතික්ෂේප කිරීමක්. ඒ ප්‍රතික්ෂේප කිරීමේ බරපතළකමවත් මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරුන් - විපක්ෂයේ සිටින මන්ත්‍රීවරුන් - තේරුම් අරගෙන නැහැ. ඒ වගකීම තවම පෙන්වන්නේ නැහැ. දැන් අපට කියනවා, අපි IMF Programme එක ඉස්සරහට අරගෙන යනවා; debt restructuring programme එක ඉස්සරහට අරගෙන යනවා කියලා.

මට මතක විධියට ඊයේ දවසේත් ප්‍රකාශ කළා, මේ IMF Programme එකට විරුද්ධව ජාතික ජන බලවේගය ඡන්දය දුන්නා කියලා. ඒක ඇත්ත. විරුද්ධ වෙන්න ඕනෑ නැන්වලදී විරුද්ධ වෙන්න ඕනෑ තමයි. අපි ඒකට විරුද්ධව ඡන්දය ලබා දීලා තිබෙනවා. අපි ඒකට විරුද්ධව ඡන්දය ලබා දීමට ප්‍රධාන හේතුව තමයි, හිටපු රජයට එවැනි ගිවිසුම්වලට ඇතුළත් වීමට ජන වරමක් තිබුණේ නැහැ කියන කාරණය. ඒ කියන්නේ, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ රජයට - ඒ කැබිනට් මණ්ඩලයට - මේ ගිවිසුම්වලට එකඟ වීමට ජන වරමක් තිබුණේ නැහැ කියන අදහසින් තමයි අපි දිගටම කටයුතු කළේ. ඒ නිසා තමයි අපි දිගටම මැතිවරණ ඉල්ලා

සිටියේ. පළාත් පාලන මැතිවරණය කල් දමලා තිබෙද්දී තමයි මේ ගිවිසුම්වලට ඇතුළත් වුණේ. ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් මන්ත්‍රීතුමා ඊයේ මතක් කළා, එතුමා විතරයි ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරු තුන්දෙනාත් සමඟ - අපේ හිටපු මන්ත්‍රීවරුන් තුන්දෙනාත් සමඟ - එහෙම ජන වරමක් නැහැ කියන අදහස පිළිගත්තේ කියලා. මේ විපක්ෂයේ සිටින අනෙකුත් සියලු මන්ත්‍රීවරුන් මේ ගිවිසුම්වලට ඇතුළත් වීමට රනිල් වික්‍රමසිංහ මහත්මයාට ජන වරමක් තිබුණා කියන එක පිළිගත්තා; සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් එහෙම පිළිගත්තා. ඒ කාලයේ සමගි ජන බලවේගයේ මන්ත්‍රීවරුන් කිව්වේ, "ජනාධිපතිතුමාගේ වැඩසටහන හොඳයි, මේ වැඩසටහන ඉස්සරහට කරගෙන යන්න අවශ්‍ය උදව්වක් තිබෙනවා නම් අපි විපක්ෂයේ සිට ලබා දෙනවා" කියලායි. එහෙමයි ඒ දවස්වල කථා කළේ. එතකොට ඒ වැඩසටහන් සුජාතකරණය කළේ ඒ අය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවා රාජ්‍යයන් නේ. අපි ඉන්නේ ආණ්ඩුවේ. එතකොට බාහිර වගකීම්වලට රාජ්‍යයක් හැටියට තමයි අපි බැඳිලා ඉන්නේ. විදේශ රටවල් හැටියට සිටින ණය හිමියන්ට, පෞද්ගලික ණය හිමියන්ට අපි රාජ්‍යයක් හැටියට තමයි බැඳිලා ඉන්නේ. එහෙම බැඳිලා තිබෙද්දී, "පසුගිය ආණ්ඩුව කරපු දේවල්වලට අපි එකඟ නැහැ, ඒ නිසා අපට මේක ඉස්සරහට ගෙනියන්න බැහැ" කියලා අපට කියන්න හැකියාවක් නැහැ; ජාත්‍යන්තර නීතිය තුළ එහෙම කියන්න හැකියාවක් නැහැ. අපි වග වෙන්න ඕනෑ ඉස්සෙල්ලා ආණ්ඩු කරපු දේවල්වලට. අපේ කරමත ඒ වැරදි තිබෙනවා. ඒක ඇත්ත. නමුත් මම මතක් කරන්න අවශ්‍යයි, මෙතැන සිටින මන්ත්‍රීවරු; විශේෂයෙන්ම විපක්ෂයේ සිටින මන්ත්‍රීවරු ඒ කාලයේ එහෙම ජන වරමක් නැහැ කියන කථාව කිව්වේ නැහැ කියන එක. එතකොට ඔක්කොමලා රට භදන්න රනිල් වික්‍රමසිංහ මහත්මයාට උදව් කරපු එක තමයි කළේ. දැන් ඇවිල්ලා කියනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ වැඩසටහන අද අපි ඉස්සරහට ගෙනියනවා කියලා. එවැනි විනාශකාරී, ජනතාවට එරෙහි, - ජනතාවට විරුද්ධ - දුගීභාවයෙන්, වේදනාවෙන්, පීඩාවෙන්, අසංවේදීභාවයෙන් පිරුණු පාලන තන්ත්‍රයක් ඉදිරියට ගෙන යෑමේ කිසිදු බලාපොරොත්තුවක් අපේ නැහැ. එවැනි ආකාරයෙන් කටයුතු කරන්න ජනතාව අපට ජන වරමක් ලබා දීලාත් නැහැ.

අපට ලබා දීලා තිබෙන ජන වරමේ ස්වභාවය තමයි ආර්ථිකයෙන් පලවා හරින ලද ජනතාව නැවත සහභාගි කර ගැනීම. පසුගිය අවුරුදු දෙක ඇතුළත ලංකාවේ ජනතාව අතිවිශාල ප්‍රමාණයක් ආර්ථිකයෙන් පලවා හැර තිබෙනවා. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත අතිවිශාල ප්‍රමාණයක් වැහිලා තිබෙනවා. කම්කරුවන්ට රැකියා අහිමි වෙලා තිබෙනවා. විශේෂයෙන් සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තවල යෙදී හිටපු කාන්තාවන්ට, ඇඟලුම් කර්මාන්තවල නියුතු කාන්තාවන්ට රැකියා අහිමි වෙලා තිබෙනවා. තමන්ගේ ජීවන මාර්ගය අහිමි වෙලා තිබෙනවා. ඒ මිනිස්සුන්ව ආර්ථිකයට සම්බන්ධ කරගන්න අවශ්‍යයි. අපේ දැක්ම තිබෙන්නේ එතැන. එහෙම නැතිව ජනතාව පෙළමින්, ජනතාව පීඩාවට පත් කරමින්, කෙසේ හෝ බදු එකතු කරගෙන ණය ගෙවමින් යන ගමනක් යන්න අපට අවශ්‍ය නැහැ. ඒ නිසා තමයි අපි කිව්වේ, අපට ජන වරමක් අවශ්‍යයි කියලා. ලෝකය ඉස්සරහා හිටගෙන, අපි කවුරු ඉස්සරහ හිටගෙන කටයුතු කළත්, විදේශීය රටවල් එක්ක කටයුතු කළත්, මොන ගිවිසුමකට එළඹුණත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක කටයුතු කළත්, ලෝක බැංකුවත් එක්ක කටයුතු කළත්, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට නියමිත කාලය අවසන්. අවශ්‍ය නම් තව විනාඩියක්, දෙකක් ගන්න පුළුවන්.

ගරු ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) லக்மாலி ஹேமசந்திர)
(The Hon. (Ms.) Lakmali Hemachandra)
Thank you, Hon. Presiding Member.
මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ලෝකයත් එක්ක ගනුදෙනු කරද්දී, - ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක, ලෝක බැංකුවත් එක්ක, විදේශ රටවල් එක්ක ගනුදෙනු කරද්දී - අපි හිටගෙන ඉන්නේ කොයි පැත්තේද කියන එක ගැන අපි දන්නවා. අපි හැම තිස්සේම හිටගෙන ඉන්නේ ජනතාවගේ පැත්තේ.

මේ රට පුංචි රටක්, කඩා බිඳ දැමූ රටක්, බංකොලොත් කළ රටක්, දුප්පත් රටක්. අපේ රටේ ස්වෛරීත්වයට ඉතාම බරපතළ හානියක් පසුගිය රජයන් විසින් කර තිබෙනවා. එය නහා සිටුවීමේ වගකීම, ලෝකය ඉස්සරහා ගරුත්වයක් ඇතිව අත පාන්නේ නැතිව පෙනී සිටීමේ වගකීම අපට තිබෙනවා. මම හිතන විධියට පසුගිය මාස දෙක තුන ඇතුළත අපි ඉතා විශිෂ්ට ලෙස ඒ වගකීම ඉෂ්ට කර තිබෙනවා. ඒක නිසා තමයි ලෝකයේ හැම රටක්ම අපිත් එක්ක ගනුදෙනු කරන්න කැමැති වෙන්නේ, ගනුදෙනු කරන්න ඉදිරිපත් වෙන්නේ, යහපත් දේවල් කියන්නේ.

කිසිම රටක්, කිසිම ආයතනයක් රජය ගැන ඍණාත්මක දෙයක් කියන්නේ නැහැ. ජපානයේ විදේශ තානාපතිවරයා බොහොම ප්‍රසිද්ධියේ කිව්වා, පසුගිය රජයන්වල ඇමතිවරු ඔවුන්ගෙන් අල්ලස් ඉල්ලුවාය කියලා. ඒ වාගේ චෝදනා එල්ල කරලා, අපේ රට අපකීර්තියට පත් කරලා තිබුණේ. අපි ඒ තත්ත්වයෙන් රට මුදාගෙන තිබෙනවා. අපි කවුරු එක්ක ගනුදෙනු කළත් ජනතාවගේ පැත්තේ ඉඳගෙනයි ගනුදෙනු කරන්නේ. මොකද, අපි තමයි ජනතාව. අපි ජනතාව සමඟයි සිටින්නේ. අපි සිටියේ ජනතාව සමඟයි; අද ඉන්නේත් ජනතාව සමඟයි; ඉස්සරහට ඉන්නේත් ජනතාව සමඟයි. එම නිසා විපක්ෂයේ මන්ත්‍රීවරුන් බොරුවට ජනතාවගේ නියෝජිතයන් වීමේ අවශ්‍යතාවක් නැහැ. වාමාංශික වෙන්න ඕනෑ කොහොමද කියලා ඔවුන් අපට කියා දෙන්න අවශ්‍යතාවක් නැහැ.

උතුරු පළාත නියෝජනය කරන, නැඟෙනහිර පළාත නියෝජනය කරන විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් උතුරු, නැඟෙනහිර පළාත්වල තිබෙන ප්‍රශ්න ගැන කථා කළා, මතක් කළා. එය බොහොම හොඳයි. උතුරු, නැඟෙනහිර පළාත්වල තිබෙන ආර්ථික ප්‍රශ්න, දේශපාලන ප්‍රශ්න ගැන අපි කථා කළ යුතුයි. අපේ සම්පත් - resources - කොළඹ කේන්ද්‍රීයව, ප්‍රධාන නගර කේන්ද්‍රීයව විතරක් බෙදා හැරෙන ප්‍රශ්නයක් රටේ තිබුණා. නමුත්, අපි මුලින්ම යන්නේ ග්‍රාමීය සංවර්ධනයේ දිශාවට; ග්‍රාමීය දුගී බව නැති කිරීමේ දිශාවට. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර පළාත් ඇතුළු ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල සිටින ජනතාවගේ ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා විශාල පියවරක් රජය ඉදිරියේදී තබන්න බලාපොරොත්තු වෙනවා. එතකොට උතුරු, නැඟෙනහිර විතරක් නොවෙයි, රටේ සෑම පළාතකම ඉන්න දුප්පත් ජනතාවගේ ප්‍රශ්නවලට අපි අත තබනවා, ඒවා විසඳනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටට නව ව්‍යවස්ථාවක් ගෙන එන්න ඕනෑය කියන කාරණය අපේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ ඉදිරිපත් කරලා තිබෙනවා. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් සහ මැලේ කියන සියලු ජනතාවට රටේ කොතැනක හිටියත්, ජාතිය කුමක් වුවත්, මොන ආගම ඇදහුවත් සමානාත්මතාවක් සහ ගරුත්වයක් ඇතිව නිසියාකාරයෙන් රාජ්‍යයට සම්බන්ධ වෙමින්, රාජ්‍යයෙන් බැහැර නොවෙමින් ක්‍රියාත්මක කරන්න පුළුවන් ආකාරයේ ව්‍යවස්ථාවක් අපි හදනවා. ඒ සඳහා අවශ්‍ය දේශපාලන විසඳුම් අපි ඉදිරියේදී ඉදිරිපත් කරනවා.

මා අවසාන වශයෙන් කියන්නේ, අපි ජනතාව සමඟයි ඉන්නේ, ජනතාව සමඟයි ඉදිරියට යන්නේ, ඒ ගැන විපක්ෂයේ

[ගරු ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය]

ඉන්න, රට බංකොලොත් කරපු ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ මන්ත්‍රීවරුන් අපට මතක් කර දෙන්න අවශ්‍ය නැහැ කියලායි. අපි ඉස්සරහට යනවා, මේ රට හදනවා. නැවත මේ රට කඩා වට්ටන්න අපි කිසි කෙනෙකුට ඉඩ දෙන්නේ නැහැ.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.21]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතිවාදයටත්, බෙදුම්වාදයටත් විරුද්ධ පුද්ගලයෙකු විධියට මේ රජය ජාතිවාදයට විරුද්ධව ගෙන යන වැඩ පිළිවෙළට, ප්‍රතිපත්තියට මා ගරු කරනවා. හැබැයි, ඉතින් ඒක හැම දාම මෙතැන ඇවිල්ලා කියව කියවා ඉන්නේ නැතුව ක්‍රියාවට නහන්න කියලා මම ආණ්ඩුවට කියනවා. මොකද, ආණ්ඩුව ඔබතුමන්ලාගේ, පොලීසිය ඔබතුමන්ලාගේ, බලය තිබෙන්නේ ඔබතුමන්ලාගේ අතේ, එහෙම නම් හරියට නීතිය ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉදිරිපත් කරලා තිබෙන වියදම් වාර්තාව අනුව රුපියල් බිලියන 1,402ක් වියදම් හැටියට දක්වා තිබෙනවා. එය රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාගේ ආණ්ඩුව ජනවාරි මාසයේ ඉඳලා අප්‍රේල් මාසය දක්වා වියදම් කරපු ගණන හා සමානයි. අපි දැක්කා පසුගිය කාලයේ මේ උදව්ය කියනවා, මේ රටේ වංචාව, දූෂණය, නාස්තිය සහ හොරකම නතර කළාම වියදම විශාල ප්‍රමාණයකින් අඩු වනවා කියලා. නමුත්, ඇස්තමේන්තු කර තිබෙන වියදම බැලුවාම හොරා කාපු මුදල් කෝ? වංචා කරපු මුදල් කෝ? නාස්තිකාර වියදම් ටික කප්පාදු කළා නම්, ඒ මුදල් ටික යොමු කළේ කොහේටද කියන එක ඒ ඇස්තමේන්තුවේ දක්වා නැහැ.

වත්මන් ජනාධිපති ගරු අනුර කුමාර දිසානායක මහතා 2022 වර්ෂයේ එක්තරා අවස්ථාවකදී කිව්වා, දැන් ණය ගන්න නායකයෙක් හොයනවා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ළඟ එම වීඩියෝ එක තිබෙනවා. ණය ගන්න නායකයෙක් නොවෙයි, ඕනෑ කරන්නේ. ණය අරගෙන මේ රට හරි පාරට ගෙන යන්න බැහැ කියපු එතුමාගේ ආණ්ඩුව දැන් මේ පළමු මාස 4ට රුපියල් බිලියන 4,000ක් ණය ගන්න යෝජනා කර තිබෙනවා. සමස්ත වියදම වාගේ තුන් ගුණයක් ණය ගැනීම සඳහා යෝජනා කරලා තිබෙනවා. එතකොට මේ රටේ ජනතාවගේ විශ්වාසය තමයි, ණය ගැනීමෙන්, ණය ගැනීමෙන්, ණය ගැනීමෙන් තමයි මේ රට බංකොලොත්භාවයට පත් වුණේ කියන එක. එහෙම නම් තවදුරටත් මේ ආණ්ඩුව යන්න උත්සාහ කරන්නේ එම පාරේමද කියලා අපට අහන්න සිද්ධ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කලින් කථා කරපු ගරු මන්ත්‍රීතුමිය කිව්වා, ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා හෝ IMF එක සමඟ ගිවිසුමකට එළඹීම සඳහා හෝ රනිල් වික්‍රමසිංහගේ ආණ්ඩුවට කිසිම ජන වරමක් තිබුණේ නැහැ කියලා.

ඔව්, ඇත්ත. අපි ඒකට විරුද්ධ වුණා. ඒකට අනුර කුමාර දිසානායක මැතිතුමායි, ජාතික ජන බලවේගයයි විතරක් නොවෙයි, අපිත් විරුද්ධ වුණා. ඒ ආණ්ඩුව ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව එකඟතාවන්ට ඇවිල්ලා තිබෙන්නේ. තවම අත්සන් කරලා නැහැ. ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියලා කලින් කියපු විධියට මේ ගිවිසුමට විරුද්ධ නම් ඒක අත්සන් කරන්න එපා. මේ ජන වරම දීලා තිබෙන්නේ කලින් ආණ්ඩුව කරපු ඒ ක්‍රියාදාමයට විරුද්ධවයි. ඒ නිසා මේ ජන වරම හරියාකාරව පාවිච්චි කරමින්, ඒ එකඟතාවලට යන්න එපා කියලා අපි කියන්න කැමැතියි. රටට ගැළපෙන හොඳ ප්‍රතිපත්තියක් ගේන්න, ඒකට අපිත් සහයෝගය දෙනවා. මොකද, අපිත් ඒ ආණ්ඩුවේ ප්‍රතිපත්තිවලට විරුද්ධව කටයුතු කරලා තිබෙනවා. හේතුව, කලින් විපක්ෂයේම හිටපු පක්ෂ දෙකක් සටන් කරලා තමයි දැන් ආණ්ඩුවයි, ප්‍රධාන විපක්ෂයයි බවට පත් වෙලා තිබෙන්නේ. පසුගිය ආණ්ඩුවේ හිටපු තුන්දෙනෙක් ද, හතරදෙනෙක් ද කොහේද මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. ඒ ටික ඒ අයට කියන්න.

ඒ එක්කම අපි රජයෙන් මේ කාරණයත් අහන්න කැමැතියි. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම් කියලා එකක් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉල්ලුවේ නැහැ. ඒක ඉල්ලුවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ණය හිමියන්. එතකොට IMF එක ඉල්ලන්නේ නැතිව තමයි පසුගිය ආණ්ඩුව දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරලා තිබෙන්නේ. ඒ වෙලාවේදී විශාල විරෝධතාවක් ආවා, ETF සහ EPFවල තිබෙන මුදල් හරහා කරලා තිබෙන ආයෝජන ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව. ඒ නිසා කම්කරුවන්ගේ ඡන්දයෙන් බලයට පත් වෙච්ච ආණ්ඩුවක් විධියට, විශේෂයෙන්ම මේ රටේ වැඩ කරන ජනතාවගේ ඡන්දයෙන් බලයට පත් වෙච්ච ආණ්ඩුවක් විධියට ඔබතුමන්ලාගෙන් අපි අහන්න කැමැතියි, ඔබව බලයට පත් කරපු ඒ සාමාජිකයන්ගේ ETF සහ EPF අරමුදල්වලට සාධාරණයක් ඉෂ්ට කරන්න මේ තුනෙන් දෙකේ ජන වරම පාවිච්චි කරනවා ද, නැද්ද කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් අපේ ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා අහපු ප්‍රශ්නයකට ලාල් කාන්ත ඇමතිතුමා උත්තර දුන්නේ නැහැ. දැන් ජනාධිපතිවරයාගේ ජ්‍යෙෂ්ඨ උපදේශකයෙක් වෙච්ච දුම්න්ද හුලංගමුව මහත්මයා ප්‍රකාශ කරලා තිබෙනවා, රජයේ සේවකයන් ලක්ෂ පහමාරක් රාජ්‍ය සේවයෙන් අයින් කරන්න ඕනෑය කියලා. එතකොට තැපෑලෙන් නේ ඔබතුමන්ලාට විශාල ඡන්ද ප්‍රමාණයක් හම්බ වුණේ. තැපෑලෙන් පත් කරපු ජනාධිපතිතුමාගේ උපදේශකයෙකු තැපෑලෙන් ඡන්දය දුන් අය ගැන මෙහෙම කියනවා. ඒක රජය පිළිගන්නවා ද, ඒක අසත්‍යයක් ද, එහෙම කරන්නේ නැද්ද කියන එක ගැන මේ රටේ ජනතාවට දැනගැනීමේ අයිතියක් තිබෙනවා.

ඒ වාගේම මම තවත් කරුණක් මතක් කරන්න කැමැතියි. 2024.08.20වැනි දා ගල්ගමුවේදී අනුර කුමාර දිසානායක මැතිතුමා කිව්වා, තෙල්වලට ගහන රුපියල් 50ක බද්දක් තිබෙනවා; ඒ බද්ද අයින් කරනවා කියලා. අපි අහන්න කැමැතියි, ඒක අයින් කරන්නේ කවදාද කියලා. ඒ වාගේම 2024.08.31වැනි දා පැවති රැස්වීමකදීත් එතුමා කිව්වා, මාසික විදුලි බිල රුපියල් 9,000ක් තිබෙනවා නම්, ඒක රුපියල් 6,000ට අඩු කරනවා; රුපියල් 3,000ක් තිබෙන මාසික විදුලි බිල රුපියල් 2,000ට අඩු කරනවා කියලා. දැන් අපි මේ කාරණයත් අහන්න ඕනෑ. ශ්‍රී ලංකා විදුලිබල පනත අනුව ලංකා විදුලිබල මණ්ඩලය කියන්නේ නිෂ්පාදන පිරිවැය කළමනාකරණය කළ යුතු ආයතනයක් විනා, ලාභ ලැබිය යුතු ආයතනයක් නොවෙයි. දැනට විදුලිබල මණ්ඩලය රුපියල් බිලියන 65කට -මිලියන 65,000කට- වැඩිය ලාභ ලබනවා. ඒ නිසා ඇත්තම කථාව නම්, විදුලි බිල අඩු කිරීමට PUCSL එකට මේ යෝජනා යවනකම් ඉන්න ඕනෑ නැහැ කියන එකයි. ඒකක බින්දුවේ සිට 30 දක්වා සමස්ත පරිභෝජනයේ

ප්‍රමාණය හොයාගෙන, ඒක රුපියල් මිලියන 65,000න් බෙදලා ඒ සහනය සමාජයේ ඉන්න පහළම ජනතාවට ලබා දෙන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. මොකද, සියයට 30කින් විදුලි බිල අඩු කරන්න තව අවුරුදු දෙකක්, තුනක් යයි කියලා දැනුයි කියන්නේ. හැබැයි එතුමා මීට කලින් වීඩියේ පට 5ක විතර කියලා තිබෙනවා, විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කියලා. ඒ වාගේම 2024.08.28වැනි දා එතුමා ත්‍රිකුණාමලයේ තිබෙන තෙල් ටැංකි සම්බන්ධයෙනුත් කිව්වා. "එතැන තෙල් ටැංකි 99ක් තිබෙනවා; එක තෙල් ටැංකියක මෙට්‍රික්ටොන් 10,000ක් විතර තැන්පත් කරන්න පුළුවන්; මේක අපට පීනන්නත් ඇති" කියලා එදා එතුමා කිව්වා. ඒ නිසා වරාය කේන්ද්‍ර කරගෙන තෙල් අපනයන කලාපයක් බවට ඒ කලාපය පත් කරන්න කියලා එදා එතුමා යෝජනා කළා. අපි දැනගන්න කැමැතියි, ඒ වැඩසටහන් කවදාද පටන් ගන්නේ; කොයි කාලයේද පටන් ගන්නේ කියලා. ඒක තෙල් සංස්ථාවට තනියම කරන්න බැහැ, ඒ නිසා විදේශ ආයෝජන ගේනවා කියලාත් කිව්වා. ඒක රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයෙනුයි කරන්නේ කිව්වා. ඒක කවදාද කරන්නේ කියන එකත් අපි අහන්න කැමැතියි.

ඒ වාගේම 2024.10.24වැනි දා ගරු අනුර දිසානායක මැතිතුමා ජනාධිපති වුණාට පස්සේ එක රැස්වීමකදී කියනවා, මහා පරිමාණ සහල් මෝල් හිමියන් එක්ක සුහදව කටයුතු කරන්න කැමැතියි, නැත්නම් නීතිය අනුව කටයුතු කරනවා කියලා. දැන් සහල් මෙට්‍රික්ටොන් 70,000ක් ගේන්න ටෙන්ඩර් දාලා තිබෙනවා. මම ඊයේ දැක්කා ප්‍රවෘත්තියක් තිබෙනවා, කිලෝග්‍රෑම් ලක්ෂ දෙක ගානේ දවසකට හාල් release කරන්න ඒ අය කැමැති වුණා කියලා. හාල් කිලෝග්‍රෑම් ලක්ෂ 2ක් කියන්නේ, රටේ සිටින මිනිසුන් ලක්ෂ 220න් බෙදුවාම, එක පුරවැසියෙකුට දවසකට හාල් ග්‍රෑම් 90යි හම්බ වෙන්නේ. මේ ජනාධිපතිතුමාම මේ පාර්ලිමේන්තුවේදීම ඒ කාලයේ ඇහුවා, හාල් මෙට්‍රික්ටොන් 6,500ක් කියන්නේ දවස් 3ක පරිභෝජනය, මෙට්‍රික්ටොන් 20,000ක් ගේනවා නම් මුදලාලි කෙනෙකුට කරන්න පුළුවන් වැඩේ කරන්න ආණ්ඩුවක් මොකටද කියලා. ඒ නිසා මම කියනවා, මේවා ක්‍රියාත්මක කරන්නේ කවදාද, ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලා මේ සභාවට දැනුම් දෙන්න කියලා.

ඒ වාගේම, ඔබතුමන්ලා මැතිවරණ කාලයේ පොරොන්දුවක් දුන්නා, උපයන විට ගෙවීමේ බද්ද අඩු කරනවාය කියලා. පසුගිය ආණ්ඩුව උපයන විට ගෙවීමේ බද්ද ඉහළ දැම්මේ; සියයට 36 දක්වා වැඩි කළේ රුපියල් බිලියන 100ක් අපේක්ෂාවෙන්. අපි දන්නා තරමට රුපියල් බිලියන 140කට වැඩි ප්‍රමාණයක් ගිය අවුරුද්දේ ඒකෙන් එකතු කළා. අපිට ආරංචි විධියට මේ අවුරුද්දේ පුරෝකථනය කරලා තිබෙනවා, පළමුවැනි කාර්තු තුනත් එක්ක බලද්දි රුපියල් බිලියන 200ක් හොයනවා කියලා. එතකොට පෞද්ගලික අංශයේ වැඩ කරන තරුණ විධායකය දෙවතාවකට බදු ගෙවන්න ඕනෑ. එකක් උපයන විට ගෙවීමේ බද්ද. අනෙක් එක තමන් මිලදී ගන්න බඩු මිලට අය කරන සියයට 18 VAT එක. එතකොට රුපියල් බිලියන 100ක පමණ අතිරේක මුදලක් එනවා නම් ඒකෙන් මේ තරුණ විධායක නිලධාරීන්ට සහනයක් ලබා දීම සඳහා ආණ්ඩුව කටයුතු කරනවාද කියන එක අපි අහන්න කැමැතියි.

ඒ වාගේම, ආණ්ඩුව මැතිවරණ සමයේදී මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා, ආහාරවලින්, අධ්‍යාපනයෙන්, සෞඛ්‍යයෙන් බදු අයින් කරනවා කියලා. එමෙන්ම, පළමුවැනි අය වැයෙන්ම ආහාර පාන සඳහා පනවා තිබෙන බදු අයින් කරනවාය කිව්වා.

ඔබතුමන්ලා බලයට පත් වුණේ පසුගිය සැප්තැම්බර් මාසයේ. ලබන අවුරුද්දේ අප්‍රේල් මාසය ඉවර වෙනකොට මාස 6කට වැඩියෙන් ගත වෙලා. ඒ කියන්නේ අවුරුදු 5න්, අවුරුදු භාගයක් ඉවරයි; ඒ කියන්නේ, සියයට 10ක් විතර කාලය ගත වෙලා ඉවරයි. එතකොට ඒ කාලය සඳහා එම ප්‍රතිලාභය ලබා දෙනවාද, නැද්ද කියන එකත් අපි දැනගන්න කැමැතියි.

ඒ එක්කම මේ දවස්වල රජය පැත්තෙන් කියන තව දෙයක් තිබෙනවා. ඍජු විදේශ ආයෝජනවලින් ඩොලර් ආදායම වැඩි කර ගැනීම සඳහා වූ වැඩ පිළිවෙළක් තිබෙනවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. නමුත් එහෙම ගිවිසුම්ගත වෙන එකක් හරි ඒ සඳහා වූ project proposal එකක් අනුමත වෙච්ච එකක් හරි, එහෙම නැත්නම් ජාත්‍යන්තර සංවිධානවලින් ලබා දෙන ප්‍රදාන හෝ ලබා දෙන වැඩසටහනක් ගැන ප්‍රවෘත්තියක් අපි දැක්කේ නැහැ. හැබැයි, ඒ වෙනුවට ලෝක බැංකුවේ, ආසියානු සංවර්ධන බැංකුවේ ණය ලබා දීමේ වැඩසටහන් තමයි ක්‍රියාත්මක වෙන්නේ. ඒ තුළ රජය කියනවා, "ඉදිරි අවුරුදු තුනක කාලය තුළ සංචාරක කර්මාන්තය දියුණු කිරීම තමයි ඔවුන්ගේ ප්‍රධාන ඉලක්කය, ඒ තුළින් සංචාරකයෝ මිලියන 4ක් ගෙනැල්ලා ඩොලර් බිලියන 8ක ආදායමක් ගේනවා" කියලා. මේක සාමාන්‍යයෙන් මැතිවරණ වේදිකාවේ කියනවා වාගේ සුන්දරව කියන්න පුළුවන්. ඒ සඳහා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද, ඒ සඳහා අරගෙන තිබෙන කඩිනම් පියවර මොනවාද, wildlife tourismවලින් එන ඒවා මොනවාද, high-end touristsලා ගේන්න තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද, සංචාරක ක්ෂේත්‍රයේ තිබෙන අනෙකුත් අලුත් ක්ෂේත්‍ර සඳහා මංපෙත් විවෘත කරලා, ආදායම් මාර්ග වැඩි කර ගැනීම සඳහා තිබෙන වැඩ පිළිවෙළ කුමක්ද කියන එක අදාළ ඇමතිතුමාගෙන් පැහැදිලිව අපි දැනගන්න කැමැතියි.

මේ කාරණයත් මම කියන්න ඕනෑ. දැන් අපට බැණලා වැඩක් නැහැ. අපට බැන්නා; අපට චෝදනා කළා; අපට ඇඟිල්ල දිගු කළා. ඒ නිසා තමයි මේ රටේ ජනතාව අනුර කුමාර දිසානායක මැතිතුමාව ජනාධිපති කළේ, මේ රටේ ජනතාව ඔබතුමන්ලාට තුනෙන් දෙකක ජන වරමක් දීලා තිබෙන්නේ. ලෙලි යන්න දීලා තිබෙන්නේ, අපට. ඒ නිසා දැන් අපට බැණලා වැඩක් නැහැ. දැන් මැතිවරණ වේදිකාවේ කියපු ටික ඉවරයි. දැන් මෙතැනට ඇවිල්ලා කරන වැඩ පිළිවෙළ කියන්න. ඔබතුමන්ලා කරන වැඩ පිළිවෙළ කිව්වාම, ඒකට ධනාත්මක යෝජනා තිබෙනවා නම් ඉදිරිපත් කරන්න අපට පුළුවන්. එක මන්ත්‍රීවරයෙක් කිව්වා, "මල් වට්ටියට අත ගහන්න" කියලා. මල් වට්ටියට අත ගැහුවත්, නොගැහුවත් මේ සභාවේ ඉන්න මහජන නියෝජිතයන් හැටියට අපි සියලුදෙනාගේ වගකීම රට විනාශ කරලා, ආණ්ඩුව විනාශ කරන එක නොවෙයි. අපේ වගකීම, ආණ්ඩුව යම් වැරැද්දක් කරනවා නම් ඒක පෙන්වලා දෙන එක; ආණ්ඩුව වැරදි පාරේ යනවා නම් ඒකට විරුද්ධව පෙනී සිටීම අපේ අයිතියක්; ඒක අපේ කාර්යභාරයක්. ඒ වාගේම, ආණ්ඩුව හරි දේ කරනවා නම් ඒකට සහයෝගය දීමත් අපේ අයිතියක්. එහෙම නැතුව ඔබතුමන්ලා, ඔබතුමියලා ආණ්ඩුවේ මන්ත්‍රීවරු හැටියට ආණ්ඩුව කරන කියන හැම දෙයකටම හොඳයි කිව්වාට අපිට එහෙම කියන්න බැහැ. දැන් ඔබතුමන්ලා අපට බැණ-බැණ ඉන්නේ නැතුව හරි දේ ක්‍රියාත්මක කරන්න, හරි දේ ඉදිරිපත් කරන්න. ඒ සඳහා සංශෝධන, යෝජනා අපෙනුත් ගන්න කැමති නම් ඒවාත් ගන්න. ඒ වාගේම, මේ පාර්ලිමේන්තුව කියන්නේ මේ සභාව විතරක් නොවෙයි. මේ සභාවට පහළ මාලයේ කමිටු ගණනාවක් රැස් වෙනවා. ඒ කමිටුවලදී යෝජනා ඉදිරිපත් කරන්න තිබෙනවා. එම නිසා ඒ යෝජනා ඉදිරිපත් කරලා, ඒ යෝජනා හරහා දායකත්වය ලබා දෙන්නත් අපි කැමැතියි. ඒ වාගේම අපි කියන්න ඕනෑ, ආංශික අධීක්ෂණ කාරක සභා 17, 9ට අඩු කරනවාටත් අපේ විරුද්ධත්වයක් නැති බව. ඒක කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ලැබී ඇති කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, මේ ආංශික අධීක්ෂණ කාරක සභා තමයි, ඇමතිවරයා නැතුව අමාත්‍යාංශයේ ක්‍රියාවලිය, අමාත්‍යාංශය කරන දේවල්, අමාත්‍යාංශයේ සිදු වෙන ගනුදෙනු සියල්ල monitor කරන්න පුළුවන් තැන. වංචාව, දූෂණය, හොරකම, නාස්තිය කරලා තිබෙනවා නම්, ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා විනිවිදභාවයකින් කටයුතු කරනවා නම් විපක්ෂයට ඒ අවස්ථාව වැඩිපුර ලබා දීලා මේ රටේ ආණ්ඩු ක්‍රමය තුළ; ආණ්ඩු කිරීම තුළ, ආණ්ඩු කෙරුවාව තුළ checks and balances පවත්වාගෙන යෑමේ ආදර්ශය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාවේ අවසරය සහිතව ගරු කථානායකතුමාගේ නිවේදනයක් සිදු කිරීමට තිබෙනවා.

ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය පිටුදැකීමේ ක්‍රියාකාරී දින 16 සනිටුහන් කිරීමේ ගෝලීය ව්‍යාපාරය සංකේතවත් කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් 2024 දෙසැම්බර් මස 06වැනි දින, එනම් හෙට දින "ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වූ හිංසනයන් අවසන් කරමු" යන පණිවිඩය රැගත් අත් පලඳනාවක් පැලඳීමට කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව හෙට දින පාර්ලිමේන්තුවේ සියලු මන්ත්‍රීවරයන්ට එම අත් පලඳනාව මන්ත්‍රී පිවිසුමේදී ලබා දීමට කටයුතු කරනු ලබන බව මෙම ගරු සභාවට දන්වනු කැමැත්තෙමි.

මීළඟට, ගරු එම්.අයි.එම්. අර්කම් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.34]

ගරු අර්කම් ඉල්යාස් මහතා
(மாண்புமிகு அர்கம் இல்யாஸ்)
(The Hon. Arkam Ilyas)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින්ම ස්තුතිවන්ත වෙනවා, පාර්ලිමේන්තුවේ මගේ මංගල කථාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. ඒ වාගේම මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, මේ විප්ලවීය වෙනසට, මේ විප්ලවීය ජයග්‍රහණයට අපගේ ජාතික ජන බලවේගය වෙනුවෙන් තමන්ගේ වටිනා ඡන්දය ප්‍රකාශ කළ සියලුම ශ්‍රී ලාංකික වැසියන්ට ස්තුතිය පළ කරන්න. මා නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ ජනතාවටත් අනිවාර්යයෙන්ම මම ස්තුති කරන්න ඕනෑ. මාතර දිස්ත්‍රික්කයේ අපට හිමි මන්ත්‍රී ආසන 7න්, 6ක්ම ජාතික ජන බලවේගයට ලබා දුන්නා. අපි ගැන විශ්වාසය තබා අප වෙනුවෙන්, අපේ රට වෙනුවෙන්, ජාතික ජන බලවේගයේ ජයග්‍රහණය වෙනුවෙන් තමන්ගේ වටිනා ඡන්දය ප්‍රකාශ කිරීම ගැන ඔවුන්ට අපි ස්තුතිවන්ත වෙනවා.

මෙවර මැතිවරණය ගොඩක් වෙනස් එකක් වුණා. අපට සුවිශේෂී ප්‍රතිඵල ගොඩක් ලබා ගන්න පුළුවන් වුණා. උතුර, නැඟෙනහිර වාගේම කඳුකරය විශේෂ පණිවුඩයක් අරගෙන ආවා. අපි ජාති මත පදනම් වූ, එහෙම නැත්නම් තමන්ගේ වර්ගයා මත පදනම් වූ පක්ෂවලින් මිදිලා ප්‍රධාන ප්‍රවාහයේ පක්ෂ එක්ක එකතු වෙලා කටයුතු කළා. අපේ රටේ උතුර, නැඟෙනහිර සහ කඳුකර ප්‍රදේශවල ජනතාවත් දැන් වෙනස් වෙලා. අපට තිබෙන්නේ, එකම ප්‍රශ්න. අපට තිබෙන්නේ, ආර්ථික ප්‍රශ්න, සමාජයීය ප්‍රශ්න, සෞඛ්‍ය ප්‍රශ්න, අධ්‍යාපනයේ ප්‍රශ්න, මූලික අවශ්‍යතාවල ප්‍රශ්න කියන එක හඳුනාගෙන ඒ ජනතාවත් අපිත් එක්ක එකතු වෙනකොට මාතර වශයෙන්, දක්ෂිණ ලංකාව වශයෙන් අපිත් වෙනස්ම පණිවුඩයක් මේ ලංකාවට, මේ ලෝකයට අරගෙන ආවා. ඒ නිසා තමයි මුස්ලිම් මටත් ඒ වාගේම දමිළ නියෝජනයකටත් ඉතිහාසයේ ප්‍රථම වතාවට මාතර දිස්ත්‍රික්කයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරගන්න පුළුවන් වුණේ. අපිත් වෙනස් වෙලා ඉන්නවා. සිංහල සමාජයත් එහෙමයි; මුස්ලිම් සමාජයත් එහෙමයි; දෙමළ සමාජයත් එහෙමයි. අපි හැමෝම දැන් එක මවකගේ දරුවන් වාගේ එකතු වෙලා අපේ රට භදන්න පුළුවන් කියන පණිවුඩය අරගෙන ඇවිත් තිබෙනවා.

ඇත්තටම ඉස්සර පොත් පත්වලින්, එහෙම නැත්නම් වාද විවාදවලින් තමයි අපි දැක්කේ, සහයෝගීතාව, ජාතික ඒකාබද්ධතාව කියන වචන. එහෙත් ජාතික ජන බලවේගය ජනාධිපතිවරණයේදී ලබා ගත් ජයග්‍රහණයත්, ඒ වාගේම පාර්ලිමේන්තු මැතිවරණයේදී ලබා ගත් ජයග්‍රහණයත් එක්කම ඒක මහ පොළොවේ යථාර්ථයක් බවට පත් වෙලා තිබෙනවා. ලංකාවේ මිනිස්සු හැමෝම දැන් එකට එකතු වෙලා ඉන්නවා. මම හිතන විධියට රටේ ජයග්‍රහණයට, රටේ ආර්ථික දියුණුවට බලපාන ප්‍රධානතම සාධකය තමයි, ඒ රට තුළ අභ්‍යන්තර ප්‍රශ්න නොතිබීම. ඒක රටකට වුණත් එහෙමයි, ආයතනයකට වුණත් එහෙමයි, පවුලකට වුණත් එහෙමයි. පවුලක හරි, ආයතනයක හරි, රටක හරි අභ්‍යන්තර ප්‍රශ්න තිබුණොත්, ඒ පවුල, ඒ ආයතනය, ඒ රට කවදාවත් දියුණු වෙන්නේ නැහැ. අන්න ඒ බාධකය අපි මේ මැතිවරණ ජයග්‍රහණයත් එක්ක නැති කර ගත්තා. ලංකාව එක මනුස්ස කොට්ඨාසයක් ලෙස දැන් එකතු වෙලා ඉන්නවා. මම හිතන විධියට තව අවුරුදු දහයක්, පහළොවක් යනකොට අපේ රට දියුණු වෙන එක කාටවත් නවත්වන්න බැහැ. මොකද, අපි දැන් එකතු වෙලා වැඩ කරන හින්දා. මම හිතනවා, ඒක පළමුවෙන්ම කථා කරන්න ඕනෑ මාතෘකාවක් කියලා.

අද දවසේ මාතෘකාව ගැන කථා කළොත්, අපි හිතනවා අපේ රට දියුණු වෙන අඩිතාලම අප දැන් දාලා ඉවරයි කියලා. අපේ ආර්ථිකය දැන් ප්‍රසාරණය වෙන්න පටන්ගෙන තිබෙනවා. අපට ගොඩක් වැඩ කටයුතු කරගන්න තිබෙනවා. අපට ආර්ථිකය ප්‍රසාරණය කරගන්න පුළුවන් විභවයන් ගොඩක් තිබෙනවා. උදාහරණයක් විධියට සංචාරක ක්ෂේත්‍රය ගන්න පුළුවන්. සංචාරක ක්ෂේත්‍රය කියන්නේ, අපට ගොඩක් විදේශ විනිමය හොයා ගන්න පුළුවන් ක්ෂේත්‍රයක්. එහෙත්, ඇත්තටම අපට ඒක තවම හරි මාර්ගයකට ගන්න බැරි වෙලා තිබෙනවා.

අපේ අසල්වැසි රටක් වන මාලදිවයින දිහා බැලුවොත්, ඒ ගොල්ලන්ට තිබෙන්නේ මුහුදු සම්පත විතරයි. ඒ ගොල්ලන් තමන්ගේ ආර්ථිකයේ ප්‍රධානම කොටස මුහුදු සම්පත භාවිත කරමින් සංචාරක ක්ෂේත්‍රයෙන් උපයා ගන්නවා. අපේ ලංකාව වටේම මහ මුහුදක් තිබෙනවා. සියලු දේශගුණික තත්ත්වයන්ට අදාළ සංචාරක කලාප - ස්ථාන - තිබෙනවා. තෙත් කලාපීය වනාන්තර, වියළි කලාපීය වනාන්තර, අතරමැදි කලාපීය වනාන්තර ආදී වශයෙන් විශාල පෙව විවිධත්වයකින් යුත් ප්‍රදේශ අපේ රටේ තිබෙනවා. සංචාරක ආකර්ෂණය ලැබෙන මැණික් වැනි වටිනා ඛනිජ සම්පත් තිබෙන ස්ථාන තිබෙනවා. ඒ වාගේම විශාල විවිධත්වයකින් යුත් විශාල පරාසයක සංස්කෘතික ලක්ෂණ සහිත ස්ථානත් තිබෙනවා. අපේ රට ඩොලර් උපද්දවන්න පුළුවන් -විදේශ විනිමය උපද්දවන්න පුළුවන්- ආකරයකයි පිහිටා තිබෙන්නේ. නමුත් අපි තවම ඒක හරි හැටි ප්‍රයෝජනයට අරගෙන නැහැ.

දක්ෂිණ ලංකාවේ වෙරළ තීරය ආසන්නයේ පදිංචි පුද්ගලයෙකු හැටියට මම දන්නවා, දක්ෂිණ ලංකාවත් අපට ඒ විධියටම දියුණු කර ගන්න පුළුවන් තැනක් බව. අතීතයේ බෙන්තොට, හික්කඩුව, ගාල්ල, උණවටුන, මිරිස්ස, තංගල්ල වැනි ප්‍රදේශවලට පමණක් සංචාරක ආකර්ෂණයක් ඇති වෙලා තිබුණා. නමුත් මේ වනවිට දක්ෂිණ වෙරළ තීරයම විශාල සංචාරක ආකර්ෂණයක් සහිත ප්‍රදේශයක් වෙලා තිබෙනවා. ඒ වාගේම දීර්ඝ නිවාඩු ගත කිරීම සඳහා උචිත ගමනාන්ත අතරින් වැදගත්ම රටක් ලෙස අපේ රට දැන් ගොඩාක් ඉහළට ඇවිල්ලා තිබෙනවා. නමුත් සංචාරක ප්‍රදේශයක ජීවත්වන පුද්ගලයෙකු ලෙස මම දන්නවා, එම ගොඩක් සංචාරක ප්‍රදේශ ඉතා ශෝචනීය තත්ත්වයකයි තිබෙන්නේ කියලා. අඩුම තරමින් විදේශීය සංචාරකයන්ට යන්න හොඳ වැසිකිළි, කැසිකිළි පද්ධතියක්වත් නැති ප්‍රදේශ බවට ඒ ප්‍රදේශ පත් වෙලා තිබෙනවා. ඉදිකිරීම් විශාල වශයෙන් අක්‍රමවත්. ළඟදී ඇති වෙච්ච ඉතා ඉහළ වැසි තත්ත්වය නිසා සතියක්, දෙකක් සමහර පාරවල් වහලා තියන්න වුණා. අපේ drainage systems හරියට වැඩ කරන්නේ නැහැ. සංචාරක ව්‍යාපාරයේ කටයුතු හරියට කරගෙන යන්න බැහැ. විදේශිකයෝ ඒ ප්‍රදේශවලින් ඉවත් වෙලා යන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. අපි ජාතික ජන බලවේගය වශයෙන් අනිවාර්යයෙන් ඒ තත්ත්වය වෙනස් කරනවා. හොඳ සැලැස්මක් සහිතව විධිමත් යටිතල පහසුකම්වලින් යුක්ත කලාප බවට ඒ කලාප පත් කරනවා. ඒ සඳහා දැනටමත් අපි සැලසුම් සකස් කරලා ඉවරයි.

තනි පුද්ගල අවශ්‍යතා මත වෙනුවට national policy එකක් ඔස්සේ ක්‍රමවත්ව, පිළිවෙළකට එම ප්‍රදේශ සංචාරක කලාප බවට පත් කරනවා. විධිමත් නගර සැලසුම් තුළින් ඕනෑම කෙනෙකුට ප්‍රිය මනාප කලාපයක් බවට ඒ කලාප පත් කරන්න ඕනෑ. එතකොට අපට හොඳ සංචාරකයන් අනිවාර්යයෙන්ම ඒ ප්‍රදේශවලට ගෙන්වා ගන්න පුළුවන්. විශේෂයෙන්ම ක්‍රියාකාරකම් ආශ්‍රිත සංචාරක කලාප ඇති කිරීම තමයි අපේ මූලික අරමුණ. තල්මසුන් නැරඹීමේ ව්‍යාපාරය ගත්තොත්, ඉස්සර දවසකට දහක විතර සංචාරකයන් ප්‍රමාණයක් මිරිස්ස ප්‍රදේශයට ආවා. නමුත් දැන් සිය දෙනෙකුවත් එන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒකට ප්‍රධාන හේතුව යටිතල පහසුකම්වල අඩු පාඩුකම්.

අපේ රටට එන සංචාරකයන්ට snorkelling කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම surfing කරන්න පුළුවන්. විශේෂයෙන් ආධුනිකයන්ට surfingවලට ඉතා උචිත ප්‍රදේශයක් විධියට වැලිගම, දික්වැල්ල, හිරිකැටිය වැනි ප්‍රදේශ හඳුනා ගෙන තිබෙනවා. වසරේ ඕනෑම කාලයක surfing කරන්න පුළුවන් ප්‍රදේශයක් විධියට හිරිකැටිය ප්‍රදේශය ගොඩාක් ප්‍රසිද්ධ වෙලා තිබෙනවා. විදේශිකයන් එන තැනක් බවට ඒ ස්ථානය පත් වෙලා තිබෙනවා. ක්‍රියාකාරකම් ආශ්‍රිත සංචාරක කලාප ප්‍රවර්ධනය කිරීමෙන් අපට කෙටි කාලීන වාගේම දීර්ඝ කාලීන සංචාරක ඉලක්ක අනිවාර්යයෙන්ම ඉෂ්ට කරගන්න පුළුවන් වෙයි.

අපේ ජනාධිපතිතුමාගේ, අපේ ජාතික ජන බලවේගයේ ඉලක්කය 2025 වර්ෂය වනකොට සංචාරකයන් මිලියන 4ක් අපේ රට තුළට ගෙන්වා ගැනීමයි. මම හිතනවා, ඒ ඉලක්ක අපට අනිවාර්යයෙන්ම ළඟා කර ගන්න පුළුවන් වෙයි කියලා. තරුණයෙක් වශයෙන් මම හිතනවා, මේ රට දියුණු කර ගන්න තරුණයන්ටත් ලොකු අවශ්‍යතාවක් තිබෙනවා කියලා. අපේ රටේ තරුණ-තරුණියන්ට මේ රටේ ඉන්න බැරි තත්ත්වයක් උදා කළා. මගේම යාළුවෝ, මගේම වයසේ ඉන්න බහුතරයක් අද ඉන්නේ ලංකාවේ නොවෙයි. බොහෝ දුරට වෙනත් රටවල පදිංචියට ගිහිල්ලා තිබෙනවා. ඔවුන් නැවත ලංකාවට ඒමට නොවෙයි ගිහිල්ලා තිබෙන්නේ. එයින් සිදු වුණේ බුද්ධි ගලනයක්. අපි අනිවාර්යයෙන්ම ඒ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. තරුණයන් විධියට අපි එකතු වෙන්න ඕනෑ. මොකද, තරුණ ප්‍රජාව තමයි ලංකාවේ සියයට 38ක ප්‍රමාණයක් ඉන්නේ. සියයට 38ක ප්‍රතිශතයක් කියන්නේ ඉතා විශාල අගයක්.

කථාව අවසන් කරන්න කලින් මම මේ කාරණයත් කියන්න ඕනෑ. ලුවිස් කැරොල්ගේ "ඇලිස් ඉන් වොන්ඩර්ලන්ඩ්" කෘතියේ සඳහනක් තිබෙනවා, "අපි දැන් ඉන්න තැනම ඉන්න නම් අපට හැකි තරම් වේගයෙන් දුවන්න වෙනවා. කොතැනකට හෝ යාමට නම් දෙගුණයක් වේගයෙන් දිව යා යුතුයි" කියලා. දෙගුණයක් වේගයෙන් දුවන්න දෙගුණයක් වේගයෙන් වැඩ කිරීමට උපරිම හැකියාව තිබෙන්නේ, උපරිම ජවය තිබෙන්නේ අපේ තාරුණ්‍යයට. අපේ ජවසම්පන්න තාරුණ්‍යයට මම ආරාධනා කරනවා, පක්ෂ, පාට භේද අත්හැරලා අපත් එක්ක එකතු වෙලා මේ රට හදමු කියලා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[ප.ව. 2.42]

ගරු ජීවන් තොණ්ඩමන් මහතා
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களுக்கு எனது வணக்கத்தை முதலில் தெரிவித்துக்கொள்கின்றேன். இன்றையதினம் அரசியல் நிலைப்பாடு சம்பந்தமாக எனது கருத்தைத் தெரிவிக்கலாமெனக் கருதுகின்றேன்.

நேற்று நான் இச்சபையில் நுவரெலியா மாவட்டம் உட்பட மலையகப் பிரதேசத்தில் வாழுகின்ற மக்களுடைய நிலைமை சம்பந்தமாகவும் அவர்களுடைய பிரச்சினைகளுக்கு எவ்வாறான தீர்வுகளைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்பது சம்பந்தமாகவும் எனது கருத்துகளை முன்வைத்திருந்தேன். ஒரு நல்ல எண்ணத்தோடுதான் நான் அந்தக் கருத்துகளை இங்கு முன்வைத்தேன். நாங்கள் இலங்கை தொழிலாளர் காங்கிரஸாக அந்த வீடுகளை டன்சினன் தோட்டத்திலுள்ள பாதிக்கப்பட்ட மக்களுக்குக் கொடுப்பது சம்பந்தமாக இந்திய தூதுவருடனும் எல்பிட்டிய பெருந்தோட்ட நிறுவனத்துடனும் பேசி, இரண்டு பேரிடமும் சம்மதக் கடிதத்தைப் பெற்றுவிட்டோம் என நானே இங்கு தெளிவாகச் சென்னேன். அவர்கள் அதனை அமைச்சுக்கு அனுப்பியிருக்கிறார்கள். ஆனால், இதுவரை அமைச்சிலிருந்து எந்தவிதமான பதிலும் வரவில்லை. நாங்கள் பண்ணவேண்டிய வேலையைப் பண்ணியிருக்கிறோம். உங்களுடைய தரப்பிலிருந்து அதற்கான ஒத்துழைப்பு எங்களுக்கு கட்டாயம் தேவைப்படுகின்றது. நாளை அங்கு மண்சரிவு ஏற்பட்டு அதன் காரணமாக உயிர்ச்சேதம் ஏதாவது ஏற்பட்டால் அதற்குப் பொறுப்புக் கூறுவது பிரச்சினைக்குரிய விடயமாகப் போகலாம். ஆகவே, தயவுசெய்து இதனைக் கருத்தில் எடுத்துக் கொள்ளுமாறு கேட்டுக்கொள்கின்றேன்.

மலையகம் சம்பந்தமான 3 விடயங்கள் இருக்கின்றன. நான் 5 வருடங்கள் அரசாங்கத்தில் பதவி வகித்தேன். முதலில் இராஜாங்க அமைச்சராகவும் அதன் பின்னர் ஒரு வருடம் அமைச்சரவை அந்தஸ்துள்ள அமைச்சராகவும் இயங்கினேன். எல்லோராலும் பேசப்படுகின்ற முக்கிய விடயமாக சம்பளப் பிரச்சினை இருக்கின்றது. இந்தச் சம்பளப் பிரச்சினை 2 வருடங்களுக்கு ஒரு முறை அல்லது 3 வருடங்களுக்கு ஒரு முறை வந்தாலும் எப்போதுமே நாம் தோட்டத்தில் வேலை செய்பவர்களை 1,000 ரூபாய்க்கு அல்லது 1,500 ரூபாய்க்கு அல்லது 2,000 ரூபாய்க்கு அல்லது 3,000 ரூபாய்க்கு ஏலம் விட்டுக்கொண்டிருக்கின்றோம். ஆனால், அதற்கொரு

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

நிரந்தரத் தீர்வு எடுக்கப்பட்டதாகத் தெரியவில்லை. நாட்கூலி முறைமையிலிருந்து மாறினால் மட்டும்தான் பெருந்தோட்டப் பகுதியில் இருக்கின்ற வறுமை குறையும்.

2020இல் நாம் அரசைப் பாரமெடுத்த பிற்பாடு 6 மாதத்திற்குள் 1,000 ரூபாய் அடிப்படைச் சம்பளத்தை தோட்டத் தொழிலாளர்களுக்கு வாங்கிக் கொடுத்தோம். அதேபோல், 2024இல் அவர்களுக்கு 1,350 ரூபாய் அடிப்படைச் சம்பளத்தை வாங்கிக் கொடுத்தோம். நான் ஏன் இதை முன்வைக்கின்றேன் என்றால், தற்போது ஆளுங்கட்சியில் இருக்கின்றவர்களுடைய தொழிற்சங்கப் பிரிவைச் சார்ந்த சில தலைவர்கள், நாங்கள் மக்களை ஏமாற்றிவிட்டதாகவும், 1,350 ரூபாய்தான் கொடுத்ததாகவும் சொல்லியிருந்தார்கள். அப்போது நாங்கள் அவர்களிடம் ஒரு தீர்வைக் கேட்டபோது, அவர்கள் "நாளொன்றுக்கான அடிப்படைச் சம்பளமாக 2,138 ரூபாய் வழங்கப்பட வேண்டும்" என்று சொல்லியிருந்தார்கள். இன்று அவர்கள் ஆளுங்கட்சியில் இருக்கின்றார்கள். அவர்களுக்கு மூன்றில் இரண்டு பெரும்பான்மைப் பலம் இருக்கிறது. நினைத்தால் அந்தத் தொகையைப் பெற்றுக்கொடுக்க முடியும். இன்றைக்கு நான் உங்களை விமர்சிக்க வேண்டும் என்பதற்காகவோ, உங்களைக் குறைசொல்ல வேண்டும் என்பதற்காகவோ இந்தச் சபையில் உரையாற்ற வரவில்லை. இரு தரப்பினரும் சேர்ந்து மக்களுக்கு உண்மையை எடுத்துச் சொல்ல வேண்டும் என்பதற்காகவே வந்திருக்கிறேன்.

இன்றிருக்கின்ற 20 பெருந்தோட்ட நிறுவனங்களுடனும் பேச்சுவார்த்தை நடத்தி, எவ்வளவு கஷ்டப்பட்டு சம்பளத்தை அதிகரித்துக் கொடுத்தோம் என்பது எங்களுக்குத் தெரியும். அடிப்படைச் சம்பளத்தை உயர்த்திக் கொடுப்பது என்பது ஒரு சாதாரண விஷயம் கிடையாது. பெருந்தோட்ட மக்களுக்கு 2,000 ரூபாய் சம்பளம் கொடுக்க வேண்டும்; 3,000 ரூபாய் சம்பளம் கொடுக்க வேண்டும் என்று நாங்கள் அரசாங்கத்துக்கு வெளியில் இருக்கும்போது சொல்லலாம். ஆனால், 10 ரூபாயைக் கூட்டிக் கொடுப்பதென்றால்கூட, பெரும் சிரமத்துக்கு மத்தியில்தான் கொடுக்க வேண்டியிருக்கிறது. அதற்கு முக்கிய காரணம், பெருந்தோட்ட நிறுவனங்களின் ஆதிக்கமாகும். அதனை அரசாங்கத்தின் தவறாகவோ, பிரச்சினையாகவோ பார்க்க முடியாது.

ஆரம்பத்தில் கூட்டு ஒப்பந்தம் நடைமுறையில் இருந்தது. அந்தக் கூட்டு ஒப்பந்தத்தின் அடிப்படையில் பேச்சுவார்த்தை நடத்தி ஒவ்வொரு முறையும் சம்பளத்தை அதிகரித்துக் கொடுத்தோம். 2020இல் 'கூட்டு ஒப்பந்தம் ஓர் அடிமைச் சாசனம்' என்று சிலர் அரசியல் ரீதியாகப் பேசினார்கள். அப்போது, நாங்கள் கூட்டு ஒப்பந்தத்தை abrogate பண்ணிவிட்டு, சம்பள நிர்ணய சபையூடாக எமது மக்களுக்குச் சம்பள அதிகரிப்பைப் பெற்றுக்கொடுத்தோம். இன்று சம்பள நிர்ணய சபையானது, தொழில் அமைச்சுக்குக் கீழ்த்தான் இருக்கிறது. அமைச்சர் அவர்கள் நினைத்தால் சம்பள நிர்ணய சபையைக் கூட்டி, 2,000 ரூபாய் அடிப்படைச் சம்பளத்தைத் தாராளமாக வழங்கலாம்.

ஆளுங்கட்சியிடம் தாழ்மையான ஒரு வேண்டுகோளை நான் முன்வைக்கின்றேன். இந்தச் சம்பளப் பிரச்சினைக்கு ஒரு நிரந்தரத் தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்றால், இந்த நாட்கூலி சம்பள முறைமையை ஒட்டுமொத்தமாக ஒதுக்கி வைக்கவேண்டும். பெருந்தோட்டத் துறையில் வேலை செய்யும் கிட்டத்தட்ட ஒன்றரை இலட்சம் தொழிலாளர்களின் சம்பளப் பிரச்சினைக்கு ஒரு நிரந்தரத் தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டும் என்றால், ஒரு மாற்று முறைமையைக் கொண்டுவந்தாக வேண்டும். அது outgrower modelஆக இருக்கலாம்; revenue-sharing modelஆக இருக்கலாம். அந்த வகையில், ஒரு மாற்று முறைமையை regulate பண்ணிக் கொண்டுவந்தாக வேண்டும். அப்படிக் கொண்டுவந்தால், கட்டாயம் உழைப்புக்கேற்ற ஊதியம் அவர்களுக்குக் கிடைக்கும். ஆனால், நாங்கள் இந்த நாட்கூலி முறைமை பற்றித் திரும்பத் திரும்பப் பேசுவதில் பயனில்லை. இன்றைக்கு நீங்கள் ஆளுங்கட்சியில் இருக்கின்றீர்கள். எதிர்த்தரப்பில் இருக்கின்றவர்கள் சொல்வார்கள், "தோட்டத் தொழிலாளர்களுக்கான சம்பளத்தை அதிகரித்து வழங்குங்கள்!" என்று. ஒருவேளை நாளை நாங்கள் ஆளுங்கட்சியாக வந்தால், நீங்கள் எதிர்க்கட்சியில் இருந்து சொல்வீர்கள், நாங்கள் சம்பளத்தைக் கூட்டிக்கொடுக்க வேண்டும் என்று. திரும்பத் திரும்ப 2-3 வருடங்களுக்கு ஒரு தடவை இதைப் பற்றிப் பேசுவதில் பிரயோசனம் கிடையாது.

2020இல் நான் அமைச்சராக வரும்போது, எதிர்க்கட்சியில் இருந்த ஒருவர்கூட மலையகம் சம்பந்தமாக எனக்கு உதவி செய்யவில்லை. அந்த மாதிரியான ஓர் அரசியல் கலாசாரத்தை முன்கொண்டு செல்ல வேண்டுமென நான் விரும்பவில்லை. இந்தப் பாராளுமன்றத்தில் புதிய உறுப்பினர்கள் நிறையப் பேர் இருக்கிறார்கள். இந்தப் பாராளுமன்றத்தில் எனக்கு கிட்டத்தட்ட 5 வருட அனுபவம் இருக்கிறது. நான் ஒரு பொற்காலத்தில் அமைச்சராக இருக்கவில்லை. மாறாக, கஷ்டமான ஒரு காலத்தில்தான் அமைச்சராக இருந்தேன். எனது மனசாட்சிக்கு அமைவாக உண்மையாக நான் வேலை செய்திருக்கிறேன். அதனால்தான், கடந்த அமைச்சரவையில் இருந்த அமைச்சர்களில் நான் மட்டும்தான் இம்முறை பாராளுமன்றத்துக்குத் தெரிவாகி இருக்கிறேன். அப்படி இருக்கும்போதுகூட, நான் என்னுடைய முழுமையான ஒத்துழைப்பை அரசாங்கத்துக்குக் கொடுப்பதற்குத் தாயாராக இருக்கிறேன். நீங்கள் நினைத்தால், இன்று உங்களுக்குப் பாராளுமன்றத்தில் கிடைத்திருக்கின்ற பலத்தை வைத்து மலையக மக்களுக்குக் கட்டாயம் நிரந்தரத் தீர்வை வழங்க முடியும். நான் அதனை உடனே எதிர்பார்க்கவில்லை. மக்களும் அதனை உடனே எதிர்பார்க்கவில்லை. ஏனென்றால், நீங்கள் இப்பொழுதுதான் ஆட்சிக்கு வந்திருக்கிறீர்கள் என்பது எங்களுக்குத் தெரியும். நீங்கள் ஒரு விஷயத்தைப் புரிந்து கொள்ளுங்கள்! உங்கள்மீது மக்கள் அதிகளவு நம்பிக்கை வைத்திருக்கிறார்கள். உங்களுக்கு 5 வருட காலம் இருக்கிறது. ஒரே இரவில் எல்லாம் மாற வேண்டும் என நாங்கள் எதிர்பார்க்கவில்லை. ஆனால், நீங்கள் ஆட்சியில் இருக்கின்ற காலப்பகுதியில் இப்பிரச்சினைக்கு நிரந்தரத் தீர்வைக் கொண்டுவருவீர்கள் என நாங்கள் எதிர்பார்க்கிறோம்.

நீங்கள் எல்லோரும் ஒரு விஷயத்தைக் கவனிக்க வேண்டும். நாம் இங்கு பேசும்போது மலையக மக்கள் அனைவருக்கும் தனி வீடு கட்டிக்கொடுக்க வேண்டும் என்று சொல்கின்றோம். நாம் யதார்த்தத்தைப் பேசுவோம். இன்று நாட்டினுடைய பொருளாதாரம் என்ன நிலையில் இருக்கிறது என்பது கௌரவ பிரதமர் அவர்களுக்குத் தெரியும். அதேபோல், நாடு இயங்குவது கஷ்டம் என்றும் எல்லாருக்கும் தெரியும். அப்படி இருக்கும்போது, ஏன் நாங்கள் போலியான வாக்குறுதிகளை மக்களுக்குக் கொடுக்க வேண்டும்? நான் பொதுவாகத்தான் சொல்கின்றேன். 2020இல் நான் தோட்ட வீடமைப்பு மற்றும் சமுதாய உட்கட்டமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சைப் பாரமெடுக்கும்போது, 550 சதுர அடிகொண்ட ஒரு வீட்டைக் கட்டுவதற்கான மதிப்பீடு 950,000 ரூபாயாக இருந்தது. அப்போது கொரோனா

தொற்றுப் பரவியது. அதனைத் தொடர்ந்து பொருளாதார நெருக்கடி ஏற்பட்டது. அதற்குப் பிற்பாடு அதே 550 சதுர அடிகொண்ட வீட்டைக் கட்டுவதற்கு கிட்டதட்ட 32 இலட்சம் ரூபாய் தேவைப்பட்டது என்பதனால்தான் நான் இதைச் சொல்கின்றேன்.

நான் பெருந்தோட்ட உட்கட்டமைப்பு சார்ந்த அமைச்சராக இருந்தபோது, அந்த அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதி வெறும் 3,000 மில்லியன் ரூபாய்தான். அதை அதிகரித்துத் தருமாறு பல முறை நாங்கள் கேட்டோம். ஆனாலும், அதை அரசாங்கம் அதிகரித்துக் கொடுக்கவில்லை. எதிர்வரும் வரவு செலவுத்திட்டத்தில் மலையகத்துக்கு குறிப்பாக பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு அமைச்சுக்குரிய நிதி ஒதுக்கீட்டை அதிகரித்தால் மட்டும்தான் நினைத்த மாதிரி வேலை செய்ய முடியும். நான் கௌரவ பிரதி அமைச்சர் சுந்தரலிங்கம் பிரதீப் அவர்களிடம் ஒரு விடயத்தைச் சொல்கின்றேன். உங்களுக்கு ஒரு வருடத்துக்கு 3,000 மில்லியன் ரூபாய் கிடைக்கும். அந்த 3,000 மில்லியன் ரூபாயில் 500 மில்லியன் மட்டும்தான் working capital. அந்த 500 மில்லியன் ரூபாயை வைத்துக்கொண்டு எப்படி வேலை செய்வது? நாட்டின் பத்து மாவட்டங்களில் எங்களுடைய மலையக சமூகம் வாழ்ந்துகொண்டு இருக்கின்றது. கிட்டத்தட்ட 10 இலட்சம் மக்கள் அங்கு வாழ்கிறார்கள். பெருந்தோட்டத்தில் 5 classrooms கொண்ட ஒரு school கட்டவேண்டுமென்றால், 150 மில்லியன் ரூபாய் நிதி தேவைப்படுகிறது. இந்த 500 மில்லியன் ரூபாயை வைத்துக்கொண்டு அங்கு 3 schoolsதான் கட்டமுடியும். இதனை வைத்துக்கொண்டு நாங்கள் பெருந்தோட்டத்தில் மாற்றத்தை எதிர்பார்க்க முடியுமா? யார் ஆளுங்கட்சியாக வருகிறார்கள்; யார் அமைச்சராக வருகிறார் என்பது முக்கியமல்ல. அங்கு வேலை செய்வதற்கான வாய்ப்புக் கிடைப்பதில்லை.

வீட்டினுடைய மதிப்பீட்டைப் பற்றி இங்கு நான் ஏன் சொன்னேன் என்றால், அங்கு ஒரு வீட்டின் பெறுமதி 950,000 ரூபாயாக இருக்கும்போது எங்களால் ஒரு வருடத்தில் கிட்டத்தட்ட 1,000 அல்லது 2,000 வீடுகள்தான் கட்டமுடியும். ஆனால், இன்றைக்கு அங்கு வீட்டின் பெறுமதி 32 இலட்சம் ரூபாயாக உயர்ந்ததும் தோட்ட உட்கட்டமைப்பு அமைச்சினால் கிட்டத்தட்ட 200 அல்லது 300 வீடுகள்தான் கட்டமுடியும். ஆனால், மலையகத்தில் மொத்தமாக 251,000 குடும்பங்கள் வாழ்கின்றன. அதில் 66,000 குடும்பங்களுக்கு வீட்டு வசதிகள் இருக்கின்றன. 1972க்குப் பின்னர் மாறி மாறி ஆட்சிக்கு வந்த அரசாங்கங்களிலிருந்த அமைச்சர்கள் மலையத்தில் வீடுகளைக் கட்டிக் கொடுத்திருக்கிறார்கள். அவ்வாறு 66,000 வீடுகளைக் கட்டிக் கொடுத்தும் மலையகத்தில் மாற்றம் வரவில்லை என்றால், அங்கு வீடு பிரச்சினை கிடையாது. எமது மக்களுக்கு காணிதான் பிரச்சினை. எமது மக்களுக்குக் காணி உரிமை முக்கியம். இன்றைக்கு 7 வருடங்களாக யாராவது ஒரு நபர் நாட்டில் எந்தப் பூமியில் வாழ்ந்தாலும், அந்தப் பூமியைச் சொந்தம் கொண்டாட அவருக்கு உரிமை இருக்கின்றது. இன்றைக்கு 200 வருடங்களாக, பரம்பரை பரம்பரையாக என்னுடைய மக்கள் அங்கு வாழ்ந்துகொண்டு இருக்கிறார்கள். ஆனால், இன்றைக்கு அவர்களுடைய குழந்தைகளுக்கு தோட்டத் துரைமார்கள் வைத்திருக்கின்ற பெயர் 'வெளியாள்' என்பதாகும். அது எந்தவிதத்தில் நியாயம்? இவை எல்லாவற்றுக்கும் ஒரு முற்றுப்புள்ளி வைக்கவேண்டு மென்றால், பெருந்தோட்ட நிறுவனங்களுடன் செய்யப்படு கின்ற ஒப்பந்தங்களிலிருந்து விடுபட்டு மக்கள் வாழும் இடங்களை - human settlements - அரசாங்கம் பாரம் எடுத்தாக வேண்டும். அதனை அரசாங்கம் பாரமெடுத்தால் அங்கு கட்டாயம் மாற்றம் வரும்.

சிந்தித்துப் பாருங்கள்! பெருந்தோட்டப் பகுதிகளில் மட்டும் ஏதாவதொரு வேலைத்திட்டம் நடக்கவேண்டுமென்றால், PHDT என்ற நிறுவனத்தால் மட்டும்தான் அதனைச் செய்யமுடியும். அந்த நிறுவனம் மட்டும்தான் அங்கு road போடுகிறது; school கட்டுகிறது; வீடு கட்டுகிறது. எல்லாவற்றையும் அவர்கதான் செய்கிறார்கள். ஏன், கல்வி அமைச்சினால் பெருந்தோட்டப்பகுதிகளில் உள்ள பாடசாலைகளுக்கு கட்டடம் கட்டிக்கொடுக்க முடியாதா? RDAஇனால் road அமைத்துக் கொடுக்க முடியாதா? NHDAஇனால் வீடு கட்டிக் கொடுக்க முடியாதா? தேசிய நீரோட்டத்துக்குள் மலையக மக்கள் உள்வாங்கப்பட வேண்டு மென்றால், அரசாங்கத்தின் வரப்பிரசாதங்கள் அவர்களுக்குப் போய்ச் சேர வேண்டும்.

இன்றைக்கு இருக்கும் பொருளாதார நிலைமையில் அரசாங்கத்தினால் எல்லோருக்கும் வீடுகள் கட்டிக்கொடுக்க முடியாது. இந்த உண்மையை நாம் எல்லோரும் ஏற்றுக்கொள்ள வேண்டும். மலையக மக்களின் வாழ்க்கையை மாற்ற வேண்டுமென்றால், அங்கு கிட்டத்தட்ட 157,000 வீடுகள் தேவை. அதே நேரத்தில், அந்த 157,000 குடும்பங்களுக்கும் அவர்கள் வாழ்கின்ற காணிகளைச் சொந்தமாக்கிக் கொடுக்க முடியும். எங்களுடைய ஆட்சியில் 'உறுமய' திட்டத்தின்கீழ் 150,000 - 200,000 குடும்பங்களுக்கு காணிகள் வழக்கப்பட்டன. ஆனால், மலையகத்தில் மாத்திரம் அவ்வளவு போராடியும்கூட 1,161 காணி உறுதிப்பத்திரங்கள் தான் தயார் செய்யப்பட்டன. எதிர்க்கட்சியுடனான பிரச்சினையோ, ஆளும் கட்சியுடனான பிரச்சினையோ, அரசியல் ரீதியான பிரச்சினையோ அதற்குக் காரணம் அல்ல. அதற்கு முக்கிய காரணம், தோட்டத்தில் வேலை செய்தால் மட்டுமே தோட்டத்தில் வாழ முடியும்; இல்லையென்றால், வெளியே போக வேண்டுமென்ற நிபந்தனையை பெருந்தோட்ட நிறுவனங்கள் வைத்திருப்பதுதான். இந்த நிலை எமது கட்சிக்காரர்களுக்கு மாத்திரமல்ல என்பதை நான் முன்கூட்டியே சொல்லி வைக்கிறேன். இல்லையானால், நான் அரசியல் ரீதியாகப் பேசுவதாக சிலர் சொல்வார்கள்.

ඉන්රු කිළක්කු මර්රුම් වටක්කු මාකාණංග්සිල් මුස්ලිම්ක්ග්ස්, තමිළර්ක්ග්ස් කූටුතලාග වාළුකින්ර පිරතේසංග්සිල් කූට, ඉන්නුම් තමිල් පේසුම් අරසාංග අතිපර්ක්ග්ස් නියමික්කප්පටාත නිලෙ කාණප්පටුකින්රතු. එංග්සුටෙය තමිල්, මුස්ලිම් මක්ග්ස් අන්ත උරිමෙයෙයිත් තංග්සුක්කුත් තරුමාරු කේට්ටාල්, අතු ඉනවාතමා? එන නාංග්ස් කේට්ක විරුම්පුකින්රෝම්. නාංග්ස් පේසුවතු ඉනවාතමල්ල, තකුතියානවර්ග්සුක්කුත් තකුන්ත ඉටංග්සෙ වළංකුමාරුතාන් කේට්කින්රෝම්. එනවේ, ඉන්ත විටයත්තිල් අරසාංගම් කූටුතලාන කවනම් සෙලුත්ත වේණ්ටුම්. ඉන්ත අරසාංගත්තින් මූලම් මක්ග්ස් එව්වාරු ඔරු මාර්රත්තෙ එතිර්පාර්ත්තිරුක්කින්රාර්ග්සේලෝ, අතෙයේ පාරාළුමන්රත්තිල් එතිර්ක්කට්සියිල් ඉරුක්කින්ර එන්නෙප්පෝන්ර ඉළම් පාරාළුමන්ර උරුප්පිනර්ග්සුම් එතිර්පාර්ක්කින්රාර්ග්ස්. අතාවතු, ඔර් අරසියල් මාර්රත්තෙ එතිර්පාර්ක්කින්රෝම්. අව්වාරානතෝර් ආරෝක්කියමාන අරසියල් කලාසාර මාර්රත්තෙ නීංග්ස් එර්පටුත්තුවීර්ග්ස් එන්ර නම්පික්කෙ එංග්සුක්කු ඉරුක්කින්රතු. අන්ත අටිප්පටෙයිල් උංග්සුටෙය පයණත්තෙච් සරියාග මේර්කොණ්ටු, ඉන්ත නාට්ටිල් නීතියාන, නියායමාන, තූය්මෙයාන අරසියලෙ නටාත්ත වේණ්ටුමෙන්පතර්කාග මක්ග්ස් වළංකියිරුක්කින්ර ආතරවෙ, අවර්ග්ස් උංග්සුක්කු අළිත්තිරුක්කින්ර වාක්කුකළෙ මතිත්තු නිච්සයම් මාර්රත්තෙ එර්පටුත්ත වේණ්ටුමෙන ඉන්ත ඉටත්තිල් කේට්ටු, විටෙපෙරුකින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්ග්ස්)
(The Hon. Presiding Member)

ගරු ආර්.එම්. ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 12ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.55]

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා (වෙළෙඳ, වාණිජ සහ ආහාර සුරක්ෂිතතා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු ආර්.එම්. ජයවර්තන - වර්ත්තක, වාණිප මර්රුම් උණවුප් පාතුකාප්පු පිරති අමෙච්සර්)
(The Hon. R.M. Jayawardhana - Deputy Minister of Trade, Commerce and Food Security)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ දවස් තුනේම - අද, ඊයේ සහ පෙරේදා - මේ පාර්ලිමේන්තුව තුළ විවිධ අදහස් හුවමාරු කර ගත්තා, විවිධ යෝජනා ඉදිරිපත් කළා, විවිධ දේවල් කථා කළා. මොනරාගල දිස්ත්‍රික්කය නියෝජනය කරමින් මට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලබා දීමට වාගේම ජාතික ජන බලවේගය නියෝජනය කරමින් අපේ දිස්ත්‍රික්කයෙන් මහජන නියෝජිතයන් 5දෙනෙකු මේ පාර්ලිමේන්තුවට එවීමට කටයුතු කළ එම දිස්ත්‍රික්කයේ ජනතාවට මගේ මේ පළමුවන කථාවේදී මගේ ගෞරවය පිරිනමනවා.

විශේෂයෙන්ම අද දවසේ අප කථා කරන, සලකා බලන මාතෘකාව, අප අද උදේ ඉදිරිපත් කරපු අතුරු සම්මත ගිණුමයි, එහෙම නැත්නම් ඉදිරි මාස 4ට මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා වන යෝජනාවයි. අපට අතුරු සම්මත ගිණුමක් අවශ්‍ය වන්නේ ඇයිද කියන එක ගැන අපි නැවත නැවතත් හිතන්න ඕනෑ. පාර්ලිමේන්තුවට අය වැයක් ඉදිරිපත් කරන්න යන කාලය සැලකිල්ලට ලක් කළොත් අපි දන්නවා, මේ පාර්ලිමේන්තුවට අය වැයක් ඉදිරිපත් කරන්න ප්‍රමාණවත් කාලයක් අපට තිබුණේ නැති බව. ඒ නිසා අපි දන්නවා, මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් වුණේ ඒ වෙනුවට බව.

විපක්ෂයේ බොහෝ මන්ත්‍රීතුමන්ලා පසු ගිය දිනවල කරපු කථා ඔක්කෝම ගත්තොත්, එතුමන්ලා යෝජනා සහ අදහස් විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කළා. ඒ යෝජනා හා අදහස් සැලකිල්ලට ගැනීම ගැන, ඒ පිළිබඳව හිතන එක ගැන අපි කල්පනා කරන්න ඕනෑ. හැබැයි, මේ ඉදිරිපත් කළ අතුරු සම්මත ගිණුම හරහා අප ලබා ගන්නා මුදල් යොදවන්නේ රට අකර්මණ්‍ය නොකර පවත්වාගෙන යෑම වෙනුවෙනුයි. එතුමන්ලා ඉදිරිපත් කළ යෝජනා, අදහස් සහ කරන ලද ප්‍රශ්න කිරීම් සම්බන්ධයෙන් කථා කරද්දී අප ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, අපේ අපේක්ෂාව, රටේ ජනතාවගේ අපේක්ෂාව වන්නේ, මේ රට ගොඩ නහන්න පුළුවන් මට්ටමේ වැඩ පිළිවෙළක් එක්ක මේ රට ඉස්සරහට යෑම බව. අපි කොහොමද මේ රට හදන්නේ, අපි කොහොමද කෘෂි කර්මාන්තයෙන් මේ රට ගොඩ නහන්නේ, අපි කොහොමද ආර්ථිකය හදන්නේ, අපි කොහොමද සෞඛ්‍ය පද්ධතිය ගොඩ නහන්නේ කියලා හැම ක්ෂේත්‍රයක් පිළිබඳවම දැවැන්ත වැඩ පිළිවෙළක් අපි පසුගිය ජනාධිපතිවරණයට පෙර ඉදිරිපත් කළා. අපි දන්නවා, ඒ ඉදිරිපත් කළ වැඩ පිළිවෙළ ක්‍රියාවට නහන්න නම්, ඒකට ගැළපෙන, ඒකට අනුගත වන අය වැය ලේඛනයක් පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගන්න ඕනෑ බව. ඒ අය වැය සකස් කරන තුරු තමයි අතුරු සම්මත ගිණුමකට යන්න අපට සිද්ධ වෙන්නේ. දවසකින් දෙකකින් අය වැයක් හදන්න, සම්මත කරන්න පුළුවන් කියලා හිතනවා නම්, එහෙම අය වැයක් හදලා රට ගොඩ නහන්න පුළුවන් කියලා හිතනවා නම් ඒකම මුළාවක්; එහෙම හිතන එකම කනගාටුදායක තත්ත්වයක්.

පසුගිය මහ මැතිවරණය තිබුණේ නොවැම්බර් මාසයේ 14වැනි දා. නොවැම්බර් මාසයේ 21වැනි දා තමයි මන්ත්‍රීවරු දිවුරුම් දුන්නේ. ඇමතිවරු සහ නියෝජ්‍ය ඇමතිවරු දිවුරුම් දුන්නේ නොවැම්බර් මාසයේ 18වැනි දා සහ 21වැනි දා. එතැන සිට අද දක්වා ගත්තොත් දවස් 14ක්, 15ක් වාගේ කාලයක් තමයි ගතවෙලා තිබෙන්නේ. අපි දන්නවා, අපිට භාර දීපු රට කොයි වාගේද කියලා. මේ රට අපට භාර දෙනකොට මේ රටේ තිබුණු තත්ත්වය පිළිබඳව ඕනෑම කෙනෙක් අධ්‍යයනය කළොත් දන්නවා. ග්‍රාමීය ආර්ථිකය සහමුලින් බිඳ වැටිලා, ග්‍රාමීය ආර්ථිකයේ කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත නැවත ගොඩ නහන්න බැරි මට්ටමකට කඩාගෙන වැටිලා තිබුණ වෙලාවක තමයි අපට රට භාර දුන්නේ. ඒ වාගේම කෘෂිකාර්මික ආර්ථිකය, කෘෂි කර්මාන්තය මහ පොළොවට වැටිලා, ගොවි ජනතාව මහ පොළොවට සමතලා වෙලා ඉන්න වෙලාවක තමයි අපට රට භාර දුන්නේ. ධීවරයා වාගේම අනෙකුත් ක්ෂේත්‍ර සියල්ලම කඩාගෙන වැටිච්ච වෙලාවක තමයි අපට රට භාර දුන්නේ. එහෙම රටක් භාර දීලා දවස් 14කින් අපෙන් අහනවා නම්, ප්‍රශ්නයට උත්තරයක් කෝ, ප්‍රශ්නයට උත්තරයක් කෝ කියලා, ඒකට උත්තර දෙනකොට පොඩි අපහසුතාවක් දැනෙනවා.

අද උදේ වරුවේ ගොඩක් අය ප්‍රශ්න ඇහුවා, ප්‍රශ්න ගැන කථා කළා. ඒ වාගේම බඩු මිල සම්බන්ධයෙනුත් අවස්ථා කිහිපයකදී කරුණු ඉදිරිපත් කළා. පසුගිය දවස්වල මහ බැංකුව නිකුත් කරපු වාර්තාව මම අරගෙන බැලුවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව අරගෙන දින 14ක් ඇතුළත කාලය ගැන තවදුරටත් අපි කරුණු පරීක්ෂා කරලා බැලුවා. අනුර දිසානායක ජනාධිපතිතුමා පත් වෙලා ගත වුණු දින 75කට ආසන්න කාලය ඇතුළතදී රටේ බඩු මිල සැලකිය යුතු මට්ටමකින් පහළට ගිහිල්ලා තිබෙනවා. පොල්, හාල් වාගේ භාණ්ඩ වර්ග කිහිපයක මිල හැරෙන්න, අනෙකුත් භාණ්ඩ ඔක්කෝගේම මිල පහළ ගිහිල්ලා තිබෙනවා. මේ තිබෙන්නේ මහ බැංකු වාර්තාවේ අලුත්ම තොරතුරු ටික. එහෙම නම්, බඩු මිල පහළට ගිහිල්ලා තිබීම නිසා මේ ආර්ථිකයට යම් දායකත්වයක් දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ආර්ථිකය සහමුලින් ම කඩා වැටිච්ච වෙලාවක අපි කල්පනා කළා, අපට භාර දුන් ආර්ථිකය ඇතුළේ අපි ඉස්සරහට යන්න ඕනෑ, අපට ගමනක් තිබෙනවා, මේ රට හදන්න ඕනෑ කියලා. ජනතාවගේ අපේක්ෂාව ඒක. හැම කෙනෙකුගේම බලාපොරොත්තුව වුණේ, ජාතික ජන බලවේග ආණ්ඩුවක් හදලා මේ රට ගොඩ නහයි කියන එක නම්, ඒකට අපි සූදානම්.

ආර්ථිකය පැත්තෙන් ගත්තොත්, කෘෂි කර්මාන්තයෙන් ඵලදායකත්වයක් ලැබුණු මහා බිමක් මුඩු බිමක් බවට පත් කළා වාගේම, ආර්ථිකයත් මුඩු බිමක් බවට පත් කරපු රටක් තමයි අපට භාර දුන්නේ. ඉක්මනින් ඒක ගොඩ දාන්න කියලා අපට කියනකොට අපි දැක්කා, ඒකේ හදලා තිබුණු විශාල බොරු වළවල් ප්‍රමාණය. ඒ හදපු බොරු වළවල් අතරින් ඉක්මනින් ගිහිල්ලා කටයුතු කරන්න කියලා තමයි අපට කියන්නේ. ඊයේ දවසේත් විවිධ ප්‍රශ්න ගැන කථා කළා. තෙල් මිල ප්‍රශ්නය ගැනත් කථා කළා. තෙල් මිල රුපියල් දෙකකින් අඩු වුණු එක අපරාධයක් කිව්වා. ඒ අඩු කරපු එක පුංචි දෙයක් කිව්වා. මීට කලින් රුපියල් 300 ගණනට තිබුණු තෙල් මිල රුපියල් 200 ගණනක් දක්වා අඩු වෙලා තිබෙන්නේ මිල අඩු කරපු නිසා තමයි. රුපියල් විසි ගණනකට වැඩි මුදලකින් මිල අඩු වෙලා තිබෙන්නේ. අපේ වර්තමාන ජනාධිපතිවරයා ඉතාම පැහැදිලිව කිව්වා, තෙල් මිල අඩු කළොත් මොකක්ද වෙන්නේ කියලා. තෙල් මිල අඩු කළොත්, ගහලා තිබෙන ඒ ගිවිසුමට අනුව පෞද්ගලික සමාගම් කිහිපයක් අතට මුදල් ටික යනවා. මහ ජනතාවට තෙල් මිල අඩු කරලා දීලා ආණ්ඩුවට ආදායම් හෙව්වාට වැඩක් නැහැ. මොකද, ඒ අඩු කරපු මුදල යන්නේ කොම්පැනි කිහිපයක් අතට. ගහලා තිබෙන ගිවිසුම්වල එහෙමයි තිබෙන්නේ. ඒක බොරු වළක්.

ඒ විතරක් නොවෙයි. දැන් විදුලිබල මණ්ඩලය කෑලි 8කට කඩලා විකුණන්න වෙච්ච එක පිළිබඳවත් කිව්වා. අපි ඒවා නවත්වලා තිබෙනවා.

ඒ වාගේම සේවකයන් ඉවත් කිරීම සම්බන්ධවත් කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ දිස්ත්‍රික්කයේ විශාල කර්මාන්තශාලා දෙකක් තිබෙනවා. ඒ, පැල්වත්ත සීනි සමාගම සහ සෙවනගල සීනි සමාගම. දැන් ඒ ආයතන දෙකම ඉතා නරක විධියට, පවත්වාගෙන යන්න බැරි මට්ටමකට කඩාගෙන වැටිලා තිබෙන්නේ; පවත්වාගෙන යන්න බැරි විධියට අර්බුදයකට ලක් කරලා තිබෙන්නේ. ඒ අර්බුදයට හේතුව මොකක්ද කියලා හොයලා බැලුවා. අපි දන්නවා, ඉතිහාසයේත් එහෙම වුණා කියලා. රාජ්‍ය සේවයට බඳවා ගන්නවා කියන, එහෙම නැත්නම් තනතුරු, රස්සාවල් දෙනවා කියන මූලික පදනමින් සේවකයන් 2,800ක් ඕනෑ පැල්වත්ත සීනි සමාගමට සේවකයන් 4,200ක් විතර අරගෙන තිබෙනවා. සේවකයන් 4,200ක් ගන්නකොට නිෂ්පාදන වියදම වැඩි වෙනවා. ඒ නිසා සීනි ටික විකුණාගන්න බැරි වෙනවා; එතනෝල් ටික විකුණාගන්න බැරි වෙනවා. පැල්වත්තත්, සෙවනගලත් දෙකම මුහුණ දීලා තිබෙන අර්බුදය ඒක. ඒ නිසා පැල්වත්ත සහ සෙවනගල ෆැක්ටරි දෙකේම සීනි නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 23,000කට වඩා තොග පිටින් ඉතුරු වෙලා තිබෙනවා.

නිෂ්පාදනය කරපු එතනෝල් ලීටර් ලක්ෂ 10කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තිබෙනවා, විකුණා ගන්න බැරුව. සෙවණගලත් ඒ විධියටම තිබෙනවා. අපි දන්නවා, මේ ආයතන පවත්වාගෙන යනකොට, විශේෂයෙන් රැකියා දෙනකොට කටයුතු කර තිබෙන ආකාරය. බොහෝ රාජ්‍ය ආයතනවලට රැකියා දීලා දීලා, පුරවලා පුරවලා සේවකයන්ගෙන් පිරිච්ච රාජ්‍ය ආයතන පද්ධතියක් තමයි තිබෙන්නේ. නමුත් ඒ කිසිදු කෙනෙක් ඉවත් කරන්න මේ ජාතික ජන බලවේගය ආණ්ඩුව සැලසුම් කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කඩා වැටිච්ච ආර්ථිකයක් සහිතව අපට රට දුන්නත්, අපි මේ වැඩ පිළිවෙළ තුළින් ජනතාවගේ අපේක්ෂා ඉෂ්ට කරන්න පටන් ගත්තා. අපි

[ගරු ආර්.එම්. ජයවර්ධන මහතා]

පළමුවෙන්ම කිව්වා, වංචා, දූෂණ, නාස්තිය නවත්වනවා කියලා. ඒ වාගේම, දූෂණය, අතිරේක වියදම් නවත්වනවා කියන එකත් අපි කියලා තිබුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ වත්මන් ජනාධිපතිතුමා දිවුරුම් දුන් මොහොතේ සිට අද දක්වා ජනාධිපතිවරයාගේ වියදම් ශීර්ෂය වාගේම, වත්මන් පාර්ලිමේන්තුවේ අපේ ඇමතිවරු, නියෝජ්‍ය ඇමතිවරු දිවුරුම් දීමේ උත්සවයේ සිට මේ සියල්ලෙන්ම අපි ඔප්පු කරලා තිබෙනවා, අපි අපේ රටේ ජනතාවට කිව්ව දේවල් ඒ විධියට ඉටු කරන ආණ්ඩුවක් බව. ඒ විධියට කටයුතු කරන්න පුළුවන් ආණ්ඩුවක් බව එකින් එක දැන් ඔප්පු කරමින් තිබෙන්නේ.

අපි පසුගිය දවස් ටිකේ මුදල් වියදම් කිරීම අවම කළා චිතරක් නොවෙයි, කඩන් වැටුණා කියපු ඩොලරයේ වටිනාකම රුපියල් 290 දක්වා පහළට එන මට්ටමට ගෙනාවා. කොටස් වෙළඳපොළ තිබිච්ච තත්ත්වයට වඩා වෙනස් කරලා ස්ථාවර ත්ත්වයට පත් වෙමින් හැමදාම එය වර්ධනය වන තැනකට අද ගෙනැල්ලා තිබෙනවා. විදේශ ප්‍රේෂණ ප්‍රමාණය සියයට 3.9ක් වාගේ මුදලකින් වැඩි කරන මට්ටමකට ගෙනැල්ලා තිබෙනවා. ඒ චිතරක් නොවෙයි, අපි දන්නවා, සැලකිය යුතු ප්‍රමාණයකට අපි ගොඩක් දේවල් කරලා තිබෙන බව. එහෙම අපි එක එක දේවල් කරනකොට මේ රට හදන්න ඕනෑ කියලා හිතපු, මේ රට හදන්න මැදිහත් වෙන්න ඕනෑ කියලා හිතපු, විදේශීය රටවල හොඳ වෘත්තීන්වල නියැළිලා හොඳ පඩියක් අරගෙන අරගෙන ඔවුන්ගේ ජීවිතය පවත්වාගෙන යන්න පුළුවන් කියලා හිතපු කණ්ඩායම අද දවස වෙනකොට අපේ ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ඉදිරි වැඩ පිළිවෙළ ගැන සෑහීමකට පත් වෙලා තිබෙනවා. ඒ බොහෝදෙනෙක් අපි කෙරෙහි විශ්වාසය තබලා දැන් ලංකාවට ඇවිල්ලා ස්වේච්ඡාවෙන් වැඩ කරමින් ඉන්නවා. ඒ හැමෝටම තිබෙනවා නව බලාපොරොත්තුවක්.

ඒ වාගේම අපේ ජනාධිපතිවරයාගේ සංකල්පයකට අනුව "Clean Sri Lanka" වැඩසටහන දැන් ඉස්සරහට පටන් ගත්තාම, සමහර අයට හිතෙන්න පුළුවන් මේ "Clean Sri Lanka" වැඩසටහන කියන්නේ කුණු කසළ සුද්ද කිරීම පමණයි කියලා. කුණු කසළ පමණක් නොවෙයි, මේ පාර්ලිමේන්තුව ගැනත් අපි යම් ප්‍රමාණයකට පසුගිය දවස්වල කිව්වා. අපි පාර්ලිමේන්තු මැතිවරණයේදී කිව්වා, මෙතරම් කාලයක් දූෂිත බවට පත් වෙලා, ජනතාවට අප්‍රසන්න වෙලා තිබුණු පාර්ලිමේන්තුව ඊට වඩා සුන්දර පාර්ලිමේන්තුවක් බවට පත් කරන්න ඕනෑ කියලා. ඒක පිළිගෙන තමයි මේ පාර්ලිමේන්තුවට ජාතික ජන බලවේගයේ නවක මන්ත්‍රීවරු 145කට ආසන්න ප්‍රමාණයක් සහිතව මන්ත්‍රීවරු 159දෙනෙක් පාර්ලිමේන්තුවට එවන්නේ. අපි පාර්ලිමේන්තුව clean කළා වාගේ මේ සමාජයත් clean කරන්න ඕනෑ. මේ සමාජයේ ජනතාවගේ ආකල්ප වෙනස් වෙලා මේ රට ගොඩනගන මාවතට යොමු කරන්න ඕනෑ. අන්න ඒ අරමුණ වෙනුවෙන් තමයි "Clean Sri Lanka" වැඩසටහන පටන් ගන්නේ. අපි පරිසරය පිරිසිදු කරන්න ඕනෑ, ජනතාවගේ මානසිකත්වය පිරිසිදු කරන්න ඕනෑ. ඒ වාගේම මේ ආයතන තුළ, සෑම තැනකම, සෑම ක්ෂේත්‍රයක්ම ගත්තොත්, ඒ හැම තැනකම සිතන විධියේ ඉඳලා කල්පනා කරන විධියේ ඉඳලා වෙනස් කරන්න ඕනෑ. මිනිසුන්ගේ සිතුම් පැතුම් වෙනස් කරන්න ඕනෑ. මේ සියල්ල එක්ක අපි "Clean Sri Lanka" වැඩසටහන ඉදිරියේදී පටන් ගන්නවා, ක්‍රියාත්මක කරනවා.

ඒ චිතරක් නොවෙයි, ගම්මාන මට්ටමට ගියාම, අපි සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳව හිතලා තිබෙනවා. ජනතාවට භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රියාවලියේදී සමුපකාර ක්ෂේත්‍රය කොහොමද වඩා ශක්තිමත්ව ඉස්සරහට ගෙනියන්නේ කියලා අපි හිතලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ආර්.එම්. ජයවර්ධන මහතා
(மாண்புமிகு ஆர்.எம். ஜயவர்தன)
(The Hon. R.M. Jayawardhana)

අන්න එතැනදී අලුත් බලාපොරොත්තු සහිතව, අලුත් වැඩ පිළිවෙළක් සහිතව මේ රට ඉස්සරහට ගෙනියන්න අපි සූදානමින් ඉන්නවා. අපි තව කල්පනා කරනවා. විපක්ෂය විසින් යම් යෝජනා ගේන්න පුළුවන්, යම් අදහස් ඉදිරිපත් කරන්න පුළුවන්, යම් මතවාද ඉදිරිපත් කරන්න පුළුවන්. අපි ඒ සියල්ලත් සැලකිල්ලට ගන්නා ගමන් ආණ්ඩුවක් විධියට කල්පනා කරමින් මේ රට වෙනස් කරන්න, මේ රට ගොඩනගන්න අපට කරන්න පුළුවන් උපරිම දායකත්වය දෙමින් මේ රට හදනවා. ඒ වෙනුවෙන් තමයි ජාතික ජන බලවේගය ආණ්ඩු බලයක් ලබා ගත්තේ කියන එක පැහැදිලි කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කාවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.07]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ස්තුතිවන්ත වෙනවා, මට කාලය ලබාදීම පිළිබඳව.

මෙවර පාර්ලිමේන්තු මැතිවරණයෙනුත් මාත්, තවත් අපේ මන්ත්‍රීවරු දෙදෙනෙකුත් ජයග්‍රහණය කරවලා, විපක්ෂයේ කාර්යභාරය කරන්න වගකීම් පැවරීම පිළිබඳව ගම්පහ දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාවටත්, මගේ ආසනය වන මීගමුව ආසනයේ ජනතාවටත් මගේ ගෞරවය විශේෂයෙන්ම මේ අවස්ථාවේදී පුද කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනතාව මේ රටේ දේශපාලන අධිකාරිය සහ මේ රටේ දේශපාලන ක්‍රමවේදය පිළිබඳව පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව සියලුදෙනාටම අලුත් පණිවුඩයක් දීලා, වර්තමාන රජය තෝරා පත් කරගෙන තිබෙනවා. මේ පාර්ලිමේන්තුව ගත්තොත්, මෙහි නවක මන්ත්‍රීවරුන් දැවැන්ත ප්‍රමාණයක් සිටිනවා. අපි ඒ අයට සුබ පතන අතර, ඒ සියලුදෙනාටම ලොකු වගකීමක් තිබෙනවා, මේ භාරදූර කර්තව්‍යය සම්බන්ධයෙන් වගකීම් සහගතව කටයුතු කරන්න. සමහර මන්ත්‍රීවරු කථා කරනකොට, "අපට විපක්ෂයේ ගුරුහරුකම් අවශ්‍ය නැහැ, අපට විපක්ෂයේ අදහස්, එහෙම නැත්නම්, ඒ අයගේ මතය අවශ්‍ය නැහැ" කියලා කියනවා, අපි දැක්කා. මම හිතන විධියට, මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන්නේ ඒක නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ මේ රටේ සියලුම පක්ෂ දේශපාලන මතවාද එක්ක මේ ගරු සභාව තුළ ගැටුණත්, මේ රටේ තීරණාත්මක අවස්ථාවලදී ගතයුතු, කළ යුතු, යුතුකම්, වගකීම් මේ සභාව තුළින් ගනිවි කියලායි ජනතාව

බලාපොරොත්තු වෙන්නේ. මොකද, අපට හංගන්න දෙයක් නැහැ. පැවති සභාවන්වලදී අපි දැක්කා, ඒ සභාවන් කොයි තරම් දුරට පරිහානියට පත් වුණාද කියලා. එසේ පරිහානියට පත් වුණු නිසා තමයි ඒ මන්ත්‍රීවරු, හිටපු සමහර ඇමතිවරු අද මේ සභාව නියෝජනය නොකරන්නේ.

පාර්ලිමේන්තුව ආරම්භ කළ දවසේම ආණ්ඩු පක්ෂයේ එක්තරා ඇමතිවරයෙක් විපක්ෂ නායකතුමාට කියනවා මම දක්කා, "ඔබතුමන්ලා මන්ත්‍රී ධුර හතළිස් ගණනකට වැටිලා ඉන්නේ. අපි මන්ත්‍රී ධුර 159ක් අරගෙන ඉන්නේ, මේක තමයි මහ පොළොවේ යථාර්ථය" කියලා. එහෙම උද්ධච්ච වෙන එක සුබදායකයි කියලා මම නම් හිතන්නේ නැහැ. මොකද, එතුමන්ලා සියයට 3ක් නියෝජනය කළ බව අපට මතකයි. හැබැයි, ජනතාව මේ බලය දෝලනය කළා. ජනතාව තුළ තමයි පරමාධිපත්‍යයේ අයිතිය තිබෙන්නේ. හැම දාම ඇමතිකම්, හැම දාම තනතුරු, -තානාන්තර- හැම දාම ආණ්ඩු බලය තිබෙන්නේ නැහැ. ඒ නිසා ජනතාව ලබා දුන් ඒ වරම තේරුම් අරගෙන කටයුතු කළොත්, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට අත් වෙච්ච ඉරණම අත් නොවේවි කියා අපි විශ්වාස කරනවා.

ඒ වාගේම සමහර මන්ත්‍රීවරු මේ ගරු සභාවේ කියනවා මම දැක්කා, "අපට භාර දුන් රට, අපට භාර දුන් රට" කියලා. දැන් රට භාර දීලා ඉවරයි. රට තිබුණු විධිය අපි කවුරුත් දන්නවා. ඒක ආවර්ජනය කරන්නත් පුළුවන්. මේ රටේ ජනතාව ඔබතුමන්ලාට රට භාර දීලා තිබෙන්නේ. එතැනින් එහාට රට ගෙනියන්නේ කොහොමද කියන එක පිළිබඳ වගකීම තමයි දැන් තිබෙන්නේ. එහෙම නම්, මේ අවස්ථාවේදීත් අපි බලාපොරොත්තු වෙන්නේ, -ප්‍රශ්නයක් නැහැ, භාර දුන්න විධිය ගැන කථා කරනවාට. හැබැයි, මිනිත්තු කිහිපයක් හරි වැය කරලා කියන්න, රට මෙතැනින් එහාට ගෙනියන්නේ කොහොමද කියලා.

මේ තිබෙන්නේ බංකොලොත් වෙච්ච රටක්, දුප්පත් රටක්, වැටුණු රටක් කියන එක අපි දන්නවා. මේ රටේ හොරකම, වංචාව, දූෂණය, අක්‍රමිකතාව නතර කරන්නේ කොහොමද? ජනතාවට සහන දෙන්නේ කොහොමද? ඒ සහනවලින් ජනතාවට ලැබෙන ප්‍රයෝජන මොනවාද? ඒ වාගේම තමයි මේ රටේ ආර්ථිකය, අධ්‍යාපනය, සෞඛ්‍ය ආදී ක්ෂේත්‍ර නහා සිටුවන්නේ කොහොමද කියන එක පිළිබඳව මේ ගරු සභාව දැනුවත් කරන්න පුළුවන්. අපි දන්නවා, මේ වසරේ අය වැයක් ඉදිරිපත් කරන්න කාලයක් නැහැ කියලා. ඒ නිසා අතුරු සම්මත ගිණුමක් තමයි මේ ඉදිරිපත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ජනතාව අය වැයක් ඉදිරිපත් වෙනකොට පඩි වැඩි කිරීම්වලට අමතරව ලබාදෙන සහන, ලැබෙන ප්‍රතිලාභ පිළිබඳව බොහොම අවධානයෙන් සිටිනවා. දැන් හැන්ද අතට අරගෙන තමන්ටම හැන්දෙන් බෙදා ගන්නවා වාගේ වැඩක් තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

අපේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා අද උදේ කිව්වා, හිටපු ජනාධිපතිවරයාගේ මාස 4ක වැය ශීර්ෂයේත්, වර්තමාන ජනාධිපතිවරයාගේ මාස 4ක වැය ශීර්ෂයේත් කිසිදු වෙනසක් නැහැ කියලා.

හෙලිකොප්ටර්වලින් යන්න, වාහන 10ක් හෝ 15ක් පසුපස අරගෙන යන්න, උපදේශකවරුන්ට රුපියල් මිලියන 320ක් වැනි විශාල මුදල් ප්‍රමාණයක් වියදම් කිරීම හා සමාන මුදලක් මෙතුමාත් වෙන් කරගෙන තිබෙන්නේ එවැනි කටයුත්තකට දෝ කියන සාධාරණ සැකයක් අපට ඇති වනවා. විශේෂයෙන්ම මේ ගැනත් කියන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. "ණය ගන්න එක කජ්ජක්ද?" කියලා ඇහුවා. අපට පෙනෙනවා, ණය ගන්නවා. ණය ගත්තාට ප්‍රශ්නයක් නැහැ. මොකද, ණය ගෙවන්න විධියක් නැති නිසා. හැබැයි, එදා කියපු දේ අද වෙනස් වෙලා තිබෙනවා. වගකීම් භාර ගත්තායින් පසුව ඒ අයට තේරෙනවා ඇති කියලා මම හිතනවා, මොකක්ද මහ පොළොවේ ප්‍රායෝගිත්වය කියන එක.

හාල් හිඟයක් ආවා. අපි වේදිකාවේ දැක්කා, හාල් මාෆියාව ගැන කථා කරනවා. දැන් හාල් පිට රටින් ගෙනෙනවා. ඒක මේ ප්‍රශ්නයට රජයේ විසඳුම වෙන්න ඇති. ඒක කෙටි කාලීන විසඳුමක් වෙන්න ඇති. හැබැයි, ගංවතුර තත්ත්වයෙන් පසුව ලැබෙන අස්වැන්න අඩු නිසා තවදුරටත් යම්කිසි කාලයක් දක්වා හාල් ගෙන්වන්න සිදු වන බව කියනවා, අපි දැක්කා. නමුත් අපි ලොකු වෙනසක් බලාපොරොත්තු වුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වෙනස සිදු වනවාද කියන එක ගැන සාධාරණ සැකයක් මේ රටේ සාමාන්‍ය පුරවැසියන්ට මෙන්ම අපටත් ඇති වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොල් නැත්නම් පොල් මාෆියාවක් ගැන කියනවා. ගෑස් නැත්නම් ගෑස් මාෆියාවක් ගැන කියනවා. එහෙම කියලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ. රජය මැදිහත් වෙන්න ඕනෑ. එක්තරා ඇමතිවරයෙක් කියනවා මම දැක්කා, බදු ගෙවන්න මිනිස්සු පෝලිමේ ඉන්නවා ලු. ඔව්, පෝලිමේ ඉන්නවා තමයි. මොකද, TIN එක දාලා ගෙදරට ලියුම එව්වාම නඩු දා ගන්න කවුද කැමැති? අනිවාර්යයෙන්ම පෝලිමේ ගිහිල්ලා බදු ගෙවනවා. බදු ගෙවන්න නැත්නම්, අඩුම ගණනේ, බදු ගෙවන්න නැහැ, "බින්දුවයි" - "nil" - කියලා සටහනක් දාලා ඒක භාර දෙන්න ඕනෑ. ඒක නිසා නිකම් මේ වාගේ බොළඳ කථා කියන එක ප්‍රායෝගිකයි කියලා මම හිතන්නේ නැහැ.

පාස්කු ඉරු දින ත්‍රස්ත ප්‍රහාරයට ලක් වුණු අපේ අහිංසක මිනිසුන්ට සාධාරණත්වය ඉෂ්ට වෙයි කියලා අපි දැස් දල්වාගෙන බලාගෙන ඉන්නවා; බලාපොරොත්තුවෙන් ඉන්නවා. ඒ වාගේම විශේෂයෙන්ම මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කරන වෙලාවේ අපි පැහැදිලිව කිව්වා, ගරු පක්ෂ නායකවරුන් එක්ක සාකච්ඡා කරලා එකඟතාව පළ කළාට ස්ථාවර නියෝග අංක 27ත්, ඒ වාගේම 121 (2)ත් අත්හිටුවනවා - suspend කරනවා - නම්, ගරු පාර්ලිමේන්තුවට ඒක ඉදිරිපත් කරන්න ඕනෑ කියලා.

විශේෂයෙන්ම Public Financial Management Act එක උල්ලංඝනය කරන්න බැහැ. අපේ ස්ථාවර නියෝග අත්හිටෙව්වාට පාර්ලිමේන්තුව සම්මත කරලා තිබෙන Public Financial Management Act එකට පිටින් කටයුතු කරන්න බැහැ. ඒක නිසා තමයි දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වේ, මේ කාරණය සම්බන්ධයෙන් උසාවි යන්න පුළුවන්, නඩු පවරන්න පුළුවන් කියලා. හැබැයි, අපේ රටේ ඒ නීතිය නැහැ. ඉන්දියාවේ Constitution එකේ එහෙම provision එකක් තිබෙනවා. හැබැයි, ලංකාවේ එහෙම provision එකක් නැහැ. නීත්‍යානුකූලව කළ යුතු ක්‍රියාදාම ක්‍රියාත්මක නොකර, වෙනත් මාර්ගයකින් කටයුතු කරන්න ගිහිල්ලා අපේ වර්තමාන රජයත්, පාර්ලිමේන්තුවත් අසීරුතාවට පත් වෙයි කියන හේතුව මත තමයි අපි ඒ කරුණු කාරණා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණ පාර්ලිමේන්තුව නොමඟ යැවීමක්. ඒ වාගේම අද උදේ වරුවේ පාර්ලිමේන්තුවේදී අපි එකඟ වුණු කරුණක් පිළිබඳව එතුමා නැවත පටලැවිලි සහගත තත්ත්වයක් ඇති කළා. එතුමාට අදහස් ප්‍රකාශ කිරීමට තිබෙන අයිතිය අපි

[ගරු බිමල් රත්නායක මහතා]

පිළිගන්නා ගමන්, එවැනි ප්‍රකාශයක් කිරීම රටේ ජනතාවට කරන වැරැද්දක් බවත් කියන්න ඕනෑ. පළමුවැනි කරුණ මෙයයි. Public Financial Management Act එක කිසිම අයුරකින් උල්ලංඝනය වීමක් වෙලා නැති බව අප විසින් මේ සභාවට සනිටුහන් කළා. සාමාන්‍ය අවබෝධයක් තිබෙන ඕනෑම කෙනෙකුට රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20වන පිටුවේ 23(1) සහ 23(2) වගන්ති කියෙව්වාට පසුව තේරෙනවා, විසර්ජන පනත් කෙටුම්පතක් ඉදිරිපත් කර නැති අවස්ථාවකදී අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළ හැකියි කියන එක. ඒක ප්‍රශ්නයක් වුණු සෑමදෙනාගෙන්ම මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා ඒ වගන්ති කියවන්න කියලා.

දෙවැනි කාරණය මෙයයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වැඩිමනත් වශයෙන් ගරු නීතිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ලේඛනය අපි හැන්සාඩ්ගත කළා. නීතිපතිතුමා පැහැදිලිව කියලා තිබෙනවා, අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කිරීමේ කිසිදු ආකාරයක නීත්‍යානුකූල ගැටලුවක් නැහැ, ඒක ලංකාවේ තිබෙන නීතියට එකඟයි කියලා. එතරම් පැහැදිලිව මේ කරුණු සනාථ වී තිබියදී තමයි ඔබතුමන්ලා මේ විධියට කථා කරන්නේ. ඒ විතරක් නොවෙයි. ඔබතුමන්ලා අද දින න්‍යාය පත්‍රය බලලා මේ සභාවට එනවා නම් හොඳයි. මෙතුමන්ලාට න්‍යාය පත්‍රය බලන්න කියන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද දින න්‍යාය පත්‍රයේ යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු යටතේ වන 1වන යෝජනාවේ මුලින්ම මෙසේ සඳහන් වෙනවා:

> "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150 ව්‍යවස්ථාවේ 2 වන අනුව්‍යවස්ථාව යටතේ, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 23 වගන්තියේ (1) උපවගන්තියට අනුකූලව අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමට වන යෝජනා සම්මතය..."

මේක අද දින න්‍යාය පත්‍රයේ - Order Paper එකේ - තිබෙනවා. ඒ සියල්ල මෙලෙස තිබියදී තමයි මේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ විධියට කථා කරන්නේ. අපට තේරෙන්නේ නැහැ, ඇයි මේ ගරු මන්ත්‍රීතුමන්ලා මේ විධියට ඒ ගැන අහන්නේ කියලා. ඒකෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කිසිවෙකු මුළාවට ලක් වෙන්නේ නැහැ. මුළාවට ලක් වෙන්නේ පොදු ජනතාව. ඒකෙන් පොඩි කැල්ලක් cut කළා; social mediaවල දැම්මා. එතකොට මිනිස්සුන්ට හිතෙන්නේ මොකක්ද? මේ පාර්ලිමේන්තුව නීති කඩාගෙන අර පරණ ගමනම යනවා කියලා. එම නිසා මම කරුණාවෙන් මේ කාරණය ඉල්ලා සිටිනවා. ඇත්ත ප්‍රශ්නය එක්ක, ඇත්ත විවේචන ඉදිරිපත් කරන්න. අපි ඒවා භාර ගන්න ලැහැස්තියි. ඒ පැරණි අඳුරු යුගයේ දේශපාලන භාවිතාව කරුණාකරලා නැවත ගෙනෙන්න එපා. ඔබතුමන්ලා නැවත කවදා හරි බලයට පත් වෙන්න හිතාගෙන ඉන්නවා නම්, ඒකෙන් කිසිම උදව්වක් ඒ සඳහා ලැබෙන්නේ නැහැ. බලයට පත් වෙන්න, ඕක නොවෙයි පාර. අපි යන පාරේ අපට වඩා හොඳට ඉස්සරහින් යන්න. එතකොට බලයට එන්න පුළුවන්. අපි ඉල්ලා සිටින්නේ, සාවද්‍ය කරුණු කියලා ජන මනස අවුල් කරන්න එපා කියලායි. මේක රාජ්‍ය මූල්‍ය පනතක්. ඉන්දියාවේ වාගේ නම් නඩු දාන්නත් පුළුවන් කියලා කිව්වා. එම නිසා අනවශ්‍ය කලබලයක් ඇති කරන්න එපා. අපි පොදුවේ ජනතාව වෙනුවෙනුයි මේ ඉල්ලීම කරන්නේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම මම මේ කාරණය කියන්න ඕනෑ. ඉන්දියාවේ නඩු දාන කථාවක් නොවෙයි මම කිව්වේ. ලංකාවේ යම්කිසි පුරවැසියෙකුට එවැනි තත්ත්වයක් කරන්න පුළුවන්. ඉන්දියාවේ Constitution එකේ ඒ කාරණය ගැන සඳහන්ව තිබෙනවා. පැහැදිලිවම මම කිව්වේ මොකක්ද? Standing Orders 27(3) and 121 suspend කරන කොට පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා ඒ පිළිබඳව පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා ඒක ක්‍රියාත්මක කරන්න පුළුවන්. ඒක කරන්න හේතුව, දින පහක් Order Book එකේ මේ යෝජනාව තිබෙන්න ඕනෑ. මේක දින දෙකකින් කරන නිසා තමයි මේ දේ කරන්නේ. Public Finance Committee එකත් තවම පත් කරලා නැහැ. Public Finance Committee එක පත් කරලා නැති නිසා තමයි Standing Order 121 suspend කරලා මේක කළේ. මේ ගැන ඔබතුමන්ලාට ප්‍රශ්නයක් නැත්නම් අපටත් ප්‍රශ්නයක් නැහැ. මේ සම්බන්ධයෙන් අපේ අදහස් ඉදිරිපත් කිරීමයි කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. Appropriation Bill එකක් දෙසැම්බර් 31වනස දාට කලින් ඉදිරිපත් කරලා නැති අවස්ථාවකට තමයි මේ කරුණු අපි ඉදිරිපත් කළේ. Public Financial Management Act එක අනුව තමයි මේ කරුණු ඉදිරිපත් කළේ. මේ ගැන ඔබතුමන්ලාට ප්‍රශ්නයක් නැත්නම් අපටත් ප්‍රශ්නයක් නැහැ. මේ සම්බන්ධව අපේ අදහස් ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.23]

ගරු රෝහණ බණ්ඩාර මහතා
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නවවැනි පාර්ලිමේන්තුව නියෝජනය කරලා විශාල අභියෝගාත්මක මැතිවරණයකට අපට මුහුණ දෙන්න සිදුවීමෙන් පසුව, දසවැනි පාර්ලිමේන්තුවටත් මා තෝරා පත් කර එවන්නට අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාව විශාල සහයෝගයක් ලබා දුන්නා. ඒ සියලුදෙනාටම මේ අවස්ථාවේදී මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. අනුරාධපුර දිස්ත්‍රික්කයේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරු නවදෙනාගෙන් අටදෙනෙක්ම දේශපාලන කටයුතුවලින් බැහැර වෙන අවස්ථාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් නවවැනි පාර්ලිමේන්තුවේ හිටපු මන්ත්‍රීවරු අතරින් එකම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විධියට අද මේ පාර්ලිමේන්තුවට මා තෝරා පත් කර එවන්න ඒ ලබා දීපු ශක්තිය වෙනුවෙන් ඒ සියලුදෙනාටම නැවතත් මම ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම මැදවච්චිය, කලාවැව නැහෙනහිර ආසනය ඇතුළු අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආසන 7ම නියෝජනය කරන සියලුම ජනතාවට මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම පසුගිය ජනාධිපතිවරණය තුළදීත්, විශේෂයෙන්ම වසර 68ක් තිස්සේ අපට ජයග්‍රහණය කර ගන්න අපහසු වෙච්ච, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නිර්මාණය කරපු දවසේ ඉඳලා අපට ජයග්‍රහණය කර ගන්න බැරි වෙච්ච ආසනය තමයි මැදවච්චිය ආසනය. ඉතිහාසයේ පළමුවැනි වතාවට මැදවච්චිය ආසනය ජයග්‍රහණය කරවීමට ඒ ජනතාව සුවිශාල දායකත්වයක් අපට ලබා දුන්නා. ඒ ජනතාවටත්, නන් අයුරින් උදව් උපකාර කළ සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.

අපි නව ජනාධිපතිතුමාගේ රාජාසන කථාවටත් ඇහුම්කන් දුන්නා. රාජාසන කථාවක් ඉදිරිපත් නොකර පාර්ලිමේන්තුව විසුරුවා හැරපු පළමුවැනි අවස්ථාවටයි පසුගිය කාලයේ අපි මුහුණ

දුන්නේ. ජනාධිපතිවරණය අවසන් වෙලා පැය ගණනාවක් ඇතුළත පාර්ලිමේන්තුව විසුරුවා හැරලා, රාජාසන කථාවක්වත්, එතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයක්වත් ඉදිරිපත් නොකර මහ මැතිවරණයකට ගියා. ඊට පස්සේ අපි ජනාධිපතිතුමාගේ රාජාසන කථාවටත් ඇහුම්කන් දුන්නා. ඒ වාගේම අතුරු සම්මත ගිණුම පිළිබඳ යෝජනාවටත් මුහුණ දෙන වෙලාවේ තමයි අද අපට කථා කරන්න අවස්ථාව ලැබිලා තිබෙන්නේ. මේ කථා කරන අවස්ථාව ඉතිහාසයේ ලොකු වෙනසක් ඇති වෙච්ච අවස්ථාවක්. මේ රටේ ජනතාව ලොකු system change එකක් ඉල්ලා සිටියා; 2014 වර්ෂයේ සිට ලොකු system change එකක් බලාපොරොත්තු වුණා. ලොකු වෙනසක් ඉල්ලලා තමයි ජනතාව එදා ආණ්ඩු පැත්ත වෙනස් කරගෙන, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම් එක්සත් ජාතික පක්ෂයේ -අපේ- ශක්තියෙන් මේ රටේ ජනාධිපති කරලා, දෙගොල්ලන් එකතු කරලා මේ රට ගෙනයන්න පුළුවන් ද කියලා බැලුවේ. නමුත්, යම් යම් කණ්ඩායම්වල කඩාකප්පල්කාරී ක්‍රියා තුළ ඒකත් අසාර්ථක වුණා. ඒකත් අසාර්ථක වෙලා අවසානයේ විශාල බේදවාචකයකට මුහුණ දීලා, ජාතිවාදය මුල් කරගෙන 2019දී නැවත system change එකක් කරන්න කියලා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මේ රටේ ජනාධිපතිවරයා බවට පත් කරලා ලොකු වෙනසක් ඇති කළා. ඒ ජනාධිපතිවරණයේදීත් එතුමන්ලාට ඡන්ද හැටඅට ලක්ෂ ගණනක් ලැබුණා. තුනෙන් දෙකකට ආසන්න පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර සංඛ්‍යාවකුත් ලැබුණා. අවසානයේදී කොහොම හරි ගැට ගහලා තුනෙන් දෙකක් හදා ගන්නත් ඒ අයට අවස්ථාව ලැබුණා. එදා ඒ උදවිය ඡන්ද හැටඅට ලක්ෂයකට වැඩි ප්‍රමාණයක් ගන්නකොට දැන් ආණ්ඩුව කරන මෙතුමන්ලා සියයට තුනක ඡන්ද ප්‍රතිශතයකයි හිටියේ. අද වන විට පොහොට්ටුව සියයට තුනක ඡන්ද ප්‍රතිශතයකට වැටිලා, දැන් ආණ්ඩුව කරන මෙතුමන්ලා ඡන්ද හැටඅට ලක්ෂ ගණනක් ලබාගෙන තිබෙනවා. ඒ කියන්නේ, අද වන විට බොහොම පැහැදිලිව දෙපැත්ත මාරු වෙලා තිබෙනවා. තම තමන්ගේ කෙරුවාවල් මේ සියල්ලටම බලපාලා තිබෙනවා.

අපේ රටේ සිදු වූ මේ සියල්ල අතරේ, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආ නවක මන්ත්‍රීවරුන් විධියට අපිත් විශාල අභියෝග ගණනාවකට මුහුණ දුන්නා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225දෙනාම එක ගොඩකට දාලා, මේ පැත්තෙන් ඇති කරපු මතවාදය තුළ අපිත් ඒකේ හෙංචියෝ බවට පත් වුණා. අපිත් ඒ ශාපලත් පුද්ගලයන් බවට පත් වුණා. හැබැයි, එදා මම පාර්ලිමේන්තුවට පළමුවැනි වතාවට පැමිණි මන්ත්‍රීවරයෙකු විධියට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ රජයෙන් ගෙනාපු ඒ සියලු යෝජනාවලට, මේ රට වටිටන්න කරපු කටයුතු සියල්ලටම විරුද්ධව කථා කළා විතරක් නොවෙයි, ඒවාට විරුද්ධව ඡන්දය දුන්නා විතරක් නොවෙයි, ඒ වෙනුවෙන් හඬ නඟන්න පුළුවන් හැම අවස්ථාවක් වෙනුවෙන්ම හඬ නැඟුවා. එදා අපි කථා කරපු ඒ කිසිදේකට ඇහුම්කන් නොදුන්නේ, ඒ කිසි දෙයක් ශත පහකටවත් ගණන් නොගන්න හේතුව බවට පත් වුණේ අතිවිශාල බලයක් ආණ්ඩුව පැත්තේ තිබීමයි. එදා අපි මේ සභාවේ කථා කරනකොට අපේ පිටුපස ආසනවල හිටියේත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු. ඒ මන්ත්‍රීවරු අපට එදා කථා කරන්න ඉඩක් දුන්නේ නැහැ. මේ සභාවේ ඉස්සරහ පැත්තේ සිටි අයට විතරක් නොවෙයි, මේ සභාවේ අපට පිටුපසින් සිටි අයටත් එදා අපට උත්තර දෙන්න වුණා. ඒ වාගේ බලයක් ලැබුණු එකේ ප්‍රතිඵලය විධියට තමයි අවසානයේ මිනිසුන්ගේ ප්‍රහාරවලට පවා ලක් වෙලා අද පාර්ලිමේන්තුවෙන් අතුගෑවිලා යන තත්ත්වයට ඒ පක්ෂය පත් වුණේ.

අද මේ පාර්ලිමේන්තුවේ මේ කාලසීමාව තුළ සිදු කරන කථා අහගෙන ඉන්නකොටත් නැවත මගේ කන් පිරෙන්නේ ඒ පරණ කථාවලින්මයි. නවක මන්ත්‍රීවරුන් විධියට මේ පාර්ලිමේන්තුවට අද බොහෝදෙනෙක් ඇවිල්ලා ඉන්නවා. මම හිතන විධියට මේ නවක මන්ත්‍රීවරුන් පසුගිය කාලයේ පාර්ලිමේන්තු විවාදයකටවත් ඇහුම්කන් නොදීපු පිරිස් වෙන්න පුළුවන්. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන බොහොමයක් නවක මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ ගැලරියටවත් ඇවිල්ලා මේ සභාව නොදැකපු පිරිසක් වෙන්න ඇති. ඒ අයත් අද කථා කරන්නේ පසුගිය ගෝඨාභය රාජපක්ෂ රජයේ කථාමයි. මේ අය බොහොම උද්දාමයට පත්වෙලා කථා කරන හඬ අපට ඇහෙනවා. ඔබතුමන්ලා "ඇබා" සංගීතයට ඇහුම්කන් දෙන පිරිස විධියට මේ කාරණයත් මතක තියාගන්න. ඔබතුමන්ලාගේ හඳවතේ ගායිකාවක් හිටියා, නන්දා මාලනී කියලා. කාලයක් ඔබතුමන්ලාගේ ජාතික ගීත බවට පත්වෙලා තිබුණේ එතුමිය ගායනා කළ ගීත. එතුමිය ගායනා කරපු බොහොම හොඳ ගීතයක් තිබෙනවා.

එම ගීතයෙන් කොටසක් මම කියන්නම්.

"පූජාසනයේ ඔබ හිඳුවා
ඔබට පුදන මේ ලෝකයමයි හෙට
ඔබට එරෙහි වී නැඟිටින්නේ..."

ඒ නිසා ඒක හොඳට මතක තියාගෙන කථා කළොත් හොඳයි. වසර හැට ගණනක් තිස්සේ ඔබතුමන්ලා ප්‍රාර්ථනා කරපු සිහිනයට, ඔබතුමන්ලා බලාපොරොත්තු වෙච්ච ඉලක්කයට යන්න අද ඔබතුමන්ලාට අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ ඉලක්කය සාර්ථක කර ගැනීමේදී ඔබතුමන්ලාම විවේචනය කරන කරුණු කාරණා ගණනාවක් මේ රට තුළ ඔබතුමන්ලා විසින් ඇති කර තිබෙනවා. ඒවා අතීතයේ දේවල් වෙන්න පුළුවන්. මට පිටුපසින් ඉන්න නුවරින් පාර්ලිමේන්තුවට ආපු මන්ත්‍රීතුමාගේ කථාවට ඇහුම්කන් දීලායි මම මේ කථා කරන්නේ. කර්මාන්තශාලා විනාශ කළා, ඒවා වැටිටුවා කියලා එතුමා කිව්වා. හැබැයි, ඒ ඉතිහාසය හාරවුස්සන්න අපි කැමති නැහැ.

කර්මාන්තශාලා ගැන කථා කරනකොට මම මේ කාරණයත් කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියෝජනය කරන නුවර ප්‍රදේශයෙන් එහාට ගිහිල්ලා නුවරඑළිය පැත්තට පොඩ්ඩක් ගොඩ වුණා නම් පෙනෙයි, ගිනිබත් වෙච්ච කර්මාන්තශාලා කොච්චරක් තිබෙනවාද කියලා. කමක් නැහැ, අපි ඒ අතීතය වළ දමමු. මේ රටේ ජනතාව ඉල්ලන system change එකට අපි ඇහුම්කන් දෙමු. ඒක ගැන අවධානය යොමු කරමු. ඔබතුමන්ලාට තිබෙන්නේ කියපු කාරණා තුළ ඉස්සරහට යන්නයි. ඒ නිසා කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් අපි ප්‍රාර්ථනා කරන්නේ යහපතක්. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයෙන් කියනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියලා. ඒක බොහොම හොඳ කරුණක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු අරවින්ද සෙනරත් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමිය [ගරු හේමාලි වීරසේකර මහත්මිය] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு அரவிந்த சேனரத் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. ARAVINDA SENARATH left the Chair and DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] took the Chair.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(*மாண்புமிகு ரோஹண பண்டார*)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට කථා කරගෙන ආපු කාරණයත් අමතක වුණා. *[බාධා කිරීමක්]* සින්දු ගායනා කරන්නත් පුළුවන්, කියන්නත් පුළුවන්, කවි කරන්නත් පුළුවන්. ඒ ගැන ගැටලුවක් නැහැ. සින්දු ගැන නොවෙයි, ඔබතුමන්ලාගේ මේ ගමන් මඟ ගැන තමයි අපට කියන්න අවශ්‍යතාව තිබෙන්නේ. ඔබතුමන්ලා අවුරුදු හැට ගණනක් තිස්සේ මේ ප්‍රාර්ථනාව කරගෙන ඇවිල්ලා, අද ඒක ඉෂ්ට වෙලා තිබෙනවා නේ. අපි ඒකට සහයෝගය දෙන්න ඕනෑ කැමැත්තෙන් හෝ අකැමැත්තෙන් නොවෙයි. මේ අපි ඔක්කෝම ජීවත් වෙන්න ආසා කරන රට. මේ රට ගොඩනැඟෙනවා නම් ඒකට ඔබතුමන්ලාට දෙන්න පුළුවන් උපරිම සහයෝගය අපි ලබා දෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු හැටියට අපි, ඔබතුමන්ලා නියෝජනය කරපු ඒ කාලකණ්ණි තැන ඉන්න සූදානම් නැහැ. ඔබතුමන්ලා මේ රටේ උද්ඝෝෂණ ඇති කර කර, වෛරය වපුර වපුර මේ රටේ ආර්ථිකය වෙනුවෙන් කරපු දේවල් අපි මතක් කරන්න ඕනෑ නැහැ. අපි එහෙම කරන්නේ නැහැ. හොඳ දෙයට හොඳයි කියන්නත්, නරක දෙයට නරකයි කියන්නත් අපි සූදානම්. හොඳ දේ වෙනුවෙන් පෙනී සිටින්නත්, ජනතාව වෙනුවෙන් ඔබතුමන්ලා ඒ කථා කරපු, ප්‍රාර්ථනා කරපු, ඔබතුමන්ලාගේ වේදිකාවේ ගිගුම් දුන්නු, ඔබතුමන්ලා නැවතත් මෙතැන කථා කරන කාරණාවලට සහයෝගය දෙන්නත් අපි සූදානම්. මේ කථා අපි හොඳට අහලා තිබෙනවා.

මේ පාර්ලිමේන්තුවට අය වැය ගණනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. මම පසුගිය පාර්ලිමේන්තුවේ ඉන්නකොට රාජාසන කථා ගණනාවකට ඇහුම්කන් දුන්නා. ඒ, එකකවත් ප්‍රතික්ෂේප කළ හැකි කරුණු තිබුණේ නැහැ. ඒ හැමකෙනාගේම ලොකු සිහිනයක් තමයි අළෙවි කළේ මෙතැනට ඇවිල්ලා. හැබැයි, ඒ සිහිනය සැබෑ කරවන්න කටයුතු කළේ නැහැ. ඒකයි මේ රට මේ තත්ත්වයට පත් වුණේ. ඒ සිහිනය සැබෑ කරවීම වෙනුවෙන් ඔබතුමන්ලා කැප වෙනවා නම්, විපක්ෂ නායකතුමා ප්‍රමුඛ සමගි ජන බලවේගය ඒ වෙනුවෙන් අපේ පූර්ණ සහයෝගය ලබා දෙන්න සූදානම්. ඒක කරන්නේ කොයිම මොහොතකවත් උද්ඝෝෂණ, වැඩ වර්ජන කරලා, මේ සභාව මැද්දට පැනලා මේ කටයුතු කඩාකප්පල් කරලා නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(*மாண்புமிகு ரோஹண பண்டார*)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඔබතුමිය මූලාසනයට පැමිණීමේදී ගත වුණු වෙලාවත් මට ලබා දෙන්න.

මේ රටේ ජනතාවගේ සිහිනය ඉෂ්ට කිරීම වෙනුවෙන් අපේ උපරිම සහයෝගය ලබා දෙන්නත්, ඒවා විනාශ කරනවා නම්, ඒවායින් පිට යනවා නම් ඒවා වෙනස් කරන්නත් අපි සූදානම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ඔබතුමන්ලා පසුගිය කාලයේ කථා කළා, රාජපක්ෂ සමාගමක් ගැන. රාජපක්ෂ සමාගම ගැන තමයි එදා ඔබතුමන්ලා කථා කළේ. රාජපක්ෂ සමාගමට තමයි මේ රටේ අය වැයෙන් සියයට 60ක් වෙන් වුණේ කිව්වා. හැබැයි, ඒ වාගේම අද අපට පේනවා, පැලවත්ත සහෝදර සමාගම. එදා රාජපක්ෂ පවුලේ සමාගම ගැනයි කථා කළේ. හැබැයි, අද පැලවත්තේ තිබෙන්නේ ජාතික ජන බලවේගයේ සහෝදර සමාගමද කියලාත් අපට හිතෙනවා. මේ අය වැයෙනුත් සියයට 60ක් වෙන් වෙලා තිබෙන්නේ අමාත්‍යවරු 6දෙනෙක් අතරේ විතරයි. සියයට 60කට ආසන්න මුදලක් අමාත්‍යවරු 6දෙනෙක් වෙනුවෙන් වෙන් වෙලා තිබෙනවා. අනෙක් සියලුදෙනාම මේ සහෝදර සමාගමේ නිලධාරි මණ්ඩලයද කියලා අපට සැකයක් තිබෙනවා. ඒ අය වාහනයෙන් ගේනවා; ඇරලනවා. ආපහු උදේට ගෙන්වනවා. එච්චරද ඔබතුමන්ලාගේ ඩියුටිය? ඔය වාගේම තමයි අනෙක් මන්ත්‍රීවරුත් එදා කථා කළේ. අපි කියන කථාවලට එරෙහිව නැඟිටලා අප විවේචනය කළා; අපට ගහන්න පැන්නා; විවිධ දේවල් කළා. ඒ, ඔය කණ්ඩායම තමයි. හැබැයි, පාලනය තිබුණේ රාජපක්ෂ පවුලේ සමාගම අතරේ. අද ඒක මේ පැලවත්ත සහෝදර සමාගම අතට පත් වෙලා තිබෙනවාද කියන වෙනස විතරයි,-

ගරු සුජීව දිසානායක මහතා
(*மாண்புமிகு சுஜீவ திசாநாயக்க*)
(The Hon. Sujeewa Dissanayake)
Sir, I rise to a point of Order.

ගරු රෝහණ බණ්ඩාර මහතා
(*மாண்புமிகு ரோஹண பண்டார*)
(The Hon. Rohana Bandara)

එතැන point of Order එකක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මට කථාව අවසන් කරන්න දෙන්න. ඕනෑ නම් මගේ කථාවෙන් පස්සේ කියන දෙයක් කියන්න.

එහෙම තැනකට යන්නේ නැතුව මේ කටයුත්ත කරන්න කියන කාරණය තමයි අපට කියන්න තිබෙන්නේ. ඒ වාගේම මම ජනාධිපතිතුමාගෙන්,- *[බාධා කිරීමක්]* ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට බාධා කරන්න දෙන්න එපා. ගරු මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. මට කථාව කරගෙන යන්න දෙන්න.

ජනාධිපතිතුමාගේ රාජාසන කථාව තුළ මම බොහොම ඇගැයීමට ලක් කරන, එතුමාගේ කථාවේ ආසා හිතෙන තැනක් තමයි ඩිජිටල් ආර්ථිකයක් ගැන කියපු කොටස. විද්‍යාව හා තාක්ෂණයට වෙනම අමාත්‍යාංශයක් වෙන් කරලා තිබෙනවා කියලා එතුමා කිව්වා. ඒ සඳහා වෙනම විද්‍යාඥයෝ ගෙන්වන්න තිබෙනවාය කිව්වා. ඒ පිළිබඳ වැඩිම අවධානයක් තිබෙන නැත්නම් ඒ පිළිබඳ අවබෝධයක් තිබෙන අයට ඒ අමාත්‍යාංශය දීලා තිබෙනවාය කිව්වා. හැබැයි, අනෙක් අමාත්‍යාංශත් එක්ක ගත්තාම ඒ අමාත්‍යාංශයට -විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශයට- වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 1.7යි. ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන්නේ රුපියල් බිලියන 3.7යි.

මේ මුදල් ප්‍රමාණය තමයි අපේ ජනාධිපතිතුමා ප්‍රාර්ථනා කරපු, ලංකාවේ ලොකුම change එකක් කරන්නට කථා කරපු, විද්‍යා හා තාක්ෂණය තුළ ඉස්සරහට ගෙනියනවා කියපු ඩිජිටල් ආර්ථිකයට වෙන් කරලා තිබෙන්නේ. මේ වාගේම තමයි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් කථා කළේ. මේ වාගේම තමයි රනිල් වික්‍රමසිංහ මැතිතුමාත් රාජාසන කථා, අය වැය ඉදිරිපත් කරනකොට හැම වෙලාවේදීම කථා කළේ. ඒ අතීතය අමතක කරලා මේ කියන කතන්දර මේ රටේ යථාවක් බවට පත් කරන්න ඔබ සියලුදෙනාට ශක්තිය, ධෛර්යය ලැබෙන්න කියා ප්‍රාර්ථනා කරමින්, දසවන පාර්ලිමේන්තුව නියෝජනය කරමින් පත් වෙච්ච ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමියටත්, සියලුම අමාත්‍යවරුන්ටත්, සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත් මගේ ශුභාශිංසන එක් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(*மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்*)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.33]

ගරු රත්න ගමගේ මහතා (ධීවර, ජලජ සහ සාගර සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரத்ன கமகே - கடற்றொழில், நீரியல் மற்றும் கடல் வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Rathna Gamage - Deputy Minister of Fisheries, Aquatic and Ocean Resources)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ පාර්ලිමේන්තුවේ පළමුවෙන්ම කථා කිරීමට පෙර මගේ යුතුකමක්, වගකීමක් කියලා මම විශ්වාස කරනවා, පාර්ලිමේන්තුවට මාව තෝරා පත් කර එවූ ගාල්ල දිස්ත්‍රික් ජනතාවටත්, ඒ වෙනුවෙන් ඡන්දය ලබා දුන්, ඒ වෙනුවෙන් මැදිහත් වුණු සමස්ත ජනතාවටත් මගේ ගෞරව ප්‍රණාමය හා ස්තුතිය පළ කිරීම. විශේෂයෙන්ම අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කළ අද දවසේ, අපි කථා බහ කරනකොට මුල සිටම තිබුණේ එයට බාධා කිරීම්. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ පාර්ලිමේන්තුවේ හිටපු කළ පුරුද්ද දත්, පළපුරුද්ද දත් මන්ත්‍රීවරු මීට වඩා පරිණත විධියට හැසිරෙයි කියලා.

අය වැයක් ඉදිරිපත් කිරීමට පෙර අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කළ පළමු අවස්ථාව මෙය නොවෙයි. මේක ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ 1931 සිට 1947 දක්වාත් තිබුණා. 1947 ඉඳලා 1971 දක්වාත් තිබුණා, සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ. 1972 ඉඳලා පළමු ජනරජ ව්‍යවස්ථාවේත් තිබුණා. 1978 ඉඳලා දෙවන ජනරජ ව්‍යවස්ථාවේත් තිබුණා. අතුරු සම්මත ගිණුමක් කියන්නේ මොකක්ද කියා දන්නේ නැති මන්ත්‍රීතුමන්ලා මේ අතුරු සම්මත ගිණුම ඉදිරිපත් කළ වෙලාවේ ඉඳලාම ඒකට බාල්දි පෙරළන්නමයි හදන්නේ.

මීට පෙර කථා කළ මන්ත්‍රීතුමාත් කිව්වා, මේක අය වැයක් කියලා. මේක අය වැයක්ද? ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමනි, මේක අහගන්න. අනුර දිසානායක සහෝදරයාගේ පවුලේ සහෝදරවරු හයදෙනෙක් ඉන්නවා කිව්වා. මම දන්නේ නැහැ, උප්පැන්න හොයලා දුන්නේ කවුද කියලා. මේ ගරු සභාව සම්පූර්ණයෙන්ම නොමඟ යැව්වා, මේක අය වැයක් කියලා. අතුරු සම්මත ගිණුමක් තමයි ඉදිරිපත් කළේ. ඉස්සෙල්ලාම තමන් ඉන්න තැන හරිහැටි දැනගෙන කථා කරන්න ඕනෑ. නිකම් බොරුවට බෙරිහන් දීලා වැඩක් නැහැ. මේක අය වැයක් නොවෙයි, අතුරු සම්මත ගිණුමක්. හරි හතරමුල්ල දැනගෙන කථා කරන්න. තොරතුරු දැනගෙන කථා කරන්න.

ඒ විධියට කථා කරපු තව එක්කෙනෙක් තමයි කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා. එතුමා කෝ? අසත්‍ය කිව්වා, ගියා. අනුර කුමාර දිසානායක සහෝදරයාගේ -ජනාධිපතිතුමාගේ- උපදේශකවරු වෙනුවෙන් බිලියන 320ක් වෙන් කර තිබෙනවාය කිව්වා. කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට අභියෝග කරනවා, පුළුවන් නම් ඒක ඔප්පු කරන්න කියලා. මොකද, bet කරනවාද මන්ත්‍රීකම? පුළුවන් නම් ඔබතුමා එය ඔප්පු කරන්න. එතුමා කෝ? අසත්‍ය කියලා මාරු වෙලා. අසත්‍ය කිව්වාට පස්සේ ඉන්න බැහැ. උන්හිටි තැන් අහිමි වෙනවා. එතුමා දැන් සභා ගර්භයේ -Chamber එකේ- නැහැ. කොහේට හරි වෙලා තේ බොනවා ඇති. කරුණාකර මේ ගරු සභාවට ඇවිල්ලා මේකට උත්තරයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අතුරු සම්මත ගිණුම පිළිබඳව කථා කරන මේ අවස්ථාවේදී හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමාත් කථා කරලා යන්න ගියා. එතුමා කිව්වා, ජනාධිපතිතුමා ධීවර ප්‍රජාවට මුදලක් වෙන් කළා කියලා. මම ධීවර ප්‍රජාව ගැන කථා කරන්නයි හිටියේ. ධීවර ප්‍රජාවට වෙන් කරපු මුදලින් කුඩා බෝට්ටු සඳහා මුදල් වෙන් කරලා නැහැ කිව්වා. හරියට දැනගෙන කථා කරන්න. ජනාධිපතිතුමා දිවුරුම් දීලා දින 10යි ගත වුණේ. දින 10ක් ගත වනකොට වගා කරන සෑම කුඹුරු හෙක්ටෙයාරයක් වෙනුවෙන් මේ රටේ ගොවි ජනතාවට රුපියල් 25,000ක සහනාධාරයක් ලබා දුන්නා. ජනාධිපතිතුමා දිවුරුම් දීලා දින 10යි ගත වුණේ. ධීවරයින්ට දුන්නා, ඉන්ධන සහනාධාරයක්. බහුදින ධීවර යාත්‍රාවක් සඳහා සෑම ඩීසල් ලීටරයකටම රුපියල් 25යි. ලීටර් 4,000ක් ගැහුවොත් රුපියල් ලක්ෂයයි. 12,000ක උපරිමයකට යටත්ව, රුපියල් ලක්ෂ 3යි. ඒගොල්ලන්ගේ ආණ්ඩුවලින් මෙවැනි සහන දුන්නාද? ඒ වාගේම කුඩා යාත්‍රාවකට දවසකට ලීටර් 15කට යටත්ව රුපියල් 25 බැගින් රුපියල් 375යි. දින 25යි, රුපියල් 9,375යි.

දිනපතා බිල් ගෙවන්න අපහසු නිසා අපේ රාමලිංගම් චන්ද්‍රසේකර් ඇමතිතුමා Cabinet Paper එකක් ඉදිරිපත් කරලා, ධීවර පරීක්ෂකගේ අනුමැතිය යටතේ මාසයකට සැරයක් ගෙවන්න අවසරයක් ගත්තා. හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා කෙළ පැමිණෙන්න පාර්ලිමේන්තුවේ හිටියාය කිව්වා නේ. කෝ, මේවා හොයා බලලාද කථා කරන්නේ? අපි නවකයි නේ. අපි නම් හොයා බලලා කථා කරන්නේ. කෙළ පැමිණෙන්න හිටියත්, කෙස් පැහුණත්, හරියට නොවෙයි කෙස් පැහිලා තිබෙන්නේ. ඒ නිසා ප්‍රශ්න කරලා සභා ගැබෙන් - Chamber එකෙන් - යන්න එපා, ඉන්න, අපි උත්තර දෙන්නම්. අපි නවක තමයි. හැබැයි, දේශපාලනයට නවක නැහැ. ඒක මතක තියා ගන්න. අපිත් දශක ගණනක් දේශපාලනය කරලා තමයි මෙතැනට ආවේ. ඒ නිසා මතක තියා ගන්න, හරිහමන් තොරතුරු දැනගෙන පාර්ලිමේන්තුවේ කථා කරන්න. නැත්නම් ඉතින් කරුණාකරලා ගෙදරට වෙලා ඉන්න. එච්චරයි අපි කියන්නේ.

මේ අතුරු සම්මත ගිණුම හරහා අපේ වත්මන් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ඉදිරි මාස හතර තුළ මේ රටේ නිෂ්පාදන ආර්ථිකය ගොඩනඟන පැහැදිලි වැඩ පිළිවෙළකට ඇවිල්ලා තිබෙනවා. අපි දන්නවා, ගැටලු තිබෙන්න පුළුවන්. හැබැයි, මාස හතරක කාලයක් සඳහා මේ ඉදිරිපත් කළ අතුරු සම්මත ගිණුම මේ රට වෙනුවෙන් යමක් කරන්න පුළුවන් අතුරු සම්මත ගිණුමක්ය කියලා මා විශ්වාස කරනවා. ඒ වාගේම ජනාධිපතිතුමාගේ-

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කවින්ද ජයවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මම සභාවේ නොසිටි අවස්ථාවේදී මෙතුමා මගේ නම කියලා එක දිගටම චෝදනා කළා. මෙතුමා කියලා තිබෙනවා, මම කැන්ටීමේ තේ බොනවාය කියලා. මම පැහැදිලිව කියන්න ඕනෑ, මෙතුමන්ලා වාගේ අපි කවදාවත් පාර්ලිමේන්තුවෙන් කන්නේ බොන්නේ නැහැ, පාර්ලිමේන්තුවෙන් දෙන ගෙවල් ගන්නේ නැහැ, වරදාන වරප්‍රසාද ලබා ගන්නේ නැහැ කියලා. අපි බඩ පැලෙනකල් පාර්ලිමේන්තුවේ කැන්ටීමෙන් කකා ඉන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ඉන්න ඉතින්, මට කියන්න දෙන්න. මේක මාර වැඩක් නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මට චෝදනාවක් කළාම ඒ චෝදනාවට උත්තර දෙන්න මට අවස්ථාව දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. චෝදනා කළා නේ, මම කැන්ටීමේ තේ බොනවාය කියලා. මම අහනවා, එතුමා කැන්ටීමෙන් කන්නේ නැද්ද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඉක්මනින් අහන්න. කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
මම කිව්වේ නැහැ, මේක අය වැයක් කියලා. අතුරු සම්මත ගිණුමක් කියන එකයි කිව්වේ. *[බාධා කිරීමක්]* මේ චණ්ඩි පාට්වලට නම් අපි බය නැහැ. පාර්ලිමේන්තුව කියන උත්තරීතර ආයතනය ආරක්ෂා කරන්නයි අපි ඇවිල්ලා ඉන්නේ. ඒ නිසා නිකම් බොරුවට චෝදනා කරන්න එපා. චෝදනාවක් තිබෙනවා නම් ඉන්න තැන මුහුණටම ඒ චෝදනාව කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමා නිශ්චිතව ඉදිරිපත් කළ කරුණ වුණේ මේකයි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාගේ කථාවේදී කිව්වා, ජනාධිපති අනුර දිසානායක මැතිතුමා උපදේශකයන් සඳහා රුපියල් මිලියන 320ක් වෙන් කරලා තිබෙනවාය කියලා. අන්න ඒක පැහැදිලි කරන්න කියලායි එතුමා ඉල්ලා සිටින්නේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
අපේ සභානායකතුමා වාගේ අන්න එහෙම බොහොම වැදගත් විධියට කිව්වා නම්, අපි වැදගත් විධියට උත්තර දෙනවා. මගේ කථාවේදී මම මොකක්ද කිව්වේ? *[බාධා කිරීමක්]* මම බොහොම වැදගත් විධියට කිව්වේ මොකක්ද? මම කිව්වේ මේකයි. අපේ කබීර් හෂීම් මන්ත්‍රීතුමා අද උදේ කරපු ප්‍රකාශයේ තිබෙනවා, රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිතුමාට මාස හතරකට වෙන් කරලා තිබෙන මුදලත්, අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාට වෙන් කරලා තිබෙන මුදලත් එක හා සමානයි කියලායි. රනිල් වික්‍රමසිංහ මහත්මයා හෙලිකොප්ටර් භාවිත කළා, ඒ වාගේම වාහන හතර පහකින් ගියා, වෙඩි නොවදින වාහනවල ගියා, ඒ වාගේම උපදේශකවරු පාවිච්චි කළා, ඒ උපදේශකවරුන්ට රුපියල් මිලියන 300කට ආසන්න ප්‍රමාණයක් ගෙවලා තිබෙනවා, එවැනි වියදමක් මේ ජනාධිපතිතුමා කරන්නේ නැත්නම්, මේ මුදල් මොනවාට ද වියදම් කරන්නේ කියලායි ඇහුවේ. ඉතින් ඒකෙන් එතුමාට චෝදනාවක් කළේ නැහැ නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු මන්ත්‍රීතුමනි, අපට මේ වචනත් තේරෙනවා, වචන අතරත් තේරෙනවා. ඔබතුමා දැන් නිශ්චිතව කියන්න, රුපියල් මිලියන 320ක් උපදේශකයාට වෙන් කළාය කියලා ඔබතුමා කිව්වේ, ජනාධිපති අනුර දිසානායකද, හිටපු ජනාධිපති රනිල් වික්‍රමසිංහද?

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු සභානායකතුමනි, ඔබතුමාට පුළුවන් නේ හැන්සාඩ් වාර්තාව අරගෙන ඒක බලන්න. ඔබතුමා හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, ඔබතුමා දැන් කියන්නකෝ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ, ඔබතුමා දැන් කියන්න. මොකද දන්නවාද, එතුමා-

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න, හැන්සාඩ් වාර්තාව තවම මුද්‍රණය කරලා නැහැ නේ. ඇයි, ප්‍රශ්නය මඟ හරින්න හදන්නේ? *[බාධා කිරීමක්]* තාක්ෂණය දියුණු වුණාට මිනිස්සු- *[බාධා කිරීමක්]* එහෙම නොවෙයි.

ගරු මන්ත්‍රීතුමා, ලොකු කාලයක් අවශ්‍ය නැහැ. අපි දැනගන්න කැමැතියි, අපේ ජනාධිපතිතුමා මිලියන 320ක් උපදේශකයන්ට වෙන් කරලා තිබෙනවාද කියලා. නැතිනම් කවුද ඒ ජනාධිපති කියලා කියන්න. හැන්සාඩ් බලන්නයි, වීඩියෝ බලන්නයි ඕනෑ නැහැ. ඔබතුමා දැන් සභාවේ ඉන්නවා නේ. ඔබතුමා සභාවේ නැත්නම් අපි බලනවා තමයි. දැන් live කියන්න.

එතුමාට මයික් එක දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අපෙන් වෙලාවත් දෙන්න එතුමාට.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, එතුමන්ලාට මගේ කථාව live stream කරලා බලන්න පුළුවන්. මම පැහැදිලව කියපු කාරණය ඒකේ තිබෙනවා නේ. *[බාධා කිරීමක්]* මම කියපු තැන- *[බාධා කිරීමක්] No, Hon. Deputy Chairperson of Committees, let me explain - [Interruption.]*

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
අපට ලොකු වේලාවක් නැහැ. "Let me explain" නොවෙයි, ඔබතුමාට මයික් එක දෙනවා නේ. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ එක දෙයයි. ඔබතුමා මේ සභාවේදී කිව්වා ජනාධිපතිවරයා මිලියන 320ක් උපදේශකයන්ට ගන්නවා කියලා. අන්න ඒ ජනාධිපති කවුද කියලා කියන්න; එච්චරයි. ආයේ කථා බලන්න ඕනෑ නැහැ, ඔබතුමා සභාවේ ඉන්නවා නේ. ඒ නිසා වැල්වටාරම් ඕනෑ නැහැ, දැන් to the point කියන්න.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Madam, what I said was that the Hon. Kabir Hashim, in his speech, very clearly said that there is no difference between the Hon. Ranil Wickremesinghe, former President and - *[Interruption.]*

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපට මේකට කාලය නාස්ති කරන්න බැහැ. අපි නිසි ගෞරව ඇතිව ගරු මන්ත්‍රීතුමාගෙන් ඉල්ලා සිටින්නේ, දැන් ප්‍රශ්නය හරියටම තිබෙන තැන පැහැදිලියි. ඔබතුමා කියන්න,- *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. ඔක්කෝම කථාව ඕනෑ නැහැ. හරිම පැහැදිලියි තැන, නිශ්චිත තැන පැහැදිලියි. *[බාධා කිරීමක්]* නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
This is his time.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
No, no. His time නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ අපේ වේලාව. එතුමා කථා කරලා එළියට ගියා. *[බාධා කිරීමක්]* දැන් තිබෙන කාරණය හරි නිශ්චිතයි. අපි ආණ්ඩු පක්ෂයෙන් කාලය දෙනවා. හැබැයි, වැල්වටාරම් නැතිව උත්තර දෙන්න. අපි එක ප්‍රශ්නයයි අහන්නේ. ඒකට කෙළින් කියන්න, මොකක්ද? ඔබතුමා කිව්ව විධියට රුපියල් මිලියන 320ක් උපදේශකයන්ට පාවිච්චි කරලා තිබෙන්නේ රනිල් වික්‍රමසිංහ හිටපු ජනාධිපතිවරයාද, නැත්නම් අනුර දිසානායක ජනාධිපතිවරයාද? ඒක කෙළින් කියන්න. ඒක කියන්න බැරි නම්, ඒකත් බැහැ කියලා කියන්න. ඒ සඳහායි ඔබතුමාට අපේ පැත්තෙන් වේලාව දෙන්නේ.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Madam, I have been asked a question and let me explain.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
Why are you changing the language?

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
Why can I not speak in the language I want?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
You said that in Sinhala.

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr.) Kavinda Heshan Jayawardhana)
හරි හරි, මම සිංහලෙන් කථා කරන්නම්. හරි, සමාවෙන්න මම සිංහලෙන් කථා කරන්නම්. *[බාධා කිරීමක්]* Okay, my apologies! I will speak in Sinhala.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මෙහෙමයි. මම මගේ කථාවේදී බොහොම වැදගත් විධියට කිව්වා අපේ ගරු කබීර් හෂීම් මැතිතුමා කළ ප්‍රකාශය අනුව අතිගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමාගේත්, රනිල් වික්‍රමසිංහ මහත්තයාගේත් අය වැයේ වෙනසක් නැහැ, එකමයි කියලා. එතකොට මම කිව්වේ ඒ තිබෙන කාරණා. ඒක එයාද වෙන් කළේ, මෙයාද වෙන් කළේ කියලා මම කිව්වේ නැහැ. ඒක කරුණාකරලා හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න, ඒ වාගේ දේවලටද වියදම් කරන්නේ කියන කාරණය. ඒකට මාව මරාගෙන කාලා හරියන්නේ නැහැ. මම කරුණක් පැහැදිලි කරලා දුන්නේ. කරුණක් පැහැදිලි කරන්න, පාර්ලිමේන්තුවේදී මගේ අදහස් දක්වන්න මට අවස්ථාවක් දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
හොඳයි. ඔබතුමා අපට යෝජනා කරන්නේ හැන්සාඩ් වාර්තාව බලන්න කියලා නේ.

[ගරු බිමල් රත්නායක මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි හැන්සාඩ් වාර්තාව බලන්නම්. අපි අපේ රටේ චූටි දරුවන්ට කියන්න කැමැතියි, කිතුල් ගහට නැඟපු මිනිස්සු අපි දැකලා නැහැ නේ. කිතුල් ගහට නැඟපු මිනිහෙක් බලා ගන්න නම්, - දැන් වේලාව ප.ව. 4.45යි - 4.45ට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මේ වීඩියෝ එක බලන්න, කිතුල් ගහට නැඟලා බොරු කියපු මිනිහෙක් බලන්න. *[බාධා කිරීම්]*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු රත්න ගමගේ නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ කාලය ලබා දෙන්න.

විශේෂයෙන්ම අතුරු සම්මතට ගිණුමට අදාළ ප්‍රස්තුතයට මම එන්නම්. ගරු ජනාධිපතිතුමා මේ සභාවට ඉදිරිපත් කළ රාජාසන කථාවේදී බොහොම පැහැදිලිව පුන පුනා කියා සිටියා මේ රටේ ජාතික ආර්ථිකය ගොඩ නැඟීම, ඒ වාගේම ජාතික ආර්ථිකයට මේ රටේ මහ ජනතාවගේ සහභාගිත්වය, ඒ ජාතික ආර්ථිකයේ ප්‍රතිලාභ ජනතාවට සාධාරණව බෙදී යාමේ ක්‍රමවේදය තුළ විශේෂයෙන් මේ රටේ ගොවි ජනතාව, ධීවර ජනතාව, කර්මාන්තකරුවන් නහා සිටුවීම පිළිබඳව.

මේ අවස්ථාවේ මා විශේෂයෙන්ම මේ කාරණයත් කියනවා. අද දවස වන විට, ජනාධිපතිතුමාගේ රාජාසන කථාවත් කරලා ඉවරයි. ඒ අනුව මේ රට තුළ කිසියම් දෙයක් කරන මේ වෙලාවේ සමහරෙකුට අර ගලේ පැහැරුවා වාගේ තමයි ඉන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අප කියන්නේ, කිසියම් සාධාරණ විවේචනයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න. ජනාධිපතිතුමා සම්බන්ධයෙන් සාධාරණ විවේචනයක් තිබෙනවා නම්, ඒ විවේචනය පිළිගන්න අපි සූදානම්. අගමැතිතුමිය සම්බන්ධයෙන් වන සාධාරණ විවේචනත් පිළිගන්න අපි සූදානම්. එහෙම නැතුව මෙතැන අසභ්‍ය කියලා, සභාව නොමඟ යවලා අන්තිමට ගලේ පැහැරුවා වාගේ ඉන්නවා. ඒක හරිම දුකයි අප්පා! ඒක කනගාටුවට කරුණක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මගේ මංගල කථාවේදී මට පොඩි වේදනාවක් ආවා මේ සිද්ධියත් එක්ක. මොකද, කියපු දේට නොවෙයි උත්තර ලැබුණේ. මම ගැහුවේ හාවාට, වැදුණේ පඳුරට. කරන්න දෙයක් නැහැ, ඒ ගැන කනගාටුයි!

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, අපි දන්නවා මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කරන්න මේ රටේ ධීවර ප්‍රජාව ගන්නා උත්සාහය ගැන. අපේ රටේ සමස්ත භූමිය වර්ග කිලෝමීටර 65,610 යි. අපට තිබෙනවා, අපට අනන්‍ය සාගර කලාපයක්, වර්ග කිලෝමීටර 517,000ක. දේශීය ජල තීරයක් තිබෙනවා, වර්ග කිලෝමීටර 27,000ක. හැබැයි, පසුගිය කාලය පුරාවට පැවති රජයන් මේ රටේ ධීවර කර්මාන්තයට වෙන් කළේ ඉතාම සුළු මුදලක්. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, 2023දී වෙන් කළේ රුපියල් මිලියන 6,450යි; එය සමස්ත රාජ්‍ය වියදමින් සියයට 0.18 යි. 2022දී රුපියල් මිලියන 6,372යි; එය සමස්ත රාජ්‍ය වියදමින් සියයට 0.11 යි. 2021දී රුපියල් මිලියන 8,358 යි; එය සමස්ත රාජ්‍ය වියදමින් සියයට 0.31 යි. නමුත් වර්තමාන ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා මෙවර අතුරු සම්මත ගිණුමෙන් ඉදිරි මාස 4ට රුපියල් මිලියන 5,769ක් -කලින් ප්‍රමාණය වාගේ තෙගුණයක ප්‍රමාණයක්- වෙන් කර තිබෙනවා, ධීවර කර්මාන්තය වෙනුවෙන්. ඒ නිසා මේ රටේ ධීවර ප්‍රජාව සම්බන්ධයෙන් තමාගේ රාජාසන කථාවේදී එතුමා කළ කරුණු පැහැදිලි කිරීම යථාර්ථයක් වෙලා තිබෙනවා; යථාර්ථයක් කර තිබෙනවා. මේකෙනුත් සමහරෙකුට රිදෙන්න පුළුවන්. නමුත් මේකෙන් ධීවරයාට මොකද වෙන්නේ? මේක ධීවරයාට සතුටක්. තව පිරිසකට මේකෙන් රිදෙන්න පුළුවන්; ඡොට් එකක් වදින්න පුළුවන්. මේ රටේ ධීවර කාර්මිකයින් 315,000ක් ඉන්නවා. ඔවුන්ගේ පවුල්වල ඔවුන්ගෙන් සෘජුව යැපෙන්නන් ඉන්නවා, ලක්ෂ 11ක්. සහාය සේවා සපයන්නන් එක්ක ලක්ෂ 20ක් ඉන්නවා, මේ රටේ ධීවර කර්මාන්තයත් සමඟ බැඳුණු ජනතාව. ඒ අයගේ හදවත්වලට කිසියම් අස්වැසිල්ලක් වෙනවා, අපේ රජයෙන් මේ කරපු කටයුත්ත.

අපේ රට වටේ මුහුදක් තිබෙනවා, දැවැන්ත ආර්ථික කලාපයක් තිබෙනවා. රට වටේ මුහුදක් තිබුණාට ගෙවී ගිය කාලය පුරාවටම මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ රටේ මිනිසුන්ට ප්‍රමාණවත්ව මාළු කෑල්ලක් කන්න ලැබිලා නැහැ. ලෝක සෞඛ්‍ය සංවිධානය අනුමත කර තිබෙනවා, සාමාන්‍යයෙන් දවසකට මාළු ග්‍රෑම් 66ක් කන්න කියලා. නමුත් මේ රටේ ජනතාව දවසකට මාළු ග්‍රෑම් 31යි කන්නේ. එය ප්‍රමාණවත් ද? මොකක්ද, පැවති රජයන් කරලා තිබෙන්නේ? මොකුත් නැහැ නේ. නමුත් අපට වැඩ පිළිවෙළක් තිබෙනවා. අපේ රටේ දවසකට ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ග්‍රෑම් 31යි නේ. අපේ ජාතික ජන බලවේගය රජය ඉදිරි අවුරුදු 5 තුළ මේ ප්‍රමාණය ප්‍රශස්ත මට්ටමකට ගන්න සැලසුම් කර තිබෙනවා.

ඒ වාගේම විමසා බලමු, පසුගිය කාලය පුරාවට මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට ධීවර කර්මාන්තයෙන් දැක්වූ දායකත්වය. එය, 2001දී සියයට 2.1 යි. දැන් කීයද? සියයට 1 යි. කල්පනා කර බලන්න. අවුරුද්දක්, අවුරුද්දක් ගණනේ දශමයක, දශමයක අඩුවීමක් තිබෙනවා. හරියට ගණිතයේදී සමාන්තර ශ්‍රේණියේ පොදු අන්තරය වාගේයි. දශම එක බැගින් අඩු වෙලා තිබෙනවා. නමුත් ඉදිරි පස් අවුරුද්ද අවසන් වන විට මේ රටේ දළ දේශීය නිෂ්පාදිතයට ධීවර කර්මාන්තය දක්වන දායකත්වය ප්‍රශස්ත මට්ටමකට ගන්න අපේ සැලැස්ම තුළ වැඩ පිළිවෙළක් තිබෙනවා.

අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා ප්‍රමුඛ අපේ වත්මන් රජයට ඉතා පැහැදිලි වැඩ පිළිවෙළක් තිබෙනවා, නිෂ්පාදන ආර්ථිකය ගොඩ නඟන්න. මේ ගැන රිදෙන්න පුළුවන්, කෙනෙකුට. හැබැයි, මේක ධීවර ජනතාවට අස්වැසිල්ලක්. ඒ වාගේම තමයි, මේ රටේ ධීවර කාර්මිකයාට අපි සිහිනයක් හදලා තිබෙනවා. Advanced Level mathematics කරන කෙනෙකුට, නැවක කැප්ටන් කෙනෙකු වෙන්න සිහිනයක් තිබෙනවා නේද? කැප්ටන් කරන්නේ නැව් පදවන එකයි. හැබැයි, බෝට්ටු පදවන කෙනාට මොකද වෙන්නේ? බෝට්ටුව පදවන කෙනාට එහෙම එකක් නැහැ. නැව පදවන්නා කැප්ටන්; බෝට්ටුව පදවන්නා මරක්කලහෙ. මේක හරිද? වැරදියි නේද? කැප්ටන් කෙනෙකු වෙන්න Advanced Level mathematics කරන්න ඕනෑ. ඉතින්, හරි නේ. මොකද ඔහු physics දැන ගන්න ඕනෑ; සර්ෂණ බලය දැන ගන්න ඕනෑ; උත්ප්ලාවකතා බලය දැන ගන්න ඕනෑ; ෘෂ්ඨීක ආතති බලය දැන ගන්න ඕනෑ. මේවා දැන ගන්න ඕනෑ, ධීවර කාර්මිකයාත්. අනාගතයේ මේ රටේ ධීවර කාර්මිකයාටත් සිහිනයක් තිබෙන්න ඕනෑ, මේ සමාජය තුළ උසස් කර්මාන්තයක් කරනවා කියලා.

අපේ සැලැස්මේ තිබෙන්නේ ඒ විධියටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, වචනයේ පරිසමාප්ත අර්ථයට අනුවම රට ගොඩ නඟන වැඩ පිළිවෙළ ජාතික ජන බලවේගයේ අප සතුව තිබෙනවා. එහි ඉලක්කයක් තිබෙනවා. දැන් ඇහුවා ඉලක්ක

තිබෙන්නේ කොහේද කියලා. මෙහි ඉලක්කයක් තිබෙනවා. පස් අවුරුදු සැලැස්මක් තිබෙනවා. කොතැනටද අප මේ රට ගෙන යන්නේ කියන එක අපේ සැලැස්මේ තිබෙනවා. ඒ වාගේම මේ රටේ ධීවර කර්මාන්තය, ගොවි ප්‍රජාව ඇතුළු සියල්ලන්ටම සෙත සලසන ඉලක්කයක් සහිතව වැඩ කරන වැඩ පිළිවෙළක් එක්ක තමයි අපි බලයට ආවේ. ඒ නිසා මේ රටේ ජනතාවගෙන් අපි ඉල්ලීමක් කරනවා. අවුරුදු 76ක් එක එක සෙල්ලම් දාලා නේ මේ රට අපට බාර දුන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ තිබෙන ප්‍රශ්න දිහා බැලුවාම, මේක හරියට පැටලුණු නූල් බෝලය වාගෙයි. දැන් මේක දිග හරින කොට තැන් තැන්වල වළලු වළලු වාගේ ගැට තිබෙනවා. ගැටයක් ළඟින් දෙපැත්තෙන් කපලා යන්තම් පුරුද්දාගෙන ඇද ගෙන යනවා, අපි. අපි මේ රට ගොඩ නඟනවා. වසර පහක් යන කොට මේ රට නිවැරැදි තැනකට ගේන්න වත්මත් ජනාධිපතිතුමා, කැබිනට් මණ්ඩලය ඇතුළු සියලු දෙනා සූදානම් වෙලා ඉන්නවා.

උපදේශකවරුන් ගැනත් කථා කරන්න පුළුවන්. එදා හිටපු උපදේශකවරුන් කොහොම අය ද? 98කට පඩි ගෙව්වා. ඒ වාගේම, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ උපදේශකයන් වශයෙන් මරු කට්ටිය නේ හිටියේ. ඥානා අක්කලා හිටියේ. දැන් එහෙම නොවෙයි. මහාචාර්ය ගෝමික උඩුගමසූරිය මැතිතුමා ආවා, ස්වේච්ඡාවෙන් වැඩ කරන්න. ඒ වාගේමයි, ආචාර්ය හාන්ස් විජයසූරිය මහත්මයා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා.

ගරු රත්න ගමගේ මහතා
(மாண்புமிகு ரத்ன கமகே)
(The Hon. Rathna Gamage)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ස්වේච්ඡාවෙන් වැඩ කරන ව්‍යවසායකයන්, ඉංජිනේරුවන් ඇවිල්ලා ඉන්නවා. දැන් මේ රට විශේෂ turning point එකකට ඇවිල්ලා තිබෙන්නේ. මතක තබා ගන්න, ඉතිහාසයේ මුදලට වැඩ කරපු යුගය අවසන්. මේ රට ගොඩ නඟන්න ස්වේච්ඡාවෙන් පිරිසක් - උගතුන්, බුද්ධිමතුන් - ඇවිල්ලා ඉන්නවා රට වෙනුවෙන්. බලන්න, කැබිනට් මණ්ඩලය අසුන් ගෙන ඉන්න මේ ඉදිරි පේළිය දිහා. විවිධ ක්ෂේත්‍රවල ඉන්න ප්‍රවීණයන්ගේ සිද්ධාන්ත දැනුමත්, ප්‍රායෝගික දැනුමත් - theory and practical knowledge - එකතු කරලා මේ රට ගොඩ නඟන ඉදිරි වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අප සූදානම් කියන පණිවුඩය දෙමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අමිල ප්‍රසාද් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි.

අද දවසේ මේ ගෞරවනීය පාර්ලිමේන්තුව ආමන්ත්‍රණය කිරීම සඳහා මට ජන වරම ලබා දුන් මීරිගම ආසනය ඇතුළු ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට පළමුව මගේ ස්තුතිය පළ කරනවා. විශේෂයෙන්ම දක්ෂිණාංශික දේශපාලන ව්‍යාපාරයක් ලෙස අප දැවැන්ත පරාජයකට පත් වෙලා තිබෙන අවස්ථාවක, ගම්පහ දිස්ත්‍රික්කය වාගේ ප්‍රදේශයකින් පළමු වතාවේම මැතිවරණ ව්‍යාපාරය ජයග්‍රහණය කරලා, මේ පාර්ලිමේන්තුවට පැමිණීම සඳහා මාහට හැකි වුණා. මෙසේ මාව තෝරා පත් කර එවූ එම ජනතාව මම ගෞරවයෙන් සිහිපත් කරනවා. ඉදිරි වසර පහක කාලසීමාව තුළ මේ රට දක්ෂිණාංශික කොඩිය යටට, කොළ පාට කොඩිය යටට ගෙන ඒම උදෙසා මේ ජනවරම භාවිත කරන බව ගම්පහ දිස්ත්‍රික්කයේ ජනතාවට මම ගෞරවයෙන් සිහිපත් කරන්න කැමැතියි.

මේ පාර්ලිමේන්තුව ආරම්භ වූ මොහොතේ පටන් මේ මොහොත දක්වාම -අලුත් රජයේ ප්‍රතිපත්ති මාලාව ගැන කියන අතරතුරත්- ප්‍රකාශ වෙච්ච වැදගත්ම දේ තමයි, 76 වසරක ශාපය කියන එක. අවුරුදු 76ක් මේ රට විනාශ කළා කියන ඒ ව්‍යාපාරවලට සහයෝගය දැක් වූ ජනතාව පළමුවැනි වතාවට මේ රටේ අලුත් දේශපාලන ව්‍යාපාරයක් කෙරෙහි විශ්වාසය තබා තිබෙනවා. ඒ නිසා මේ රටේ මහජනතාව තමන් කරපු ඒ පව අවසන් කර ගත්තා කියන අදහස මේ මොහොතේදී මට කියන්න පුළුවන්. දැන් අලුත් ජනවරමක් තිබෙනවා. ඔබට පුළුවන්, ඔබගේ ජීවිත කාලය තුළ වින්ද ඒ වේදනා නැති කරන්නට, ඊට අමතරව ඒ දැකපු සිහින මේ රට ඇතුළේ යථාර්ථයක් බවට පත් කරන්නට. හැබැයි, ඔබතුමන්ලාගේ දේශපාලන ව්‍යාපාරය ඒ වසර 76න් වසර 60ක් ම දේශපාලනය කරපු දේශපාලන ව්‍යාපාරයක්. වාමාංශික දේශපාලනය පිළිබඳ විශ්වාසය තබා ගෙන, අලුත් දේශපාලන ගමන් මහක් පිළිබඳව මේ රටේ මිනිසුන්ට දහසක් බලාපොරොත්තු ලබා දීලා, බලය ලබා ගත් අවස්ථාවක් මේක. ඒ නිසා අපි නැවත ඔබතුමන්ලාට ආරාධනා කරනවා, ඔබ දක්ෂිණාංශික දේශපාලන ව්‍යාපාර මාවතෙන් අයින් වෙලා, හැකිතාක් ඉක්මනින් ඔබේ වාමාංශික දේශපාලන ව්‍යාපාරයත් එක්ක මේ රට ඔබතුමන්ලා බලාපොරොත්තු වන තැනට ගෙන යන්න කියලා. ඔබතුමන්ලා මේ මොහොතේ මොන කථා කිව්වත්, රනිල් වික්‍රමසිංහ නිර්මාණය කරපු ඒ දක්ෂිණාංශික දේශපාලන ව්‍යාපාරය, ආර්ථික ව්‍යාපාරය ඇතුළේ තමයි තවමත් ක්‍රියාත්මක වෙමින් ඉන්නේ. ජනාධිපතිතුමාගේ රාජාසන කථාවේ පටන් අද දවසේ මේ මොහොත වන කල්ම කථා කරපු හැම විටම හැඟුනේ මේ ව්‍යාපාරය තවම දුවන්නේ ඒ පීල්ල දිගේ කියලායි. ඔබතුමන්ලාගේ පීල්ලට මේ රට කවදාද ගෙන යන්නේ? ඇත්තටම අපි ඔබතුමන්ලාගෙන් බලාපොරොත්තු වන්නේ එයයි. ඒක අප අමනාපයෙන්වත්, වෛරයෙන්වත් කියන දෙයක් නොවෙයි. අපිත් දක්ෂිණාංශික ව්‍යාපාරයක් ලෙස කැමැතියි, සැබෑ වාමාංශික ව්‍යාපාරයක් ඇවිල්ලා මේ රට ඒ දෙසට අරගෙන යන එකට. ඒකට හේතුව මේකයි. ඔබ ඔබේ වාමාංශික ව්‍යාපාරය හරහා මේ රටේ මිනිසුන්ට යහපතක් කළොත්, පොහොසත් රටක් නිර්මාණය කළොත්, මේ රටේ පුරවැසියන් ලෙස අපටත් සතුටින් ඉන්න පුළුවන්. ඒ නිසා අපි කිසිම අවස්ථාවක කුහක ලෙස ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ කකුලෙන් අදින්න බලාපොරොත්තු වන්නේ නැහැ. හැබැයි, අපි ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා, ඔබතුමන්ලාගේ අතින් ඇදලා කියනවා, ඔබ ඔබේ වාමාංශික ව්‍යාපාරය දිගේ, මෙතෙක් බලාපොරොත්තු වෙච්ච ගමන් මහ දිගේ ඔබේ ක්‍රමයට මේ රට අරගෙන යන්න කියලා. මොකද, ඔබ ඔබේ පාරේ මේ රට අරගෙන යද්දී යම් හෙයකින් සාර්ථක වුණොත්, ඒක රටවැසියන් ලෙස ඔබතුමන්ලාටත්, අපටත් මහඟු දායාදයක්. යම් හෙයකින් අසාර්ථක වුණොත්, ඊළඟ ජනවරමකින් දක්ෂිණාංශික ව්‍යාපාරයක් ලෙස අපේ පාරේ දිගේ මේ රට ඉදිරියට ගෙන යන්න අපට පුළුවන්. ඒ නිසා ඔබ නිරවුල්ව ඔබේ මාවත තෝරා ගන්න කියලා ඉල්ලනවා.

[ගරු අමිල ප්‍රසාද් මහතා]

ඒ වාගේම, දැන් මේ දිනවල කථා වෙන කාරණා ටික අරගෙන බලමු. අපේ ධීවර නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා දින 10ක් ඇතුළත විශාල සහන ප්‍රමාණයක් ලබා දුන්නා කියලා. ඔව්. ඒක සතුටට කාරණාවක්. මොකක්ද ඒකෙන් කියැවෙන්නේ? එහෙම නම්, මේ රට ඔබ කියන තරම් බිමට වැටිලා නැහැ. හේතුව මේකයි. දවස් 10ක් ඇතුළත කිසිදු මූල්‍ය පැමිණීමක් නොමැතිව පසුගිය ආණ්ඩුවලින් ලබා දුන්නු මූල්‍ය පැමිණීම්වලින් සහන ලබා දීමට හැකියාවක් පවතින මට්ටමේ ආණ්ඩුවක් තමයි ඔබට ලැබිලා තිබෙන්නේ. ඒ නිසා පළමුව ඔබ, 76 වසරේ ශාපය ඇතුළේත් යම් මුදලක් ඉතිරි කර ගිය රටක් බව මතක තබා ගෙන ඔබේ කාර්යය කරගෙන යා යුතු බව මා ප්‍රකාශ කරනවා.

ඒ වාගේම තමයි මේ ගෙවුණු අවුරුදු 60ක දේශපාලන ඉතිහාසය තුළ ඔබ 1977 ඉඳලා මේ විවෘත ආර්ථිකයට බැන්නා. දැන් ඔබට පුළුවන් අවුරුදු 76කට පස්සේ අලුත් සංවෘත ආර්ථිකයකට යන්න. ඔබ මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට බැන්නා. ජේ.ආර්. මරමු කිව්වා. ඒ සියල්ලට උත්තර සපයන්න දැන් ඔබට අවස්ථාව තිබෙනවා. තවදුරටත් අතීතයට අපහාස නොකර ඉමු. අතීතයේ වේදනා පිළිබඳ කථා නොකර, මෙතැන ඉඳලා කාල රාමුව මොකක්ද, කොතැනින්ද ආරම්භ කරන්නේ, මෙන්න මෙතැන ඉඳන් ආරම්භ කරනවා කියලා, අන්න ඒ විධියට අලුත් සැලසුම් එක්ක ඔබ කථා කළා නම්, අපට පුළුවන් ඒ සැලසුම් එක්ක මේ රට ඉදිරියට යන්නේ කොහොමද කියලා බලන්න. ඒ වාගේම තමයි ඔබ නිරන්තරයෙන්ම දේශපාලන වේදිකාවේ කිව්වේ, "මේ රට ස්වාභාවික සම්පත්වලින් අනූනයි. ඕනෑම නිෂ්පාදනයක් මේ රටේ කරන්න පුළුවන්" කියලා. ඔබතුමන්ලාගෙන් මම ඉල්ලීමක් කරනවා, හැකි ඉක්මනින් ඒ නිෂ්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන්න කියලා. ඔබ හැම කර්මාන්තයක්ම මේ රටේ ආරම්භ කරන්න බලාපොරොත්තුවෙන් ආපු ආණ්ඩුවක්. මම ඔබෙන් අහන්නේ කවදාද ඔබ ඒ කර්මාන්ත ආරම්භ කරන්නේ කියන එකයි. ඉක්මනින් ඒවා ආරම්භ කරන්න. හේතුව, මේ රටේ මිනිස්සු ඒ ඉක්මන් බලාපොරොත්තුවෙන් තමයි ඔබතුමන්ලාට මේ සා විශාල බලයක් ලබා දුන්නේ. ඔබට අංශු මාත්‍රයක හෝ බාධාවක් ඇති වෙයි කියලා විපක්ෂය හොඳටම දුර්වල කළා. ඒ තරම් ඔබ ගැන විශ්වාසය තැබුවා. එහෙම නම්, ඔබට තිබෙන වගකීම තමයි අල්ලස, දූෂණය, නාස්තිය නවත්වන්න හැකි ඉක්මනින් නීති ගෙනෙන එක. ඊට අමතරව ඔබේ ව්‍යාපාරය ඇතුළේ මේ සමස්ත නිෂ්පාදන ක්‍රියාවලිය -හැම නිෂ්පාදනයක්ම- ආරම්භ කරන්න. අපි කුහක නැහැ. ඔබ විසින් ගොඩනඟන රටේ ප්‍රතිඵල මේ වසර 5 තුළ ඔබටම දකින්න පුළුවන් විධියේ වේගවත් සංවර්ධන ක්‍රියාවලියක් ආරම්භ කරන්න කියලා ඉල්ලනවා.

ඒ වාගේම තමයි ඔබේ විදේශ ප්‍රතිපත්තිය. මම නිරන්තරයෙන්ම ඔබේ කථා සියල්ල දෙස බලාගෙන සිටිනවා, කුමක්ද ඔබේ විදේශ ප්‍රතිපත්තිය කියලා. ඇයි, මම එහෙම අහන්න හේතුව? අපේ රටට ආසන්නයේ තිබෙන්නේ එක විශාල රටක් විතරයි. ඉන්දියාවත් එක්ක තමයි අපට සියල්ල ගනුදෙනු කරන්න තිබෙන්නේ. ඉන්දියාවත් එක්ක ව්‍යාපාර කරන්න. ඉන්දියාවත් එක්ක දේශපාලන ගනුදෙනු කරන්න. ඒ සියල්ල තිබෙන අවස්ථාවක මම දැක්කා ඔබේ ආණ්ඩුවෙන් අදානි ව්‍යාපෘති නතර වෙන්න යන කථාවක් පිළිබඳව. යම් හෙයකින් ඉන්දියාව ආරම්භයේ දීම ඔබ අමනාප කර ගත්තොත් ඒකේ ප්‍රතිඵල ඔබට විතරක් නොවෙයි, අපට විතරක් නොවෙයි, අපේ පහළ පරම්පරාවලටත් භුක්ති විඳින්න සිද්ධ වෙනවා. ඒ නිසා ඔබේ විදේශ ප්‍රතිපත්තිය ගැන පැහැදිලි අදහසක් අපි දැන ගන්න කැමතියි. ඒ වාගේම ඔබේ විදේශ ප්‍රතිපත්තිය නොබැඳි ප්‍රතිපත්තියක්ද? එහෙම නැත්නම් චීනය පැත්තට හැරෙනවාද? ඒ කියන කාරණා අපි දැන ගන්න කැමතියි.

ඒ වාගේම, මේ රටේ මධ්‍යම පාන්තික සමාජය අප ප්‍රතික්ෂේප කරන්න ප්‍රධාන හේතුවක් තමයි ඔවුන්ට තිබෙන අධික බදු බර. ඒ බදු බර හේතුකොටගෙන සජිත් ප්‍රේමදාස මැතිතුමා,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
මට තව විනාඩියක් ගන්න පුළුවන් ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
තත්පර 30කින් අවසන් කරන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කට පාඩම් කරලා.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
කට පාඩම් කරන්න කිසි දෙයක් නැහැ. ඕනෑ එකක් අහන්න. ඒකටත් මම උත්තරයක් දෙනවා. අවුරුදු 5ක් ඇතුළත කොච්චර කට පාඩම් කරලා තිබෙනවාද කියලා මම ඔබ ඉදිරියේදීම පෙන්වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මට තව විනාඩි දෙකක් ගන්න පුළුවන්ද? *[බාධා කිරීමක්]* කමක් නැහැ. කමක් නැහැ. ඒකට කමක් නැහැ. ඕනෑ එකක්. මට විනාඩි දෙකක් ගන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විනාඩියකින් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා. කාලය කළමනාකරණය කර ගන්න ඕනෑ.

ගරු අමිල ප්‍රසාද් මහතා
(மாண்புமிகு அமில பிரசாத்)
(The Hon. Amila Prasad)
ඒ විනාඩියෙනුත් ගත්තා නේ. මම කියමින් හිටියේ මේකයි. මධ්‍යම පාන්තික සමාජය අපව ප්‍රතික්ෂේප කළේ, සජිත් ප්‍රේමදාස මැතිතුමා සුබසාධනවාදියෙක් කියලායි. හැබැයි, ඔබ පළමුවෙන්ම කළේ දැවැන්ත සුබසාධන කොටසක් එළියට දැමීමයි. ඔබ "අස්වැසුම" වැඩි කරනවා; ළමයින්ට තවත් මුදල් වෙන් කරනවා. හැබැයි, අවසානයේ බදු බර අඩු කරයි කියලා බලාපොරොත්තු යියා ගෙන හිටපු මධ්‍යම පාන්තික ජනතාවගේ බලාපොරොත්තු නැති කරමින්, නිකම් දෙන්න ජනාධිපතිවරු ඕනෑ නැහැ කියපු ඔබ, මුලින්ම සජිත් ප්‍රේමදාස මැතිතුමා කරගෙන ආපු සුබසාධන වැඩ පිළිවෙළ ආණ්ඩුවේ දේශපාලන ව්‍යාපෘතියට හරවාගෙන ඒකට මහජනතාවගේ බදු මුදල් යොදා ගත්තා. අපේ නායකයා ඒවාට භාවිත කළේ පක්ෂ අරමුදලේ මුදල් බව මතක තබා ගන්න කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඔෂානි උමංගා මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 7ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.02]

ගරු ඔෂානි උමංගා මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) ஒஷானி உமங்கா)
(The Hon. (Ms.) Oshani Umanga)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ප්‍රථමයෙන්ම, දසවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක ලෙස මා තෝරා පත් කර එවූ හොරණ ආසනයේ සහ කළුතර දිස්ත්‍රික්කයේ ආදරණීය ජනතාවට මාගේ ස්තුතිය ප්‍රකාශ කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

ඒ වාගේම, කළුතර දිස්ත්‍රික්කයෙන් විශිෂ්ට ජයග්‍රහණයක් **ලබා** දෙමින් ආසන 11න් ආසන 8ක් අපි වෙනුවෙන් පිරිනැමූ, ඒ වෙනුවෙන් කළුතර දිස්ත්‍රික්කයේ මහන්සි වුණ, කැප වුණ සියලුදෙනාම මම මේ මොහොතේ ඉතාම ගෞරවයෙන් මතක් කර සිටිනවා.

මේක අපට ලැබුණු ඉතාම ආස්වාදජනක අවස්ථාවක්. මීට අවුරුදු 30කට පෙර 1994 වසරේ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනා අතර අපේ පක්ෂයේ එක මන්ත්‍රීවරයෙක් හිටියා. අද අවුරුදු 30ට පස්සේ, එදා තනිව ජනතාව වෙනුවෙන් හඬ නැඟූ ඒ ගරු මන්ත්‍රීවරයා පෙරටු කරගෙන මේ සභා ගර්භයේ පිරිලා ඉන්න මන්ත්‍රීවරු 159දෙනා දැකීම අපට ලොකු ආස්වාදයක් ගෙන දෙන කරුණක්. මේ සභා ගර්භයේ පිරිලා ඉන්න 159දෙනාගෙන් අතිබහුතරයක් ගරු සභා ගර්භයට අලුත් අය තමයි. හැබැයි, ඒ කවුරුවත් ඒ අය පත් කරලා එවපු මේ රටේ අතිබහුතරයක් පුරවැසියන්ට නම් අලුත් අය නොවෙයි. මේ ඇවිල්ලා ඉන්නේ දශක ගණනාවක් පුරාවට මේ රටේ පුරවැසියන්ට වඩාත් හොඳ ජීවන තත්ත්වයක් ලබා දීම වෙනුවෙන් අවංකව වෙහෙස නොබලා මහන්සි වුණ, අරගළ කරපු, අපහසු අවස්ථාවලදී වුවත් දැඩිව අල්ලාගෙන නොපසුබට උත්සාහයෙන් සිටි දේශපාලන ව්‍යාපාරයක ශක්තියෙන් සහ අත්දැකීම්වලින් පෝෂණය වුණු කණ්ඩායමක්. ඉතින්, බිඳ වැටිලා බංකොලොත් කරපු අපේ රට ක්‍රමානුකූලව පොහොසත් රටක් බවට පත් කරලා, මේ රටේ පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැනකට ගෙනැත් ලස්සන ජීවිතයක් හැමෝමට උරුම කර දෙන කාර්යය අපේ කණ්ඩායම නියත ලෙසම ඉෂ්ට කරන බව මම මේ වෙලාවේ ඉතාම විශ්වාසයෙන් යුතුව මේ ගරු සභාවට ප්‍රකාශ කරන්න කැමතියි.

අපි මැතිවරණයට පෙර ඉතාම පැහැදිලිව ප්‍රකාශ කළ අයුරින්, අඳුරු, පරාජිත පිළිණු වුණු යුගයේ සිට නව පුනරුදු යුගයක් කරා මේ රට ගෙන යෑමේ මුල් පියවර මේ වනවිටත් අරඹා අවසන්. හොර බොරු නැති අවංකව වැඩ කරන්න පුළුවන් හැකියාවක් ඇති පිරිසක් රාජ්‍යයේ වගකීම මේ වන විටත් භාර ගනිමින් සිටිනවා. රාජ්‍යයේ තිබුණු පැරණි යල් පැන ගිය ක්‍රියාවලි යාවත්කාලීන කරමින් productivity එක වැඩි කිරීමේ මූලික පියවර මේ වනවිටත් ගනිමින් සිටිනවා. ඒ වාගේම රට ඉතා ශීඝ්‍රයෙන් ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අපි අරගෙන තිබෙනවා. දූෂණයට සහ අල්ලසට මේ ආණ්ඩුවේ ඉඩක් කොහොමත්ම නැති බව මේ රටේ පුරවැසියන් අතර පමණක් නොවෙයි, ප්‍රතිවිරුද්ධ මත දරන කණ්ඩායම් විසින් පවා මේ වනවිට පිළිගෙන තිබෙනවා. ආණ්ඩුවේ ඉදිරිගාමී ක්‍රියාමාර්ග දකින ආයෝජකයන්, ව්‍යාවසායකයන්, නව නිර්මාණකරුවන්, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නව කර්මාන්ත ඇති කරන්න, නිෂ්පාදන ධාරිතාව වැඩි කරන්න, මේ රටේ නිෂ්පාදන ආර්ථිකය තව තවත් ශක්තිමත් කරන්න මේ වනවිට පෙළ ගැසෙමින් සිටිනවා.

ඒ වාගේම මම මේ කාරණය මෙම ගරු සභාවට ප්‍රකාශ කරන්න කැමතියි. පසුගිය පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනය තිබුණේ සියයට 5ක් වාගේ ප්‍රමාණයක්. මේ වනවිට එය දෙගුණයක් දක්වා වර්ධනය වෙලා තිබෙනවා. දසවැනි පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජනයෙන් බහුතරයක් මාලිමාවේ අපේ කණ්ඩායමේ නියෝජිතවරියන්. පෙරේදා පාර්ලිමේන්තුවේ කාන්තා නියෝජිතයන්ගේ සංසදය පිහිටෙව්වා. එහි සභාපති විධියට සරෝජා පෝල්රාජ් ඇමතිවරිය පත් කර ගනු ලැබුවා. අපේ ආණ්ඩුව කාන්තාවන්ගේ ප්‍රශ්න, ගැටලු නිරාකරණය කරලා ඔවුන්ට ලස්සන ජීවිතයක් ලබා දීම වෙනුවෙන් ප්‍රමුඛස්ථානය ලබා දෙනවා.

ඔබ සියලුදෙනා දන්නවා, අපේ ආණ්ඩුව පත් කරගෙන ඉතාම කෙටි කාලයක් තුළ රාජ්‍ය සේවයේ නියැළි කාන්තාවන්ට කුසලතාව මත රැකියාවේ ඉහළට යෑමට තිබූ බාධා, glass ceiling effect කියලා අප හඳුන්වන තත්ත්වය ඉවත් කරමින් මේ වන විට ආදර්ශයක් ලබා දී තිබෙන බව.

අපේ ආණ්ඩුවේ අග්‍රාමාත්‍ය ධුරය දරන්නේ කාන්තාවක්. අග්‍ර විනිශ්චයකාර ධුරය දරන්නේත් කාන්තාවක්. අමාත්‍යාංශ ලේකම්වරුන් වශයෙන් ද කාන්තාවන් ගණනාවක් මේ දින කිහිපය තුළ පත් කර තිබෙනවා. ඒ වාගේම, මීට දින කිහිපයකට පෙර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ඉතිහාසයේ ප්‍රථම වතාවට කාන්තාවක් පත් වූවා. ඒ වාගේම, කාන්තාවන්හට ව්‍යවසායිකාවන් හැටියට ඉදිරියට ඇවිල්ලා මේ රටේ සංවර්ධන ක්‍රියාවලියට සම්බන්ධ වෙන්නත් අවස්ථා විවර කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමියට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමිය.

ගරු ඔෂානි උමංගා මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) ஒஷானி உமங்கா)
(The Hon. (Ms.) Oshani Umanga)

මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

"පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ ඉතාම පැහැදිලිව සඳහන් කර තිබෙන කරුණු ඉතාම ඉක්මනින් යථාර්ථයක් බවට පත් කරන්න ගරු පාර්ලිමේන්තුව බැඳී සිටිනවා.

අපේ රටේ තිබෙන නිවාස ලක්ෂ 52ක ප්‍රමාණයේ ගෘහ ආර්ථිකය කළමනාකරණය කිරීමේ වැඩි වගකීමක් දරන්නේ කාන්තාව විසින්. පසුගිය පාලනය විසින් ඇති කරන ලද අර්බුදකාරී තත්ත්වයන් හේතුවෙන් ගෙදර ආර්ථිකයේ සිදු වූ කඩා වැටීම් නිසා වැඩි වැඩියෙන් පීඩාවට පත් වුණේ ගෙවල්වල ඉන්න අම්මලා සහ බිරින්දෑවරු. අපේ ආණ්ඩුව විසින් මේ වන විට සිදු කර තිබෙන සහනාධාර වැඩි කිරීම්, දරුවන්ගේ පාසල් උපකරණ සඳහා රුපියල් 6,000ක මුදලක් ලබා දීම, ජ්‍යෙෂ්ඨ පුරවැසි විශ්‍රාමිකයන්ගේ දීමනාව රුපියල් 3,000කින් වැඩි කර ලබා දීම, අස්වැසුම දීමනාව රුපියල් 8,500 රුපියල් 10,000 දක්වා වැඩි කිරීම, රුපියල් 15,000ක දීමනාව රුපියල් 17,500 දක්වා වැඩි කිරීම, පොහොර සහනාධාරය ලබා දීම, ධීවර ප්‍රජාවට තෙල් සහනාධාරය ලබා දීම ආදි ක්‍රියා මාර්ග නිසා කාන්තාවන්ට ගෙදර ආර්ථිකය කළමනාකරණය කිරීමට - household management සඳහා - විශාල සහනයක් ලැබිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

ගරු ඔෂානි උමංගා මෙනෙවිය
(மாண்புமிகு (செல்வி) ஒஷானி உமங்கா)
(The Hon. (Ms.) Oshani Umanga)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

මේ දේවල් සාර්ථකව කරගෙන යන්න අවශ්‍ය කරන නීති සහ මූල්‍ය ප්‍රතිපාදන ලබා දී, අගාධයට වැටිලා තිබෙන මේ රට පොහොසත් රටක් බවට පත් කරන්න, මේ රටේ සමස්ත පුරවැසියන්ට ලස්සන ජීවිතයක් උරුම කර දෙන්න අවශ්‍ය කරන මූලික අඩිතාලම දමන්න සහාය දෙන්න එකට එකතු වෙලා වැඩ කරමු කියා මම මගේ මංගල කථාවේදී ගරු පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටිනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු කේ.එස්. කුගදාසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[பி.ப. 5.11]

ගරු කේ.එස්. කුගදාසන් මහතා
(மாண்புமிகு கே.எஸ். குகதாசன்)
(The Hon. K.S. Kugathasan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, திருகோணமலை மாவட்டத்தின் பிரதிநிதியாக என்னை இந்த நாடாளுமன்றத்திற்குத் தெரிவுசெய்து அனுப்பிய வாக்காளப் பெருமக்களுக்கு முதலில் நன்றியைத் தெரிவித்துக்கொண்டு, நீண்ட காலம் திருகோணமலை மாவட்டத்தினைப் பிரதிநிதித்துவப்படுத்திய மறைந்த தலைவர் அமரர் இரா. சம்பந்தன் ஐயா அவர்களையும் நினைவுகூர்ந்தவனாக, 10ஆவது நாடாளுமன்றத்தில் எனது முதலாவது உரையை ஆற்ற விழைகின்றேன்.

மாண்புமிகு குடியரசுத் தலைவர் அநுர குமார திஸாநாயக்க அவர்கள் 10ஆவது நாடாளுமன்றத்தின் முதலாவது கூட்டத் தொடரைத் தொடக்கிவைத்து ஆற்றிய விளக்க உரையின்மீது கருத்துரைக்க விரும்புகின்றேன். அவர் தனது உரையில் ஊழலற்ற, இனவாதமற்ற, மதவாதமற்ற, வெளிப்படைத் தன்மையான ஓர் ஆட்சியை நடத்தவுள்ளதாகக் குறிப்பிட்டுள்ளார். இது வரவேற்கத்தக்க கூற்றாகும். இதைச் சொல்லில் மட்டுமன்றிச் செயலிலும் காட்டவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன். மேலும் அவர் தனது உரையில், அரச சேவையினை வினைத்திறன் மிக்கதாக மாற்றப் போவதாகவும், சட்டவாட்சியை நிலைநாட்டப் போவதாகவும் குறிப்பிட்டுள்ளார். அரச சேவையினை வினைத்திறன் மிக்கதாக மாற்றினால்தான் இந்த நாட்டை முன்னேற்றப் பாதைக்குக் கொண்டுசெல்ல முடியும். இலங்கை சுதந்திரம் அடைந்தபொழுது 139 குடிமக்களுக்கு ஓர் அரச ஊழியர் இருந்தார். இன்று 13 குடிமக்களுக்கு ஓர் அரச ஊழியர் இருக்கின்றார் எனக் கூறப்படுகின்றது. எனவேதான் அரச சேவையினை ஒழுங்குபடுத்தி மீளமைக்கவேண்டிய தேவை உள்ளது. அடுத்து அவர் பேசுகையில், பொதுச் சொத்துகளைக் களவாடியவர்களைச் சட்டத்தின் முன் நிறுத்தி, உரிய தண்டனை வழங்கப் போவதாகக் கூறியுள்ளார். இதற்கு முன்வந்த அரசுகளும் தேர்தல் காலங்களில் இவ்வாறுதான் கூறின. ஆனால், ஒன்றும் நடக்கவில்லை. எனினும், அவர் கூறியவாறு செய்வார் என நம்புகின்றேன்.

தொடர்ந்து அவர் உரையாற்றுகையில், பொருளாதாரத் தினை மேம்படுத்த நடவடிக்கை எடுக்கப்படும் எனவும் இயம்பியுள்ளார். வேளாண்மைத்துறை, கடற்றொழில்துறை, கைத்தொழில்துறை முதலியவற்றில் இந்த நாடு நீண்ட தூரம் வளர்ச்சி காண வேண்டியுள்ளது. இத்துறைகள் வளர்ச்சி கண்டால் மாத்திரம் போதாது; அபிவிருத்தியும் அடைய வேண்டும். பொருளியலில் வளர்ச்சியும் அபிவிருத்தியும் - growth and development - என்ற சொற்கள் வெவ்வேறான பொருள் கொண்டவை. ஒரு மரம் செங்குத்தாக வளர்வது போன்றது 'வளர்ச்சி'. 'அபிவிருத்தி' என்பது அந்த மரம் பல்வேறு கிளைகளைப் பரப்பி வளர்வது போன்றது. அந்த வகையில் கைத்தொழில், கடற்றொழில், கால்நடை வளர்ப்பு போன்ற துறைகளும் பல்வேறு கிளைகளைப் பரப்பி அபிவிருத்தி காண வேண்டும்.

1960களில் பொலிவியா நாட்டின் பொருளாதாரம் 20 சதவீதத்தால் உயர்ந்தது. அந்த வளர்ச்சிக்கு முன்பு பொலிவியா நாட்டில் 60 சதவீதமான வருமானத்தினை 40 சதவீதமான மக்களும் 40 சதவீதமான வருமானத்தினை 60 சதவீதமான மக்களும் வைத்திருந்தனர். ஆனால், பொருளாதாரம் வளர்ச்சி கண்ட பின்பு 80 சதவீதமான வருமானத்தினை 20 சதவீதமான மக்களும் 20 சதவீதமான வருமானத்தை 80 சதவீதமான மக்களும் வைத்திருந்தனர். இது ஒரு பொருளாதார அபிவிருத்தியல்ல. எனவே, இந்த அரசு பொருளாதார வளர்ச்சியில் மட்டுமன்றி, வருமானப் பங்கீட்டிலும் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

அதேபோன்று வேளாண்மைத்துறை, கடற்றொழிற் றுறை, கால்நடை வளர்ப்புத்துறை ஆகியவற்றில் மேம்பாடு அடைய வேண்டுமானால், இந்தத் துறைகளுக்கெனத் தனித்தனியான சிறப்புப் பல்கலைக்கழகங்கள் நிறுவப்பட வேண்டும். எமக்கு அயலிலுள்ள இந்தியாவின் ஒரு மாநிலமான தமிழ் நாட்டில் உள்ள கோயம்புத்தூர் என்ற இடத்திலே அமைந்துள்ள வேளாண்மைப் பல்கலைக்கழகம் விவசாயத் துறை மேம்பாட்டிற்கு ஆற்றிவரும் பணி அளப்பரியது என்பதை நாம் எண்ணிப்பார்க்க வேண்டும். அதேபோன்ற பல்கலைக்கழகங்கள் இந்த நாட்டிலும் உருவாக்கப்பட வேண்டும். அவர்கள் கொண்டு வரும் அந்நிய நாணய மாற்றின் அளவும் பொருளாதாரத்திற்கு அவர்கள் அளிக்கின்ற பங்களிப்பும் மிகப் பெரியது என்பது குறிப்பிடத்தக்கது.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු කේ.එස්. කුගදාසන් මහතා
(மாண்புமிகு கே.எஸ். குகதாசன்)
(The Hon. K.S. Kugathasan)
இவ்வேளையிலே 10ஆவது பாராளுமன்றத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் ஆற்றிய கொள்கை விளக்க உரையின்மீதான கருத்துரையை நிறுத்திக்கொண்டு, அண்மையில் காலநிலை மாற்றம் காரணமாக திருகோணமலை மாவட்டத்தில் ஏற்பட்ட இழப்புகள் பற்றி இந்த உயரிய அவையின் கவனத்திற்குக் கொண்டுவருகின்றேன்.

அண்மையில் ஏற்பட்ட வெள்ளப்பெருக்கின் காரணமாக திருகோணமலை மாவட்டத்தில் முழு அளவில் 23,463 ஏக்கர் நெற்செய்கையும் பகுதியளவில் 10,525 ஏக்கர் நெற்செய்கையும் சேதமடைந்துள்ளன. இதனால் 12,994 விவசாயக் குடும்பங்கள் பாதிக்கப்பட்டுள்ளன. மேலும், இம்மாவட்டத்தில் 10 குளங்கள் முழுமையாகவும் 18 குளங்கள்

பகுதியளவிலும் உடைப்பெடுத்துள்ளன. அதேபோன்று, இம்மாவட்டத்தின் கடற்கரைப் பிரதேசத்தினை அண்டி வாழ்கின்ற மீனவர்கள் கடந்த 10 நாட்களாகக் கடலுக்குச் செல்லாத காரணத்தினால் 23,178 மீனவக் குடும்பங்கள் வாழ்வாதாரத்திற்கான வருமானத்தினை இழந்து இன்னலுறுகின்றனர். மேலும், வெள்ளம் வீடுகளுக்குள் புகுந்த காரணத்தினால் 4,250 குடும்பங்கள் பாதிக்கப்பட்டுள்ளன. மேற்குறிப்பிட்டுள்ள அனைத்துத் தரப்பினர்களுக்கும் இடருதவிகள் வழங்க ஆவன செய்ய வேண்டுமென வேண்டிக் கொண்டு, நேரம் போதாமையால் எனது உரையை இத்துடன் நிறைவு செய்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාට නියමිත කාලය අවසන්, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කථාවේ ඉතිරි ටික ලිඛිතව තිබෙනවා නම් එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා ලබා දෙන්න පුළුවන්.

ගරු කේ.එස්. කුගදාසන් මහතා
(மாண்புமிகு கே.எஸ். குகதாசன்)
(The Hon. K.S. Kugathasan)
හොඳයි. මගේ කථාව මා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුනිල් කුමාර ගමගේ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.17]

ගරු සුනිල් කුමාර ගමගේ මහතා (තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு சுனில் குமார கமகே - இளைஞர் விவகாரங்கள் மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Sunil Kumara Gamage - Minister of Youth Affairs and Sports)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, පළමුවෙන්ම, දසවැනි පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අපව තෝරා ගත් මාගේ ලාංකික පුරවැසියන්ට මම හිස නමා ආචාර කරනවා.

ඇත්තටම දැන් මේ පාර්ලිමේන්තුවේ මගේ කථාව ඇතුළේ මම ගොනු කරන්න බලාපොරොත්තු වෙන්නේ, මේ අතුරු සම්මත ගිණුම පිළිබඳ විවාදයේ දී අද උදේ ඉඳලා මතු වෙච්ච කරුණක් ගැනයි. ඒ තමයි අපේ ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය සම්බන්ධයෙන් මතු වෙච්ච සාකච්ඡාව. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ජනාධිපතිතුමාගේ වියදම් පිළිබඳ තොරතුරු මම ගෙන්වා ගත්තා. අපි මේ ඉදිරිපත් කරලා තිබෙන අතුරු සම්මත ගිණුමේ මේ මාස හතරට අදාළ වියදමත්, හිටපු ජනාධිපතිතුමාගේ පසුගිය අවුරුද්දේ මේ මාස හතරට අදාළ වියදමත් මම හරියටම කියන්නම්. කලින් අවුරුද්දේ මුල් මාස හතරට රුපියල් මිලියන 109ක් කලින් ජනාධිපතිතුමා වියදම් කරලා තිබෙනවා; රුපියල් මිලියන 109ක් වියදම් කරලා තිබෙනවා. අනුර කුමාර දිසානායක අපේ ජනාධිපතිතුමා මේ අතුරු සම්මත ගිණුමට ඉදිරිපත් කරලා තිබෙන්නේ මුල් මාස හතරට රුපියල් මිලියන 39යි; රුපියල් මිලියන 39යි. අපි අඩු කරලා තිබෙනවා, මාස හතරට රුපියල් මිලියන 70ක්. සියයට 64ක් අඩු කරලා තිබෙනවා. ඒ නිසා මේ සභාව නොමඟ යවන ප්‍රකාශ කරන්න එපා. මොකද, අපි කථා කරන්නේ සංඛ්‍යාලේඛනත් එක්ක. නැවත කිව්වා, මේකත් අර රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ මුල් මාස හතරේ වියදමට සමානයි කියලා. ඒකත් මම කියන්නම්. මේ ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ඇතුළේ, මුල් මාස හතර සඳහා තිබෙන රුපියල් මිලියන 2,647 ඇතුළේ තිබෙනවා, World Food Programme එකෙන් හම්බ වෙච්ච grant එකකින් අපි වියදම් කරන්න තිබෙන රුපියල් මිලියන 1,300ක්. ඒ මිලියන 1,300 මේකෙන් ඉවත් කළාම, මේකේ ඇත්ත වියදම මේ මාස හතරට රුපියල් මිලියන 1,347යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, හිටපු ජනාධිපතිතුමා මේ අදාළ මුල් මාස හතරට වියදම් කරලා තිබෙනවා, රුපියල් මිලියන 1,901ක්. අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමාගේ වියදම් ශීර්ෂය රුපියල් මිලියන 554කින් අඩු කරලායි තිබෙන්නේ; සියයට 30කින් අඩු කරලා තිබෙන්නේ. තවත් මේකේ අඩු කරන්න වියදම් තිබෙනවා. මේක ඇස්තමේන්තුවක් විතරයි. මේ වියදම් අඩු වෙනකොට විශාල වියදමක් ජනාධිපතිතුමා මේ මාස හතරට මේ අය වැය ඇතුළේ ඉතුරු කරනවා. මම ඒක වගකීමෙන් කියන්නේ. ඒ නිසා ගරු මන්ත්‍රීවරු මේ සභාවට කරුණු ඉදිරිපත් කරනකොට, වගකීමෙන් එය කරන්න. අපට වගකීම් ගැන කියලා දෙන්න එන මන්ත්‍රීවරුන්ට අපි කියන්නේ, අපි මෙතැන facts and figures එක්ක හැපෙමු කියලායි. නිකම් මේ, "අරයාගෙන් ඇහුවා, අරයා කිව්වා, මෙයා කිව්වා, අරයා කිව්ව එක තමයි මම කියන්නේ" කියලා එහෙම කථාවලට මේ පාර්ලිමේන්තුවේ දැන් ඉඩක් නැහැ, මේ මන්ත්‍රීවරු 159දෙනාත් එක්ක. එහෙම කථාවලට හැප්පෙන්න හම්බ වෙන්නේ නැහැ. අපි එන්නේ කරුණුත් එක්ක; අපි එන්නේ facts and figures එක්ක. ඉස්සරහටත් නිකම් බොරු කියලා ගල් කැටවලින් ගහලා දුවන්න ලැහැස්ති වෙන්න එපා, මේ පාර්ලිමේන්තුවේ.

ඊළඟට, උදේ මතු කරපු කාරණයට අමතරව අපි ඉදිරිපත් කරපු අතුරු සම්මත ගිණුමේ පුනරාවර්තන වියදම් රුපියල් බිලියන 1,000ක් සහ ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 425ක් වශයෙන් දක්වා තිබෙනවා. ඇත්තටම ගත්තාම මේකේ ඇත්ත වියදම රුපියල් බිලියන 1,425යි. මොකද, පරණ කරුමයට කර ගහන්න තිබෙන අර ණය සම්බන්ධ ප්‍රශ්නයට තමයි මේකේ ඉතුරු ටික ඔක්කෝම යන්නේ.

මේක මාලිමා ආණ්ඩුව නාස්තිකාර වියදම් කරන්න හදපු අතුරු සම්මත ගිණුමක් නොවෙයි. මම ඒකත් මේ ගරු සභාවට මතක් කරනවා. අපි මේ අදින්නේත් පරණ බේදවාචකයේ කුණු ගොඩවල්. ඒවා තමයි මේක අස්සේ ගොඩක්දුරට තිබෙන්නේ. අතුරු සම්මත ගිණුම ගැන කථා කරන මහත්වරුන්ට අපි කියනවා, මේවා හදාරලා කථා කරමු, නිකම් බොරුවට මෙතැනට ඇවිල්ලා මොකක් හරි කියන්න ඕනෑ හින්දා මොනවා හරි කියන්න එපා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, තව මන්ත්‍රීවරයෙක් මේ සභාවේදී චෝදනා කළා, නාස්තිකාර වියදම් මොනවාද, කොහේද තිබෙන්නේ කියලා ඔවුන්ට කියන්න කියලා. මට වෙලාව නැහැ, අවුරුදු 76ක නාස්තිකාර වියදම් ගැන කියන්න. මා දන්නා ආසන්නතම සිදුවීමක් ගැන කියන්නම්. මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන තරුණ සේවා සභාව වෙනුවෙන් රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුව පැවති මේ අවුරුද්දේ රුපියල් මිලියන 323ක් වියදම් කරලා තිබෙනවා. මොකටද? "Smart Youth Night" එකට. ඒක පටන් ගත්තේ ජූනි මාසයේ. Entertainmentවලට රුපියල් මිලියන 70යි, stage lights and soundsවලට රුපියල් මිලියන 154යි, marketing promotionsවලට රුපියල් මිලියන 30යි, අනෙකුත් වියදම්වලට රුපියල් මිලියන 69යි. තරුණයා ගොඩනඟන්න, අපේ රටේ

** පූර්වකාලයේ නබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුනිල් කුමාර ගමගේ මහතා]

තරුණයාට ජවය දෙන්න "Smart Youth Night" කියලා එකකට, ඡන්ද campaign එක වෙනුවෙන් රුපියල් මිලියන 323ක් වියදම් කරනවා. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. තරුණයෝ විනෝද වෙන එකට අපි විරුද්ධ නැහැ. අපි ඒකට එකඟයි. හැබැයි, අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේක තමයි ගිය අවුරුද්දේ තරුණ සේවා සභාව දරපු වැඩිම වියදම; විශාලම ව්‍යාපෘතිය. කොහොමද එහෙම වෙන්නේ?

"Smart Youth Night" එකක්, තරුණ සේවා සභාව විසින් තරුණයා ගොඩ නැඟීම වෙනුවෙන් කරන විශාලම ව්‍යාපෘතිය වෙන්න පුළුවන්ද? ඒක එක ප්‍රශ්නයක්. නාස්තිය, වංචාව, දූෂණය කියන්නේ මේවාට. මේවා තමන්ගේ යහළුවන්ට, හිතවතුන්ට මුදල් බෙදා දෙන ක්‍රියාමාර්ග. ඒකටයි අපි විරුද්ධ. ඒක විතරක් නොවෙයි, මෙතැන තිබෙන ප්‍රශ්නය. මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. තරුණ සේවා සභාවේ ප්‍රධාන ශාලා ගොඩනැඟිල්ල දැන් පාවිච්චි කරන්න බැරි මට්ටමට පත්වෙලා. වහිනකොට තෙමෙනවා. වහල කඩාගෙන වැටෙන මට්ටමක තිබෙන්නේ. පාවිච්චි කරන්න බැරි නිසා ඔක්තෝබර් මාසයේ ඒ ශාලාව වැහුවා. ඒක ප්‍රතිසංස්කරණය කරන්න ඇස්තමේන්තු කරලා තිබෙනවා, දළ වශයෙන් රුපියල් මිලියන 200ක්, 250ක් විතර වැය වන බවට. ඒවාත් කරන්නේ නැතුව, ඒ වාගේ අත්‍යවශ්‍ය වියදමක් ගැන හිතන්නේවත් නැතුව තමයි මේ "Smart Youth Night" කරලා තිබෙන්නේ. අපට තිබෙන ප්‍රශ්නය එයයි. වියදම් ගැන අහන අයට අපට කියන්න තිබෙන්නේ මෙයයි. ඒ වාගේ වියදම් කරන්න නොවෙයි, අපි මේ අතුරු සම්මත ගිණුම පාවිච්චි කරන්නේ. ඔය වෙන්න එපා, මේක ඇතුළේ ටෙන්ඩර් මගඩි යන්නේ නැහැ. මේක ඇතුළේ අපි යහළුවන්ට කොන්ත්‍රාත් දෙන්නේ නැහැ. මේක ඇතුළේ ඒ වාගේ නාස්තිකාර විධියට ඡන්ද campaignවලට වියදම් කරන්නේ නැහැ. මේ අතුරු සම්මත ගිණුමෙන් එක රුපියලක්වත් ඊළඟට එන මැතිවරණයේ ඡන්ද campaign කරන්න අපි ගන්නේ නැහැ. ඒක තමයි අපි වියදම් කරන විධිය. ඒක නිසා මේ ගරු මන්ත්‍රීවරුන්ට මම මේ කාරණය කියන්න ඕනෑ. අපව ප්‍රශ්න කරන්න ඉස්සෙල්ලා තමන්ම ප්‍රශ්න කර ගන්න. සංඛ්‍යාලේඛන ගේන්න ඉස්සෙල්ලා බලන්න, ඒවා ඇත්තද, බොරුද කියලා. මඩ ගහන්න කලින් මේ දේවල් ගැන කල්පනා කරන්න. එහෙම නැතුව මේ පාර්ලිමේන්තුවත්, ජනතාවත් නොමඟ යවන්න, අසත්‍ය කියලා දුවන්න ලැහැස්ති වෙන්න එපා. අසත්‍ය කිව්වොත්, face කරන්න; කියන දේ වෙනුවෙන් පෙනී ඉන්න. අරයා කිව්වා, මෙයා කිව්වා, අරයාගෙන් ඇහුවා, අරයා කිව්ව හින්දා කිව්වා කියනවා. අපි නම් කවදාවත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා එහෙම කථා කරන්නේ නැහැ. අපේ මන්ත්‍රීවරුන් 159දෙනාගෙන් කවුරුවත් බලාපොරොත්තු වෙන්නේ නැහැ, අරයා කිව්ව හින්දා කියන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, ඉදිරි වැඩ පිළිවෙළ ගැනත් අපෙන් ඇහුවා. අපි වගකීමෙන් කියනවා, මේ රටේ ක්‍රීඩාවත්, තරුණයාත් නහා සිටුවන්න අපේ උපරිම ශක්තිය අපේ අමාත්‍යාංශය වෙනුවෙන් යොදන්න, අපේ රජය වෙනුවෙන් යොදන්න අපි කටයුතු කරන්න සැලසුම් කරලායි තිබෙන්නේ කියලා.

මේ රටේ බිඳ වැටුණු සමාජයේ සිටින තාරුණ්‍යය අභිමි වෙච්ච තරුණයාට, ජීවිතයක් දෙන්න, තාරුණ්‍යය දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ අපේ රජය යටතේ අපි සකස් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු සුනිල් කුමාර ගමගේ මහතා
(மாண்புமிகு சுனில் குமார கமகே)
(The Hon. Sunil Kumara Gamage)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

රටක ආර්ථිකය බල ගැන්වීමෙන් විතරයි තරුණයාට තාරුණ්‍යයක් ලබා දෙන්න පුළුවන් වෙන්නේ. අපි දියුණු සංස්කෘතියක් හදනවා. අපි ආර්ථිකය හදනවා. ඒවා ඇතුළේ තරුණයාට තාරුණ්‍යය, ක්‍රීඩකයාට ක්‍රීඩා කරන්න අවස්ථාව, පහසුකම් කියන මේ සියලු දේවල් ලබා දෙන්න අපි බලාපොරොත්තු වන බව මම සියලුදෙනාට මේ වෙලාවේ මතක් කරනවා. අපේ ප්‍රතිපත්ති පිළිබඳව අපි දිගටම කියලා තිබෙන නිසා නැවත නැවත ඒවා කියන්න අවශ්‍ය නැහැ. මේ වෙනුවෙන් අපි ඉදිරිපත් වෙලා තිබෙන්නේ, මේ වෙනුවෙන් අපි මැදිහත් වෙන්නේ, මේ රාජ්‍යය දියුණු රාජ්‍යයක් බවට පත් කරන්නයි. ඒ බව සපථ කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි, සියලුදෙනාටම.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 5.28]

ගරු සුරංග රත්නායක මහතා
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි. අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට මට ඡන්දය ලබා දුන්, නොදුන් සියලු ජනතාවට ස්තුති කරන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා. විශේෂයෙන්ම අනුරාධපුර දිස්ත්‍රික්කයේ සමස්ත ජනතාව විශාල යුතුකමක්, වගකීමක් ඉෂ්ට කරාවි කියන බලාපොරොත්තුවෙන් මට ඡන්දය ප්‍රකාශ කර, මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට මහජන නියෝජිතයෙකු විධියට මා එවා තිබෙනවා. ඒ නිසා අපේ පාර්ලිමේන්තු කාලසීමාව ඇතුළතත්, ඉදිරි දේශපාලන ජීවිතය ඇතුළතත්, ඒ ජනතාව බලාපොරොත්තු වන පරිදි ඒ විශ්වාසය එක බිඳකින්වත් පළුදු නොවන ආකාරයට ඒ කටයුතු ඉදිරියට ගෙන යන බව අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජනතාවට මේ අවස්ථාවේදී මා ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, මේ වෙද්දීත් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව අර්බුද රාශියකට මුහුණ දීලා ඉන්නේ. මීට කලින් කථා කළ මාලිමාවේ මන්ත්‍රීවරයෙකු ප්‍රකාශ කළා, ගොවි ජනතාව වෙනුවෙන් පොහොර සහනාධාරය සඳහා රුපියල් 25,000ක මුදල ලබා දීලා අවසානයි කියලා. හැබැයි මම වගකීමෙන් ප්‍රකාශ කරනවා, මේ වෙද්දී අනුරාධපුර දිස්ත්‍රික්කයේ කිසිම ගොවියෙකුට රුපියල් 25,000ක මුදල සම්පූර්ණයෙන් ලැබිලා නැති බව. රුපියල් තුන්දහස් ගණනක්, හාරදහස් ගණනක් වාගේ මුදලක් කොටස් දෙකකට ලැබී තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඔබතුමන්ලා දුන් පොරොන්දු ඒ ආකාරයෙන්ම ඉෂ්ට කරන්න. මොකද, පොහොර සහනාධාරය නොලැබුණු නිසා ගොවි ජනතාව විශාල අර්බුදයකින් ඉන්නේ. ඒ වාගේම ඔවුන් විශාල අපහසුතාවලින් ගොවිතැන් කටයුතු සිද්ධ කළත්, නැවත වතාවක් ඔවුන්ට මේ ගංවතුර ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්නකොට -

විශේෂයෙන්ම නාමල් කරුණාරත්න මහත්මයා- ප්‍රකාශ කළා, ගංවතුර ව්‍යසනයට අදාළව අක්කරයකට රුපියල් 40,000ක මුදලක් මදි, රුපියල් ලක්ෂයක මුදලක්වත් ලබා දෙන්න ඕනෑ, හෝග 6කට විතරක් නොවෙයි, අනෙක් හෝගවලටත් එම වන්දි මුදල් ලබා දෙන්න ඕනෑය කියලා. එම නිසා මා හිතනවා, ඒ පිළිබඳව ඔබතුමන්ලා අවධානය යොමු කරාවි කියලා. ජනතාව වෙනුවෙන් ආදරයෙන් අපි ඉල්ලා සිටින්නේ, මේ අවස්ථාවේ ජනතාව අපහසුතාවට පත් වෙලා තිබෙන නිසා ඒ පිළිබඳව ඔබේ අවධානය යොමු කරන්න කියලායි.

ඒ වාගේම මේ කාරණයත් විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ. පාර්ලිමේන්තුවට ආ නවක මන්ත්‍රීවරුන් විධියට අපි මේ පාර්ලිමේන්තුවේ අතුරු සම්මත ගිණුම පිළිබඳ කථා කරන අවස්ථාවේදී, 76 වසරක දේශපාලනය පිළිබඳව, පරණ දේවල් පිළිබඳව කථා කර කර ඉදිරියට යන්න තවදුරටත් බලාපොරොත්තු වෙන්නේ නැහැ. මේ රටේ ජනතාව සමානුපාතික ඡන්ද ක්‍රමය යටතේ විශාල ජන වරමක් මාලිමා ආණ්ඩුවට ලබා දීලා තිබෙනවා. ඒ ජන වරම තුළින් ජනතාව මේ system එක, මේ දේශපාලනය වෙනස් කරන්න බලාපොරොත්තු වෙනවා. තවදුරටත් ජනතාවට පරණ කථා කියලා වැඩක් නැහැ. 76 වසරක දේශපාලන ඉතිහාසය ගැන කථා කරනවා නම් මේ සියලුදෙනාම මේකට වග කියන්න ඕනෑ. පක්ෂ විපක්ෂ සියලුදෙනා මේ දේශපාලනයට වගකියන්න ඕනෑ. කැරලි දෙකක් පටන් ගත්ත රාජ්‍යයක් මේක. ඒ කැරලිවලින් මහජන දේපළ විශාල වශයෙන් විනාශ වුණා. 1994න් පස්සේ මේ රටේ ආණ්ඩුකරණයට සහයෝගය දැක් වූ මේ සියලුදෙනාම 76 වසරක දේශපාලන ඉතිහාසයට වග කියන්න ඕනෑය කියන කාරණය මේ වෙලාවේ මම මතක් කරනවා.

මැතිවරණය වෙලාවේදී ආණ්ඩුව ජනතාවට පොරොන්දු රාශියක් දීලා තිබෙනවා.

මහා පරිමාණ දූෂණ, වංචා සහ හොරකම් කරපු දූෂිතයන් නීතිය ඉදිරියට අරගෙන එනවා, ඊට අදාළ ෆයිල් 400ක් තිබෙනවා, සාක්ෂි සහ සාධක තිබෙනවා, ඒ අය නීතිය ඉදිරියට අරගෙන එනවා කියලා පොරොන්දු දුන්නා. ඒ නිසා අපි ඉතා වගකීමෙන් ඉල්ලනවා, මැතිවරණ සමයේදී ජනතාවට දීලා තිබෙන පොරොන්දු ඉතා ඉක්මනින් ඉෂ්ට කරන්න කියලා. රටේ ජනතාව ඒ වෙනුවෙන් බලාගෙන ඉන්නවා. ඔබතුමන්ලා ඒ පොරොන්දු ඉෂ්ට කරනතුරු ප්‍රශ්න කරන්න විපක්ෂයේ මන්ත්‍රීවරු වන අපට අවස්ථාව දීලා තිබෙනවා. ඒ ජනතාව වෙනුවෙන් තමයි අපි ප්‍රශ්න කරන්නේ. විපක්ෂයේ ප්‍රශ්න කිරීම ඔබතුමන්ලා කරදරයක් කර ගන්න එපා. විපක්ෂයේ ප්‍රශ්න කිරීම ඔබතුමන්ලාට තිබෙන තර්ජනයක් විධියට ගන්න එපා. ඔබතුමන්ලා ඒවාට උත්තර දෙන්න. අපි විපක්ෂයේ මන්ත්‍රීවරුන් හැටියට අපේ කාර්යභාරය කරනවා. ඒ වාගේම ඔබතුමන්ලා නිවැරදි දේ කරගෙන යන්න කියන ඉල්ලීම මම කරනවා. මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
විවාදය කල් තැබීම, ගරු සභානායකතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි, "අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1- අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමේ යෝජනා සම්මතය සහ විෂය අංක 2 සිට 13 දක්වා - පරිපූරක ඇස්තමේන්තු 12ක් පිළිබඳ ආරම්භ කරනු ලැබූ විවාදය 2024 දෙසැම්බර් 06වන සිකුරාදා, එනම් හෙට දින තවදුරටත් පැවැත්වීම පිණිස කල් තැබිය යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ඊට අනුකූලව විවාදය කල් තබන ලදී.
එතැන් සිට විවාදය 2024 දෙසැම්බර් 06වන සිකුරාදා පවත්වනු ලැබේ.

අතන්පඩි විවාදම් ඔත්තිවෛක්කප්පට්ටදු.
විවාදම් 2024 டிசම්පර් 06, වෙළ්ළික්කිළමෛ මීණ්ඩුම් තොඩංගුම්.

Accordingly, the Debate stood adjourned.
Debate to be resumed on Friday, 06th December, 2024.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

එකල්හි වේලාව අ.භා. 5.30 වූයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමිය විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2024 දෙසැම්බර් 06වන සිකුරාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப. 5.30 மணியாகிவிடவே மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2024 டிசம்பர் 06, வெள்ளிக்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 5.30 p.m.., THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES adjourned Parliament without Question put.
Parliament adjourned accordingly until 9.30 a.m. on Friday, 06th December, 2024.

සැ.යු.

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

NOTE

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

Contents of Proceedings :

Final set of manuscripts Received from Parliament :

Printed copies dispatched :

හැන්සාඩ් වාර්තා
කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.

මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.